330 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 330 - இல. 09
Volume 330 - No. 09

2026 නොවැම්බර් 03 වන අඟහරුවාදා
2026 நவம்பர் 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd November, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ:

මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 1607]

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය [තීරුව 1608]

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 1608]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයකු නම් කිරීම [තීරුව1608]

අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 1609]

2027 අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව පැවැත්වෙන තේ පැන් සංග්‍රහය සඳහා ආරාධනා [තීරුව 1609]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 1610]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු]තීරු 1615-1665]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

2026 මහ කන්නයේදී එල් නිනෝ බලපෑම්වලට මුහුණ දීම සඳහා ගනු ලබන පියවර [තීරුව 1665]

සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් විෂමතා, උසස්වීම් සහ සේවා ව්‍යවස්ථාව [තීරුව 1667]

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමුවන වර කියවන ලදී [තීරුව 1671]

1983 කළු ජූලි ඛේදනීය සිදුවීම හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව [තීරුව 1682]

ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා අපනයනකරුවන්ට මූල්‍ය සහන [තීරු 1689-1798]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තීරු 1799-1802]

பிரதான உள்ளடக்கம்

சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்:

பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 1607]

அறிவிப்புகள்:

சபாநாயகரது சான்றுரை [ப: 1608]

ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைத் தடுத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 1608]

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர் நியமனம் [ப: 1608]

கல்வி, ஊழியப் படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம் [ப: 1609]

2027 வரவு செலவுத்திட்ட உரையின் பின்னரான தேநீர் விருந்துபசார த்துக்கான அழைப்பிதழ்கள் [ப: 1609]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 1610]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1615-1665]

தனி அறிவித்தல் மூல வினா:

2026 மகா போகத்தில் எல்நினோ தாக்கத்தை எதிர்கொள்வதற்கான நடவடிக்கைகள் [ப: 1665]

அபிவிருத்தி உத்தியோகத்தர்களின் சம்பள முரண்பாடுகள், பதவியுயர்வுகள் மற்றும் சேவைப் பிரமாணக் குறிப்பு [ப:1667]

குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1671]

1983 கறுப்பு யூலை துன்பியல் சம்பவம் மற்றும் அதன் தாக்கங்கள் குறித்து முழுமையான ஆய்வொன்றை மேற்கொண்டு அறிக்கையிடுவதற்கும் தேசிய சகவாழ்வை உறுதிப்படுத்துதல் மற்றும் பாதிக்கப்பட்ட தரப்பினருக்கு நிவாரணம் வழங்குவது தொடர்பான அதன் முன்மொழிவுகளையும் பரிந்துரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு [ப: 1682]

ஒத்திவைப்புப் பிரேரணை:

உலகளாவிய சவால்களை எதிர்கொள்வதற்காக ஏற்றுமதியாளர்களுக்கு நிதி நிவாரணம் [ப: 1689-1798]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1799-1802]

PRINCIPAL CONTENTS

MESSAGES FROM THE PRESIDENT:

Public Security Proclamation [Col. 1607]

ANNOUNCEMENTS:

Speaker's Certificate [Col. 1608]

Prevention of Organised Crimes Bill: Petitions to the Supreme Court [Col. 1608]

Ministerial Consultative Committees: Nomination of Member [Col. 1608]

Sectoral Oversight Committee on Education, Manpower and Human Capital: Nomination of Member [Col. 1609]

Invitations for Tea Party Following Presentation of Budget, 2027 [Col. 1609]

AUDITOR - GENERAL'S REPORT [Col. 1610]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1615-1665]

QUESTION BY PRIVATE NOTICE:

Measures to Address the Impact of El Nino during 2026 Maha Season [Col. 1665]

Salary Anomalies, Promotions and Service Minutes of Development Officers [Col. 1667]

CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL: Read the First time [Col. 1671]

SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY AND REPORT ON THE TRAGIC INCIDENT OF BLACK JULY OF 1983 AND ITS IMPACT AND TO SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS TO PARLIAMENT ON ENSURING NATIONAL HARMONY AND PROVIDING RELIEF TO THE AFFECTED PEOPLE [Col. 1682]

ADJOURNMENT MOTION:

Financial Relief for Exporters to Face Global Challenges [Cols. 1689-1798]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1799-1802]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 නොවැම්බර් 03වන අඟහරුවාදා
2026 நவம்பர் 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd November, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ
சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்
MESSAGES FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Speaker has received the following Message from the President:

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

My No. PS/CSA/00/7/IX/3/01

October 26, 2026

Hon. I.W.M. Jagath Wickramarathne
Speaker
Parliament of Sri Lanka

Hon. Speaker,

The Public Security Ordinance (Chapter 40)

By virtue of the powers vested in me by Section 12 of the Public Security Ordinance (Chapter 40), I have issued an order to the effect that all members of the Armed Forces specified in the First Schedule are summoned for the maintenance of Public Order in the areas specified in Second Schedule thereof taking into consideration the need for the Public Order to be maintained.

Accordingly, I hereby inform the Parliament of the said Order in terms of Section 2(3) of the aforesaid Ordinance read with Section 21(2) thereof.

Yours sincerely,

Anura Kumara Dissanayake
President

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform Parliament that the Hon. Speaker has endorsed the Certificate on the Bills titled "Poisons, Opium and Dangerous Drugs (Amendment) (L.D.O 8/2026)" and "Poisons, Opium and Dangerous Drugs (Amendment) (L.D.O 11/2026)" on the 30th of October, 2026 in terms of the Article 79 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

II

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைத் தடுத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
PREVENTION OF ORGANISED CRIMES BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform Parliament that the Hon. Speaker has received copies of twenty petitions filed at the Supreme Court in terms of the Article 121(1) of the Constitution in respect of the Bill titled "Prevention of Organised Crimes" .

III

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයකු නම් කිරීම
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர் நியமனம்
MINISTERIAL CONSULTATIVE COMMITTEES: NOMINATION OF MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform that the Hon. Habeeb Rifan, Attorney -at-Law, Member of Parliament has been nominated by the Committee of Selection to serve on each Ministerial Consultative Committee mentioned below, in terms of the provisions of Standing Order No. 112 of the Parliament and the Motion agreed to by Parliament on 19th March, 2025 :

- Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education;
- Ministerial Consultative Committee on Industry and Entrepreneurship Development;

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

- Ministerial Consultative Committee on Health and Mass Media;
- Ministerial Consultative Committee on Trade, Commerce, Food Security and Co-operative Development;
- Ministerial Consultative Committee on Youth Affairs and Sports; and
- Ministerial Consultative Committee on Buddhasasana, Religious and Cultural Affairs.

IV

අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම

கல்வி, ஊழியப் படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம்

SECTORAL OVERSIGHT COMMITTEE ON EDUCATION, MANPOWER AND HUMAN CAPITAL: NOMINATION OF MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform that the Hon. Suranga Rathnayaka, Member of Parliament has also been nominated by the Committee of Selection to serve in the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital, in terms of the provisions of Standing Order No. 111 of Parliament and as per the Motion agreed to by Parliament on 17th March, 2025.

V

2027 අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව පැවැත්වෙන තේ පැන් සංග්‍රහය සඳහා ආරාධනා

2027 வரவு செலவுத்திட்ட உரையின் பின்னரான தேநீர் விருந்துபசாரத்துக்கான அழைப்பிதழ்கள்

INVITATIONS FOR TEA PARTY FOLLOWING PRESENTATION OF BUDGET, 2027

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform this House that the Ministry of Finance, Planning and Economic Development has informed the Hon. Speaker that the invitations for the Tea Party to be held following the Budget Speech for the year 2027, scheduled to be held by the Minister of Finance, Planning and Economic Development on 12.11.2026, have already been sent to the email addresses and WhatsApp numbers of all Hon. Members.

විගණකාධිපතිවරයාගේ වාර්තාව

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

AUDITOR-GENERAL'S REPORT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the First Installment - Parts VII, VIII, IX and X, Fourth Installment - Part VI, Fifth Installment - Parts VI and VII and Sixth Installment - Part I of the Report of the Auditor -General for the Financial Year 2025, in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

Hon. Deputy Speaker, I move,

"That the Report be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

II

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the -

- Ninth Installment - Part XLVIII of the Report of the Auditor-General for the Financial Year 2020;
- Ninth Installment - Part L of the Report of the Auditor-General for the Financial Year 2021;
- Ninth Installment - Part XXXIII of the Report of the Auditor-General for the Financial Year 2023;
- Second Installment - Part LXVII and Ninth Installment - Part LII of the Report of the Auditor-General for the Financial Year 2024; and
- Second Installment - Parts XIII, XIV, XV and XVI, Third Installment - Part XII and Ninth Installment - Parts VII, VIII, IX and X of the Report of the Auditor-General for the Financial Year 2025,

in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
Hon. Deputy Speaker, I move,

"That the said Reports be printed".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැහෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැහෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍යතියර්) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍යතියර්) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් පරිපූරක ඇස්තමේන්තු සහ රෙගුලාසි ඉදිරිපත් කරමි.

(i) 2026 අංක 07 දරන පරිපූරක ඇස්තමේන්තුව;

(ii) 2026 අංක 08 දරන පරිපූරක ඇස්තමේන්තුව; සහ

(iii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ඔක්තෝබර් 01 දිනැති අංක 2508/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි.

මෙම පරිපූරක ඇස්තමේන්තු සහ රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2025 අංක 23 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව 2026.09.01 සිට 2026.09.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන කටයුතු වැඩසටහනෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා සීමාසහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2016 වර්ෂය සඳහා සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2025 වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

Hon. Deputy Speaker, I present the Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Department of Samurdhi Development in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බදුල්ල, පහළගම, රත්පහ, අංක 27/1 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.ඩී. ගාමිණී සේනාතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුණ්ඩසාලේ, වරාපිටිය, විදුරගේවත්ත, අංක 81/ඒ යන ලිපිනයෙහි පදිංචි උපාලි ඒකනායක මහතා සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සම.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යටියන්තොට, මහවිල පාර, හල්ගහකොටුව යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.එස්.එන්.කේ. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු එම්.ඒ.සී.එස්. වතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තණමල්විල, හම්බෙගමුව, ජනපද හන්දිය යන ලිපිනයෙහි පදිංචි පී.ජී. පියදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) පොතුහැර, මහපිටිය, "පියකරු සෙවණ" යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්.පී.ඒ. කුමාරි කරුණාරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) කු/මැටියගනේ, පැලවත්ත, පුවක්ගොල්ල යන ලිපිනයෙහි පදිංචි ජී.පී. බෝගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) උහුමීය, කහටගොල්ලවත්ත පාර යන ලිපිනයෙහි පදිංචි අයි.එම්.ඩී.කේ. ඉලංගකෝන් මහතා සහ වෙනත් පස්දෙනෙකුගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 1 - 1195/2025 - (1), the Hon. Sivagnanam Shritharan. - *[Not in the Chamber.]*

මුලතිව්, තිරුමුරිකණ්ඩි පිල්ලෙයාර් කෝවිල ඉදිරිපිට වන රක්ෂිතය: විස්තර
முல்லைத்தீவு, திருமுறிகண்டி பிள்ளையார் கோவிலுக்கு முன்னாலுள்ள வன ஒதுக்கம்: விபரம்
FOREST RESERVE OPPOSITE THIRUMURIKANDY PILLAIYAR KOVIL MULLAITIVU: DETAILS

1574/2025

2. ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, තිරුමුරිකණ්ඩි පිල්ලෙයාර් කෝවිල (ගණදෙවි දේවාලය) ඉදිරියේ ඇති ජනාවාස පිටුපස පිහිටි වනාන්තරය රක්ෂිත ප්‍රදේශයක් බවත්;

(ii) 2010 වර්ෂයෙන් පසු එම රක්ෂිතය තුළ වන විනාශයක් සිදු කර ඉදි කිරීම් කර ඇති බවත්;

(iii) එම රක්ෂිතය මෙතෙක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිපාලනයෙන් නිදහස් කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත රක්ෂිතයේ නම කවරේද;

(ii) එම වනාන්තර ප්‍රදේශය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කළ ගැසට් පත්‍රයේ දිනය සහ අංකය කවරේද;

(iii) රක්ෂිතය තුළ සිදුකරන ලද ගස් කැපීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(iv) රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් විසින් එම ගස් කැපීම් සිදු කර ඇත්තේ නීත්‍යානුකූල අනුමැතියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தில், திருமுறிகண்டிப் பிள்ளையார் கோவிலுக்கு (விநாயகர் கோவில்) முன்னால் அமைந்துள்ள குடியிருப்பின் பின்புறத்தில் உள்ள வனப்பகுதி ஒதுக்குப் பிரதேசமாகும் என்பதையும்;

(ii) 2010ஆம் ஆண்டிற்குப் பின்னர் மேற்படி ஒதுக்குப் பிரதேசத்தில் வன அழிப்பு மேற்கொள்ளப்பட்டு நிர்மாணப் பணிகள் மேற்கொள்ளப்பட்டுள்ளன என்பதையும்;

(iii) மேற்படி ஒதுக்குப் பிரதேசம் இதுவரையில் வனப் பாதுகாப்புத் திணைக்களத்தின் நிர்வாகத்திலிருந்து விடுவிக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வன ஒதுக்குப் பிரதேசத்தின் பெயர் யாதென்பதையும்;

(ii) மேற்படி வனப்பகுதியை ஒதுக்குப் பிரதேசமாகப் பிரகடனப்படுத்திய வர்த்தமானி அறிவித்தலின் திகதி மற்றும் இலக்கம் யாதென்பதையும்;

(iii) வன ஒதுக்குப் பிரதேசத்திற்குள் மேற்கொள்ளப்பட்ட மரம் வெட்டுதல் தொடர்பாக சுற்றாடல் தாக்க மதிப்பீட்டு அறிக்கை பெறப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அரச மரக் கூட்டுத்தாபனத்தின் அலுவலர்களினால் குறித்த மரம் வெட்டும் நடவடிக்கை சட்டரீதியான அனுமதியின்கீழ் மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Is he aware that the -
  (i) forest situated behind the human settlement opposite the Thirumurikandy Pillaiyar Kovil (Ganadevi Devalaya) in the Mullaitivu District is a reserved area;
  (ii) forest in the said reserve has been cleared after the year 2010 and constructions have been erected therein; and
  (iii) said reserve has not yet been released from the administration of the Department of Forest Conservation?

(b) Will he inform this House -
  (i) the name of the aforesaid forest reserve;
  (ii) the date and number of the Gazette Notification by which the said forest area was declared a reserve;
  (iii) whether an Environmental Impact Assessment report had been obtained in respect of the felling of trees carried out within the reserve; and
  (iv) whether the officials of the State Timber Corporation have carried out the said felling of trees under proper approval?

(c) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ තිරුමුරිකණ්ඩි පිල්ලෙයාර් කෝවිල ඉදිරියේ ඇති ජනාවාසය "ශාන්තිපුරම්" ලෙස හඳුන්වන අතර, එම ජනාවාසය පිටුපස පිහිටි වනාන්තරය ඉරණමඩු රක්ෂිත වනාන්තරයට අයත් භූමි ප්‍රදේශයක් වේ. එම භූමිය තුළ ශාන්තිපුරම් ගම්මානයේ පවතින ජනාවාස සහ ආරක්ෂක අංශ කඳවුරු පිහිටා ඇත.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

(ii) වර්තමානය වන විට අදාළ රක්ෂිත භූමිය තුළ අලුතින් වන විනාශයක් හෝ අනවසර ඉදි කිරීමක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය නොවන අතර, 2011 වර්ෂයෙන් පසුව මූලතිව් දිසාවේ කාර්යාල කටයුතු ආරම්භ කර ඇති අතර, 2010 වර්ෂයේ මේ සම්බන්ධව තොරතුරු අනාවරණය වී නොමැත.

(iii) අදාළ වනාන්තර භූමිය මෙතෙක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිපාලනයෙන් නිදහස් කර නොමැත.

(ආ) (i) අදාළ රක්ෂිතයේ නිල නම "ඉරණමඩු රක්ෂිත වනාන්තරය" වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම රක්ෂිත වනාන්තරය තමයි උතුරට ගලන අපේ රටේ තිබෙන එකම ගංගාව වන කනකරායන් ආරු ගංගාවත්, ඒ වාගේම ඉරණමඩු ජලාශයත් කියන දෙකටම අදාළ ජල පෝෂක ප්‍රදේශය වෙන්නේ.

(ii) එම වනාන්තර ප්‍රදේශය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කළ දිනය 1930.05.16 වන අතර, අංකය 7777 වේ.

(iii) නොමැත. රාජ්‍ය දැව සංස්ථාව වාණිජ වන වගා කපා ඉවත් කරන අතර නැවත වගා ඇති කිරීමට වර්ෂයක් තුළ කටයුතු කරයි. එබැවින්, වන කළමනාකරණ සැලැස්මට අනුව හෙළීම් කරනු ලබන භූමිය සඳහා වෙනම පරිසර ඇගයීමක් නොකරන අතර පරිසර පනතේ කොන්දේසි අනුගමනය කරමින් කටයුතු කරනු ලබයි.

(iv) 2019 වර්ෂයේ දී පමණ ඉරණමඩු රක්ෂිතයේ බොරලු ඉවත් කිරීම නිසා හානි වූ ගස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත කපා ඉවත් කරන ලදී.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may ask your Supplementary Questions now.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, இந்தக் கேள்விகளுக்கான பதில்களில் மயக்கம் இருக்கின்றது. எனினும், கூடுதலான கேள்விகளுக்கான பதில்களை நான் ஏற்றுக்கொள்கின்றேன். குறித்த இடத்தில் காடழிப்பு நடந்தமை தொடர்பான விபரம் தங்களால் பூரணமாகத் தெரிவிக்கப்படவில்லையென நினைக்கின்றேன்.

எனது முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன். முல்லைத்தீவு அடங்கிய வன்னித் தேர்தல் மாவட்டத்தில் ஒருபுறம் வன ஒதுக்குப் பகுதிகளிலிருந்து காடுகள் அழிக்கப்படுகின்றன. பொதுமக்களிடம் இருந்து ஆவணங்களைக் கோரும் வனவளத் திணைக்களம், சட்டவிரோதக் காடழிப்புகளிலும் படையினரின் சட்டவிரோத நிர்மாணங்களிலும் அமைதி காக்கின்றது. ஆவணம் இல்லை என்ற ஒரே காரணத்துக்காக மா மரமும் வேம்பும் வீட்டு அத்திவாரமும் தெரியும்படியாக உள்ள காணிகளைக்கூட துப்புரவாக்கத் தடைபோடும் வனவளத் திணைக்களம், படையினரின், அத்துமீறிய செயற்பாட்டாளர்களின் காடழிப்புகளுக்கு ஏன் மௌனம் காக்கின்றது? ஒருபுறம் காடுகளைப் பாதுகாக்க வேண்டுமென செயற்றிட்டங்களை இந்த அரசு முன்னெடுக்கின்றது. ஆனால், மறுபுறம் சட்டவிரோத காடழிப்புகளைக் கட்டுப்படுத்தத் தவறுவதோடு, அவற்றுக்கான திணைக்கள பொறுப்புக்கூறலையும் உரியவாறு முன்னிறுத்தவில்லை.

நூற்றுக்கணக்கான ஏக்கர் அளவில் அழிக்கப்படும் காடுகள் தொடர்பான முறைப்பாடுகளை மக்கள் எங்களிடம் முறையிட்டு, நாங்கள் அங்கு சென்று பார்வையிட்டு உறுதிப்படுத்தி, வனவளத் திணைக்களத்திடம் சொல்லும் வரையில் காடழிப்பு நடவடிக்கைகள் தொடர்கின்றன. வவுனியா வடக்குப் பிரதேச செயலகப் பிரிவுக்கு உட்பட்ட திரிவச்சகுளம் பகுதியில் நடைபெற்ற காடழிப்பு, வவுனியா பல்கலைக்கழகத்துக்கு அருகில் நடைபெற்ற காடழிப்புக்கு மக்கள் நேரடியாக வனவளத் திணைக்கள அதிகாரிகளையே சாடுகின்றனர். எனவே, இவ்வாறு தமது எல்லைப் பரப்புகளில் சட்டவிரோத மரம் வெட்டுதல், நிர்மாணங்களை மேற்கொள்ளல், காடழிப்புகள் நடைபெறுவதைக் கண் காணிக்கத் தவறுதல் என்பவை மீள நிகழாதிருக்கும் வகையில் வனவளத் திணைக்களத்தின் பொறுப்புக்கூறலை மேலும் வலுப்படுத்த தங்கள் அமைச்சு நடவடிக்கை எடுக்குமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන සොයා බලන්නම්. වන රක්ෂිත තුළ තිබෙන ඉඩම් එහෙම බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමට හෝ කපා ඉවත් කිරීමට අපි අවසර දෙන්නේ නැහැ. නමුත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනවගා හැටියට වගා කරලා තිබෙන ඉඩම්වල තිබෙන ගස් කපා ඉවත් කිරීම කෙරෙනවා. ඒවා රාජ්‍ය දැව සංස්ථාවට ලබා දෙනවා. ඔබතුමා කියන කාරණය සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට අප කටයුතු කරන්නම්.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் ஆராய்ந்து பார்க்க வேண்டும். முக்கியமாக, வன இலாகாவின் எல்லா அதிகாரிகளையும் நான் குறை சொல்லவில்லை. சில அதிகாரிகள்தான் நான் குறிப்பிட்ட இடங்களில் தவறு செய்கிறார்கள் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

எனது இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன். கடந்த ஆட்சிக் காலத்தில் பல்வேறு துறைசார் அதிகாரிகளின் களவிஜயம், கூட்டம், Zoom செயலி ஊடான கலந்துரையாடலின் ஊடாக முல்லைத்தீவில் 29,486.32 ஹெக்டெயார் காணிகள் விடுவிக்கப்பட வேண்டும் எனவும், அவற்றில் 17,469.58 ஹெக்டெயார் காணிகள் ஆவணங்கள் எதுவும் பெறப்படாமல் நேரடியாக விடுவிக்கப்பட வேண்டும் எனவும் தீர்மானிக்கப்பட்டது. அதேபோல், மன்னார் மாவட்டத்தில் 26,330.98 ஹெக்டெயார் காணிகள் வனவளத் திணைக்களம் மற்றும் வனசீவராசிகள் திணைக்களத் திடமிருந்து விடுவிக்கப்பட வேண்டும் எனவும், அவற்றுள்

2,895.89 ஹெக்டெயார் காணிகள் ஆவணங்கள் எதுவுமின்றி நேரடியாக விடுவிக்கப்பட வேண்டும் எனவும் ஒருங்கிணைந்த திணைக்கள அதிகாரிகளின் கள விஜயங்கள் ஊடாகத் தீர்மானிக்கப்பட்டது.

இவ்வாறாக, முன்னரே மக்களின் காணிகள்தான் என அடையாளப்படுத்தப்பட்டு உறுதிப்படுத்தி, காணி ஆவணங்கள் ஏதுமின்றி விடுவிக்கப்படலாம் எனத் தீர்மானிக்கப்பட்ட காணிகள், தேசிய மக்கள் சக்தி அரசின் காலத்திலும், இரண்டு ஆண்டுகளாகியும்கூட விடுவிக்கப் படாத நிலை காணப்படுகிறது. கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய அரசாங்கத்தை மக்கள் கூடுதலாக நம்பிக்கொண்டு இருக்கிறார்கள். எனவே, கடந்த கூட்டத் தீர்மானங்களுக்கு அமைவாக, நேரடியாக விடுவிக்கப்படத் தீர்மானிக்கப்பட்ட காணிகளை விடுவிக்க தங்களுடைய அமைச்சு கூடுதல் கரிசனைகொள்ளுமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය බලයට ආ පසු, 2025 අගෝස්තු මාසයේදී පමණ අපි මේ සම්බන්ධයෙන් විශේෂ කැබිනට් අනුමැතියක් සහිත කමිටුවක් පත් කළා. විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත්වල තිබෙන ඉඩම් ප්‍රශ්නය විසඳීම සඳහා. ඒ කමිටුව හරහා අපි ග්‍රාම නිලධාරි වසම් මට්ටමට ගිහිල්ලා නැවත තොරතුරු සොයා බලා මේ වන විට දිස්ත්‍රික්ක ගණනාවකම නිදහස් කළ හැකි ඉඩම් හඳුනා ගෙන තිබෙනවා. නමුත්, අපට තවමත් දිස්ත්‍රික්ක කිහිපයකින් ඒ අවශ්‍ය සහයෝගය නොලැබීම නිසා මෙම කටයුත්තේ යම් ප්‍රමාදවීමක් තිබෙනවා. ඔබතුමා කියපු කාරණය නිවැරදියි. අපි මේ සඳහා සැලකිය යුතු කාලයක් අරගෙන තිබෙනවා. දැන් අපි අවසන් අදියරේ ඉන්නේ. අපි විශ්වාස කරනවා, මේ වසර අවසන් වන්න කලින් අපට නිදහස් කළ හැකි භූමි ප්‍රමාණය හඳුනාගෙන ඒකට අදාළ කටයුතු කර ගන්න පුළුවන් වෙයි කියලා.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කින්නියා කාර්යාලය: පහසුකම් හිඟය
தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் கிண்ணியா அலுவலகம்: வசதியின்மை
OFFICE OF NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD, KINNIYA: LACK OF FACILITIES

1684/2025

3. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කින්නියා ප්‍රදේශයේ ජනගහනය සහ ජල පාරිභෝගිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව, එම ප්‍රදේශයේ පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලය ප්‍රමාණවත් නොවන බවත්;

(ii) එම කාර්යාලයට ලබා දී ඇති වාහනය භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්වන්නේද?

(ආ) (i) මණ්ඩලයේ කින්නියා කාර්යාලය මඟින් නඩත්තු වන පානීය ජල සැපයුම් ලබා දී ඇති පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාලය වෙනුවට, පහසුකම් සහිත නව කාර්යාලයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) කින්නියා ප්‍රදේශයේ නව ජල සම්බන්ධතා සඳහා ඉල්ලුම් කරන පුද්ගලයින් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බැවින් නව පොදු ජල සම්බන්ධතා පුළුල් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிண்ணியா பிரதேசத்திலுள்ள சனத்தொகையுடன் நீர் பாவனையாளர்களின் எண்ணிக்கையை ஒப்பிடுகையில், மேற்படி பிரதேசத்தில் அமைந்துள்ள தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் அலுவலகம் போதுமானதாக இல்லை என்பதையும்;

(ii) மேற்படி அலுவலகத்துக்கு வழங்கப்பட்டுள்ள வாகனம் பயன்படுத்த முடியாத நிலையில் காணப்படுகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி சபையின் கிண்ணியா அலுவலகத்தின் மூலமாகப் பராமரிக்கப்படும் குடிநீர் வழங்கப் பட்டுள்ள பாவனையாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி அலுவலகத்துக்குப் பதிலாக, வசதிகளுடன்கூடிய புதிய அலுவலகமொன்றை அமைப்பதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப் படுமா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) புதிய நீர் இணைப்புகளுக்கு விண்ணப்பிக்கும் ஆட்களின் எண்ணிக்கை கிண்ணியா பிரதேசத்தில் அதிகரித்துள்ளமையால் புதிதாக பொது நீர் இணைப்புக்களை விரிவாக் குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Is he aware that the -

(i) office of the National Water Supply and Drainage Board located in the Kinniya area is inadequate, relative to the population and the number of water consumers in that area; and

(ii) vehicle provided to the said office is in an unusable condition?

(b) Will he inform this House -

(i) the number of consumers who have been provided with drinking water supply services which are maintained by the Kinniya office of the Water Supply and Drainage Board;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(ii) whether steps will be taken to establish a new office with adequate facilities in place of the existing office;

(iii) if not, the reasons therefor; and

(iv) whether action will be taken to provide new public water connections, given the increase in the number of persons requesting for new water connections in the Kinniya area?

(c) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම නිලධාරී කොට්ඨාස 31ක් පවතින අතර, එකී සම්පූර්ණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයන්ගෙන් කොට්ඨාස 30ක් සඳහා මේ වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් නළ ජල පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත. මේ වන විට ලබා දී ඇති ජල සම්බන්ධන ගණන 20,504ක් වන අතර, ඊට සාපේක්ෂව දැනට පවතින කාර්යාලය ප්‍රමාණවත් නොවේ.

(ii) කින්නියා ජල සම්පාදන ක්‍රමය වෙත ලබා දී ඇති ඩබල් කැබ් රථයේ පවතින දෝෂ හේතුවෙන් එම රථය තවදුරටත් භාවිත කිරීම සුදුසු වන්නේද, නැද්ද යන්න සම්බන්ධයෙන් වාර්තාවක් ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික හා විදුලි) මඟින් ලබා ගත් අතර, එම වාර්තාවට අනුව මෙම කැබ් රථය තවදුරටත් භාවිතයට සුදුසු නොවන බවට දන්වා ඇත. එම වාර්තාව ඇමුණුමක් ලෙස මේ සමඟ ඉදිරිපත් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

එබැවින් මෙම කැබ් රථය භාවිතයෙන් ඉවත් කර ඒ සඳහා Crew Cab රථයක් මාසික කුලී පදනම මත ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ආ) (i) 2026 සැප්තැම්බර් මස වන විට කින්නියා ප්‍රදේශයේ පවුල් 26,614ක් සඳහා අපගේ ජල සැපයුම් ලබා දී ඇත.

(ii) දැනට නව කාර්යාලයක් ඉදිකිරීමට පියවර ගෙන නොමැති අතර, 2027 වර්ෂයේ Rehabilitation Budget (RH Budget) මඟින් පවතින කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත.

(iii) මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඉදිරියේදී කින්නියා කාර්යාලය සඳහා පහසුකම් සහිත නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

එබැවින් මේ සඳහා විසඳුමක් ලෙස දැනට පවතින කාර්යාලය ප්‍රතිසංස්කරණය කර කින්නියා කාර්යාලය වෙත සේවාව ලබා ගැනීමට පැමිණෙන පාරිභෝගිකයින් සඳහා අවශ්‍ය පහසුකම් සහිතව නවීකරණය කිරීමටද, පාරිභෝගික සම්බන්ධතා ඉතා හොඳින් පවත්වා ගැනීමට අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩලය යෙදවීමටද සැලසුම් කර ඇති අතර, මෙම කටයුතු 2027 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිතව ඇත.

(iv) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙත ජලය බෙදා හරිනු ලබන ප්‍රධාන ජල පවිත්‍රාගාරය කන්තලේ වන අතර එහි දෛනික ජල පිරිපහදු ධාරිතාව 54,000 m^3 වේ. මෙම ජල පවිත්‍රාගාරය මඟින් කන්තලේ, වාන්ඇල, ත්‍රිකුණාමලය නගරය, පාලයුත්තු, ආන්දමිකුලම, කින්නියා, නිලාවෙලි සහ තඹලගමුව යන ජලසම්පාදන ක්‍රම 8ක් සඳහා ජලය බෙදා හරිනු ලබයි.

මේ වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජල ඉල්ලුම ඉතා අධිකව පවතින බැවින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙත ජලය ලබා දීම සඳහා කන්තලේ ජල පවිත්‍රාගාරය උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක කරනු ලබයි. එම තත්ත්වය යටතේ වුවද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාරිභෝගිකයින්ගේ ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් ජල සැපයුමක් ලබා දීමට නොහැකි වී ඇත. මේ හේතුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ජල පාරිභෝගිකයින් වෙතින් ලැබෙන පැමිණිලි ප්‍රමාණයද ඉහළ ගොස් ඇත. ඒ අනුව දැනට පවතින ජල ධාරිතාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පොදු ජල සම්බන්ධතා පුළුල් කිරීම මෙම අවස්ථාවේදී සිදු කළ නොහැක.

මේ සඳහා විසඳුමක් ලෙස ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත 2027 PIP Greater Trincomalee Project මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ජල සැපයුම වැඩිදියුණු කිරීමටත්, පාරිභෝගිකයින් වෙත අඛණ්ඩ ජල සැපයුමක් ලබා දීමටත් සැලසුම් සකස් කර ඇත. දැනට මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ඇගයීම් කමිටුවේ අනුමැතිය සහ ජලසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන මේ වනවිට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Imran Maharoof, you may ask a Supplementary Question, if you have one.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

கௌரவ அமைச்சர் அவர்களே, தற்போது கிண்ணியாவிலுள்ள குடும்பங்களின் எண்ணிக்கை சுமார் 26,000; சனத்தொகை அண்ணளவாக 100,000; நீர்த்தாங்கியின் கொள்ளளவு 1,500 மீற்றர் கியூப்; நீர் பாவனையாளர்களின் எண்ணிக்கை சுமார் 20,500; நீர் விநியோகம் வழங்கப்பட வேண்டிய குடும்பங்களின் எண்ணிக்கை 5,500. காலம் செல்லச்செல்ல இவ்வெண்ணிக்கை அதிகரித்துச் செல்லக்கூடிய காரணத்தால் அங்கு பல பிரச்சினைகள் ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கிறது.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன். தற்பொழுது, 20,500 குடும்பங்களுக்கு 1,500 மீற்றர் கியூப் கொள்ளளவு கொண்ட நீர்த் தாங்கியில் இருந்துதான் ஒரே நேரத்தில் நீர் வழங்கப்படுகின்றது. இதன் காரணமாக பகல் நேரத்தில் குறைந்த அழுத்தத்திலே நீர் கிடைப்பதுடன், சில இடங்களில் நீர் கிடைக்காத நிலையும் காணப்படுகின்றது. இதனால் பொதுமக்கள் பல சிரமங்களை எதிர்நோக்குகின்றார்கள். பொதுமக்களின் சிரமங்களைக் குறைப்பதற்காக கிண்ணியா நகர சபை பகுதியிலுள்ள நீர் பாவனையாளர்களுக்கு நீரை வழங்குவதற்காக 2,000 மீற்றர் கியூப் கொள்ளளவு கொண்ட புதிய நீர்த்தாங்கி ஒன்றை அமைப்பதற்கான நடவடிக்கை ஏதும் இந்த அரசாங்கத்தால் முன்னெடுக்கப்படுகின்றதா? அல்லது இவ்விடயம் சம்பந்தமாக எந்த நிலைப்பாட்டில் அமைச்சு இருக்கின்றது என்பதைத் தெளிவுபடுத்த முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ලබා දුන් පිළිතුරේත් මේ කාරණය අන්තර්ගත කළා. රට පුරාම තිබෙන ගැටලුව මේකයි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීම සඳහා විශාල ඉල්ලුමක් තිබෙනවා. නමුත්, පසුගිය කාලයේ පැවති ආර්ථික අර්බුදයත්, දේශපාලන අර්බුදත්, වෙනත් ගැටලුත් නිසා ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රධාන ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න සහ ඒවා සම්පූර්ණ කරන්න අසමත් වෙලා තිබෙනවා.

අපේ රජය ඇවිල්ලා තමයි ඇත්තටම මේ අතරමඟ නතර කරලා තිබුණු ජල ව්‍යාපෘති බොහොමයක් ආරම්භ කළේ. ඒවායින් සමහර ව්‍යාපෘති දැන් අවසන් කරමින් තිබෙනවා. අලුත් ව්‍යාපෘති කිසිවක් ආරම්භ කළේ නැහැ. අපි දන්නවා, JICA එකෙන් සහ වෙනත් ආයතනවලින් මූල්‍ය ආධාර ලැබුණු ව්‍යාපෘති පවා විවිධ ගැටලු නිසා අතරමඟ නතර කර තිබුණු බව. දැන් තමයි ඒවා ආරම්භ කිරීම සඳහා කටයුතු කරන්නේ. ඇත්තටම දැන් කන්තලේ ජල පවිත්‍රාගාරයේ තිබෙන ධාරිතාව මදි. අපේ ගරු මන්ත්‍රීතුමා ඉල්ලන්නේ ටැංකියක් හදන්න කියායි. නමුත් එතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ටැංකිය නොවෙයි, පිරිපහදු කරන ජල ප්‍රමාණය මදි වීමයි. ඒ නිසා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යෝජනා කළ Greater Trincomalee ජල ව්‍යාපෘතියේ වැඩිදියුණු කිරීම් රාශියක් අපි ඉල්ලා තිබෙනවා. අපි හිතනවා, බොහෝ වෙලාවට 2027 අය වැය මඟින් මේ සඳහා මුදල් වෙන් වෙයි කියලා. යෝජනා වෙලා තිබෙන ව්‍යාපෘති සහ අනුමත වෙලා තිබෙන ව්‍යාපෘති ඉදිරි වසරේදී ක්‍රියාත්මක කිරීම තමයි අපේ සැලැස්ම වෙන්නේ. ඒ හරහා තමයි අපට මේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න සිද්ධ වෙන්නේ. ඒ සඳහා අපේ සූදානමක් තිබෙනවා. අපි ඉදිරි වසරේදී මේ සඳහා ආරම්භයක් ගන්න ලැහැස්තියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Imran Maharoof, you may raise your second Supplementary Question.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ அமைச்சர் அவர்களே, எனது இரண்டாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

கிண்ணியாவில் நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் கீழுள்ள வாடிக்கையாளர்கள் மற்றும் சனத்தொகைக்கு ஏற்ப, தற்போதுள்ள அலுவலகம் போதுமானதாக இல்லை. இதனை கௌரவ அமைச்சர் அவர்களும் கூறியிருந்தார். எனவே, கிண்ணியா பிரதேச சபை எல்லைக்குள் சகல வசதிகளுடனும் கூடிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் மற்றுமொரு அலுவலகத்தை அமைப்பதற்கான நடவடிக்கைகளை அமைச்சால் முன்னெடுக்க முடியுமா? அல்லது அது சம்பந்தமான விடயங்கள் முன்னெடுக்கப்படுகின்றதா? எனக் கேட்கின்றேன். மேலும், திருகோணமலை மாவட்டத்தில் சில பகுதிகளில் நீர் இணைப்பு வழங்கப்படாமல் இருக்கின்றன. குறிப்பாக, குச்சவெளி, புடவைக்கட்டு போன்ற பிரதேசங்களுக்கு இன்னும் நீர் இணைப்பு வழங்கப்படவில்லை. இது தொடர்பிலும் அமைச்சு நடவடிக்கை எடுக்குமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මම පිළිතුර කියෙව්වා. සභාගත වන නිසා ඒ විස්තර ඔබතුමාට ලැබෙයි. දැනට තිබෙන කාර්යාලය ප්‍රතිසංස්කරණය කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම 2027 වර්ෂයේදී එතැනට staff එක දමන්න ඕනෑද කියන එක සම්බන්ධයෙනුත් අධ්‍යයනයක් කරලා කටයුතු කරන්න ලැහැස්තියි. 2027 අවුරුද්දේ ඒ කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒ සඳහා සැලසුම් සකස් කර තිබෙනවා. ඒ අනුව කාර්යාලයේ ප්‍රශ්නය සහ වාහනයේ ප්‍රශ්නය විසඳෙයි.

මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ සහ තුවාල ලබන සංඛ්‍යාව: විස්තර
வீதி விபத்துகளால் மரணமடைவோர் மற்றும் காயமடைவோர்: விபரம்
DEATHS AND INJURIES RESULTING FROM ROAD ACCIDENTS: DETAILS

1827/2026

4. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්ෂයකට මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාවෙහි සහ තුවාල ලබන සංඛ්‍යාවෙහි සාමාන්‍යය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් තාවකාලිකව සහ ස්ථිරව ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් සංඛ්‍යාවෙහි සාමාන්‍යය කොපමණද;

(iii) අනතුරුවලට ලක්වූවන් සඳහා වර්ෂයකට වෙන් කරනු ලබන ඇඳන් සංඛ්‍යාවෙහි සහ ඇඳන් භාවිතා කරන දින ගණනෙහි සාමාන්‍යය කොපමණද;

(iv) මාර්ග අනතුරුවලට ලක්වූවන් සඳහා ප්‍රතිකාර ලබාදීම සඳහා වර්ෂයකට වැයවන ආසන්න වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

සුකාදාරම් මත්‍රුම් වෙකුසන ඌටක අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) ඉලංකෙයිල් වීදි විපත්තුකළ් කාරණමාක වරුටමොන්‍රුක්කු ඉටම්පෙරුකින්‍ර මරණංකළින් එණ්ණික්කෙ මත්‍රුම් කායමටෙපවර්කළින් සරාසරි එණ්ණික්කෙ වෙව්වේරාක යාතු එන්පතෙයුම්;

(ii) මේර්පටි විපත්තුකළ් කාරණමාක තර්කාලිකමාකවුම් නිරන්තරමාකවුම් අංකවීනමටෙයුම් නපර්කළින් සරාසරි එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්;

(iii) විපත්තුකළිල් කායමටෙපවර්කළුක්කාක ආණ්ටොන්‍රුක්කු ඔතුක්කප්පටුම් කට්ටිල්කළින් එණ්ණික්කෙ මත්‍රුම් කට්ටිල්කළෙප් පයන්පටුත්තුම් නාට්කළ් ආකියවර්‍රින් සරාසරි එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්;

(iv) වීදි විපත්තුකළුක්කු උළ්ළානවර්කළුක්කුච් චිකිච්චෙයළිප්පතර්කාක වරුටමොන්‍රුක්කුච් චෙලවාකුම් තොකෙ අණ්ණළවාක එව්වළවු එන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අර්විප්පාරා?

(ආ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) average number of deaths and injuries resulting from road accidents in Sri Lanka per year, separately;

(ii) average number of individuals who become temporarily and permanently disabled due to the said accidents;

(iii) average number of hospital beds allocated and the average number of bed-days utilized per year for road accident victims; and

(iv) approximate annual cost incurred in treating those injured in road accidents?

(b) If not, why?

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(මාණ්පුමිකු (වෛත්තියර්) හංසක විජේමුනි - සුකාදාර පිරදි අමෙච්චර්)

(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සිදු වූ මරණ සංඛ්‍යාව සහ තුවාල ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	2021	2022	2023	2024	2025
මරණ සංඛ්‍යාව	2,557	2,540	2,341	2,521	2,721
තුවාල ලැබූ සංඛ්‍යාව	20,587	21,118	21,751	22,851	26,110

පසුගිය වර්ෂ 05කට අදාළව වර්ෂයකදී මාර්ග අනතුරු හේතුවෙන් සිදු වූ මරණ හා තුවාල ලැබූ සංඛ්‍යාවෙහි සාමාන්‍යය පහත පරිදි වේ.

මරණ සංඛ්‍යාව (සාමාන්‍යය පසුගිය වර්ෂ 05කට අදාළව) - 2,536

ඒ, සාමාන්‍යයෙන් අවුරුද්දකට සිදුවන මරණ සංඛ්‍යාව, අනතුරුවලින්.

තුවාල ලැබූ සංඛ්‍යාව (සාමාන්‍යය පසුගිය වර්ෂ 05කට අදාළව) - 22,483

ඒකත් අවුරුද්දකට සිදුවන සාමාන්‍ය සංඛ්‍යාව.

(ii) මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, අවුරුද්දක සාමාන්‍ය සංඛ්‍යාව. පසුගිය අවුරුදු පහට අදාළ සංඛ්‍යාව බෙදලා ගත්තාම දළ වශයෙන් පුද්ගලයින් 25,000ක් පමණ තාවකාලිකව සහ ස්ථිර වශයෙන් ආබාධිත තත්ත්වයට පත් වෙනවා.

(iii) අමාත්‍යාංශය සතුව මේ සම්බන්ධව නිශ්චිතවම කියන්න පුළුවන් සංඛ්‍යාලේඛන නැහැ.

(iv) අන්තර්ජාතික නිර්ණායකවලට අනුව රටක මාර්ග අනතුරු නිසා ආර්ථිකයට සිදු වන ඵලදායීතා හානිය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 3ත්, සියයට 5ත් අතර ප්‍රමාණයක් වනු ඇතැයි විශ්වාස කෙරේ.

(ආ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා

(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)

(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Pathmanathan Sathiyalingam, you may ask your first Supplementary Question.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

(මාණ්පුමිකු (වෛත්තියර්) පත්මනාතන් සත්තියලිංකම්)

(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

නන්‍රි, කෞරව පිරති අමෙච්චර් අවර්කළේ! එනතු මුතලාවතු මේලතිකක් කේල්වියෛක් කේට්කින්‍රේන්.

இப்பொழுது நீங்கள் கூறிய இறப்புக்களின் எண்ணிக்கையாக இருக்கட்டும் அல்லது நிரந்தரமாகவோ, தற்காலிகமாகவோ அங்கவீனமாக்கப்பட்டவர்களின் எண்ணிக்கையாக இருக்கட்டும் அல்லது சிகிச்சை பெற்றவர்களின் எண்ணிக்கையாக இருக்கட்டும். எல்லா எண்ணிக்கையும் இரட்டை இலக்கத்தைத் தாண்டி, ஆயிரக்கணக்கில் இருக்கின்றன. எனவே, இது இலங்கையில் காணப்படுகின்ற மிகவும் முக்கியமானதொரு பிரச்சினையாகக் கருதப்படுகின்றது.

தற்பொழுது, இச்சபையில் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் இருக்கிறார். வீதி விபத்துகளைத் தடுப்பதற்கான செயற்பாடுகளை எடுக்கவேண்டிய பொறுப்பு அவருடைய அமைச்சுக்கு உரியதாக இருக்கின்றது. இப்பொழுது, அவர் இது சம்பந்தமாக பல வேலைத்திட்டங்களை முன்னெடுப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. ஒரு விபத்து ஏற்பட்ட பின்னர், அந்த விபத்துக்கு உட்பட்டவரின் மருத்துவத்துக்காகச் செலவழிக்கப்படுகின்ற பணத்தின் அளவானது, அந்த விபத்து ஏற்பட்ட இடத்திலிருந்து உரிய சிகிச்சை நிலையத்துக்கு அந்த நபரை எடுத்துச் செல்வதிலும், அதற்குப் பின்னர் அங்கு அவருக்குச் சிகிச்சை அளிப்பதிலும் பிரதானமாகத் தங்கியிருக்கிறது. எனவே, பிரதான வீதிகளில்

இருக்கின்ற வைத்தியசாலைகளிலுள்ள விபத்து மற்றும் அவசர சிகிச்சைப் பிரிவை -accident and emergency unitஐ- அபிவிருத்தி செய்தல் மற்றும் பிரதான மார்க்கத்தில் இருக்கின்ற சிறிய வைத்தியசாலைகளில் அடிப்படை மருத்துவ சிகிச்சை வழங்குவதற்குத் தேவையான அடிப்படை வசதிகளைச் செய்தல் என்பன தொடர்பில் விசேட கவனம் செலுத்தி, 2027ஆம் ஆண்டுக்கான பாதீட்டில் சுகாதார அமைச்சுக்கு மேலதிக நிதியை ஒதுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු මන්ත්‍රීතුමා, අපි වැඩකටයුතු ආරම්භ කරනකොට බාගෙට සකස් කළ හදිසි ප්‍රතිකාර ඒකක විශාල ප්‍රමාණයක් - විශේෂයෙන්ම ප්‍රධාන රෝහල්වල - තිබුණා. ඒ සියල්ලේම වැඩ නිම කිරීමට අපි කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම, ලබන වසර තුළදී ඉතිරි හදිසි ප්‍රතිකාර ඒකකවල වැඩකටයුතු නිම කිරීමටත් සැලසුම් කර තිබෙනවා.

තවද, ග්‍රාමීය රෝහලවල ඉඳලා teaching hospitals දක්වා වන සෑම රෝහලකම මෙම හදිසි අනතුරු අංශ ඊට අවශ්‍ය උපකරණවලින් සහ වෛද්‍යවරුන්ගෙන් සන්නද්ධ කිරීම සඳහා අවශ්‍ය සියලු සැලසුම් මේ වනවිට සකස් කරලා ඉවරයි. ඒ සඳහා ලබන වසරේ අය වැයෙනුත් සැලකිය යුතු මුදලක් වෙන් වෙනවා.

ඒ වාගේම, ඒ හා සබැඳි වෙනත් සේවාවන් වන රුධිර පාරවිලයන සේවාව, theatres හා සම්බන්ධ සේවාවන් සහ ඊට අනුබද්ධ අනෙකුත් සේවාවන් වැඩිදියුණු කිරීම සඳහාත් ලබන අය වැය හරහා සැලසුම් කර තිබෙනවා. "හදිසි අනතුරු" කියන එක සෞඛ්‍ය අංශයේ පවතින ලොකු ප්‍රශ්නයක් විධියට අපි හඳුනාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විධියටම අපි මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශය එක්කත් එකතුව කටයුතු කරනවා. අපගේ දත්ත ඒ අයට ලබා දී ඇති අතර, ඒ සඳහා ඔවුන් වෙනම කමිටුවක්ද පත් කර තිබෙනවා. ඒ සඳහාත් අපේ උපරිම දායකත්වය ලබා දෙනවා.

ඊට අමතරව, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි වෙනම පර්යේෂණ - research - කරගෙන යනවා, මෙම හදිසි අනතුරු වළක්වා ගැනීම සඳහා අපේ පැත්තෙන් ඉදිරිපත් කළ යුතු යෝජනා මොනවාද කියන එක සම්බන්ධයෙන්. ඒ හැම අංශයක් කෙරෙහිම ලබන අය වැය තුළින් අපි අවධානය යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Pathmanathan Sathiyalingam, do you have another Supplementary Question to ask?

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Yes.எனது இரண்டாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

விபத்து நடந்த இடத்திலிருந்து பாதிக்கப்பட்டவர்களை வைத்தியசாலைக்கு எடுத்துச் செல்வதற்கு எடுக்கும் காலம் மிகவும் முக்கியமானது. நான் வடக்கு மாகாண சுகாதார அமைச்சராக இருந்த காலத்தில் நேரடியாகப் பார்த்த ஒரு சம்பவத்தை அடிப்படையாகக் கொண்டு இதனைக் கூறுகின்றேன். இந்த நாட்டில் முதன்முதலாக 2016ஆம் ஆண்டு தை மாதம் 06ஆம் திகதி வடக்கு மாகாணத்தில் ஓர் இலவச ambulance சேவையை நாங்கள் ஆரம்பித்தோம். அந்தச் செயற்பாடு மிகவும் சிறப்பாக நடைபெற்றது. அதற்கு ஒரு வருடத்துக்குப் பின்னர்தான், 1990 சுவசெரிய அவசர அம்பியுலன்ஸ் சேவை இலங்கை முழுவதும் ஆரம்பிக்கப்பட்டது. நாங்கள் மேற்குறித்த ambulance சேவைக்கு விசேடமாகச் செலவழிக்கவில்லை. வடக்கு மாகாணத்திலுள்ள 117 வைத்தியசாலைகளிலும் இருக்கின்ற ambulanceஐ ஒரு networkக்குள் கொண்டுவந்து, அவற்றுக்கு GPS கருவிகளைப் பொருத்தி, மக்களுக்கு ambulance சேவை தேவைப்படுகின்ற சந்தர்ப்பத்தில் அந்தந்த வைத்தியசாலைகளில் இருந்து ambulanceஐ mobilize பண்ணியிருந்தோம். இதன்மூலம் மிகவும் குறைந்த செலவில் நிறைவான சேவை வழங்கப்பட்டது.

ගරු අරුන් හේමවන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) විදේශ රැකියා නියෝජිත ආයතනවලට තමන් යවන ශ්‍රමිකයින්ගේ සේවා ගිවිසුම් ආරක්ෂා කිරීමේ නීතිමය වගකීමක් තිබෙනවා. මෙහිදී තමා විසින්ම විදේශ රැකියාව සොයා ගත් ශ්‍රමිකයින් - self-registered employees - විසින්ම එම වගකීම භාර ගත යුතුයි. ගෘහස්ථ සේවයේ නිරත වී සිටින ශ්‍රමිකයින්ගේ සේවා තොරතුරු මාස හයකට වරක් යාවත්කාලීන කළ යුතුයි. ශ්‍රමිකයාට ගැටලු ඇති වුණොත් පැමිණිලි කරන්න අපි ක්‍රම කිහිපයක් හඳුන්වා දීලා තිබෙනවා. ඒ අනුව, "1989" කියන ක්ෂණික ඇමතුම් අංකය හරහා පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් ඉන්නවා. ඔවුන් හරහාත් පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සියලුම ශාඛා හරහාත් ඒ පැමිණිලි ලබා දෙන්න පුළුවන්. පැමිණිලි ඉදිරිපත් කළාට පස්සේ අමාත්‍යාංශයක් විධියට අපිත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් ඒවාට අදාළ කරන මැදිහත් වීම් කරනවා. අපි මෑතකදී "LankaKonect" නමින් යම්කිසි App එකක් හඳුන්වා දීලා තිබෙනවා. යම්කිසි පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න ඕනෑ නම්, ඒ App එක හරහාත් එය කරන්න පුළුවන්.

(ii) සාමාන්‍යයෙන් දුරකථනය සහ අන්තර්ජාලය හරහා මේ සියලුදෙනාම වාගේ සම්බන්ධතා පවත්වාගෙන යනවා. කොතැනක හරි සම්බන්ධතාව බිඳ වැටුණොත් මම ඉහත සඳහන් කරපු ඒ ක්‍රමවේදය හරහා අපට complaint එක ලබා දුන්නාම කාර්යාංශයක් විධියට අපි ඒකට අදාළ කරන මැදිහත් වීම් කරනවා. විශේෂයෙන්ම අදාළ පුද්ගලයා යම්කිසි පෞද්ගලික නියෝජිත ආයතනයක් හරහා රැකියාවකට ගිහිල්ලා හිටියා නම්, අපි ඒකට අදාළ කරන විමර්ශනයක් කරමින් ඒ සම්බන්ධතා යළි ඇති කිරීමට අදාළ කරන කටයුත්ත කරනවා.

(iii) විදේශගත වීමට පෙර ශ්‍රමිකයින්ගේ සේවා ගිවිසුම් පරීක්ෂා කරන එක අපේ වගකීමක්. ඒ වාගේම වැටුප් සහ අනෙකුත් සේවා කොන්දේසි ගිවිසුමේ සඳහන් විය යුතුයි කියන එකත් එතැන සඳහන්ව තිබෙනවා. ඒ වාගේම අදාළ පුද්ගලයා පිටත් වීමට පෙර තමන්ගේ අයිතිවාසිකම් ගැන සහ පැමිණිලි කරන ආකාරය පිළිබඳ පුහුණුවක් අපි ලබා දෙනවා. තවද එතැනට ගියාට පසුව ඒ කොන්දේසිය යම්කිසි ආකාරයකින් කඩ වෙලා තිබුණොත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සහ අමාත්‍යාංශයට පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්නට අපි අනිවාර්යයෙන් බැඳී ඉන්නවා.

(iv) විදේශගත වීමට පෙර ශ්‍රමිකයින්ට තමන්ගේ ආරක්ෂාව පිළිබඳව පුහුණුවක් ලබා දෙනවා. රැකියා අනුමත කිරීමේදී වැඩ කරන කාලය සහ වෛද්‍ය පහසුකම් පිළිබඳව අවධානයට යොමු කරනවා. ඒ වාගේම මේ සම්බන්ධව කුමන හෝ පැමිණිල්ලක් අපට ලැබුණොත් ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න අපි බැඳී ඉන්නවා.

(v) එකක් තමයි, කුමන හෝ පුද්ගලයෙක් තමන්ගේ ගිවිසුම දීර්ඝ කළොත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තමන්ගේ ලියාපදිංචිය අලුත් කළ යුතුයි. ඒ වාගේම තමන් රැකියාව කරමින් සිටි ස්ථානයෙන් පිට තවත් ස්ථානයක රැකියාවක යෙදෙනවා නම් අනිවාර්යයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය අලුත් කළ යුතුයි කියන ඒ කොන්දේසිය අපි පළ කර තිබෙනවා. මේ කාරණාව හරහා අපට මේ තත්ත්වය ඉතාම පහසුවෙන් කළමනාකරණය කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවා. තවද, අපි ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ යම්කිසි අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන්නට සූදානම් වෙලා ඉන්නවා. විශේෂයෙන්ම අදාළ ශ්‍රමිකයා ලංකාවෙන් පිටතට ගියාද, නැත්නම් ලංකාවට ආවාද කියන කාරණා සොයා ගැනීමට අදාළව අපි දැනටමත් කටයුතු කරගෙන යනවා. ඒක නිසා අපි හිතනවා, කෙටි කාලයක් තුළ මේ ඩිජිටල්කරණය සම්පූර්ණ වීමත් එක්ක අපට යම්කිසි ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

(vi) රක්ෂණ සහ මරණ වන්දිවලට අදාළව ගත්තොත්, අපි රක්ෂණ වන්දි විධියට 619දෙනෙකුට රුපියල් මිලියන 277.15ක් පමණ ගෙවා තිබෙනවා. ඒ වාගේම අපේ ආණ්ඩුව ආවාට පසුව මරණ වන්දි වැඩි කළා, රුපියල් ලක්ෂ 6 සිට රුපියල් ලක්ෂ 20 දක්වා. අපි දැනට රුපියල් මිලියන 1.4 ගණනේ 50දෙනෙකුට වන්දි ලබා දීලා තිබෙනවා. ඒ වාගේම සේවක සුබසාධන අරමුදලෙන් 105දෙනෙකුට රුපියල් මිලියන 22.65ක් පමණ ගෙවා තිබෙනවා. පාසල් සිසුන්ගේ ශිෂ්‍යාධාර ඇතුළු විවිධ වැඩසටහන් මේ වනකොටත් අපි දියත් කරලා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Rajapaksha, do you have a Supplementary Question?

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර පිළිබඳව මම සන්තෝෂ වෙනවා. කඩා වැටී නිබුණු ආර්ථිකය නැවත ගොඩනඟනකොට විදේශ සේවා නියුක්තිකයින් අපේ රටට ගෙනෙන ඩොලර් බොහොම වටිනවා. නමුත් ඒ ඩොලර් සොයා යෑම පිටුපස තමන්ගේ මව හෝ පියා විදේශගත වීම නිසා තනි වන දරුවන්ට ආදරය, රැකවරණය වාගේම ආරක්ෂාව ආදී දේවල් නොලැබීම සම්බන්ධයෙන් ගැටලු මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ ශ්‍රමිකයින් පිට රට යැවීම නිසා යම්කිසි මුදල් ඉපැයීමක් කරන විදේශ රැකියා නියෝජිතායතනත් එකතු කරගෙන අරමුදලක් ගොඩනඟලා, මේ ආකාරයට අපහසුතාවට පත් වන දරුවන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය සහ රැකවරණ ආදී ගැටලු විසඳීම වෙනුවෙන් සුබසාධන වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න හැකියාවක් තිබෙනවාද?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ සම්බන්ධව සාකච්ඡා කළා. මෙතැන පාර්ශ්වකරුවන් කිහිපදෙනෙක් ඉන්නවා. අපි දැනට යෝජනා කරලා තිබෙනවා, දායක විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක්. ඒ එක්කම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුදල පාවිච්චි කරමින් යම්කිසි ආකාරයකින් මේක පෝෂණය කරන්න අපි ආණ්ඩුවක් විධියට කටයුතු සූදානම් කරලා තිබෙනවා. අපි මේ මොහොත වනකොට මහා භාණ්ඩාගාරයෙනුත් යම්කිසි මුදලක් අරගෙන ඒ අරමුදල තවත් දියුණු කිරීමට අදාළ කටයුතු කරගෙන යනවා. අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයටම නියෝජිතායතනවලිනුත් යම්කිසි ගාස්තුවක් අය කිරීම සම්බන්ධව අපි සාකච්ඡා කළා. නමුත් දැන් තිබෙන trend එක අනුව නියෝජිතායතන හරහා යන ප්‍රතිශතය ක්‍රමානුකූලව අඩු වෙමින් තිබෙනවා. ඒ අය කොහොමත් CESS බද්ද ගෙවනවා. ඒ වාගේම ඒ අය කොහොමත් Sri Lanka Foreign Employment Bureau එකට ගණනක් ගෙවනවා. ඒ අය කරන CESS බද්ද යන්නේ රජයට. ඒක නිසා රජය හරහා යම්කිසි මුදලක් මේ අරමුදලට ලබා ගැනීමට අදාළව දැනටමත් අපි සාකච්ඡාවක් කරගෙන යනවා. ඒක ඉතා පුළුල් ක්‍රියාවලියක්. අපි ආණ්ඩුවක් විධියට මේ සියලු පාර්ශ්වකරුවන් ඍජුව හෝ වක්‍රව සම්බන්ධ කරගෙන ඒ සඳහා අදාළ මැදිහත්වීම කරන්න සූදානම් වෙලා ඉන්නවා. සමහරවිට අපට ඍජුව අය කරන්න බැරි වෙයි. මොකද, දැන් තිබෙන trend එක අනුව නියෝජිතායතන හරහා විදේශගත වන ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය අඩු වෙමින් පවතින නිසා අපට ඒ සඳහා තිරසාර ක්‍රමවේදයක් සකස් කරන්න බැරි වෙයි.

නමුත්, වක්‍රව හෝ ඔවුන්ගේ දායකත්වය අරගෙන මේ කටයුත්ත කරන්න අපි සූදානම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may ask the second Supplementary Question, if you have one.

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, දැනට විදේශ රැකියා සඳහා අප ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ කොරියාව, ජපානය සහ ඊශ්‍රායලය වාගේ රටවල් කිහිපයක් එක්ක විතරයි කියන එක. නමුත්, ලංකාවේ ශ්‍රමිකයින්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

අපි ගිවිසුම්ගත නොවූ රටවලට සේවය සඳහා යනවා. එලෙස ඒ රටවල රැකියා සඳහා ගිය අය ඇතැම් වෙලාවට මාස 6ක්, 8ක් විතර හම්බ කරන සල්ලි රැකියා නියෝජිතායතනයට ගෙවන්න ඕනෑ. ඒක අධික පිරිවැයක්, අධික මුදලක්. ඒ නිසා අනෙක් රටවල් එක්කත් රැකියා සඳහා ගිවිසුම්ගත වෙලා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මහපෙන්වීම යටතේම මේ සේවකයින් ඒ තැන්වලට යොමු කරන්න අපිට බැරිද කියන එකයි මම විමසන්නේ. බොහෝ වෙලාවට ඒ අය වෙනත් රටවලට ගියාම මම කලින් කිව්ව ආකාරයට රැකියා නියෝජිතායතනවලට විශාල මුදලක් ගෙවන්න සිදු වීම වාගේම රැකියාවේ සුරක්ෂිතභාවය පිළිබඳව තිබෙන ගැටලුත් අවම කර ගන්න පුළුවන් වේවි. ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට තිබෙන හැකියාව කුමක්ද කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඇහුවේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. දැනට අපි කොරියාව සහ ඊශ්‍රායලය කියන රජයන් එක්ක ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා, විශේෂයෙන්ම G2G කියන ක්‍රමවේදය යටතේ. ඒ වාගේම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ජපානයත් එක්ක G2B පදනමෙන් යම්කිසි ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. තවද, අපි විවිධ රටවල් එක්ක කම්කරු සහයෝගිතාවට - labour co-operationවලට - අදාළව ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. බොහෝ මැද පෙරදිග රටවල් ඇතුළු ලෝකයේ විවිධ රටවල් එක්ක අපි ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. එවිට G2G agreement විතරක් නොවෙයි, පෞද්ගලික අංශය හරහා විදේශ රටවලට යන අය සඳහාත් ඒ කොන්දේසි ටික ඒ විධියටම පැනවෙනවා.

ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළව ගත්තොත් අනිවාර්යයෙන් සියලුම නියෝජිතායතන මේ කොන්දේසි පිළිපැදිය යුතුයි කියලා අපි හිතනවා. මැද පෙරදිග රටවල රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයින්ගෙන් මාස දෙකක වැටුප තමන්ගේ රැකියා නියෝජිතායතනයට ගාස්තු විධියට අය කරන්නට අපි අනුමත කරලා තිබෙනවා. ඒ වාගේම මැද පෙරදිග නොවන රටවල රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයින්ගෙන් මාස තුනක වැටුපක් අය කිරීමටත් අපි අනුමත කරලා තිබෙනවා. ඒ නිසා මේ කොන්දේසි අපි හරි විධියට පිළිපැදිය යුතුයි. කවුරුන් හෝ පුද්ගලයෙක් මේ සම්බන්ධව අසාධාරණයකට ලක් වුණා කියලා පැමිණිල්ලක් ඉදිරිපත් කළොත් අපි ඒ සඳහා අදාළ කරන නීතිමය ක්‍රියාමාර්ගය ගන්න සූදානම්. අපි ආණ්ඩුවක් විධියට G2G සම්බන්ධව තවත් රාජ්‍යයන් එක්ක කථා කරනවා. ඒ වාගේම labour cooperation agreement එකට අදාළව, ඒ කියන්නේ ශ්‍රම සංක්‍රමණයට - labour migrationවලට - අදාළව අපි විවිධ රටවල් එක්ක සාකච්ඡා කරනවා. පසුගිය කාල වකවානුව තුළදී අපි තායිලන්තය සමඟ අත්සන් කරපු ගිවිසුමත් මෙවන් ගිවිසුමක්. විශේෂයෙන්ම මෙය අපේ ආණ්ඩුව පැමිණියාට පසුව අත්සන් කළ ගිවිසුමක්. ඒ වාගේම තමයි අපි රුමේනියාවත් එක්ක මේ අවුරුද්ද මුලදී ගිවිසුමක් අත්සන් කළා. විශේෂයෙන්ම සුබසාධන කම්කරු ආරක්ෂණයට අදාළව එම ගිවිසුම අපි අත්සන් කරලා තිබෙනවා. ඒ නිසා අපගේ අමාත්‍යාංශයේ සංවර්ධන අංශය හරහා මේ සියලු කටයුතු අපි කරගෙන යනවා. ඉදිරියේදීත් මෙවැනි දේවල් කරන්න අපි සූදානම්.

මේ මුදලට අදාළව ගත්තොත්, අපි දන්නවා Nawala Agency" කියන්නේ, "Sri Lanka Foreign Employment Agency" කියන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුයුක්ත, රජයට අයිති ආයතනයක් බව. මේ ආයතනය හරහා ඉතාම අඩු මුදලට B2B agreements හරහා, - විශේෂයෙන්ම එහේ පුද්ගලික ආයතනය සහ අපේ රටේ පුද්ගලික ආයතනය විධියට රජයට සියයට සියයක් අයිති මෙම ආයතන හරහාත් - අපි ශ්‍රමිකයින්ට අවස්ථාව ලබා දීමට කටයුතු කරගෙන යනවා. දැනටමත් අපි එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඇතුළු රටවලට අදාළව අවස්ථා කිහිපයක් විවෘත කරලා තිබෙනවා.

ත්‍රිවිධ හමුදා නිලධාරීන් සේවය අතහැර යාම: හේතු
முப்படை உத்தியோகத்தர்கள் பணியிலிருந்து விலகிச் செல்லல்: காரணம்
VACATION OF SERVICE BY OFFICERS OF TRI-FORCES: REASONS

2484/2026

10. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ආරක්ෂක අමාත්‍යාතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1):

(අ) (i) විවිධ වෘත්තීන්වලට බඳවා ගන්නා ලද ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සෙසු නිලයන් සේවය අතහැර යාමේ ප්‍රවණතාවක් පවතින්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) සේවය හැර ගොස් විදේශගතව සිට මෙරටට පැමිණීමේදී අත්අඩංගුවට ගනු ලබන හෝ භාරවන නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) සේවය හැර ගොස් විදේශගතව සිටින නිලධාරීන්ට නැවත සේවයට එක්වීමේ හැකියාවක් තිබේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

(vi) සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කරන නිලධාරියෙකුගේ ඉල්ලීම සම්පූර්ණ කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රාජ්‍ය සේවකයන්ගේ වර්ෂ 05ක විදේශ නිවාඩු ක්‍රමවේදයට ත්‍රිවිධ හමුදා සාමාජිකයන් ඇතුළත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) එම ක්‍රමවේදය යටතේ විදේශ නිවාඩු ලබාගත් ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විදේශ නිවාඩු පසුව අවලංගු කර තිබේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) සේවය හැරගිය ඉහත (අ)(i)හි සඳහන් පුද්ගලයින්ට පොදු සමා කාලයක් ලබා නොදීමට සහ පසුගිය පොදු සමා කාලයන්ට ඇතුළත් නොකිරීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல்வேறு தொழில்களுக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள முப்படை உத்தியோகத்தர்களும் ஏனைய பதவியணியினரும் பணியிலிருந்து விலகிச் செல்லும் போக்கு நிலவுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) பணியிலிருந்து விலகி வெளிநாட்டுக்குச் சென்று இந்நாட்டுக்குத் திரும்பும்போது கைது செய்யப்படும் அல்லது சரணடையும் உத்தியோகத்தர்களுக்கு எதிராக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) பணியிலிருந்து விலகி வெளிநாடு சென்றுள்ள உத்தியோகத்தர்களுக்கு மீண்டும் பணியில் இணையக்கூடிய வாய்ப்புள்ளதா என்பதையும்;

(v) இன்றேல், ஏன் என்பதையும்;

(vi) பணியிலிருந்து விலகுவதற்கு விண்ணப்பிக்கும் உத்தியோகத்தர் ஒருவரது விண்ணப்பத்தைப் பூர்த்தி செய்வதற்கு எடுக்கும் காலம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரசாங்க உத்தியோகத்தர்களின் 05 வருட வெளிநாட்டு விடுமுறைத் திட்டத்தில் முப்படை அங்கத்தவர்களும் உள்வாங்கப்பட்டுள்ளார்களா என்பதையும்;

(ii) இன்றேல், ஏன் என்பதையும்;

(iii) மேற்படி முறையின்கீழ் வெளிநாட்டு விடுமுறையைப் பெற்றுக்கொண்ட முப்படை அங்கத்தவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அந்த வெளிநாட்டு விடுமுறைகள் பின்னர் இரத்துச் செய்யப்பட்டிருப்பின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) பணியிலிருந்து விலகிச் சென்றுள்ள மேற்படி (அ)(i)இல் குறிப்பிடப்பட்டுள்ள நபர்களுக்குப் பொதுமன்னிப்புக் காலத்தை வழங்காமைக்கும், கடந்த பொதுமன்னிப்புக் காலங்களுக்குள் உள்வாங்கப்படாமைக்குமான காரணங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) whether there is a tendency for officers and other ranks of the Tri-Forces, who have been recruited for various professions, to vacate their service;

(ii) if so, the reasons for such a tendency;

(iii) the actions taken against officers who, having vacated the service and remained overseas, are arrested or surrender themselves upon returning to Sri Lanka;

(iv) whether there is a possibility for officers who have vacated the service and are residing abroad to rejoin the service;

(v) if not, why; and

(vi) the time required to process the request of an officer applying to resign from the service?

(b) Will he also inform this House -

(i) whether the members of the Tri-Forces have been included in the five-year foreign leave scheme for the public servants;

(ii) if not, why;

(iii) the number of members of the Tri-Forces who have obtained foreign leave under the said scheme, for each force separately;

(iv) if such foreign leave has subsequently been cancelled, the reasons for such cancellation; and

(v) the reasons for not granting a general amnesty period to the persons referred to in (a)(i) above who have vacated the service, and for not including them in previous general amnesty periods, separately?

(c) If not, why?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සේවය අතහැර යාමේ ප්‍රවණතාවක් පවතී.

(ii) (a) විදේශ රැකියා හා අධ්‍යාපන අවස්ථා සඳහා යොමු වීම.

(b) සිවිල් අංශයේ වඩාත් හොඳ රැකියා අවස්ථා ලැබීම.

(c) තම වෘත්තීය සුදුසුකම් හා නිපුණතා අනුව වෙනත් රැකියා සඳහා යොමුවීමට ඇති කැමැත්ත.

(d) පෞද්ගලික අංශයේ වැඩි ආදායම් ඉපයීමේ අවස්ථා පැවතීම.

(e) රාජකාරි බහුලත්වය හා දිගු සේවා කාලසීමාවක් රාජකාරි සිදු කිරීම.

(f) පවුලේ ආර්ථික අවශ්‍යතා ඉහළ යාම.

(g) දුෂ්කර සේවා ස්ථානවල රාජකාරි කිරීමට සිදුවීම හා එබැවින් පවුලෙන් දුරස්ව සේවය කිරීමට සිදු වීම.

(h) විවාහය සහ පවුල් ජීවිතයට ප්‍රමුඛතාව ලබා දීම.

(i) පෞද්ගලික අභිමතය සහ වෘත්තීය අරමුණු වෙනස් වීම.

(j) සේවා ජීවිතයට අනුවර්තනය වීමේ අපහසුතා.

(k) විනය හා සේවා නීති රීති සම්බන්ධව ඔවුන්ගේ ඇති අකැමැත්ත.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

(iii)

ත්‍රිවිධ හමුදාව	ගනු ලබන ක්‍රියාමාර්ග
යුද්ධ හමුදාව	1949 අංක 17 දරන යුද්ධ හමුදා පනත සහ 1950 යුද්ධ හමුදා විනය රෙගුලාසි මාලාවේ විධිවිධාන ප්‍රකාරව සක්‍රිය සේවයේ යෙදී සිටිය දී සේවය හැර ගොස් (නිවාඩු නොමැතිව නොපැමිණෙන) විදේශගත වන නිලධාරීන් යුද්ධ හමුදාවෙන් පැනගිය නිලධාරීන් වන බැවින්, ඔවුන් අත් අඩංගුවට ගැනීමෙන් පසුව යුද්ධාධිකරණයක් ඉදිරියට පමුණුවා චෝදනා විභාග කර යුද්ධ හමුදා සේවයෙන් අස්කිරීමට කටයුතු කරනු ලබයි. තවද, නිවාඩු නොමැතිව නොපැමිණෙන නිලධාරීන් ස්වකැමැත්තෙන් නැවත යුද්ධ හමුදාව වෙත පැමිණ භාරවන අවස්ථාවකදී ඔවුන්ගේ නිලය සහ නිනොනො (නිවාඩු නොමැතිව නොපැමිණෙන) දින ගණන අනුව පහත පරිදි ක්‍රියාමාර්ග ගනු ලබයි. i. නිවාඩු නොමැතිව නොපැමිණ සිට නැවත යුද්ධ හමුදාව වෙත භාරවන ලුතිනන් කර්නල් සහ ඉන් ඉහළ නිලයේ නිලධාරීන්ට එරෙහිව මහා යුද්ධ අධිකරණයක් හමුවේ චෝදනා විභාග කර, එහි තීන්දුව ප්‍රකාරව ඔවුන් සබැඳිව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබයි. ii. දින 21ට අඩු දින ගණනක් නිවාඩු නොමැතිව නොපැමිණ සිට නැවත යුද්ධ හමුදාව වෙත භාර වන මේජර් සහ ඉන් පහළ නිලධාරීන්ට එරෙහිව චෝදනා ලඝු නඩු වශයෙන් විභාග කර, ඔවුන් යුද්ධ හමුදා සේවයේ රඳවා තබා ගැනීමට කටයුතු කරනු ලබන ප්‍රවේශයක් තිබෙනවා. iii. දින 21ට වැඩි දින ගණනක් නිවාඩු නොමැතිව නොපැමිණ සිට නැවත යුද්ධ හමුදාව වෙත භාර වන මේජර් සහ ඉන් පහළ නිලධාරීන්ට එරෙහිව චෝදනා ලඝු නඩු වශයෙන් විභාග කර ඔවුන් අධිකාරියෙන් ඉවත් කරනු ලබයි.
නාවික හමුදාව	නාවික හමුදාවේ පවත්නා නෛතික ක්‍රමවේදයට අනුව විනයානුකූලව කටයුතු කරනු ලැබේ. එනම්, යුද්ධාධිකරණයක් මඟින් හෝ ලඝු නඩු විභාගයක් මඟින් අදාළ චෝදනාව සම්බන්ධයෙන් නඩු කටයුතු සිදුකොට වැරදිකරුවන් ලෙස එම අධිකරණය මඟින් හඳුනා ගන්නා නිලධාරීන්ට නාවික හමුදා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව දඬුවම් නියම කරනු ලැබේ.
ගුවන් හමුදාව	ගුවන් හමුදාවේ පවත්නා නෛතික ක්‍රමවේදයට අනුව, විනයානුකූලව කටයුතු කරනු ලැබේ. එනම්, යුද්ධාධිකරණයක් මඟින් හෝ ලඝු නඩු විභාගයක් මඟින් අදාළ චෝදනාව සම්බන්ධයෙන් නඩු කටයුතු සිදුකොට වැරදිකරුවන් ලෙස එම අධිකරණයන් මඟින් හඳුනා ගන්නා නිලධාරීන්ට ගුවන් හමුදා පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව විනය ක්‍රියාමාර්ග සහ ඉදිරි පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

(iv)

ත්‍රිවිධ හමුදා නිලධාරීන්	සේවයට එක්වීමේ හැකියාව
යුද්ධ හමුදාව	දින 21ට අඩු දින ගණනක් විදේශගතව සිට යුද හමුදාව වෙත බාර වන ලද නිලධාරීන් සඳහා සේවයට එක්වීමට අවස්ථාව සලසා ඇත. එහෙත් දින 21ට වැඩි කාලසීමාවක් විදේශගතව සිටි නිලධාරීන් අධිකාරියෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. එහෙත් පුද්ගලයින් අත්අඩංගුවට ගෙන යුද්ධ හමුදාව වෙත භාර දුන් අවස්ථාවේදී එම අවස්ථාව අහිමි වේ.
නාවික හමුදාව	නඩු විභාගයකින් අනතුරුව ලබා දෙන දඬුවමේ ස්වභාවය අනුව එය තීරණය වේ.
ගුවන් හමුදාව	නඩු විභාගයකින් අනතුරුව ලබා දෙන දඬුවමේ ස්වභාවය මත ගුවන් හමුදා පනත අනුව, ගුවන් හමුදාපතිතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරනු ලබයි.

(v)

ත්‍රිවිධ හමුදා නිලධාරීන්	සේවයට එක්වීමේ හැකියාව
යුද්ධ හමුදාව	සේවය හැර ගොස් (නිවාඩු නොමැතිව නොපැමිණෙන) විදේශගත වන නිලධාරීන් යුද්ධ හමුදාවෙන් පලායන්නන් වන අතර, ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය හා සංග්‍රාමික නීතිය ප්‍රකාරව යුද්ධ හමුදාවෙන් පැන යන හෝ පැන යාමට තැත් කරන අයගේ සංග්‍රාමික වරදකට මෙන්ම අපරාධමය වරදකට වරදකරුවන් වන බැවින්, එම අයවලුන්ට නිවාඩු නොමැතිව නොපැමිණෙන නිලධාරීන් සඳහා පවතින විධිවිධානයන්ට අනුකූලව සේවයේ තබා ගැනීම හෝ ඉවත් කිරීම සිදු කරයි.
නාවික හමුදාව	නාවික හමුදා පනත අනුව, අවමන් සහිතව/අවමන් රහිතව නාවික හමුදාවෙන් පහ කිරීමේ දඬුවම ලබා දුන්නොත් නැවත සේවයට බැඳීමට හැකියාවක් නැත.
ගුවන් හමුදාව	නඩු විභාගයකින් අනතුරුව ලබා දෙන දඬුවමේ ස්වභාවය මත ගුවන් හමුදා පනත අනුව ගුවන් හමුදාපතිතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරනු ලබයි.

(vi)

ත්‍රිවිධ හමුදා නිලධාරීන්	සේවයට එක්වීමේ හැකියාව නොමැති නම් ඊට හේතුව
යුද්ධ හමුදාව	නිවාඩු නොමැතිව නොපැමිණෙන නිලධාරියෙකුගේ අස්කිරීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කිරීමට ගතවන කාලය අනුව එම කාලසීමාව තීරණය වේ.
නාවික හමුදාව	අධිකාරියෙන් ඉවත් වීමට ඉල්ලුම් කරන විශ්‍රාම යාමට නියමිත කාලසීමාව සම්පූර්ණ කොට නැති සෑම නිලධාරියෙකුටම අධිකාරියෙන් ඉවත්වීමේ අවස්ථාව ලබා නොදෙන අතර, ඔහුගේ සේවා කාලය, අදාළ අංශයේ පවතින පුරප්පාඩු අනිවාර්ය සේවා ගිවිසුම් සහ ඔහුගේ ඉල්ලීමේ ස්වභාවය සලකා බලා පමණක් අධිකාරියෙන් ඉවත් වීමට අවසර ලබා දෙන අතර, ඔහු වෙතින් ඇති අය කර ගැනීම් හා වෙනත් පරිපාලන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව පමණක් ඉල්ලීම සම්පූර්ණ කිරීමට හැකිවේ. ඒ සඳහා ගත වන කාලසීමාව එක් එක් පුද්ගලයාට වෙනස් වේ.
ගුවන් හමුදාව	එය අදාළ නිලධාරියා සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කරන දිනය, ඔහුගේ ඉවත් වීමට අදාළ හේතුව, ඔහුගේ ඉවත්වීම සමඟ පැන නඟින සේවා අවශ්‍යතාව හා ගරු ජනාධිපතිතුමන්ගේ අනුමැතිය ලබා ගත යුතු බැවින් හා ඊට අදාළ අනෙකුත් සාධක මත රඳා පවතින බැවින් නිශ්චිත කාල වකවානුවක් සඳහන් කළ නොහැකිය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Deputy Minister, I understand that it is a long Reply. So, you may just spell out only the salient points and table it.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

(අ) (i) එම විදේශ නිවාඩු ක්‍රමවේදය ත්‍රිවිධ හමුදාවට අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ

(iv) අදාළ නොවේ.

(v)

ත්‍රිවිධ හමුදා නිලධාරීන්	පොදු සමා කාලයක් ලබා නොදීමට සහ පසුගිය පොදු සමා කාලයන්ට ඇතුළත් නොකිරීමට හේතු
යුද්ධ හමුදාව	සේවය හැරගිය අයවලුන්හට පොදු සමා කාලයට පමණක් නොව ඔවුන් හට පැමිණ අස්කිරීම් කටයුතු සිදු කර ගැනීමේ හැකියාවක් පවතී. වෘත්තීන්වලට අනුව බඳවා ගන්නා ලද සෙසු නිලයන් වෙත රාජ්‍ය අරමුදල් භාවිත කරමින් ලබා දී ඇති විශේෂ ගණයේ පුහුණුවීම් සඳහා දරන ලද වියදම් හා ඔවුන් සේවයෙන් ඉවත් කිරීමෙන් එම ක්ෂේත්‍රවල කටයුතු පවත්වා ගෙන යාමේ බාධා සැලකිල්ලට ගෙන 2024 වර්ෂයේ පොදු සමා කාලය අදාළ කර නොමැති බව දන්වා සිටිමි.
නාවික හමුදාව	නාවික හමුදාවේ විවිධ වෘත්තීන්ට අයත් නාවික පුද්ගලයින් සඳහා අදාළ කර නොගැනීමට නිර්දේශ කිරීම හුදෙක්ම නාවික හමුදාවේ පැවැත්ම හා පිරිස් අවශ්‍යතාව මත පදනම්ව සිදු කරන අතර, ඔවුන්ගේ පුහුණු කාල සීමාව සඳහා නාවික හමුදාව මඟින් දැරීම. පොදු සමා කාල සීමාවක් ලබා දීම තුළින් නීත්‍යානුකූලව ඉවත්වීමට අවස්ථාවක් කර ගැනීම.
ගුවන් හමුදාව	ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ප්‍රකාශිත පසුගිය පොදු සමා කාලයන්හි දී ඇතැම් විශේෂ වෘත්තීන්වලට බඳවා ගන්නා සෙසු නිලයන් ඇතුළත් වී නොතිබීම හේතුවෙන් එම පොදු සමා කාලය තුළදී එම වෘත්තීන්ට අදාළ සේවා පුද්ගලයින්ගේ නිෂ්කාසන කටයුතු සිදු නොකිරීම හා ගුවන් හමුදා අධිකාරීන් නිලධාරීන් සඳහා ද 2024 වර්ෂයට අදාළ පොදු සමා අවස්ථාව ලබා දී නොමැති හෙයින්ද වේ.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Major General (Rtd.) G.D. Sooriyabandara, do you have Supplementary Questions? If so, make them very brief.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා, විස්තරාත්මක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, යුද්මය කාලයකදී වාගේම යුද්මය තත්ත්වයක් නොපවතින කාලයේදීත් සමහර අවස්ථාවල නිවාඩු නොමැතිව සේවයට නොපැමිණෙන සංඛ්‍යාවක් ත්‍රිවිධ හමුදාවේම වාර්තා වෙමින් පවතින බව. විශේෂයෙන්ම වෘත්තීය පාඨමාලා හදාරපු අය විශාල සංඛ්‍යාවක් මේ වනකොට නැවත සේවයට වාර්තා නොකර සමාජයේ ඉන්නවා. නැවත සේවයට වාර්තා කරලා තමන්ගේ ගැටලු ඉදිරිපත් කරලා සේවයෙන් ඉවත් වීමට ඔවුන්ට අවශ්‍යතාව තිබුණත්, ත්‍රිවිධ හමුදාවේ සේවා ව්‍යවස්ථාවන්ට අනුව ඔවුන්ට සේවයෙන් ඉවත් වීමට හැකියාවක් නැහැ. වෘත්තීය පාඨමාලා හදාරා ඇති සේවයට වාර්තා නොකළ වෘත්තීය සෙබළුන් විශාල සංඛ්‍යාවක් සමාජයේ ඉන්නවා. දීර්ඝ කාලීනව සේවයට වාර්තා නොකර සිටින ඒ සෙබළුන් සඳහා යම්කිසි සහන කාල සීමාවක්, එහෙම නැත්නම් සහනයක් ලබා දුන්නොත්, විශේෂයෙන් ඔවුන්ට සේවයෙන් ඉවත් වීම සඳහා අවසර ලබා දුන්නොත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා වාගේ ඔවුන්ට විදේශ රැකියාවලට යාමට අවකාශ ලැබෙනවා. එමඟින් අපේ රටට විදේශ විනිමය ඉපැයීමටත් අවස්ථාවක් ලැබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම අහන්න කැමැතියි, ඔවුන්ට සේවයෙන් ඉවත් වීමට අවස්ථාවක් ලබා දීමට හැකියාවක් තිබෙනවාද, ඒ සඳහා වැඩ පිළිවෙළක් යොදන්න පුළුවන්ද කියන එක.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය හරි පැහැදිලියි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ ත්‍රිවිධ හමුදාවේ වෘත්තීමය පාඨමාලා හදාරා ඇති අය නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටීම හේතුවෙන් අස් කිරීමේ කටයුතු සිද්ධ කිරීම සඳහා අපේ ආරක්ෂක අමාත්‍යාංශයට සංකීර්ණ ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදුවීමයි. ඒ අයට විශේෂ පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා රජය මඟින් විශාල පිරිවැයක් දරා තිබෙනවා. ඒ කියන්නේ වැය කරපු මුදල් ප්‍රමාණය ආපසු දීලා යන්න හිතුවාට, ඒක කිසිසේත් පහසු කාර්යයක් නොවෙයි. ඒ වාගේම, නීති රෙගුලාසි තිබෙනවා. ත්‍රිවිධ හමුදාවේ විනය ක්‍රියාපටිපාටිවලට අනුකූලව තමයි මේ අවශ්‍යතා ඉටු කරන්න ඕනෑ. වෘත්තීය පාඨමාලා හදාරා ඇති අය නිවාඩු ගොස් නොපැමිණ සිටීම හේතුවෙන් හමුදාවෙන් අස් කිරීමට කටයුතු සිදු කළොත්, වෘත්තීමය සෙබළුන්ගේ නිහතාවක් ඇති වෙනවා. එතකොට ඒකට ඉඩ ප්‍රස්තා මතු වීම සහ සේවයේ යෙදී සිටින අයට එය වැරැදි පූර්වාදර්ශයක් ද වනවා. හමුදාවට බැඳිලා, ඉතාම කෙටි කාලයකදී ඔවුන් නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර ගියාට පස්සේ හමුදාවේ වැඩ කටයුතුවලට වෘත්තීමයභාවය තිබෙන අයගේ අඩුවීමක් සිදු වන නිසා, එය විශාල ලෙස බලපානවා. ඒ නිසා පරිපාලනාත්මක සහ විධිවිධානයන්ට අනුකූලව ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කරන්න, රජය හැටියට අපේ බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී ඒ ගැන ගරු ජනාධිපතිතුමා එක්කත් කථා කරලා කටයුතු කරන්න අපි සටහන් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, do you have a second Supplementary Question to ask?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, වෘත්තීය වාගේම වෘත්තීය නොවන සෙබළු විශාල සංඛ්‍යාවක් ද මේ වන කොට නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර ඉන්නවා. ඇත්තටම ඔවුන්ට ඒ සේවා ඒකක වෙත භාර වෙලා අස් වීමට හැකියාව තිබුණත්, නිවාඩු නොමැතිව රාජකාරියට නොපැමිණ සිටින ඒ පිරිස අතර වැරැදි මතයක් පැතිර ගිහිල්ලා තිබෙනවා, සේවයට වාර්තා කරලා අස්වීම ගන්න ගියාම ඔවුන්ට දඬුවම් පමුණුවනවා කියලා. මා හිතන විධියට, ඇත්තටම ඒ හරහා තමයි මේ අස්වීමේ කටයුතුවලට විශාල බාධාවක් වෙලා තිබෙන්නේ. ඒ අස්වීමේ කටයුතු සඳහා වාර්තා කරන්න ඉන්න පිරිසට අපි පොදු සමා කාලයක් ලබා දුන්නොත්, ඔවුන්ට ඒ සේවා ඒකකවලට භාර වෙලා අස්වීමේ කටයුතු කරගෙන යන්නට කිසිදු බාධාවක් පැන නඟින්නේ නැහැ. එවිට ඔවුන්ගේ අස්වීමේ කටයුතු නියමාකාරයෙන් කර ඔවුන් හමුදාවලින් ඉවත් කිරීමට හමුදාවන්ටත් අවස්ථාව ලැබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමැතියි, එවැනි පොදු සමා කාලයක් ලබා දීමට හැකියාවක් පවතිනවාද, එසේ ලබා දීමට වැඩ පිළිවෙළක් යොදන්න පුළුවන්ද කියන එක.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඇහුවා වාගේ 1995 සිට 2024 දක්වා මේ වනකොට විසිපස් වතාවක් පොදු සමා කාල දීලා තිබෙනවා. මෙතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ ඔවුන් හමුදා සේවයේ ඉන්න කොට පොදු සමා කාලය දීමට අපට ලොකු අපහසුතාවක් තිබෙනවා. නමුත් ඉදිරියේදී අපි ඒ ගැන සලකා බැලීමක් කරගෙන යනවා. ඔවුන් හමුදාවේ ඉන්න කොට නිවාඩු නොමැතිව රාජකාරියට රිපෝර්තු කරන්නේ නැතිව ගිහිල්ලා විදේශගත වෙලාත් තිබෙනවා. එතකොට, ඔවුන් හමුදාවේ සිටිද්දී අවි ආයුධ සම්බන්ධයෙන් වැඩ කටයුතු කළාද, මුදල් සම්බන්ධව වැඩ කටයුතු කළාද, එහෙම නැත්නම් ඔවුන් විනය කඩ කිරීමක් හෝ කරලා හමුදාවෙන් පැනලා ගිහිල්ලා ඉන්නවාද කියන කාරණා බලන්න ඕනෑ. නිලධාරියෙක් නම් ඔහු අනිවාර්යයෙන්ම ඇවිල්ලා භාර වෙන්න ඕනෑ; ඉදිරිපත් වෙන්න ඕනෑ. මොකද, ගරු ජනාධිපතිතුමා විසින්මයි ඒ අධිකාරිය අයින් කරන්න ඕනෑ. ඒ අනුව හැම පැත්තකින් ඒ තොරතුරු සොයා බලා පාලනමය පැත්තෙන් කරන්න විශාල ක්‍රමවේදයක් තිබෙනවා. මොකද, අපරාධයකට සම්බන්ධ වෙලා යම් කෙනෙක් හමුදාවෙන් පැන ගිහින් හිටියොත් ඒ සම්බන්ධව තොරතුරු විමසීමේදී ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ කාලයේ පොදු සමා කාලයක් දුන්නාම අලුතින් හමුදාවට බැඳෙන අයත් ඒක පූර්වාදර්ශයක් කරගෙන කෙටි කාලයක් ඉඳලා යන්න පුළුවන්.

හමුදාවක මූලික පුහුණුව ගත්තාම, පළමු අවුරුදු 5, 6, 7, 10 කාලවල ඉන්න අය තමයි හමුදාවට ලොකු ශක්තියක් වෙන්නේ. හමුදාව කියන්නේ වෙනත් ආයතන, දෙපාර්තමේන්තු වාගේ නොවෙයි. ඒ නිසා පොදු සමා කාලය කියන දේ අපට සලකා බැලීමට ඉතා අපහසුයි. නමුත් අපි ක්‍රමවේදයක් හදා තිබෙනවා, ඔවුන්ට ඇවිල්ලා භාර වෙන්න. දඬුවම් දීම කියන එකම නොවෙයි වෙන්නේ. නිෂ්කාසන වාර්තා අරගෙන ඉතා කෙටි කාලයකින් ඔවුන්ගේ පාලන කටයුතු අවසන් කර ඔවුන් නීත්‍යානුකූලව මුදා හරින්න අපට ත්‍රිවිධ හමුදා පනත්වල ප්‍රවේශ තිබෙනවා. අපි ඒ ගැන කටයුතු සලස්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Second round.

යා/ඩෙල්ෆ්ට් මහා විද්‍යාලය: කාර්ය මණ්ඩල පුරප්පාඩු
யா/நெடுந்தீவு மகா வித்தியாலயம்: பணியாட்டொகுதி வெற்றிடங்கள்
J/ DELFT COLLEGE: STAFF VACANCIES

1195/2025

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි පාසල් භෞතික සම්පත් ඌනතාවකින් සහ කාර්ය මණ්ඩල පුරප්පාඩු සහිතව ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ප්‍රදේශයේ පිහිටි යා/ඩෙල්ෆ්ට් මහා විද්‍යාලය අයත් වන පාසල් වර්ගීකරණය කවරේද;

(iii) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පාසලේ විදුහල්පති, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් ඇතුළු අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(v) මේ වන විට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ දක්වා කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ නොකිරීමට බලපා ඇති හේතු කවරේද;

(vii) එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාල සීමාව කොපමණද;

(viii) ගුරු පුරප්පාඩු හේතුවෙන් එම පාසලේ සිසුන් මුහුණ දී සිටින ගැටලු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாண மாவட்டத்தில், நெடுந்தீவில் அமைந்துள்ள பாடசாலைகள் பௌதிக வளங்கள் மற்றும் பணியாட்டொகுதி பற்றாக்குறையுடன் இயங்குவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பிரதேசத்தில் அமைந்துள்ள யா/ நெடுந்தீவு மகா வித்தியாலயத்துக்குரிய பாடசாலை வகைப்படுத்தல் யாது என்பதையும்;

(iii) மேற்படி பாடசாலையில் கல்வி கற்கும் மாணவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) பாடசாலையின் அதிபர், ஆசிரியர்கள் மற்றும் கல்விசாரா ஊழியர்கள் உட்பட அங்கீகரிக்கப்பட்ட பணியாட்டொகுதியின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) இன்றளவில் சேவையில் ஈடுபட்டுள்ள பணியாட்டொகுதியின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) தற்போதுவரை பணியாட்டொகுதியின் வெற்றிடங்கள் நிரப்பப்படாமல் இருப்பதற்கு செல்வாக்குச் செலுத்தும் காரணிகள் யாவை என்பதையும்;

(vii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்குத் தேவைப்படும் காலப்பகுதி யாது என்பதையும்;

(viii) ஆசிரியர் பற்றாக்குறை காரணமாக மேற்படி பாடசாலையின் மாணவர்கள் முகங்கொடுத்துள்ள பிரச்சினைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that the schools located in Delft Island in the Jaffna District are operating with inadequate physical resources and a shortage of staff;

(ii) the category to which J/Delft College, located in that area, belongs;

(iii) the number of students who receive education at the said school;

(iv) the approved cadre of the school, including the principal, teachers, and non-academic staff;

(v) the number of staff members currently serving;

(vi) the reasons for not filling the vacancies in the staff, to date;

(vii) the period of time that is required to fill the said vacancies; and

(viii) the difficulties the students of the said school are experiencing as a result of inadequate academic staff?

(b) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 1C පාසලක් ලෙස වර්ගීකරණය කර ඇත.

(iii) 204යි.

(iv)

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය
විදුහල්පති	1
ගුරුවරු	29
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	1
පාසල් මුරකරු	1

(v) 2026.09.30 දිනට කාර්ය මණ්ඩල විස්තර

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	සේවයේ නියුතු කාර්ය මණ්ඩලය
විදුහල්පති	1	1
ගුරුවරු	29	15
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	1	1
පාසල් මුරකරු	1	0

(vi) උතුරු පළාතේ ගුරු පුරප්පාඩු 4,158ක් ඇත. එම පුරප්පාඩු කලාපයන්හි සියලුම පාසල්වල පවතින අතර යා/ඩෙල්ෆ්ට් මහා විද්‍යාලයේ පවතින පුරප්පාඩුද මේ තුළ පවතින බැවින් නව බඳවා ගැනීම් විෂයානුබද්ධව සිදු කරන තෙක් ඉහත පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත.

(vii) ඉදිරි බඳවා ගැනීම් මඟින් මෙම පුරප්පාඩු පියවීමට අපේක්ෂා කෙරේ.

(viii) මෙම ගුරු පුරප්පාඩු මත ළමුන්ගේ දෛනික අධ්‍යාපනික කටයුතුවලට බාධා වන බව නිරීක්ෂණය කරන අතර අවශ්‍ය ගුරු බඳවා ගැනීම් නොපමාව සිදු කිරීමට කටයුතු කරමින් ඇත.

(ආ) අදාළ නොවේ.

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය: පුරප්පාඩු
இலங்கை விஞ்ஞான சேவை: வெற்றிடங்கள்
SRI LANKA SCIENTIFIC SERVICE: VACANCIES

2198/2026

7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ජේ.සී. අලවතුවල මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஜே.சீ. அலவத்துவல சார்பாக)
(Hon. Gayantha Karunathilleka on behalf of the Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එම සේවය සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) මේ වන විට එම සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එක් එක් රාජ්‍ය ආයතන තුළ මෙම සේවය සඳහා අනුමත කර ඇති තනතුරු නාම කවරේද;

(v) එම සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් අදාළ තනතුරුවල රාජකාරී ආවරණය කිරීම සඳහා වෙනත් සේවාවල නිලධාරීන් පත් කර තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) මෙම සේවයේ පවතින පුරප්පාඩු සහ අනෙකුත් ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිරුවාග, මාකාණ සපෙකළ් මත්‍රුම් උළ්ලූරාට්චි අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) இலங்கை விஞ்ஞான சேவைக்கு ஆட்சேர்ப்புச் செய்யப்படும் முறை யாது என்பதையும்;

(ii) மேற்படி சேவைக்காக அங்கீகரிக்கப்பட்ட ஆளணியின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) தற்போது மேற்படி சேவையில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) ஒவ்வோர் அரச நிறுவனத்திலும் குறித்த சேவைக்காக அங்கீகரிக்கப்பட்டுள்ள பதவிப் பெயர்கள் யாவை என்பதையும்;

(v) மேற்படி சேவையில் நிலவும் வெற்றிடங்கள் காரணமாக, சம்பந்தப்பட்ட பதவிகளின் கடமைகளை நிறைவேற்றுவதற்காக வேறு சேவைகளைச் சேர்ந்த உத்தியோகத்தர்கள் நியமிக்கப்பட்டிருந்தால், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி சேவையில் நிலவும் வெற்றிடங்கள் மற்றும் ஏனைய பிரச்சினைகளைத் தீர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the recruitment procedure to the Sri Lanka Scientific Service;

(ii) the approved cadre of the said Service;

(iii) the number of existing vacancies in the aforesaid Service;

(iv) the designations of the posts approved for the said Service in each Government institution;

(v) if officers from other services have been assigned to cover up duties of the relevant posts due to vacancies in the said Service, the particulars thereof; and

(vi) the measures that will be taken to address the issues relating to the existing vacancies and other matters pertaining to the said Service?

(b) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අංක 1877/27 හා 2014.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත, අංක 1925/59 හා 2015.07.29 දිනැති, අංක 1996/25 හා 2016.12.06 දිනැති, අංක 2082/59 හා 2018.08.03 දිනැති, අංක 2137/89 හා 2019.08.23 දිනැති, අංක 2233/19 හා 2021.06.22 දිනැති සහ අංක 2407/02 හා 2024.10.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මඟින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවේ 07 වන වගන්තිය යටතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගනු ලැබේ.

ඉහත කී විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කර ඒ අනුව පවත්වනු ලබන තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

(ii) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරුවල 2026.09.30 දිනට අනුමත කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

ශ්‍රේණිය	අනුමත සංඛ්‍යාව
විශේෂ ශ්‍රේණිය	22
I ශ්‍රේණිය	75
II ශ්‍රේණිය	17
III/II ශ්‍රේණිය	584

(iii) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරුවල 2026.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.

ශ්‍රේණිය	පුරප්පාඩු සංඛ්‍යාව
විශේෂ ශ්‍රේණිය	5
I ශ්‍රේණිය	36
II ශ්‍රේණිය	6
III/II ශ්‍රේණිය	156

(iv)

අ/ප	අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	තනතුර
1	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ
2	ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ
3	මිනුම් ඒකක හා ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ
		මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා සහකාර අධ්‍යක්ෂ
4	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
		කාලගුණ විද්‍යා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ
		නියෝජ්‍ය අධ්‍යක්ෂ
		ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යාඥ / කාලගුණ විද්‍යාඥ
5	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	ජ්‍යෙෂ්ඨ භෞතික විද්‍යාඥ
		භෞතික විද්‍යාඥ
		ජ්‍යෙෂ්ඨ ජීව රසඥ
		ජීව රසඥ
		ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (ස්වභාවික නිෂ්පාදන හා රසායන විද්‍යා)
		පර්යේෂණ නිලධාරී (ස්වභාවික නිෂ්පාදන හා රසායන විද්‍යා)
		පර්යේෂණ නිලධාරී (කීට විද්‍යා)
		ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (බැක්ටීරියාවේදී හා වෛරස්වේදී)
		පර්යේෂණ නිලධාරී (බැක්ටීරියාවේදී හා වෛරස්වේදී)
		ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (එන්නත් හා නිෂ්පාදන)
		පර්යේෂණ නිලධාරී (එන්නත් හා නිෂ්පාදන)
		පර්යේෂණ නිලධාරී (ජීව රසායන විද්‍යා)
		පර්යේෂණ නිලධාරී (පරපෝෂිතවේදය)
		පර්යේෂණ නිලධාරී (අණුක ජීව විද්‍යා)
		ජ්‍යෙෂ්ඨ කීට විද්‍යාඥ
		කීට විද්‍යාඥ
		ජ්‍යෙෂ්ඨ රසඥ
		රසඥ
		පරපෝෂිතවේදී
		ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී
		විද්‍යාත්මක නිලධාරී
		අනුක ජීව විද්‍යාඥ
		ප්‍රාදේශීය මැලේරියා මර්දන නිලධාරී
6	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වන සංරක්ෂක ජනරාල්
		අතිරේක වන සංරක්ෂණ ජනරාල්
		වන සංරක්ෂක
		නියෝජ්‍ය/ සහකාර වන සංරක්ෂක (වන කළමනාකරණ), (අධ්‍යාපන), (පර්යේෂණ)
7	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	ආණ්ඩුවේ රස පරීක්ෂක
		ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක
		සැක කටයුතු ලේබන පිළිබඳ ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක
		ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක
		සැක කටයුතු ලේබන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක
		ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ/ සහකාර රස පරීක්ෂක
		සැක කටයුතු ලේබන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ/ සහකාර පරීක්ෂක
		සැක කටයුතු ලේබන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ/ සහකාර පරීක්ෂක (ඩිජිටල්/ අපරාධ)
8	කම්කරු දෙපාර්තමේන්තුව	කම්කරු කොමිසාරිස්
		නියෝජ්‍ය කම්කරු කොමසාරිස්
		ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
		පර්යේෂණ නිලධාරී
9	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ ජනරාල්
		අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ)
		අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)
		අධ්‍යක්ෂ (පර්යේෂණ)
		අධ්‍යක්ෂ (සංවර්ධන)
		අධ්‍යක්ෂ (නියාමන)
		අධ්‍යක්ෂ (විශේෂ පර්යේෂණ)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
10	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ ජනරාල්
		අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ (විද්‍යා)
		අධ්‍යක්ෂ (සංස්කෘතික)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (මානව වංශ විද්‍යා)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (මානව විද්‍යා)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (උද්භිද විද්‍යා)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සත්ත්ව විද්‍යා)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා)
11	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ ජනරාල්
		අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ
12	ජේෂ කර්ම දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ
		ජේෂ කර්ම තාක්ෂණ විද්‍යාඥ
13	ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව	රසඥ
		භූ ගර්භ විද්‍යාඥ
14	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	රසායන විද්‍යාඥ
15	ආයුර්වේද දෙපාර්තමේන්තුව	විද්‍යාත්මක නිලධාරී (තත්ත්ව සහතික)
		විද්‍යාත්මක නිලධාරී (වනාස්පති)
		විද්‍යාත්මක නිලධාරී (කෘෂි)
		විද්‍යාත්මක නිලධාරී (ශාක අභිජනන)
		විද්‍යාත්මක නිලධාරී (ක්ෂුද්‍ර ජීවී)
		විද්‍යාත්මක නිලධාරී (රසායන)
		විද්‍යාත්මක නිලධාරී (ඖෂධ නව්කරණ)
16	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ)
		ජල විද්‍යා දත්ත අධිකාරී
		ජල විද්‍යා ක්ෂේත්‍ර අධිකාරී
		ඉංජිනේරු ද්‍රව්‍ය අධිකාරී
		භූ විද්‍යාඥ
		සිවිල් ඉංජිනේරු ද්‍රව්‍ය සම්පාදන අධිකාරී
		ජල ශක්ති අධිකාරී
		ඉඩම් පරිහරණ අධිකාරී
		ප්‍රධාන සැලසුම් කාර්යාල සහකාර
		විශේෂඥ නිලධාරී (ඉඩම් පරිහරණ)
		සහකාර පස් රසඥ
		පර්යේෂණ නිලධාරී (ඉඩම් පරිහරණ)
		පර්යේෂණ නිලධාරී (ජල විද්‍යා)
		උපකරණ අධිකාරී
17	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ)
		නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ)
18	ශ්‍රී ලංකා භූමිය දෙපාර්තමේන්තුව	රසඥ සහ ලෝහ විද්‍යාඥ
19	පොලිස් දෙපාර්තමේන්තුව	අපරාධවේදී
20	කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
		සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
		සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)
21	සුරාබදු දෙපාර්තමේන්තුව	අධ්‍යක්ෂ
		සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
22	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	අධ්‍යක්ෂ ජනරාල්
		අධ්‍යක්ෂ
		සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
23	වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය	අධ්‍යක්ෂ
		නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
24	පරිසර අමාත්‍යාංශය	අතිරේක ලේකම්
		අධ්‍යක්ෂ

(v) කිසියම් තනතුරක වැඩ බැලීම සඳහා පත් කළ හැක්කේ එම තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පටිපාටියේ හෝ සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති එම තනතුරට සමාන තනතුරක හෝ එම තනතුරට ආසන්නතම පහළ තනතුරක හෝ සේවයේ යෙදී සිටින නිලධරයෙක් පමණක් වේ. එබැවින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරුවල රාජකාරී ආවරණය කිරීම සඳහා වෙනත් සේවාවක නිලධරයින් වැඩ බැලීම සඳහා පත් කළ නොහැක.

(vi) 2025.01.31 දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පැවති විවෘත පදනමේ පුරප්පාඩු 107ක් සම්පූර්ණ කිරීම සඳහා 2025.06.13 දින ගැසට් පත්‍රයේ පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව අදාළ විභාගය පවත්වා, මේ වන විට තනතුරු පුරප්පාඩුවලින් 89ක් සම්පූර්ණ කර ඇත.

2024.12.31 දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පැවති සීමිත පදනමේ පුරප්පාඩු 23ක් සම්පූර්ණ කිරීම සඳහා 2025.12.26 දින ගැසට් පත්‍රයේ පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව 2026.08.21, 22 හා 23 තෙදින අදාළ විභාග පවත්වා ඇති අතර මෙතෙක් ප්‍රතිඵල නිකුත් කර නොමැත.

දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය මඟින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගැනීමේදී උද්ගත වූ ගැටලු හේතුවෙන් එම තරග විභාගයෙන් බැහැරව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු සඳහා එම සේවයේ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වෙනම තරග විභාගයක් පවත්වා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ඉල්ලා 2026.09.10 දිනැතිව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇත. එකී අමාත්‍ය

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

මණ්ඩල අනුමැතිය ලද පසු ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත පදනමේ පුරප්පාඩු 146ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CAD/MOPUBAD/SLSS හා 2026.09.28 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පුරප්පාඩු අවම කිරීම)
(The Hon. Deputy Speaker)
Questions under Standing Order No. 27(2), the Hon. (Dr.) M.L.A.M. Hizbullah.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

2026 මහ කන්නයේදී එල් නිනෝ බලපෑම්වලට මුහුණ දීම සඳහා ගනු ලබන පියවර
2026 மகா போகத்தில் எல்நினோ தாக்கத்தை எதிர்கொள்வதற்கான நடவடிக்கைகள்
MEASURES TO ADDRESS THE IMPACT OF EL NINO DURING 2026 MAHA SEASON

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதிச් සභාநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரின் கவனத்துக்கு பின்வரும் விடயத்தைக் கொண்டுவர விரும்புகின்றேன்.

நாட்டின் விவசாயத்துறை வளர்ச்சிக்கு மாண்புமிகு சனாதிபதி அவர்களும் கௌரவ அமைச்சர் அவர்களும் எடுத்துவரும் நடவடிக்கைகளுக்கு எங்களுடைய நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக்கொள்கின்றோம்.

நமது நாடு விவசாயத்துறையில் முக்கியமானதொரு நாடு! நமது நாட்டின் பொருளாதாரத்தின் முதுகெலும்பு விவசாயமாகும். தற்போது நாட்டில் மிக முக்கிய விவசாயப் பருவமான 2026 மகாபோகச் செய்கை ஆரம்பமாகியுள்ளது. நாட்டின் உணவுப் பாதுகாப்புக்கும் இலட்சக்கணக்கான விவசாயக் குடும்பங்களின் வாழ்வாதாரத்துக்கும் இம்மகாபோகம் மிகவும் தீர்க்கமானது. இருப்பினும், இம்முறை எல்நினோ காலநிலைத் தாக்கத்தால் வறட்சி மற்றும் சீரற்ற மழைவீழ்ச்சி ஏற்படுவதற்கான சாத்தியக்கூறுகள் அதிகமாக இருப்பதாக வானிலை அவதானநிலைய நிபுணர்கள் தெரிவித்திருக்கிறார்கள்.

கௌரவ பிரதிச් සභාநாயகர் அவர்களே, இந்த நெருக்கடியான சூழலில், விவசாயிகளின் நலனைப் பாதுகாக்கவும் தேசிய உணவு உற்பத்தியை உறுதி செய்யவும் விவசாயத்துக்குப் பொறுப்பான அமைச்சிடமிருந்தும் அரசாங்கத்திடமிருந்தும் தெளிவான பதில்களையும் அவசர நடவடிக்கைகளையும் நாம் எதிர்பார்க்கின்றோம்.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களிடம் பின்வரும் கேள்விகளை நான் முன்வைக்க விரும்புகின்றேன்.

(1) அ. 2026 மகாபோகச் செய்கைக்குத் தேவையான உரங்களான urea, TSP, MOP போன்றவை போதியளவில் கையிருப்பில் உள்ளதா?

ஆ. சந்தையில் உரத் தட்டுப்பாடு அல்லது அதிக விலை உயர்வு ஏற்படுவதைத் தவிர்க்கவும், விவசாயிகளுக்கு உரிய நேரத்தில் நியாயமான விலையில்/மானிய அடிப்படையில் உரம் கிடைப்பதை உறுதி செய்யவும் எடுக்கப்பட்டுள்ள வேலைத்திட்டங்கள் யாவை?

(2) அ. எல்நினோ வறட்சித் தாக்கத்தை எதிர்கொள்வதற்காக நீர்நிலை முகாமைத்துவம் - water management - மற்றும் குளங்களைச் சீரமைத்தல் தொடர்பில் விவசாய மற்றும் நீர்ப்பாசன அமைச்சு இணைந்து எடுத்துள்ள உடனடித் திட்டங்கள் என்ன?

ஆ. எல்நினோ காலநிலை நிகழ்வுடன் தொடர்புடைய காலநிலை மாற்றங்களால் ஏற்படக்கூடிய அதிக மழைவீழ்ச்சி மற்றும் வெள்ளப்பெருக்கு அபாயங்களை எதிர்கொள்வதற்காக, விவசாய நிலங்கள், வயல் நிலங்கள் மற்றும் விவசாயக் குடியிருப்புகளைப் பாதுகாக்க அமைச்சினால் முன்னெடுக்கப்பட்டுள்ள முன்னெச்சரிக்கை நடவடிக்கைகள் யாவை?

(3) எல்நினோ காலநிலை மாற்றம் குறித்த விழிப்புணர்வும் பயிர்ச்செய்கைக்கான தொழில்நுட்ப ஆலோசனைகளும் அடிமட்ட அளவில் உள்ள அனைத்து விவசாயிகளுக்கும் விவசாய அமைப்புப் பொறுப்பாளர்களுக்கும் - Govijana Seva - முறையாகச் சென்றடைந்துள்ளனவா?

(4) காலநிலை மாற்றத்தால் பயிர்கள் சேதமடைந்தால், விவசாயிகளுக்கு நிவாரணம் அல்லது காப்பீடு - insurance- வழங்குவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளதா? அதுதொடர்பில் எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் என்ன?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා කාලය ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச් සභாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

The second Question under Standing Order No. 27(2), the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam.

II

සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් විෂමතා, උසස්වීම් සහ සේවා ව්‍යවස්ථාව

அபிவிருத்தி உத்தியோகத்தர்களின் சம்பள முரண்பாடுகள், பதவியுயர்வுகள் மற்றும் சேவைப் பிரமாணக் குறிப்பு

SALARY ANOMALIES, PROMOTIONS AND SERVICE MINUTES OF DEVELOPMENT OFFICERS

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

දිවයින පුරා සේවය කරන 106,000ක් පමණ වන සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් විෂමතා, උසස්වීම් සහ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වසර 20කට අධික කාලයක් තිස්සේ පවතින ගැටලු මෙතෙක් විසඳී නොමැති බව වෘත්තීය සමිති විසින් පෙන්වා දෙනු ලබයි.

ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ජනතාවට රාජ්‍ය සේවාවන් ලබා දීමේදී සංවර්ධන නිලධාරීන් වැදගත් කාර්යභාරයක් ඉටු කරති. රාජ්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ දායකත්වය සහ දිගුකාලීන සේවය නිසි ඇගැයීමට ලක්විය යුතුය. එම නිලධාරීන්, MN 4 වැටුප් පරිමාණය MN 5 දක්වා ඉහළ නැංවීම, MN 7 වැටුප් පරිමාණය යටතේ උසස්වීම් අවස්ථා ලබා දීම සහ අධ්‍යාපන සුදුසුකම් හා සේවා ජ්‍යෙෂ්ඨත්වයට සරිලන සේවා ව්‍යුහයක් ස්ථාපිත කිරීම ඉල්ලා සිටිති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියන්නේ, සංවර්ධන නිලධාරියෙකුගේ වැටුප MN 4 සිට MN 5 දක්වා වැඩි කරන ලෙස තමයි ඉල්ලන්නේ. මොකද, ඒගොල්ලන්ට දැනට මාසික වැටුප හැටියට ලැබෙන්නේ රුපියල් 70,000ක් පමණයි. ඒ වැටුපෙන් ජීවත් වෙන්න අමාරු බවයි ඔවුන් කියන්නේ.

ශ්‍රී ලංකා සංවර්ධන සේවය - SLDS - ස්ථාපිත කිරීම සහ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ලබා දුන් පොරොන්දු මෙතෙක් ඉටු නොවීම පිළිබඳව ද වෘත්තීය සමිති වෝදනා කරති. මෙම ගැටලුවලට විසඳුම් නොලැබීම හේතුවෙන් නොවැම්බර් මස 09වැනි දින දිවයින පුරා අසනීප නිවාඩු වාර්තා කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයක් ප්‍රකාශයට පත් කර ඇත. මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය ආයතනවල මහජන සේවා අඩාළ වී, ජනතාව දැඩි අපහසුතාවට පත්වීමේ අවදානමක් පවතී.

එබැවින්, මහජනතාවට සිදුවිය හැකි බලපෑම් සැලකිල්ලට ගනිමින්, මෙම ගැටලුව කඩිනමින් විසඳිය යුතු හදිසි සහ ප්‍රමුඛතා කාරණයක් ලෙස සලකා, ස්ථාවර නියෝග 27(2) යටතේ මම ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයාගෙන් පහත ප්‍රශ්න විමසමි.

1. දැනට දිවයින පුරා සේවය කරන සංවර්ධන නිලධාරීන්ගේ නිශ්චිත සංඛ්‍යාව කොපමණද?

   එම සංඛ්‍යාව 106,000ක් ලෙස මම සඳහන් කළා. නමුත්, නිශ්චිත සංඛ්‍යාව කොපමණද කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහනවා.

2. සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ වත්මන් ප්‍රගතිය කුමක්ද? අනුමැතිය ප්‍රමාද වීමට හේතු මොනවාද? එය ක්‍රියාත්මක කරන්නේ කවදාද?

   සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පිළිබඳව තමයි මම මේ ප්‍රශ්නයෙන් අහන්නේ.

3. MN 4 වැටුප් පරිමාණය MN 5 දක්වා ඉහළ නැංවීමටත්, MN 7 යටතේ උසස්වීම් අවස්ථා ලබා දීමටත් රජය පියවර ගන්නේද?

4. ශ්‍රී ලංකා සංවර්ධන සේවය - SLDS - විධිමත්ව ස්ථාපිත කර, අධ්‍යාපන සුදුසුකම් සහ සේවා ජ්‍යෙෂ්ඨත්වය අනුව උසස්වීම් තහවුරු කිරීමේ සැලැස්ම කුමක්ද?

5. සංවර්ධන නිලධාරීන් සම්බන්ධව මැතිවරණයට පෙර ලබා දුන් පොරොන්දුවලින් මෙතෙක් ඉටු කර ඇත්තේ මොනවාද? ඉටු නොකළ පොරොන්දු සඳහා හේතු මොනවාද?

6. නොවැම්බර් 09වැනි දිනට නියමිත වෘත්තීය ක්‍රියාමාර්ගයට පෙර වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කර නිශ්චිත කාලරාමුවක් සහිත විසඳුම් ලබා දීමට රජය සූදානම්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් විධියට පත් වෙලා, මැරෙනකල්ම සංවර්ධන නිලධාරියෙක් විධියට කටයුතු කරන්න ඕනෑ කියන එකද ස්ථාවරය? ඒ කියන්නේ, ඔවුන්ට exam එකක් තියලා MN 7 ශ්‍රේණියට යන්න, promotion එකකට යන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න කියලායි ඉල්ලන්නේ. ඒ වාගේම, වැටුප් සම්බන්ධවත් ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් තිබෙන්නේ. ඒ වාගේම තමයි, Economic Development Officers හැටියට ගත්ත අය ඊට පස්සේ DO කරලා, CDO කරලා තිබෙනවා. එම නිසා ඒ අයට නිවැරදි ක්‍රමවේදයක් හදන්න. මම හිතන විධියට, මීට පෙර සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් විශේෂයෙන්ම පෙනී සිටියේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු. අද එම නිලධාරීන් මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා අපෙන් ඉල්ලා සිටියා. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මේ සම්බන්ධයෙන් මම සවිස්තරාත්මක පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසන ලද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 78,710කි.

2. සංවර්ධන නිලධාරී සේවය සඳහා 2011 අගෝස්තු 01 වැනි දින සිට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාවක් පවතී. සේවා අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය සංශෝධන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව එක් කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, මෑතකදී I පන්තියේ සංවර්ධන නිලධාරීන් සඳහා අදාළ IIIවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට විකල්ප සුදුසුකමක් ලෙස දින 10ක පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හැකි වන පරිදි අදාළ සංශෝධන සිදු කරමින් පවතී.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

3. රාජ්‍ය සේවයේ තනතුරුවලට අදාළ MN 4, MN 5 සහ MN 7 වැටුප් පරිමාණ රාජ්‍ය ප්‍රතිපත්තියක් මත පිහිටා ස්ථාපිත කර ඇති අතර, ඉන් පරිබාහිරව අවධිමත් ලෙස කටයුතු කිරීමේ හැකියාවක් නොමැත. එම වැටුප් පරිමාණ පමණක් නොව, අනෙකුත් සියලු වැටුප් පරිමාණ සකස් කිරීමේදී අදාළ ප්‍රතිපත්තිමය රාමුව තුළ පිහිටා කටයුතු කර ඇති බැවින්, අවශ්‍ය සංශෝධන හඳුන්වා දෙනු ලබන්නේ නම් එය විධිමත්ව ඉදිරියේදී සිදු කරනු ඇත. විශේෂයෙන්ම පිහිටුවා ඇති රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන කරුණු ද සැලකිල්ලට භාජනකොට ඉදිරියේදී වඩාත් යෝග්‍ය වැටුප් තල පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයන්ට එළැඹීමට කටයුතු කරනු ලැබේ.

4. සංවර්ධන නිලධාරී සේවය විධිමත් සේවා ව්‍යවස්ථාවක් මඟින් පාලනය වන සේවාවක් වන අතර, එය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවකි.

5. එක් සේවාවක් සඳහා පමණක් නොව, සමස්ත රාජ්‍ය සේවයේ උන්නතිය වෙනුවෙන් රජය කටයුතු කරමින් සිටින අතර, එය ඉදිරියේදී තවදුරටත් වඩා විධිමත්ව සහ ක්‍රමවත්ව සිදු කිරීමට කටයුතු කරනු ඇත. උදාහරණයක් වශයෙන්, සංවර්ධන නිලධාරීන් ඇතුළු රාජ්‍ය සේවයට ලබා දුන් පොරොන්දුවක් අනුව, 2025 ජනවාරි පළමුවැනිදා, 2026 ජනවාරි පළමුවැනිදා සහ 2027 ජනවාරි පළමුවැනිදාට විශේෂ වැටුප් වැඩි කිරීම් කරලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ ඉල්ලීම්වලට යම් සාධාරණ විසඳුම් ලබා දී තිබෙනවා. තවත් ගැටලු තිබෙනවා නම් ඒවා විසඳීමටත් අපි කටයුතු කරනවා.

6. වෘත්තීය සමිති නියෝජනය මඟින් ඉදිරිපත් කරනු ලබන කරුණු අවධානයට ගැනීමටත්, සුදුසු සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමටත් රජය කටයුතු කරන අතර, ගැටලු සහිත අවස්ථා පවතී නම් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට නොපැකිළිව කටයුතු කරනු ලැබේ. ඒ අනුව මෙතෙක් ඔවුන් කළ ඉල්ලීම්වලට අනුව අපි සාකච්ඡා ලබා දීලා තිබෙනවා. තව ඉදිරියටත් අවශ්‍ය නම් ඉල්ලීමක් කළොත් සාකච්ඡාවක් ලබා දීමට අපි පසුබට වන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You may seek a brief clarification, Hon. Member.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කෞරව අමෙච්සර් අවර්කලේ, නීංකල් අපිවිරුත්ති උත්තියෝකත්තර්කලින් එණ්ණික්කෛ 78,710 එන්රු සොල්කින්රීර්කල්. අවර්කළුටෙය පිරතාන කේල්වි එන්නවෙන්රාල්, අපිවිරුත්ති උත්තියෝකත්තර්කළාක නියනම් පෙට්ර තාංකල්, අපිවිරුත්ති උත්තියෝකත්තර්කළාකවේ ඔය්වුපෙර වේණ්ටුමා? එන්පතුතාන්. කෞරව අමෙච්සර් අවර්කලේ, ඉතු නියායමානතොරු කේල්වි! අවර්කල් කේට්පතු එන්නවෙනිල්, MN 7 categoryක්කුච් චෙල්වතර්කාක exam ඔන්රෛ නටාත්තුමාරුතාන්. අතෛ ඒන් නටාත්ත මුටියාතු? මේලුම්, අපිවිරුත්ති උත්තියෝකත්තර් චේවෛක්කාන Service Minutesඉත් තිරුත්තියමෛත්තාල්තාන්, අවර්කළාල් පතවි උයර්වුකළෛප් පෙට්රු අටුත්තටුත්ත පතවිනිලෛකළුක්කුප් පෝකලාම්. ඉවර්රෛ අටිප්පටෛයාක වෛත්තු, පුතිතාකක් කුළුවොන්රෛයාවතු නියමිත්තු තීර්වුකාණ වේණ්ටුම්. ඉවෛ එල්ලාම් තේසිය මක්කළ් චක්ති අරචාංකත්තින් කාලප්පකුතියිල් වළංකප්පට්ට වාක්කුරුතිකළ්! ඉන්ත වාක්කුරුතිකළෛ නිරෛවේර්ර වේණ්ටිය පොරුප්පු කූටුතලාක ඉන්ත අරචාංකත්තුක්කුත්තාන් ඉරුක්කින්රතු.

ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ කාරණා සම්බන්ධයෙන් වහාම මැදිහත්වෙලා විසඳුමක් ලබා දෙන්න. ඔබතුමා සඳහන් කළා, සංවර්ධන නිලධාරීන්ට MN 7ට යන්න ක්‍රමවේදයක් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, would you shorten it please?

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සහ ඒගොල්ලන් කියපු කාරණා පරස්පර විරෝධියි. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සඳහා මැදිහත්වීමක් කරන්න කියලා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you may reply.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොටත් මේ සංවර්ධන නිලධාරි තනතුරේ කටයුතු කරමින් පාසල්වල ඉගැන්වීම් කටයුතු කරන සංවර්ධන නිලධාරීන්ට ගුරු සේවයට ඇතුළත් වෙන්න අවශ්‍ය නම් ඊට අදාළ විභාග අපි පවත්වා තිබෙනවා. ඒගොල්ලන් සංවර්ධන නිලධාරි තනතුරේම ඉන්න ඕනෑය කියලා එකක් නැහැ. ඒගොල්ලන්ට අවශ්‍ය නම් වෙනත් තනතුරුවලට යන්න පුළුවන්. අපි මේ වනකොට රාජ්‍ය නිලධාරීන්ගේ සහ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා සම්බන්ධව සොයා බලන්න "රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව" පිහිටුවා තිබෙනවා. මේ සේවය සම්බන්ධයෙන් තිබෙන ගැටලු ඒකට ඉදිරිපත් කරන්න ඔවුන්ට පුළුවන්. ඒ අනුව ඔවුන්ගේ සේවයට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගන්න අපි කටයුතු කරනවා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL

"(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසිනි.

2026 නොවැම්බර් 17වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் சார்பாக மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2026 நவம்பர் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Nalinda Jayatissa on behalf of the Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 17th November, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, what is your point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29(1) සහ (2) යටතේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කළා. මම ඒක personally භාර දුන්නා, කථානායකතුමාගේ කාර්යාලයේ සම්බන්ධීකරණ නිලධාරිතුමාට. ඒ වාගේම මම ඒක ඔබතුමාටත් භාර දුන්නා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කියලා. විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන අයිතිය, යෝජනා කරන්න තිබෙන අයිතිය, ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුව තුළ කථානායකවරයාට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්න තිබෙන අයිතිය කියන කාරණාවලට අදාළව තමයි මම ඒ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒ නිසා කරුණාකරලා විපක්ෂ නායකවරයා හැටියට මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මට ඒ වරප්‍රසාද ප්‍රශ්නය මේ මොහොතේ පාර්ලිමේන්තුවේදී මතු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, for your information, there were five Questions of Privilege that were brought to our notice. You handed over one to me, and the Hon. Dayasiri Jayasekara also handed over one after I came to the Chair. But, these have to be gone through and studied. I mean, it is not humanly possible for all of these to be gone through now because all of them were handed over after 9.00 a.m. today.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
No, no. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is what I was told by the Speaker's Office.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will let one of you to speak. I will listen to the Hon. Leader of the Opposition.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න වෙලාවක් ඉල්ලුවාම, උදේ 09.15ට කථානායකවරයාගේ office එකට එන්න කිව්වා. ඒක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න වෙලාවක් ලබා ගන්නවා, කථානායකතුමාගෙන්. උදේ 09.15ට අපි ඒක භාර දුන්නා. එතකොට ඔබතුමාවත්, කථානායකතුමාවත් හිටියේ නැහැ, කාමරයේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ, පොඩ්ඩක් ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let me comment because you mentioned my name now.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේක ඔබතුමාට භාර දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I was in the office from 8.15 this morning.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
We did not know that. - *[Interruption.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නේ නැහැ, කථානායකතුමා අද එනවාද, නැද්ද කියලා. මට වෙලාවක් දීලා තිබුණේ, පෙර වරු 09.15ට වරප්‍රසාද ප්‍රශ්නය භාර දෙන්න. එතකොට අපි කොහොමද දන්නේ, ඔබතුමා තමයි මුලසුන දරන්න එන්නේ, ඒ නිසා ඔබතුමාගේ office එකට එන්න ඕනෑය කියලා? අපි කොහොමද ඒක දන්නේ? ඒ නිසා කරුණාකරලා මේ වෙලාවේ මට මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්න අවස්ථාව ඕනෑ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Dayasiri Jayasekara?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු කථානායකතුමාගේ කාර්යාලයට ගිහිල්ලා මේ Privilege matter එක භාර දුන්නේ නවයට දහයක් තිබියදී. ඔබතුමා මෙතැනට ආවාට පස්සේ තමයි අපි දැනගත්තේ අද කථානායකතුමා එන්නේ නැහැ කියලා. අපි දන්නේ නැහැ, මොකක්ද හේතුව කියලා. නමුත් එතුමා ඇවිල්ලා නැහැ. අපි කලින් දන්නවා නම් අද ඔබතුමා තමයි මුලසුන දරන්න එන්නේ කියලා, ඔබතුමා ළඟට ඇවිල්ලා මේක භාර දෙනවා. ඊට පස්සේ ඔබතුමාව දැක්කාට පසුව මම ආයෙත් දුවගෙන ගිහිල්ලා තව එකක් ඔබතුමාට භාර දුන්නා. ඒ නිසා ඒක අදාළ වන්නේ නැහැ, නවයට දහයක් තිබියදී මම මෙය භාර දීලා තිබෙන්නේ. Therefore, I humbly request for your permission to raise this Privilege issue. මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා. කරුණාකරලා මට මේක කියවන්න අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, even I have not had time to go through it. I have not gone through it. I can see that it has four pages.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කවුද mike එක off කරන්න කිව්වේ? Mike එක දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට කලිනුත් - මීට මාසයකට විතර කලින් - මේ හා යම් සමානතාවක් තිබෙන ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. අදටත් ඒක වනගත වෙලා තිබෙන්නේ. ඒකට වෙච්ච දෙයක් නැහැ. ඒක කුණු කූඩයට ගිහිල්ලාද, නැත්නම් ජයලත් මහත්තයා තවම ඒක බල බලා ඉන්නවාද කියලා අපි දන්නේ නැහැ. ජයලත්ද මේක බලන්නේ, නැත්නම් ලේකම් මණ්ඩලයද මේවා ගැන බලන්නේ? මේක පුදුම ප්‍රශ්නයක්. ඔබතුමන්ලා අවසර ගන්න ඕනෑ සහ යම් කිසි විධියකට මේ අයගෙන් - ලේකම් මණ්ඩලයෙන් - අදහස් විමසන්න ඕනෑ. ලේකම් මණ්ඩලයෙන් ඇහුවාම කියනවා, අපට තවම මොකුත් කියන්න බැහැලු. එහෙම වැඩ කරන්න පුළුවන්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ජයලත් ද මේක පාලනය කරන්නේ?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ජයලත් ද පාලනය කරන්නේ, මේ පාර්ලිමේන්තුව?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, why are you on your feet? I guess you also had submitted a matter of Privilege.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Hon. Deputy Speaker, මම මගේ වරප්‍රසාද ප්‍රශ්නය භාර දුන්නේ පෙර වරු 9.00ට කලින්. නමුත්, Standing Ordersවල තිබෙන්නේ සභාව පටන් ගන්න කලින් වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න ඕනෑය කියලායි. ඒකේ වෙලාවක් සඳහන් කරලා නැහැ. ඒ කෙසේ වෙතත්, අපි උදේ 9.00ට කලින් භාර දීලා තිබෙනවා.

ඊළඟට, ප්‍රධාන කාරණාව මෙකයි. කථානායකතුමා අද සභාවේ මුලසුන දරන්නේ නැහැ කියලා අපි දන්නේ ඔබතුමා මුලසුනට පැමිණියාට පසුව. කථානායකතුමා එන්නේ නැහැ කියන එක කලින් අපට දන්වා තිබුණා නම්, අපට ඔබතුමාගේ කාර්යාලයට ඇවිල්ලා මේක භාර දෙන්න තිබුණා. නමුත්, Hon. Deputy Speakerට Privilege issues භාර දෙන්න ඕනෑය කියලා Standing Ordersවල කොහේවත් නැහැ. ඒ නිසා අපි නීත්‍යානුකූල ක්‍රමයට කථානායකතුමාගේ කාර්යාලයට උදේ 9.00ට කලින් භාර දීලා තිබෙනවා. ඒ නිසා මේ Privilege issue එක ගන්න ඉඩ දෙන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
භය වෙන්න එපා, මේක කියවන්න දෙන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ajith P. Perera?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට හේතුව වුණේ මේකයි. විශ්වාස භංග යෝජනාවක් කථානායකතුමාට විරුද්ධව භාර දුන්නා, රාජ්‍ය දේපළ අවභාවිතය සම්බන්ධ චෝදනා 17ක්, අල්ලස් විමර්ශනවලට අදාළ චෝදනා 20ක් සහ අපක්ෂපාතිත්වය බිඳ වැටීම සම්බන්ධව චෝදනා 13ක් වශයෙන් චෝදනා 50ක් ඉදිරිපත් කරලා. මේ තරම් බරපතළ කාරණයක් ඉදිරිපත් වෙලා තිබියදී ඒ විශ්වාස භංග යෝජනාව අද දින විවාද කරන්නේ නැතිව ඒ පිළිබඳව සම්පූර්ණයෙන් පසෙක දමා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඔබතුමා සභාවේ මුලසුන දරන්නේ කථානායකතුමා ඉල්ලා අස් වෙලාද? කථානායකතුමා මේ චෝදනා භාර ගන්නවාද, කථානායකතුමා ධුරයෙන් ඉවත් වෙනවාද? අපි දැනගත්තා, කථානායකතුමා ඉල්ලා අස් වෙන්න යනවා කියලා. කමක් නැහැ. කථානායකතුමා ඉල්ලා අස් වෙනවා නම් අපි ඒක භාර ගන්නවා. *[බාධා කිරීම්]* හැබැයි, මේ විශ්වාස භංග යෝජනාව විවාද කරන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව උත්තර දෙන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ කරුණු විමර්ශනය කරන්න *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, I have given an opportunity to everybody. - *[Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.- *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara? - *[Interruption.]* Next, I will come to you, Hon. Leader of the Opposition.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාස භංගය *sub judice* කියලා පැත්තකට වීසි කරන්න හදන්නේ. මේක එහෙම *sub judice* නැහැ. තවම මේ නඩුව අරගෙනවත් නැහැ. *[බාධා කිරීම්]* අපේ නීතිඥ මහත්වරුන් ගිහිල්ලා සොයා බැලුවා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න අය කියනවා තවම මේක support, - *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leder of the Opposition.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගොඩ පෙරකදෝරුවෝ. *[බාධා කිරීම්]* ගොඩ පෙරකදෝරුවෝ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Dayasiri Jayasekera, I have listened to you. Now, let me listen to the Hon. Leader of the Opposition.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමාගේ office එකෙන් මට දැනුම් දී තිබුණා, මගේ වරප්‍රසාද ප්‍රශ්නය භාර දෙන්න අද උදේ 09.15ට එන්න කියලා. ඒ වරප්‍රසාද ප්‍රශ්නයට අඩංගු වන්නේ කථානායකවරයාට විරුද්ධව ගෙනෙන විශ්වාස භංග යෝජනාව බොරු රීතියක් ඉදිරිපත් කරලා විවාදයට නොගැනීම පිළිබඳවයි. මම අද උදේ 09.15ට කථානායකතුමාගේ office එකට ආවා. එතුමා එනතුරු උදේ 09.20 වෙනකම් බැලුවා. උදේ 09.25ට එය කථානායකතුමාගේ සම්බන්ධීකරණ ලේකම්තුමාට භාර දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභා ගර්භය ඇතුළට ආවාට පස්සේ තමයි ඔබතුමා කථානායක පුටුවට එන්නේ කියලා අපි දැනගත්තේ. ඊට පස්සේ අපි එය ඔබතුමාටත් භාර දුන්නා. ඒ නිසා කරුණාකරලා මේ අවස්ථාවේදී මගේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්න ඉඩ දෙන්න. කරුණාකරලා ඉඩ දෙන්න. *[බාධා කිරීමක්]* කරුණාකරලා ඉඩ දෙන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, I rise to a point of Order. *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, you gave me your matter of Privilege after I came to the Chair. I agree with what you said but I have not even gone through it. So, I cannot let it be taken up in the House. - *[Interruption.]* In the course of today, this will be gone through and you will be informed when this could be taken up. - *[Interruption.]* Hon. Rasamanickam, what brings you to your feet?

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rasamanickam, please make it brief. I can see you standing up there.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Allow me not to be brief, Sir. මට විනාඩියක් දෙන්න.

ස්ථාවර නියෝග 29 (1) යටතේ තිබෙනවා, "පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට සෘජුවම අදාළ හදිසි යෝජනාවකට අනෙකුත් සියලු යෝජනා සහ දිනට නියමිත කටයුතුවලට වඩා ප්‍රමුඛතාව හිමි වේ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ස්ථාවර නියෝග 29 (2)හි තිබෙන්නේ Division එකක්, නැත්නම් Privilege issue එකක් හැම අවස්ථාවකදීම priority එකක් වෙනවා කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, I understand what you are saying.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. මුලසුනට දැනුවත් කරන්න කියලා තිබෙනවා මිස,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Anyway, Hon. Members of the Opposition on your feet, I can tell - *[Interruption.]* Hon. Mujibur Rahuman, I will give you one minute. I gave you some time earlier, too.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමාට විරුද්ධව ගෙනෙන විශ්වාස භංග යෝජනාව අද දින Order Paper එකට ඇතුළත් වෙලා තිබෙනවා කියන එක අපි සියලුදෙනාම දැනගෙන හිටියා. කථානායකතුමා ඊයේ මාධ්‍යයට කිව්වා, විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න, එතුමා ඒකට මුහුණ දෙන්න ඕනෑම වෙලාවක ලැහැස්තියි කියලා. කථානායකතුමා එහෙම කියනවා නම් කවුද මේක Order Paper එකෙන් අයින් කරන්නේ? *[බාධා කිරීමක්]* කවුද, මේ අදෘශ්‍යමාන බලවේගය? කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ නැතුව ඉන්නේ ඇයි? *[බාධා කිරීම්]* කථානායකතුමා එකඟ නම් අපි විශ්වාස භංග යෝජනාව පිළිබඳව විවාද කරමුකෝ. ඇයි, ඒකට භය වෙන්නේ? *[බාධා කිරීම්]* ඇයි, ඔයගොල්ලන් ඒක ගෙනෙන එක නවත්වන්නේ? *[බාධා කිරීම්]* කාටද වුවමනාව තිබෙන්නේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන එක නවත්වන්න? *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members of the Opposition on your feet, please give ear to me. - *[Interruption.]* This matter of Privilege was submitted to me. I have not been able to go through it. Without going through that, I cannot allow it to be taken up. - *[Interruption]* This will be gone through in the course of the day and may be taken up tomorrow. - *[Interruption.]*

Item No. 2 under Notice of Motions, the Hon. Chief Government Whip. -*[Interruption.]*

[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් පුවරු ප්‍රදර්ශනය කරමින් නැඟී සිටියහ.]

[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் பதாகைகளைக் காட்சிப்படுத்தியவாறு எழுந்து நின்றனர்.]

[At this stage, some Hon. Members of the Opposition rose, displaying placards.]

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition? - *[Interruption.]* No, I will listen to him. - *[Interruption.]* I will just listen to the Hon. Leader of the Opposition. Other! Hon. Members, please take your seats. Let him represent you all. Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ වරප්‍රසාද ප්‍රශ්නය භාර දීම පිළිබඳව කථානායක කාර්යාලයෙන් මට වෙලාවක් දුන්නා. ඒ, අද උදේ 09.15ට. උදේ 09.15ට කථානායකතුමා කාර්යාලයේ හිටියේ නැහැ. උදේ 09.20ටත් නැහැ, කථානායකතුමා. උදේ 09.25ටත් නැහැ. ඒ නිසා මගේ වරප්‍රසාද කඩවීමක් වෙලා තිබෙනවා. මට මේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]* අපිව එහෙම නොමහ යවන්න බැහැ. *[බාධා කිරීම්]* එහෙම රවටන්න බැහැ. *[බාධා කිරීම්]* මේ පාර්ලිමේන්තු ක්‍රමවේදය අනුගමනය කරන්න ඕනෑ. අපිට ඒ අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, how many points of Order have been raised? Who I am going to listen to? It is not even robotically possible for me to listen to any one of you all. - *[Interruption.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.-*[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Harsha de Silva. - *[Interruption.]* I gave you time earlier, Hon. Member.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, may I suggest that you suspend this House for 10 or 15 minutes? Then, you can study this. After your studying it, we can reconvene.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
And, allow the matter of Privilege.-*[Interruption.]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Yes, allow the matter of Privilege. Under Standing Order No. 29, Sir, you are obliged to allow it to be taken up. So, why do we not suspend the House? - *[Interruption.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Chief Government Whip? Could we please listen to him? *[Interruption.]* The Chief Government Whip is on his feet.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (2) අනුව මූලාසනයේ අවසර ලබා ගත යුතුයි, මේ ප්‍රශ්නය සාකච්ඡා කරන්න. ඔබතුමා කියපු හැටියට, ඒ සඳහා කල් අරගෙන පිළිතුරක් ලබා දෙන්න. අපි සාමාන්‍ය විධියට සභාවේ කටයුතු කරගෙන යමු. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.- *[Interruption.]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.- *[Interruption.]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.- *[Interruption.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have informed the Hon. Leader of the Opposition of my stance on this; I have informed you in the best possible way. These five matters of Privilege are not even robotically possible for me to go through. - *[Uproar.]* Leave alone what happened earlier, but it is not possible for me to go through them. So, these will be gone through and in the course of the day, I will let you know. - *[Uproar.]* Okay, Hon. Members, I have given enough time for all of you to voice your concerns.

We will now move onto the next Item in today's Order Paper. - *[Uproar.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Uproar.]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Item is to be moved by the Hon. Thanura Dissanayake. - *[Uproar.]*

Hon. Members of the Opposition, I have listened to you. I have told you about my difficulty. -*[Uproar.]* I understand you all. It is also time for you to understand my stance. - *[Uproar.]*

The Hon. Thanura Dissanayake. - *[Uproar.]*

[මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු පිරිසක් පුවරු ඔසවාගෙන සහ ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் பதாகைகளை ஏந்தியவாறு சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமிட்டனர்.]
[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar displaying placards.]

1983 කළු පැලි ඛේදනීය සිදුවීම හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

1983 கறுப்பு யூலை துன்பியல் சம்பவம் மற்றும் அதன் தாக்கங்கள் குறித்து முழுமையான ஆய்வொன்றை மேற்கொண்டு அறிக்கையிடுவதற்கும் தேசிய சகவாழ்வை உறுதிப்படுத்துதல் மற்றும் பாதிக்கப்பட்ட தரப்பினருக்கு நிவாரணம் வழங்குவது தொடர்பான அதன் முன்மொழிவுகளையும் பரிந்துரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு

SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY AND REPORT ON THE TRAGIC INCIDENT OF BLACK JULY OF 1983 AND ITS IMPACT AND TO SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS TO PARLIAMENT ON ENSURING NATIONAL HARMONY AND PROVIDING RELIEF TO THE AFFECTED PEOPLE

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු තනුර දිසානායක මහතා
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
ගරු ගයාන් ජනක මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා

ගරු ගමගෙදර දිසානායක මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
ගරු චමින්ද ලලිත් කුමාර මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු එරංග වීරරත්න මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය
ගරු කංචන වැලිපිටිය මහතා
ගරු ආර්.ජී. විජේරත්න මහතා
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
ගරු මුහම්මද් ෆයිසාල් මහතා
ගරු සුනිල් බියන්විල මහතා
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු සුගත් තිලකරත්න මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු කේ. ඉලංකුමාරන් මහතා
ගරු ආනන්ද විජේපාල මහතා
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරුකන්දසාමි ප්‍රභු මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
ගරු එරංග ගුණසේකර මහතා
ගරුආර්.එම්. සමන්ත රණසිංහ මහතා
ගරු සංජීව රණසිංහ මහතා
ගරු රියාස් ෆාරූක් මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,- 1983 කළු ජූලි බෙදනීය සිදුවීම හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,- 1983 වසරේදී සිදු වූ කළු ජූලිය හේතුවෙන් දශක කිහිපයක් තිස්සේ රටක් ලෙස ආර්ථික, සමාජීය, සංස්කෘතික වශයෙන් ආපස්සට ඇද දමන ලදුව, ඒ හේතුවෙන් වටිනා ජීවිත දහස් ගණනක් අහිමි වූ අතර, දැවැන්ත දේපළ හානියක් ද සිදු වූ අතර ආර්ථික වශයෙන් ද දැවැන්ත පසුබෑමකට ලක් වූ හෙයින් ද;

එම භෞතික හානියට වඩා රටට සිදු වූ බරපතළම සහ විනාශකාරී හානිය වන්නේ ජන කොටස් අතර නොසන්සුන්තාව, බිය හා සැකය වර්ධනය වීම හෙයින් ද;

ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම භේදවාචකයක් ලෙස සැලකෙන 1983 කළු ජූලි සිදුවීමෙන් සිදු වූ ජීවිත හානි, දේපළ හානි හා ජනතාවට සිදුව ඇති මානසික හා සමාජීය හානිය මෙතෙක් නිසි ලෙස තක්සේරු කර නොමැති හෙයින් ද;

මෙවැනි ජාතිවාදී හා අර්බුදකාරී සිදුවීම් අනාගතයේදී නැවත සිදුවීම වළක්වා ගැනීම සඳහා ශක්තිමත් නීතිමය, සමාජීය හා සංහිඳියා යන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකාව තුළ විවිධ ජාතීන් අතර පවතින විශ්වාසය සහ සුහදතාව බිඳ වැටෙන ආකාරයේ ක්‍රියාකාරකම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබෙන හෙයින් ද;

එම සිදුවීම් සඳහා හේතු සාධක වූ කරුණු සහ එම විනාශකාරී ක්‍රියාවන් මෙහෙය වූ පුද්ගලයින් අනාවරණය කරගත යුතු හෙයින් ද;

එම සිදුවීමෙන් පීඩාවට පත් සහ අගතියට පත් වූ සමස්ත ජනතාවගේ සිත් පැදීම් උදෙසා සහ ඔවුන් වෙත යම්කිසි සාධාරණ සහනයක් හෝ ගෞරවනීය සුවපත් කිරීමේ පියවර ලබා දීම රාජ්‍යයක වගකීමක් වන හෙයින් ද;

1983 කළු ජූලි බෙදනීය සිදුවීම් හා එහි බලපෑම් පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම් පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට -

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ පළමුවෙනි වතාවට 1983 කළු ජූලිය වෙනුවෙන්, ඒ ජනතාවට සහන සැලසීම වෙනුවෙන්, ජාතික සමගිය වෙනුවෙන් මෙවැනි විශේෂ කාරක සභාවක් යෝජනා කරන මේ අවස්ථාවේදී, මෙවැනි සංවේදී කටයුත්තක් සිදු වෙන අවස්ථාවේදී මේ රටේ විපක්ෂයේ හැසිරීම බලන්න කියලා මම මේ රටේ ජනතාවට ආරාධනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තූතියි. [සෝෂා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Bhagya Sri Herath to second the Motion.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව මා ස්ථිර කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ඒ වාගේම, ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න මා අවස්ථාව ඉල්ලා සිටිනවා. කාලාන්තරයක් තිස්සේ - *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Could we have a little silence, please? I cannot hear anything. Would you all stop your noise, Hon. Members? Let me have silence first. - *[Uproar.]*

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේම හිටපු මේ රට පාලනය කළ සමහර කණ්ඩායම් - *[සෝෂා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, I will give you a minute to raise your point of Order. Hon. Members, please be silent!

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා ඔබතුමා කථානායකතුමා වාගේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරන්න එන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, I gave you time.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ස්ථාවර නියෝග 29 (1) සහ 29 (2) අනුව ඔබතුමා අවස්ථාව දෙන්න, අපේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, අපේ කටවල් වහන්න එන්න එපා. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Do not make accusations here. Please, do not do that.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
So, that is why I have given you time.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි, මට වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න අවස්ථාව දෙන්න. මගේ වරප්‍රසාද ප්‍රශ්නය, - *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Adjournment of the House, the Hon. Chief Government Whip.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
Hon. Deputy Speaker, I move,

"That the Parliament do now adjourn." - *[Uproar.]*

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have been so reasonable here. I do not like false accusations. - *[Uproar.]*

The Hon. Ruwan Wijeweera to move the Adjournment Motion.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෑත කාලීනව මැද පෙරදිග කලාපයේ ඇති වූ යුධමය හා භූ-දේශපාලනික නොසන්සුන්තාවන් හමුවේ වුවද, ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය ලැබූ වර්ධනය - *[සෝෂා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Could I have one person speaking? Just stop this, please! If you want me to listen to you, Hon. Leader of the Opposition, you have to stop your Members from making this noise. Otherwise, I could not listen to anybody, obviously!

අන්න, විපක්ෂ නායකතුමා කියනවා නවත්වන්න කියලා.Ah, that is better.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, you can make it better.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, you should be better.

Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේත් ස්ථාවර නියෝග උල්ලංඝනය කරලා සභාව adjourn කරන්නට ඉස්සෙල්ලා යෝජනාව ඉදිරිපත් කළා. එහෙම කරන්නේ කොහොමද? ඒකත් වැරදියි. සභාව කල් තබන්න ඉස්සෙල්ලා කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළා, ඒක කියෙව්වා, ඒක ස්ථිරත් කළා; ඒකත් වැරදියි. -*[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, with all this noise here, we do not hear what is being said. So, if the noise could be stopped, there will be more order here. - *[Uproar.]* Nobody understands me! - *[Uproar.]* If this noise could be stopped, there could be more order and sanity here. - *[Uproar.]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I rise to a point of Order, Hon. Deputy Speaker. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ravi Karunanayake? I see you standing now for the first time. All the other Hon. Members have been standing. What is your point of Order, Hon. Ravi Karunanayake? Make it brief.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, as you know, there was a Meeting of the Committee on Parliamentary Business. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I cannot hear anything. - *[Uproar.]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, there was a Meeting of the Committee on Parliamentary Business last Friday. On that day, it was discussed that the No-Confidence Motion would be taken up today. Also in the process, there was a Private Members' Motion mentioned. At the same time, I mentioned about the appointment of a Select Committee related to the Youth Commission - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, I cannot hear anything.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You are controlling the House, Hon. Deputy Speaker. You are the Speaker to be; you are going to be the Speaker. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
But what can I do with this noise? Let us have some sanity here, Hon. Members. - *[Uproar.]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, last Friday, we had a Meeting of the Committee on Parliamentary Business.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

And your good self was presiding. At that particular moment, we all discussed that the No-Confidence Motion would be taken up, but there was a dispute. At that particular moment, the appointment of the Select Committee, - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, of the outcome of the Committee on Parliamentary Business, you know because you were there. The Government had its stand and you all had your stand. So, that is how it concluded. - *[Uproar.]*

May I call upon the Hon. Ruwan Wijeweera to move the Adjournment Motion of the Day.

ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා අපනයනකරුවන්ට මූල්‍ය සහන
உலகளாவிய சவால்களை எதிர்கொள்வதற்காக ஏற்றுமதியாளர்களுக்கு நிதி நிவாரணம்
FINANCIAL RELIEF FOR EXPORTERS TO FACE GLOBAL CHALLENGES

[ප.භා. 11.45]

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා: *[සෝෂා කිරීම්]*

"මෑත කාලීනව මැද පෙරදිග කලාපයේ ඇති වූ යුද්ධය හා භූ-දේශපාලනික නොසන්සුන්තාවන් හමුවේ වුවද, ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය ලැබූ වර්ධනය සහ අපනයන ආදායම ඉහළ යාම කෙරෙහි මෙම පාර්ලිමේන්තුවේ ප්‍රශංසනීය අවධානය යොමු විය යුතුය.

ගෝලීය සැපයුම්දාමයන්හි බාධා සහ නාවික ගාස්තු ඉහළ යාම් පැවතියද, මෙරට අපනයනකරුවන්ගේ කැපවීම සහ නම්‍යශීලිභාවය හේතුවෙන් ඇහලුම්, තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ සේවා අපනයනයන්හි ධනාත්මක වර්ධනයක් සටහන් කිරීමට ශ්‍රී ලංකාවට හැකි වී ඇත. මෙම ප්‍රගතිය ඉදිරියට පවත්වා ගෙන යෑම සහ ඩොලර් බිලියන ගණනක ජාතික අපනයන ඉලක්ක සපුරා ගැනීම උදෙසා අපනයන ක්ෂේත්‍රය වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය සහ දිරිගැන්වීම් තවදුරටත් පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

එබැවින්, ගෝලීය අභියෝග හමුවේ-"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට ඉස්සරහට යන්නේ ගෝලීය අභියෝග හමුවේයි. *[සෝෂා කිරීම්]*

"එබැවින්, ගෝලීය අභියෝග හමුවේ අපනයනකරුවන් මුහුණ දෙන ප්‍රවාහන හා රක්ෂණ පිරිවැය පාලනයට සහන සැලසීමටත්, නව වෙළෙඳ පොළවල් හඳුනා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන අපනයනය දිරිමත් කිරීමටත්, අපනයන නියාමන ක්‍රියාවලින් ඩිජිටල්කරණය කරමින් අපනයනකරුවන්ට අවශ්‍ය යටිතල පහසුකම් කඩිනමින් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා රටක් විධියට අප මේ ලබාගෙන තිබෙන ආර්ථික ස්ථාවරභාවය- *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලබාගෙන තිබෙන ආර්ථික ස්ථාවරභාවය සඳහා අපේ රටේ අපනයන ක්ෂේත්‍රය,- Hon. Deputy Speaker, our export sector has done a good job and made a very efficient contribution to create a better economy and to take the country forward. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම කියන්නට කැමැතියි, අපේ රටේ- *[සෝෂා කිරීම්]* අපේ රටේ ආර්ථිකය ගැන සලකා බැලීමේදී මේ "හූ" කියන විපක්ෂයට කියන්න තිබෙන දේ තමයි, 2024 මුල් මාස 9දී අපේ රටේ තිබුණේ ඩොලර් බිලියන 12ක වාගේ අපනයන ආර්ථිකයක් කියන එක. *[සෝෂා කිරීම්]* ඒ ඩොලර් බිලියන 12ක් පමණ වූ අපනයන ආර්ථිකය 2026 මුල් මාස 9දී ඩොලර් බිලියන 13.9ක් දක්වා ඉදිරියට අරගෙන ඇවිත් තිබෙනවා. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අපනයන ආර්ථිකය, අපේ රටේ අපනයන ගැන සලකා බැලීමේදී, අපේ රටේ අපනයනවල ප්‍රධාන ගමනාන්ත ගත්තොත්, අපේ රටේ අපනයන ගමනාන්තවල මේ වනකොටත් ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, එංගලන්තය වාගේ රටවල් ඉදිරියෙන්ම ඉන්නවා. *[සෝෂා කිරීම්]* විශේෂයෙන්ම ගත්තොත්, අපේ රටේ අපනයන ආර්ථිකය- *[සෝෂා කිරීම්]* අපේ රටේ අපනයන ආර්ථිකය ඉහළ නැංවීම සඳහා විශිෂ්ට කාර්යභාරයක් සහ දායකත්වයක් දක්වනු ලබන ආර්ථිකයේ අංශ ගණනාවක් තිබෙනවා. *[සෝෂා කිරීම්]* අපේ රටේ අපනයන ආර්ථිකය වර්ධනය කිරීම සඳහා දායකත්වය දුන් ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. *[සෝෂා කිරීම්]* ඒවා අතරින් කිහිපයක් කෙරෙහි මගේ අවධානය යොමු කරන්නට මම කැමැතියි. විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික සංරචකවලින් අපේ රටේ අපනයන ආර්ථිකයට කරන ලද දායකත්වය සියයට 61කින් පමණ ඉහළ නංවන්නට අපේ රටේ EDB එක ඇතුළු කර්මාන්ත අමාත්‍යාංශයට හැකි වී තිබෙනවා. *[සෝෂා කිරීම්]* ඒ විතරක් නොවෙයි. *[සෝෂා කිරීම්]* අපේ රටේ තිබෙන කුළු බඩු, සුගන්ධ තෙල් වැනි දේවල් ගත්තොත්, ඒවායේ තිබෙන ආර්ථික දායකත්වය සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ නංවන්නට හැකි වී තිබෙනවා. *[සෝෂා කිරීම්]* ඒ විතරක් නොවෙයි. *[සෝෂා කිරීම්]* ආහාර පාන වර්ග, රබර් ආශ්‍රිත නිෂ්පාදන වැනි දේවල් සලකා බැලීමේදී ඒ හැම දෙයක්ම ආර්ථිකයට විශිෂ්ට දායකත්වයක් දක්වා තිබෙනවා සහ අපනයන ආර්ථිකය ඉහළ නංවන්නට දැවැන්ත කාර්යභාරයක් කර තිබෙනවා. *[සෝෂා කිරීම්]* මම මෙතැනදී මේ කාරණය කෙරෙහිත් අවධානය යොමු කරවන්නට කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[සෝෂා කිරීම්]* රටක් විධියට අප මේ අපනයන ආර්ථිකයේ විශිෂ්ටත්වය ඇති කරගෙන තිබෙන්නේ, ඩොලර් බිලියන 13.9ක් දක්වා අපේ රටේ අපනයන ආර්ථිකය අරගෙන ඇවිල්ලා තිබෙන්නේ ඉතාම අභියෝගකාරී තත්ත්වයක් මධ්‍යයේයි. *[සෝෂා කිරීම්]*

Hon. Deputy Speaker, I would like to draw the attention of this House to the challenges and the obstacles we have faced as a nation throughout this period. I will take them up one by one. අප මුහුණ දී තිබෙන අභියෝග සහ කම්පන ගත්තොත්, අපි ඒවා අභ්‍යන්තර සහ බාහිර වශයෙන් කොටස් දෙකකට බෙදෙනවා.

විශේෂයෙන්ම ගත්තොත්, මට මතකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[සෝෂා කිරීම්]* මේ කෑ ගහන විපක්ෂය- *[සෝෂා කිරීම්]* මේ කෑ ගහන විපක්ෂය; ඔබතුමාට බාධා කරන විපක්ෂය; මේ රටේ ආර්ථික සමෘද්ධියට වින කරන්න කැසකවන විපක්ෂය අපේ රටේ ආර්ථික අර්බුදය එනකොට,- *[සෝෂා කිරීම්]* මට මතකයි, 2025 අප්‍රේල් මාසයේ US tariff එකක් අපේ රටට

පැනවූවා. *[සෝෂා කිරීම්]* ඒ කියන්නේ, ඇමෙරිකා එක්සත් ජනපදය අපේ රටට තීරු බදු පැනවූවා. *[සෝෂා කිරීම්]* ඒ අර්බුදය ආපු වෙලාවේදී මේ කෑ ගහන විපක්ෂය සිනාමුසු මුහුණින් මේ සභාවට ආවා. *[සෝෂා කිරීම්]* ඒ අය විශ්වාස කළා, ඒ අර්බුදය හමුවේ රටේ ආර්ථිකය කඩා වැටෙයි කියලා. *[සෝෂා කිරීම්]* එහෙම නම්, ඔතැන කෑ ගහන්නේ වෙන කවුරුවත් නොවෙයි, මේ රට වැටෙන කල් බලාගෙන ඉන්න,- *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ruwan Wijeweera, your time is up. - *[Uproar.]*

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Sir, finally, I would like to tell you that, therefore, it is clear that there have been a lot of obstacles from 2024. - *[Uproar.]* The first one was the US tariff issue. When that was happening, I can still remember, this Opposition, who are shouting, disturbing and making a mockery of the nation, came to this House in that same spirit and it was disgusting. The behaviour of the Opposition is disgusting. Everybody in this country could see what their behaviour is. Sir, we, as a nation, are facing many issues with global supply chains being disrupted and the global economy facing severe and critical challenges. So, such issues are there; there are a lot of issues to be solved. But, this Opposition is causing damage to the nation, the economy and everything in this country. - *[Uproar.]* It is very disgusting, Sir. - *[Uproar.]*

I would like to tell you that it was not only the US tariff issue that we had to face, but also Cyclone "Ditwah". So, the Ministry of Industry and Entrepreneurship Development, the EDB, the related institutions and all got together and did a good job to protect the entrepreneurs as well as the industries of this country to build a better economy.

Sir, still, the Gulf War is going on. The repercussions of the Gulf war are not over. The war is developing day by day and no one knows what the repercussions as well as the future would be; nobody can understand that. - *[Uproar.]* රටක් විධියට මුහුණ දෙන්න තිබෙන අභියෝගය කිසි කෙනෙකුට කියන්න බැහැ. *[සෝෂා කිරීම්]*

සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා නැඟී සිටිය යුත්තේ කුමක් සඳහාද? මේ රටේ මිනිස්සු උදෙසායි; මේ රටේ පුරවැසියෝ උදෙසායි; මේ රටේ මිනිසුන්ට අඛණ්ඩව තෙල් ලබා දීම සඳහායි; මේ රටේ මිනිසුන්ගේ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහායි. *[සෝෂා කිරීම්]* විපක්ෂ නායකතුමා නැඟී සිටිය යුත්තේ ඒවාටයි. හැබැයි අවාසනාවට - unfortunately - our Leader of the Opposition has stood up while his Members have gone near the Chair where the Hon. Deputy Speaker is sitting and are disturbing continuously, showing to the whole world that this is their behaviour. - *[Uproar.]* We are extremely sorry and unhappy to see that. It is also very sad to see this kind of an Opposition; මේ වාගේ Opposition එකක් දකින්න ලැබීම ගැන අපි කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබියදී what the Standing Orders provide and how this has to be implemented in Parliament, when everything has been explained, still the Leader of the Opposition cannot control his team. - *[Uproar.]* It is insane and is a very disgusting behaviour is how I feel as a new Member of Parliament.

Sir, to improve the economy of this country, අපේ රටේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා අපි විවිධාකාර පියවර ගනිමින් ඉන්නවා. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, අපට බරපතළ අභියෝගයක් තිබෙන බව. ඒ අභියෝගය මෙයයි.

Sir, we have a responsibility not for individuals, but for the nation. We have a responsibility not for individual characters or to improve individual characters, but to rebuild the nation and create a resilient economy. So, we have a huge responsibility. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විධියට, EDB එක විධියට අපට වගකීමක් තිබෙනවා. හැම දෙයක්ම ගත්තොත්,- *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අපේක්ෂාව, ජනතාව වෙනුවෙන් අලුත් රටක් නිර්මාණය කිරීමයි කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thanura Dissanayake to second that Motion.

[අ.භා. 12.01]

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පිහිටුවනකොට විපක්ෂයේ කණ්ඩායම් කිව්වා, මාස දෙකක්, තුනක් යනකොට ආණ්ඩුව කඩා වැටෙනවාය කියලා. *[සෝෂා කිරීම්]* ඊට පස්සේ කියන්න පටන් ගත්තා, ඉන්නේ පොහොය දෙකයි කියලා. *[සෝෂා කිරීම්]* මේ රටේ ජනතාවට දැන් පැහැදිලියි, ඔවුන්ට හොඳට හිතා ගන්න පුළුවන් තත්ත්වය. මට නම් පෙනෙන්නේ, පොහොය හඳ දිහා බලන්න ගිහිල්ලා විපක්ෂයට මොකක් හරි වෙලා තිබෙනවාය කියන එකයි. *[සෝෂා කිරීම්]* ආණ්ඩුව වැටෙනවාය කියපු පොහොය ගණන ගණන් කරන්න ගිහිල්ලා විපක්ෂයේ මේ මන්ත්‍රීවරුන්ට වෙන මොනවා හරි අවුලක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thanura Dissanayake, you are asked only to second the Motion.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, what is your point of Order? - *[Uproar.]* I will give a minute for your point of Order. - *[Uproar.]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, let all of us take a minute and try to figure out how to resolve this problem.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I agree that my Colleague is raising a matter of public importance. That is correct. But, if you read the Standing Orders, it is very clear that Parliamentary Privilege takes precedence over a matter of such importance relating to disruption in the global supply chains. But, this is a matter of importance; this takes precedence; this is a matter of Privilege which concerns all Members of Parliament. We are not discounting what our Colleague is saying, but this takes precedence. Even though this is an Adjournment Motion, Sir, you can and you have the authority to stop this and take up this Privilege issue. You can do that.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. (Dr.) Harsha de Silva. Now, let me have my say.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
You can do that; even though the House had been adjourned for the Adjournment Motion, you can still do it, Sir. So, be reasonable. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Would you please listen? -*[Uproar.]*. May I be heard? Like I have been telling the Hon. Leader of the Opposition, - *[Uproar.]* Now see, I am not heard. Would you all maintain decorum? At least, listen to me! - *[Uproar.]* Would you listen to me? You are not listening to me. Then, how can I talk? Okay, Hon. Members, - *[Uproar.]* I told you, Hon. (Dr.) Harsha de Silva, but I listened to you. - *[Uproar.]* Would you all listen to me? I told you from the beginning - even to the Hon. Leader of the Opposition I have mentioned it - that I have to have time to go through these. - *[Uproar.]* It is not even robotically possible for me to go through these five Privilege matters within that short time.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Sir, suspend Parliament for a Party Leaders' Meeting.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, let me reply. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
So, these will be gone through in the course of the day and I will let you know. - *[Uproar.]* You will be let known. - *[Uproar.]* Okay, could we now go on with the Proceedings of the House? - *[Uproar.]*

Hon. Ajith P. Perera, you are listed to speak today. - *[Uproar.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Shall we listen to the Government side also? - *[Interruption.]* Hon. Chief Government Whip.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Uproar.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
Second කළා, second කළා. *[බාධා කිරීම්]* හරි, හරි. මම කථා කරන්නම්. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Motion was seconded. - *[Uproar.]*Could we listen to the Government side also? - [*Uproar.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයෙන් අද ඉදිරිපත් කිරීමට නියමිත සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අපි ඉදිරිපත් කළා. *[සෝෂා කිරීම්]* ඒ යෝජනාව ස්ථිර කරලායි තිබෙන්නේ. ඒ නිසා විවාදය පවත්වාගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දැන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දුන්නා. *[සෝෂා කිරීම්]* එතුමන්ලා කථා කරන්නේ නැත්නම් අපි අද කථික ලැයිස්තුව අනුව කටයුතු කරගෙන යමු. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ කථාව ආරම්භ කරනවා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ajith P. Perera, would you go to your seat and start talking from there, please? - [*Uproar.]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

එහෙම කරන්න බැහැ නේ. *[බාධා කිරීම්]*

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

එහෙම බැහැ නේ. මෙහෙම Parliament එකේ කටයුතු කරගෙන යන්න පුළුවන්ද?*[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Parliament එකේ කටයුතු කරගෙන යමු. *[සෝෂා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Suspend Parliament, call for a Party Leaders' Meeting and discuss this matter. - [*Uproar.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Suspend Parliament and have a Party Leaders' Meeting, Sir.- [*Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chief Government Whip.

[අ.භා. 12.06]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි. *[සෝෂා කිරීම්]* ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එතුමාගේ අවස්ථාව අහිමි කර ගත්තා. මට තේරෙන්නේ නැහැ, විපක්ෂයේ මන්ත්‍රීවරු මැද්දට පැනලා ජගත් විතාන මන්ත්‍රීතුමාගේ නම කියලා, හොරා හොරා කියන්නේ ඇයි කියලා. තමන්ගේ කණ්ඩායමේ මන්ත්‍රී කෙනෙකුට එහෙම කියන එක සාධාරණ නැහැ. *[සෝෂා කිරීම්]* සාමාන්‍යයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා. එය කවදත් පාර්ලිමේන්තුවේ වෙන වැඩක්.

ඔබතුමන්ලා පස් වරු 12.30 වෙනකල් ඔය විධියට ඉන්න. *[සෝෂා කිරීම්]* පස් වරු 12.30 වෙනකල් ඉන්න. අපි lunch එක සඳහා සභාවේ කටයුතු තාවකාලිකව නවත්වනවා. *[සෝෂා කිරීම්]* Lunch එකෙන් පස්සේ මන්ත්‍රීවරුන් කී දෙනෙක් ගරු සභාවට ඒවිද කියලා බලමු. *[සෝෂා කිරීම්]* හරිද? *[සෝෂා කිරීම්]* ඔහොම ආවත්, - *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව විශ්වාස භංග යෝජනාවක් හරියට ඉදිරිපත් කරගන්න බැරි විපක්ෂයක් මේ. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ. *[සෝෂා කිරීම්]* ස්ථාවර නියෝග අනුව විශ්වාස භංග යෝජනාව හරියට ඉදිරිපත් කළා නම් සාකච්ඡා කරන්න පුළුවන්. *[සෝෂා කිරීම්]* එය විවාදයට ගන්න පුළුවන්. *[සෝෂා කිරීම්]* තවම තේරෙන්නේ නැහැ, කොහොමද විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්නේ කියලා. *[සෝෂා කිරීම්]* ඒ නිසා කරුණාකරලා, - *[සෝෂා කිරීම්]* කරුණාකරලා,- *[සෝෂා කිරීම්]*

කරුණාකරලා ස්ථාවර නියෝග අනුව ඔබතුමන්ලා විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න. *[සෝෂා කිරීම්]* එහෙම ඉදිරිපත් කළොත් ඒ යෝජනාව විවාදයට ගන්න පුළුවන්. *[සෝෂා කිරීම්]* ඒ අනුව ඉදිරිපත් කළොත් විශ්වාස භංග යෝජනාව විවාදයට ගන්න පුළුවන්. *[සෝෂා කිරීම්]* කවුද මේ විශ්වාස භංග යෝජනාව හැදුවේ? කවුද මේ විශ්වාස භංග යෝජනාව හැදුවේ? *[සෝෂා කිරීම්]* අපට හරි පැහැදිලියි, අද ඇයි මේ කලබලය කියලා. *[සෝෂා කිරීම්]* අද මේ කලබලය මොකක් නිසාද? *[සෝෂා කිරීම්]* 'හොරා, හොරා' කියලා බෝඩ් තියාගෙන ඉන්න බහුතරයකට චෝදනා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් පරීක්ෂණ කරලා දැන් නඩු විභාග වෙන්න පටන් අරගෙන තිබෙනවා. *[සෝෂා කිරීම්]* අධිකරණයේ නඩු විභාග වෙන්න පටන් අරගෙන තිබෙනවා. *[සෝෂා කිරීම්]* මෙතැන ඉන්න කීදෙනෙකුට චෝදනා තිබෙනවාද? *[සෝෂා කිරීම්]* මෙතැන ඉන්න කීදෙනෙකුට විරුද්ධව නඩු විභාග වෙනවාද? කීදෙනෙක් රිමාන්ඩ භාරයේ හිටියාද? *[සෝෂා කිරීම්]* කීදෙනෙකුට අධිකරණයට එන්න කියලා තිබෙනවාද? *[සෝෂා කිරීම්]* ඒකයි මේ කලබලේ. *[සෝෂා කිරීම්]* නැත්නම් වෙන කිසිම කලබලයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[සෝෂා කිරීම්]*

ඔබතුමන්ලා කරුණාකරලා තමන්ගේ ආසනවලට යන්න. කොහොමත් ජනාධිපති අරමුදලෙන් ගත්ත ඒවායේ සිටම මේ වන විට පරීක්ෂණ මෙහෙයවමින් පවතිනවා. දිනපතා නඩු ඇහෙනවා. ඒ කලබලය තමයි මේ ප්‍රකාශයට පත්වෙන්නේ. වෙන මොකුත් නොවෙයි. *[සෝෂා කිරීම්]* එහෙම නැතුව මේ විධියට සභා ගර්භය මැදට ඇවිල්ලා දඟලන්න දෙයක් නැහැ. Parliamentary Business Committee meetings දෙකකදී මේ ගැන කථා කළා. ඒ හැම Parliamentary Business Committee meeting එකකදීම අපි කිව්වා, ස්ථාවර නියෝග අනුව විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. *[සෝෂා කිරීම්]* සභා ලේඛන කාර්යාලයෙන් තමයි විශ්වාස භංග යෝජනාව න්‍යාය පත්‍රයට දැම්මේ. *[සෝෂා කිරීම්]* ඔබතුමා නොවෙයි, හැදුවේ. *[සෝෂා කිරීම්]* විශ්වාස භංග යෝජනාව හරියට හදාගන්න බැරි කට්ටිය තමයි වැඩිපුර කෑගහන්නේ. *[සෝෂා කිරීම්]* විශ්වාස භංග යෝජනාව හරියට හදාගන්න බැරි වුණු කෙනා තමයි වැඩිපුර කෑගහන්නේ. *[සෝෂා කිරීම්]*

ගරු රවුෆ් හකීම් මැතිතුමාට දුන්නා නම් ඒ කටයුත්ත හරියට කරනවා. *[සෝෂා කිරීම්]* එතුමා අවුරුදු තිස් ගණනක්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

පාර්ලිමේන්තුවේ හිටපු නිසා දන්නවා, විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා. *[සෝෂා කිරීම්]* ස්ථාවර නියෝග අනුව අධිකරණයේ සාකච්ඡා වෙන කටයුත්තක් විශ්වාස භංග යෝජනාවකට දාන්න බැහැ. *[සෝෂා කිරීම්]* ඒකයි අපි කිව්වේ. *[සෝෂා කිරීම්]* ඒක නිසා කරුණාකරලා, හරියට විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න. *[සෝෂා කිරීම්]* අපි ලෑස්තියි, සාකච්ඡා කරන්න. *[සෝෂා කිරීම්]* අපි ලෑස්තියි, විවාද කරන්න. *[සෝෂා කිරීම්]* අනිවාර්යයෙන් අපි එය පරාජයට පත් කරනවා. *[සෝෂා කිරීම්]* ඒ නිසා ස්ථාවර නියෝගවලට පටහැනි විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා මේ විධියට කොච්චර ජවුසන් නැටුවත් පාර්ලිමේන්තුවේ කටයුතු නතර කරන්නේ නැහැ. *[සෝෂා කිරීම්]* පාර්ලිමේන්තුවේ කටයුතු දිගටම කරගෙන යනවා. *[සෝෂා කිරීම්]* පාර්ලිමේන්තුවේ කටයුතු දිගටම කරගෙන යනවා. ආණ්ඩුව ඉස්සරහට යනවා. රට ඉස්සරහට යනවා. *[සෝෂා කිරීම්]* ඒවා නවත්වන්න බැහැ. *[සෝෂා කිරීම්]* ඒවා නවත්වන්න බැහැ. *[සෝෂා කිරීම්]* අපි ඔක්කෝම ඉන්නවා. *[සෝෂා කිරීම්]* අපි ඔක්කෝම ඉන්නවා. *[සෝෂා කිරීම්]* කෑගැහුවා කියලා වැඩක් නැහැ. *[සෝෂා කිරීම්]*

අනෙක් කාරණය මෙයයි. මේ විරෝධයට ඇයි අද දවසම තෝරාගත්තේ? මේ විරෝධයට අදම තෝරාගත්තේ ඇයි? *[සෝෂා කිරීම්]* හේතුව මෙයයි. 1983 කළු ජූලිය සම්බන්ධයෙන් සොයන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා මේ පාර්ලිමේන්තුවේ යෝජනා කළා. *[සෝෂා කිරීම්]* ඒ කළු ජූලිය සම්බන්ධයෙන් සොයන්න පත් කළ ඒ විශේෂ කාරක සභාවට බාධා කරන්නේ ඒ කළු ජූලියට සම්බන්ධ සමහර අය; ඒ කළු ජූලියට සම්බන්ධ සමහර අයගේ දරුවෝ; ඔවුන්ගේ දෙවැනි පරම්පරාව. *[සෝෂා කිරීම්]* අන්න ඒගොල්ලනුත් අද සභා ගර්භය මැදට ඇවිල්ලා ඉන්නවා. ඇයි? *[සෝෂා කිරීම්]* 1983 කළු ජූලිය ගැන විශේෂ කාරක සභාවක් පත් කරනවාට තමුන්නාන්සේලා විරුද්ධයි. *[සෝෂා කිරීම්]* තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින් තමයි ඒවා කළේ; ඒ මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කළේ. *[සෝෂා කිරීම්]* ඒවාත් එක්ක තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියල්ලන්ම එන්නේ. *[සෝෂා කිරීම්]*

අපි අපනයන ආදායම ඉහළ නංවාගෙන ආර්ථිකය ඉදිරියට ගෙන යනකොට, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරනකොට, මේ හතර, පස්දෙනෙක් සභා ගර්භය මැදට ආවාය කියලා පාර්ලිමේන්තුවේ කටයුතු නවත්වන්නේ නැහැ. *[සෝෂා කිරීම්]* මම කියන්නේ මෙයයි. පුළුවන් නම් දිවා ආහාරයෙන් පස්සෙත් ඇවිල්ලා මෙහෙම කරන්න කියන්න කෝ. *[සෝෂා කිරීම්]* එන්නේ නැහැ. එන්නේ නැහැ. දිවා ආහාරයෙන් පස්සේ එන්න කියන්න කෝ. *[සෝෂා කිරීම්]* මෙක විපක්ෂයේ පොඩි ෂෝ එකක් විතරයි. දැන් මෙතුමන්ලාට මාධ්‍යවල අවධානයත් නැහැ. *[සෝෂා කිරීම්]* රැස්වීම් කර ගන්නත් බැහැ. *[සෝෂා කිරීම්]* කරුණාකරලා දැන් ගිහිල්ලා වාඩිවෙන්න. කරුණාකරලා දැන් ගිහිල්ලා වාඩිවෙන්න. *[සෝෂා කිරීම්]* දැන් ඇති. *[සෝෂා කිරීම්]* ඔබතුමන්ලා ඔය කරන වැඩෙන් කාටවත් වැඩක් වෙන්නේ නැහැ. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ශක්තිමත්ව පාර්ලිමේන්තුව මෙහෙයවා ගෙන යන්න. අපි මේ විවාදය පවත්වාගෙන යමු. මේ මාතෘකාව යටතේ කථා කරන්න දෙයක් නැති වුණාම තමයි මේ අය කලබල කරන්නේ. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ajith P. Perera, you have forfeited your opportunity to speak. Are you not going to speak? - *[Uproar]* I am going to give you the mike. You can say that same thing over the mike. I am giving you the mike, Hon. Member. - *[Uproar]*
May I call upon the next speaker? - *[Uproar]* Once again, it is the Hon. Chief Government Whip.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මම වෙලාව අරගෙන කථා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මට මෙතැනට මොනවාවත් ඇහෙන්නේ නැහැ. *-[සෝෂා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කමකුත් නැහැ, එක පැත්තකින්. "දූෂිතයි", "හොරා" කියලා තමන්ම බෝර්ඩ් එකක් උස්සාගෙන ඉන්න එකත් එක පැත්තකින් හොඳයි. අපට තිබෙන්නේ කරුණු ටික කියන්න විතරයි. ඔයගොල්ලන්ම තමන් හොරු සහ දූෂිතයෝ කියලා බෝර්ඩ් එකකින් පෙන්වන එක වඩා හොඳයි. *[සෝෂා කිරීම්]* ඒ නිසා ආණ්ඩු ගණනක -යූඑන්පී ආණ්ඩුව ආවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුව ආවත්- ඇමතිකම් කරලා ඒවායේ තිබුණු චෝදනා දැන් එකින් එක ඉස්සරහට එනවා, විභාග වෙමින් පවතිනවා. ඒකයි ප්‍රශ්නය. ඒ නිසා ඔය නැටුම්වලට මේ පාර්ලිමේන්තුව දැන් නවත්වන්න බැහැ. *[සෝෂා කිරීම්]* මම අලුත් මන්ත්‍රීවරුන්ටයි මේ කියන්නේ, මේ දෙතුන්දෙනාගේ ආදර්ශය ගන්න යන්න එපා. කරුණාකරලා තමන්ගේ ආසනවලට ගිහිල්ලා පාර්ලිමේන්තු විවාදයට සම්බන්ධ වෙන්න. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන්නේ තමන් මතුවීම සම්බන්ධ ප්‍රශ්නයක්. විපක්ෂ නායකතුමාගේ විපක්ෂ නායකකමත් නැති කරගෙන දෙතුන්දෙනෙක් දඟලන්න හදනවා. ඒ හැරුණාට පස්සේ මෙගොල්ලන්ට එහෙම ප්‍රශ්නයක් නැහැ. *[සෝෂා කිරීම්]* මම ආයෙත් කියන්නේ, ජගත් විතානගේ මන්ත්‍රීතුමාට "හොරා" කියන්න එපා කියලායි. ඇයි, ජගත්ට හොරා කියන්නේ? ඔයගොල්ලන් ඔක්කෝම එකතු වෙලා ජගත් විතානගේ මන්ත්‍රීතුමාට හොරා කියන්නේ ඇයි? *[සෝෂා කිරීම්]* ජගත් මන්ත්‍රීතුමා වචනයක්වත් ඒකට විරුද්ධව කියන්නේ නැහැ. ඒ නිසා මෙක විපක්ෂයේ ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඩුම තරමේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගෙන විපක්ෂ නායකතුමාට පුළුවන් වෙන්න ඕනෑ, තමන්ගේ කණ්ඩායම මෙහෙයවා ගන්න. අද විපක්ෂ නායකතුමා පැත්තක. සමහරුන් විපක්ෂ නායක වෙන්න දඟලනවා. *[සෝෂා කිරීම්]* දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කල්ලියක් හදාගෙන මේ පාර්ලිමේන්තුවේ ඩෙහා නටනවා. ඔයගොල්ලන් ඒකට අහුවෙලා ඉන්නේ. ඔය දයාසිරිගේ ෂෝ එකක්. අහුවෙන්න එපා. විපක්ෂ නායකතුමා ෂෝක් එකට ඉන්නවා. විපක්ෂ නායකකම ගන්න තෙක් මේ වාගේ වැඩ කරනවා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රටේ ආර්ථිකය ගැන කථා කරමු, අපනයන ආදායම ගැන කථා කරමු, සංචාරක ඉපැයීම් ගැන කථා කරමු, ප්‍රේෂණ ගැන කථා කරමු, අපේ රටේ ආර්ථිකයේ වර්ධනය ගැන කථා කරමු. ඔබතුමන්ලාට මේවා කථා කරනකොට තමයි මේ ඔක්කෝම ප්‍රශ්න. කඩා වැටුණු ආර්ථිකයක් තමයි අපි මේ කෙළින් කරගෙන එන්නේ, ස්ථාවර

කරගෙන එන්නේ. ආර්ථිකය ගැන කථා කරන්න හදනකොටම මේ කලබලේ. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරන්න වැඩක් නැතිව පාර්ලිමේන්තු ඇවිල්ලා කෑ ගහනවා. අපි සභාව පවත්වා ගෙන යමු. පාර්ලිමේන්තුවේ කාලය කන්නේ නැතිව කරුණාකරලා ගිහිල්ලා වාඩිවෙන්න. ගරු කථානායකතුමා නැති දවසට ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා. ඒක අලුත් දෙයක් නොවෙයි. ඒ නිසා අපි මේ විවාදය පවත්වාගෙන යනවා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ විශ්වාස භංගය ගැන කිව්වේ ඉතා නිවැරදි කරුණක්. අධිකරණයේ විභාග වන දේවල් මෙතැනට දාන්න එපා කිව්වා. එච්චරයි. ඒක අයින් කරලා ගෙනෙන්න. අඩුම තරමේ පාර්ලිමේන්තුවේ කථානායකවරුන්ට එරෙහිව ගෙනාපු විශ්වාස භංග දිහා බැලුවා නම් මේ යෝජනාවත් හරියට හදාගන්න තිබුණා. [සෝෂා කිරීම්] හැබැයි, වැඩය තිබෙන්නේ මේකයි. මේ විශ්වාස භංගය හදාගන්න හරිහමන් නීතිඥයෙක් අල්ලලා නැහැ. හරිහමන් නීති උපදෙස් අරගෙන නැහැ. [සෝෂා කිරීම්] හරියට නීති උපදෙස් අරගෙන හැදුවා නම්, විශ්වාස භංගයට මෙහෙම වෙන්නේ නැහැ. කොහොමත් අපට මේක පරාජයට පත් කරන්න පුළුවන්. ඒ වාගේ වෙලාවක, - [සෝෂා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I gave the mike to the Opposition, but they did not speak. - *[Uproar.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේ සද්දෙට යට වෙන්න ඕනෑ නැහැ. ඔය කෑ ගහලා ගෙදර යනවා දැන්. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, you refused to speak. - *[Uproar.]* Could we get on with the Debate now?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමාට. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, would you take your seats, please? - *[Uproar.]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, summon a meeting of the Committee on Parliamentary Business.- *[Uproar.]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ගැන Parliamentary Business Committee එකේදි කථා කළා. *[සෝෂා කිරීම්]* මෙතුමන්ලාට කිව්වා, ස්ථාවර නියෝග අනුව මෙම යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. එහෙම නොකරනවා නම් මේ විවාදය පවත්වාගෙන යන්න බැහැ. *[සෝෂා කිරීම්]* ස්ථාවර නියෝග අනුව තමයි පාර්ලිමේන්තුව කටයුතු කරන්නේ. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, please take your seats, I am telling you. - *[Uproar]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ නිසා මෙගොල්ලන්ගේ මේ සද්දෙට, කෑ ගැහිල්ලට පාර්ලිමේන්තුවට වැඩ කරන්නේ බැහැ. පාර්ලිමේන්තුව වැඩ කරන්නේ ස්ථාවර නියෝග අනුව. *[සෝෂා කිරීම්]* විශ්වාස භංගය ඔය මන්ත්‍රීතුමා හැදුවා නම් හරියට හදනවා කිව්වා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, would you please take your seats? - *[Uproar.]* Hon. Chief Government Whip, could we get on with the Debate? - *[Uproar.]* I call upon the next Speaker. - *[Uproar]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපි විවාදය කරගෙන යනවා.*[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker from the Opposition is the Hon. S.M. Marikkar, I will give you the mike. You can say what you want over the mike. - *[Uproar.]*

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Kabir Hashim, what is your point of Order?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Speaker, if you look at the Standing Orders, Standing Order No. 29(1) very clearly states, I quote:

> "… the privileges of Parliament shall take precedence of all other motions,…"

Sir, you must understand that the world is watching this because this is the main institution of democracy, and it is not about our rights, but about the rights of all.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, I told you that it is not humanly possible for me to go through these. I said it from the start, that it is not humanly possible. -*[Uproar.]*

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
This is a very serious matter. The JVP does not understand the democratic rights of the people. This is an institution we are protecting. This is stated clearly in the Standing Orders. Today, the world is looking at what is happening. You are depriving the Privilege of a Parliamentarian. From the Secretary-General onwards, you all are responsible for what you are doing. Sir, this is not about us; this is about all these MPs here and all the people in this country. Therefore, you have the right to take the correct decision.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, as I have told you, these five matters of Privilege had been given to me around 9.10 a.m. and 9.15 a.m. It is not humanly possible for me to go through all those.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
No, මෙක විහිළුවක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
If it were a joke, I could have gone through it. As it is not a joke, I have to go through these and see whether there is a case of Privilege. - *[Uproar.]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Summon a Meeting of the Committee on Parliamentary Business. - *[Uproar.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Since there are no speakers from the Opposition, I call upon the Hon. Sunil Watagala to speak. Hon. Watagala, you are listed to speak. Hon. Deputy Minister, you have ten minutes.

[අ.භා. 12.21]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලිවම අද දවසේ ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාවක් පිළිබඳව විවාද කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ මන්ත්‍රීවරුන්ගේ විනය ගැන හිතා ගන්න බැහැ. අපේ රටේ විපක්ෂ නායකයෙක් ඉන්නවා. හැබැයි, එතුමන්ට කණ්ඩායම හසුරුවා ගන්න බැහැ. *[සෝෂා කිරීම්]* අපේ රටේ විපක්ෂ නායකයෙක් ඉන්නවා, අඩුම තරමින් සභාවට සාධාරණත්වය ඉටු කරන්න දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභා ගර්භයේ හිටපු සියලු පාසල් ශිෂ්‍යයින් මේ පාර්ලිමේන්තුවෙන් යන්න ගියා. ඇයි, ඒ? *[සෝෂා කිරීම්]* මෙන්න මේ වැරදි සම්ප්‍රදායය නිසා. මිරිස් කුඩු සම්ප්‍රදායය මීට කලිනුත් පාර්ලිමේන්තුවට අරගෙන ආවා. *[සෝෂා කිරීම්]* අද මහජන ගැලරියේ එක පාසල් ශිෂ්‍යයෙක්වත් නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ෆුවනෝට් කල්ලියේ කෙනෙක් මෙතැනට දාලා, ෆුවනෝට් කල්ලියේ හොරෙකුට ඇවිල්ලා පාර්ලිමේන්තුව හසුරුවන්න දෙන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන ඉන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මේ පාර්ලිමේන්තුව යට කරන්න දෙනවාද? *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව ශීලාචාර පාර්ලිමේන්තුවක් කරන්න තමයි,- *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව ශීලාචාර පාර්ලිමේන්තුවක් කිරීම වෙනුවෙන් ආණ්ඩු පක්ෂය කැප වෙමින් ඉන්නවා. *[සෝෂා කිරීම්]* අපි Parliamentary Business Committee එකේදී ඉතාම සදාචාරාත්මක ලෙස මේ අයට පෙන්වා දුන්නා, තමුන්නාන්සේලා ගෙනෙන විශ්වාස භංගය රීති විරෝධියි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති විරෝධියි කියලා කිව්වාට පස්සේ එය පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරන්න බැහැ කියලා Parliamentary Business Committee එකේදී කිව්වා. මේ කියන විපක්ෂ නායක පොරොන්දු වුණා, විශ්වාස භංගය සංශෝධනය කරලා ගෙනෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේදී ඒ ගැන විවාද වන අද දවසේ අභියාචනාධිකරණයේ මේ නඩුව විභාගයට අරගෙන තිබෙනවා. එහෙම නම් ඒක *sub judice* නොවෙයිද? ඒක *sub judice* නොවෙයිද? *[සෝෂා කිරීම්]* ඊයේ දවසේ මේ නඩුව ගත්තා. *[සෝෂා කිරීම්]* අද මේ නඩුව ගන්නවා. එහෙම නම්, ඒක *sub judice* නොවෙයිද? මේ ඉන්න කට්ටිය,- *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් අපි පැහැදිලිවම Parliamentary Business Committee එකේදී පෙන්වා දුන්නා, මීට කලින් ඕනෑ තරම් මේ පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා තිබෙනවාය කියන කාරණය. ඉතාම සදාචාරවත් ලෙස, පාර්ලිමේන්තුවට ගෞරවයක් ලෙස තමයි ඒ විශ්වාස භංග යෝජනා භාර දීලා තිබුණේ. මේ විශ්වාස භංගය කොළපොතක්. මේ විශ්වාස භංගය හැදුවේ විපක්ෂයෙන් නොවෙයි. *[සෝෂා කිරීම්]* මේ විශ්වාස භංගය හැදුවේ මේකට පාත්‍ර වෙච්ච එක්කෙනෙක්, මෙච්චර නීතිඥයෝ ඉඳලාත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Parliamentary Business Committee එකේදී පැහැදිලිවම පෙන්වා දුන්නා, මේ විශ්වාස භංගය රීති විරෝධියි කියලා. *[සෝෂා කිරීම්]* මේ විශ්වාස භංගය රීති විරෝධියි කියලා පෙන්වා දුන්නා. *[සෝෂා කිරීම්]* ඒ පදනමින් තමයි,- *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තිබෙන ස්ථාවර නියෝගයන්වලට පටහැනිව පාර්ලිමේන්තුවක්

අපට පවත්වා ගෙන යන්න බැහැ. *[සෝෂා කිරීම්]* ඒක Parliamentary Business Committee එකේදී අපි පෙන්වා දුන්නා. *[සෝෂා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය කියන සෑම ප්‍රශ්නයකටම උත්තර අපි Parliamentary Business Committee එකේදී ලබා දුන්නා. Parliamentary Business Committee එකේදී මේ තීරණය භාරගෙන, ඒ ගැන සාකච්ඡා කරලා, ඒ ගැන එකඟ වෙලා මේ කරන වැඩේ මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පාර්ලිමේන්තුවක් මෙහෙම පවත්වාගෙන යන්න බැහැ, මේ විධියට නම් දැන් මේ විපක්ෂය හැසිරෙන්නේ, මේ විධියට නම් තමන්ගේ විපක්ෂය හසුරුවන්නේ. *[සෝෂා කිරීම්]* මේ ඉන්න විපක්ෂ නායකතුමා තමන්ගේ කණ්ඩායම,- *[සෝෂා කිරීම්]* තමන්ගේ අණට කීකරු නැති කණ්ඩායමක් මෙතැන ඉන්නවා. *[සෝෂා කිරීම්]* එකිනෙකාට ඇඟිල්ල දික් කරමින් "හොරා", "හොරා" කියනවා. ඇත්ත තමයි. ඔය සභා ගර්භයේ ඉස්සරහට ඇවිල්ලා ඉන්න කාටද චෝදනා නැත්තේ කියලා කියන්න. හැම කෙනාම හොරා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I listened to you, Hon. (Dr.) Harsha de Silva.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොරෙන් රෑට රෑට බන්ධනාගාරවලට කථා කරලා, මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ට කථා කරපු මහත්වරු දැන් පෝස්ටරය අල්ලාගෙන ඉන්නවා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, I did give ear to you.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු කට්ටිය පාර්ලිමේන්තු සම්ප්‍රදායය ගැන කථා කරනවා. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, you may continue.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභා ගර්භයට ඇවිල්ලා "කවුද හොරා - මහින්ද හොරා", "කවුද හොරා - රනිල් හොරා" කිය-කියා බෙදිව්ව දෙගොල්ලන් තමයි මේ ඉන්නේ. *[සෝෂා කිරීම්]* මෙතැනදී අපට ඇඟිල්ල දික් කරනවා. *[සෝෂා කිරීම්]* අපට ඇඟිල්ල දික් කරනකොට තමන්ගේ පැත්තට ඇඟිලි හතරක් දික් වෙනවා. අන්න ඒක මතක තියා ගන්න, මේ මහත්වරු. මේ, හුටිනෝට් කල්ලියේ මහත්වරු. *[සෝෂා කිරීම්]* මහ බැංකු බැඳුම්කර වංචාව ගැන පොත් ලියලා සල්ලි ගත්ත කෙනෙක් ඔතැන ඉන්නවා. තේරුණාද? මේ, පොත් ලියලා සල්ලි ගත්ත මහත්වරු, ඇලෝසියස්ලාගෙන් සල්ලි ගත්ත මහත්වරු, හුටිනෝට් කල්ලියේ මහත්වරු. මෙතැන හොරු ඇවිල්ලා. මේ, තමන්ගේ මල්ලිගේ නමින් පෙට්‍රල් ෂෙඩ් ගත්ත මහත්වරු. තමන්ගේ මල්ලිගේ නමින් තමයි පෙට්‍රල් ෂෙඩ් ටික තිබෙන්නේ. ඔයගොල්ලන් ඒවා අපෙන් අහගන්න. *[සෝෂා කිරීම්]* කළුතර දිස්ත්‍රික්කයේ මහත්වරු. මේ ඇවිල්ලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිවම කියනවා, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී - Parliamentary Business Committee එකේදි - ගත්ත තීන්දු-තීරණ හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. ඒක හින්දා කල්ලියකට යට වෙලා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

යට වෙලා, මේ රටේ මහජනයාගේ දේපළ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

යට වෙලා මේ පාර්ලිමේන්තුව පවත්වා ගෙන යන්න අපි කිසිසේත්ම ලැහැස්ති නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[සෝෂා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, you have two more minutes.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ශීලාචාර පාර්ලිමේන්තුවක් වෙනුවෙන් අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා දේශපාලන සදාචාරය අපි වෙනස් කරගෙන ඇවිල්ලා තිබෙනවා. තුනෙන් දෙකක බලයක් සහිත පාර්ලිමේන්තුවක ඉන්න අපේ මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීමයි, ඔතැන ඉන්න කිහිපදෙනාගේ හැසිරීමයි සන්සන්දනය කර බලන්න කියලා අපි මේ රටේ ජනතාවට කියනවා. *[සෝෂා කිරීම්]* ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වුණේ වෙන කිසිවක් නිසා නොවෙයි. ඒ, එක දේශපාලන පොරොන්දුවක් වෙනුවෙන්. ඒ, දේශපාලන සදාචාරය හදන්න. *[සෝෂා කිරීම්]* ඒක නිසා තමයි මීරිස් කුඩු පාර්ලිමේන්තුව වෙනුවට මේ රටේ සදාචාරාත්මක පාර්ලිමේන්තුවක් නිර්මාණය කරගන්න අපි කටයුතු කරමින් ඉන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

යට වෙලා පාර්ලිමේන්තුවේ සදාචාරවත් ගමන අපි කිසිසේත්ම වළක්වන්නේ නැහැ කියන කාරණාව මේ වෙලාවේදී මතක් කරමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මෙම සභාව කල්තැබීමේ විවාදය අවස්ථාවේදී කිසිම කෙනෙක් මාතෘකාවට අදාළව කථා කළේ නැහැ. නමුත් මේ විවාදයේදී රජයේ කථිකයන් විසින් මෙතෙක් ඉදිරිපත් කරපු කරුණුවලට පිළිතුරු දීමේ වගකීමක් හා යුතුකමක් මට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ මතභේදයට ලක් වෙලා තිබෙන විශ්වාස භංග යෝජනාව ගත්තොත්, එය ඉතාම පැහැදිලිව, ඉතාම නීත්‍යානුකූලව, ඉතාම විස්තරාත්මකව ඉදිරිපත් කරන ලද යෝජනාවක්. ඒ යෝජනාව 2026.10.09වැනි දා භාර දුන්නා; 2026.10.12වැනි දා න්‍යාය පුස්තකයට ඇතුළත් කළා; 2026.10.16වැනි දා නීතිපති මතය විමසීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව එකඟ වුණා. 2026.10.23වැනි දා නීතිපති මතය විමසීමකින් තොරව ගරු කථානායකතුමා මුලසුන දරපු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව න්‍යාය පුස්තකයෙන් එම යෝජනාව ඉවත් කිරීමට තීරණය කළා. තමන්ට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනකොට මීට කලින් තිබුණු සම්ප්‍රදාය තමයි - කලින් කථානායකවරයාටත් මේ වාගේ ප්‍රශ්නයක් මතු වුණා - ඒ අවස්ථාවේදී නියෝජ්‍ය කථානායකතුමා මුලසුන දැරීම.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, මාතෘකාවට අදාළව කථා කරමු නේද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අද තිබෙන්නේ සභාව කල් තැබීමේ යෝජනාවක්. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ කරුණ පිළිබඳව සඳහන් කළා. මම එතුමාට පිළිතුරු දෙනවා. ඔබතුමිය ඒ ගැන ලේකම් මණ්ඩලයෙන් අහලා බලන්න. ඒ හැම ප්‍රශ්නයකටම පිළිතුරු තමයි මම මේ ලබා දෙන්නේ. මේ කල් තැබීමේ විවාදය තුළ ඒ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඒ නිසා මට ඉඩ දෙන්න. අද දවසේ වෙච්ච දේවල් තුළ අපට අනවශ්‍ය කථාවලට යන්න අවශ්‍ය නැහැ. මීට කලින් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියපු කාරණාවලට තමයි මම පිළිතුරු දෙන්නේ. වටගල මැතිතුමාත් ඒ ආකාරයෙන්ම කථා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම කාර්ය පටිපාටිය සියයට සියයක්ම හරි. චෝදනා 50ක් ඉදිරිපත් කරලා තිබුණා. මේ එකක්වත් *sub judice* නැහැ. එක ප්‍රශ්නයක් මතු කළා, චමින්ද කුලරත්න නියෝජ්‍ය ලේකම්තුමා සම්බන්ධ කාරණය අධිකරණයේ තිබෙන බවට. චමින්ද කුලරත්න මහත්මයා රිට් පෙත්සමක් ඉදිරිපත් කරලා තිබෙනවා, හැබැයි අද වෙනකම් නොතීසිවත් දීලා නැහැ. යම් කාරණයක් අධිකරණයක විනිශ්චයට ලක් වුණා කියලා කියන්නේ ඒ නඩුව ඉදිරියට ගෙන යෑමට අවස්ථාව ලබා දීමයි. මීට කලින් මහින්ද යාපා කථානායකතුමාට අදාළව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණු වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ, හිටපු පොලිස්පතිවරයා පත්කිරීම සම්බන්ධව, leave to proceed, ඒ කියන්නේ ඉදිරියට යාමට අවසර දීපු නඩු නවයක් තිබුණා. එසේ තිබියදී දවස් තුනක් මේ පාර්ලිමේන්තුවේ විවාද කළා. ඉදිරිපත් කරන චෝදනා පනහේ හරි වැරැද්ද පිළිබඳව අපට කරුණු කියන්න පුළුවන්. ඒ වාගේම කථානායකතුමාට උත්තර දෙන්න පුළුවන්; කථානායකතුමා වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කරන්න පුළුවන්; කථානායකතුමාගේ ස්ථාවරය තහවුරු කරන්න පුළුවන්. ඒවා බිඳ හෙළන්න අපට අයිතිය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කථානායකතුමා අද මේ ගරු සභාවට ආවේ නැහැ. එන්නේ නැති හේතුවක් කියලාත් නැහැ. අද සභාව මඟ හැරලා තිබෙනවා. ඒ වාගේම න්‍යාය පුස්තකයේ තිබෙන යෝජනාවක් මේ සභාවේ යෝජනා සම්මුතියකින් හැර ඉවත් කරන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ විතරක් නොවෙයි, මේ සභාව තුළට අරගෙන ආපු යෝජනාවක් එක්කෝ ඒ ඉදිරිපත් කරපු මන්ත්‍රීවරු 41 දෙනාම අත්සන් කරපු යෝජනාවකින් ඉල්ලා අස්කරගන්න ඕනෑ. අපි එහෙම කරන්න ලැහැස්ති නැහැ. එහෙම නම් ඉවත් කරන්න පුළුවන් එකම ක්‍රමය මේ සභාවේ යෝජනාවක් සම්මත කිරීම පමණයි. එහෙම දෙයක් වෙලත් නැහැ. ඒ නිසා අදටත් වලංගු විශ්වාස භංගයක් මෙම පාර්ලිමේන්තුව ඉදිරියේ තිබෙනවා. එය විවාද කළ යුතුයි. එය විවාද කළ යුතුමයි. ඒක තමයි අපේ ස්ථාවරය. ඒ චෝදනාවලට මුහුණ දීමට ගරු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පෞරුෂයක් තිබෙන්න ඕනෑ. පලා යන එක නොවෙයි, මේ සභාවේ නායකයාගේ රාජකාරිය. මම ඒ ගැන එතැනින් එහාට කියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ කාරණය ගැන අදහස් දැක්වීම මම අවසන් කරනවා.

ඊළඟ කාරණය මේකයි. මෙම විශ්වාස භංග යෝජනාවේ චෝදනා 50ක් තිබෙනවා. චෝදනා 17ක් රාජ්‍ය මුදල්, දේපළ හා මහජන මුදල් අවභාවිතය සම්බන්ධව. චෝදනා 20ක් අල්ලස් විමර්ශනයට බලපෑම් කිරීම සහ ළබැඳියා අතර ගැටුම් සම්බන්ධව. චෝදනා 13ක් අපක්ෂපාතිත්වය බිඳ වැටීම හා පාර්ලිමේන්තු

ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කිරීම සම්බන්ධව. මේ විධියට චෝදනා 50ක් තිබෙනවා. මෙවා පිළිබඳව කරුණු කීමට, එරෙහිව කරුණු කීමට, විවාද කිරීමට මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ අපට අයිතියක් තිබෙනවා; මේ මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔය සම්බන්ධව Parliamentary Business Committee meetings ගණනාවක කථා කළා නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, Parliamentary Business Committee එකට අයිතියක් නැහැ, න්‍යාය පුස්තකයේ තිබෙන දෙයක්, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
අද මාතෘකාවට අදාළව කථා කරමු, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
අද මාතෘකාව තමයි - *[බාධා කිරීමක්]* මොකක්ද මාතෘකාව?

ගරු කාරක සභා සභාපතිතුමියනි, දැන් ආණ්ඩුවේ සංවිධායකතුමා මාතෘකාවට අදාළවද කථා කළේ? කරුණාකරලා කියන්න. ආණ්ඩුවේ සංවිධායකතුමා මාතෘකාවට අදාළවද කථා කළේ? සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මාතෘකාවට අදාළවද කථා කළේ? ඒ කරුණු, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
හරි, දැන් ඔබතුමාගෙන් පටන් ගන්නකෝ, මාතෘකාවට අදාළව කථා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ඒ කරුණුවලට උත්තර දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනර් ඔරුවර්)
(An Hon. Member)
එතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
හරි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ඔබතුමිය මයික් එක දෙන්නේ නැත්නම්, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුව තමයි උත්තරීතර වාද මණ්ඩපය. මේ පාර්ලිමේන්තුව තුළ කරුණු කියන්න පුළුවන්, එකඟ වෙන්න පුළුවන්, එකඟ නොවෙන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුව තුළ කථානායකවරයෙකුට විරුද්ධව යම් චෝදනාවක් එල්ල වෙනවා නම්, ඒ චෝදනාව පිළිබඳ කරුණු කියන්න විධිමත් යෝජනාවක් අරගෙන එන්න කියලා මේ කථානායකවරයා පසුගිය පාර්ලිමේන්තු සතියේ අහහරුවාදා මටම කිව්වා. මම වරප්‍රසාද කඩවීමක් පිළිබඳව ඉදිරිපත් කරනකොට, "ඒ වරප්‍රසාද කඩවීම පිළිබඳව, ඔබට පුළුවන් වන්නේ මට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් අරගෙන එන එක පමණයි" කිව්වා. මම එතුමාට කිව්වා, "ඔබතුමාට විරුද්ධව අරගෙන එනවා" කියලා. සභානායකතුමා කිව්වා "ඔව්, අරගෙන එන්න සිකුරාදාම ගන්නවා" කියලා. හැබැයි, අපි සිකුරාදා ඉදිරිපත් කළාම ඒවා පැත්තකට විසි කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේවා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ කොටස්. අපි මේ පාර්ලිමේන්තුවට පුරුදු වෙන්න ඇවිල්ලා නොවෙයි නේ. අපි මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය දන්නවා; මේ පාර්ලිමේන්තුවේ තනතුරු දරලා තිබෙනවා; ඒ වාගේම නීතිය පිළිබඳව අධ්‍යයනයක්, අවබෝධයක් තිබෙනවා. මේ අද තිබෙන ස්ථාවර නියෝග කෙටුම්පත් කළ කමිටුවේ මමත් සාමාජිකයෙක්. ඒ නිසා මේවා සරලව කියන කතන්දර නොවෙයි. මේ වෙලාවට මතක් වෙලා කියන දේවල් නොවෙයි. *[බාධා කිරීමක්]* මට කියන්න, න්‍යාය පුස්තකය තුළ තිබෙන දෙයක් කථානායකතුමාට ඉවත් කරන්න බලය ලැබුණේ කොහොමද කියලා. සභානායකතුමා හෝ ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා හෝ මේ ඉස්සරහා පේළියේ ඉන්න ඇමතිවරයෙක් හෝ කවුරු හරි මන්ත්‍රීවරයෙක් නැඟිටලා මට කියන්න, න්‍යාය පුස්තකයට ඇතුළත් කළාට පස්සේ එහෙම ඉවත් කරන්න බලය තිබෙනවා කියලා ස්ථාවර නියෝගවල කොහේද තිබෙන්නේ කියන එක. මේක පසුගිය 12වැනි දා න්‍යාය පුස්තකයට ඇතුළත් කළා. න්‍යාය පුස්තකයට ඇතුළත් කරපු දෙයක් කථානායකවරයා තනි මතයට ඉවත් කරන්නේ කොහොමද? අනෙක, ඒවා කථානායකතුමාට එරෙහිව තිබෙන චෝදනා. කථානායකතුමා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දරන්නේ කොහොමද? ඒක ළඟැදියාවන් අතර ගැටුමක් - a conflict of interest. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට වඩා තව දෙයක් මොනවටද?

ඒ විතරක් නොවෙයි, මොනවාද මේ තිබෙන කාරණා. බලන්න, කථානායකතුමාට රජමල් වත්තේ නිල නිවසක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා ලොරිස් පටුමගේ තිබෙන සුඛෝපභෝගී මහල් නිවාස සංකීර්ණයේ 1/8 සහ ඒ වාගේම ලේකම්ට 3/4 කියන නිවාස දෙක අරගෙන තිබෙනවා. ගෙවලා තිබෙන්නේ මාසයකට රුපියල් 8,252යි. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැනට නීතිය ඉදිරියේ තිබෙන කරුණක් ගැන කථා කරන්න බැහැ කියන එක Standing Ordersවල තිබෙනවා නේ. ඒ නිසා- *[බාධා කිරීම්]* කරුණාකරලා මාතෘකාවට කථා කරමු, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජමල් වත්තේ නිල නිවස ගැන හෝ ලොරිස් පාරේ නිල නිවාස දෙකක් ලබා ගැනීම ගැන නඩුවක් නැහැ, අල්ලස් කොමිසමේ පරීක්ෂණයක් විතරයි තිබෙන්නේ. ඔබතුමිය ඒක දන්නවාද? නඩුව තිබෙන්නේ, චමින්ද කුලරත්න මහත්මයා සම්බන්ධ කාරණය ගැන විතරයි. ලොරිස් පාරේ 3/4 නිවස චමීර ගාල්ලගේ ලේකම්ට, 1/8 නිවස කථානායකට. රජමල් වත්තේ නිවසට අමතරව ගෙවල් තුනක්! රම්‍ය, සුරම්‍ය, සුභ! රුපියල් 8,252යි ගෙවලා තිබෙන්නේ. ලොරිස් පාරේ ආරක්ෂාව සහිතව තිබෙන three-bedroom apartment එකේ අද market value එකට අනුව rent එක මාසයකට රුපියල් ලක්ෂ පහකට වැඩියි. රුපියල් 8,252යි ගෙවා තිබෙන්නේ. රජමල්වත්තේ නිල නිවස තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රජමල්වත්තේ නිල නිවාසයට ජේවීපී කාඩර් එකේ අටදෙනෙක් full time දාලා තිබෙනවා. මේකේ තිබෙන එක චෝදනාවක් ඒක. ඒ අයට පඩි ගෙවනවා, ඒ අයට වරප්‍රසාද දෙනවා. ඒ අයට වාහන දෙනවා. එතකොට මොකක්ද මේ කියන කථාව?උසාවියේ නැහැ ඒවා. *[බාධා කිරීම්]* උසාවි යනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ උසාවි යන්න බැරි වුණොත් අපේ ආණ්ඩුව යටතේ අපි යනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඔබතුමිය අසරණ වෙනවා. මම ඔබතුමියත් එක්ක වාද කරන්න යන්නේ නැහැ. ඔබතුමියත් එක්ක මෙතැන කරන්න වාදයක් නැහැ. නමුත්, ඔබතුමිය මුලසුනේ ඉන්න නිසා ඒ ගෞරවය සමඟ මම කියන්නේ. අද ඔබතුමිය ඔතැනට දාලා ඔබතුමිය අසරණ කරන්න ඕනෑ නැහැ නේ, කථානායකතුමා ඇවිල්ලා මුල් පුටුවේ ඉඳලා උත්තර දෙන්න එපායැ. කාර්ය පටිපාටිය ගැන උත්තර දෙන්න ඕනෑ, චෝදනා ගැන උත්තර දෙන්න ඕනෑ. කථානායකතුමා ඇයි අද මහහැරියේ, කථානායකතුමා ඇයි මේ සභාවට ආවේ නැත්තේ?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, - *[බාධා කිරීම්]*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මොකක්ද point of Order එක? මොන Standing Order එක යටතේද කියන්න.*[බාධා කිරීම්]*

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

මෙතුමා වැරැදි දෙයක් සමාජගත කරන්න හදනවා. මෙතුමා Parliamentary Business Committee එකෙත් නැහැ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මෙතුමා මොකක්ද කියන්නේ? *[බාධා කිරීම්]* ඒකේ point of Order එකක් නැහැ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. CBI-5198 අංකය දරන මේ පාර්ලිමේන්තුවේ වාහනය පොළොන්නරුවේදී අනතුරකට ලක් වුණා. නිල වශයෙන් මුදා හැර නැහැ, කථානායකට වාහන දෙකයි අයිති. හැබැයි තුන්වැනි, හතරවැනි, පස්වැනි වාහනත් පාවිච්චි කරනවා. කැබිනට් අනුමැතියක් නැතුව මාධ්‍ය ඒකකයත් පාවිච්චි කරනවා. ඒ මාධ්‍ය ඒකකයට කෝටි ගණනක් වටිනා උපකරණ, භාණ්ඩ මුදා හැර තිබෙනවා. ඒවා සාවද්‍ය පරිහරණය; අපරාධ - criminal - වැරදි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නිබියදී, ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විධිමත් විමර්ශන පවත්වා ගෙන යද්දී එහෙම කෙනෙකුට මේ කථානායක තනතුර දරන්න පුළුවන්ද? මොකද කියන්නේ? අපේ පොළොන්නරුවේ සරත් නියෝජ්‍ය ඇමතිතුමාට නම් සන්තෝෂයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මොකද, ඔබතුමාගේ දේශපාලන ගැටීම තිබෙන කෙනා. සරත් නියෝජ්‍ය ඇමතිතුමාගේ සන්තෝෂය මම දන්නවා. හැබැයි, නියෝජ්‍ය ඇමතිතුමා, පොළොන්නරුවටත් ලජ්ජාවක් නේ. පොළොන්නරුවටත් ලජ්ජාවක් නේ, මේ වැඩේ. *[බාධා කිරීම්]*

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ලජ්ජයි. [බාධා කිරීම්]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මේවා - *[බාධා කිරීම්]* මේ පාර්ලිමේන්තුවේ මීට කලින් හිටපු කථානායකතුමාට- *[බාධා කිරීම්]* ආචාර්ය උපාධිය නැතිකම අහුවෙලා, බොරු උපාධියක් කියලා ගියා. *[බාධා කිරීම්]*

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

චෝදනා කොච්චරද? *[බාධා කිරීම්]* ඒ වාගේම කොච්චර විධියට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කිසිම ආකාරයක පාර්ලිමේන්තු සම්ප්‍රදායයක් දන්නේ නැතුව, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කෙරෙහි කිසිම ආකාරයක ගෞරවයක් නැතුව, ඒ වාගේම පාර්ලිමේන්තුව තුළ ඇත්ත යුක්තිය පිළිබඳව හැඟීමක් නැතුව තමයි එතුමා කටයුතු කරන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවේ මාධ්‍ය ඒකකය එතුමාට පෞද්ගලිකව මාධ්‍ය කටයුතු කරනවා වෙන්න බැහැ නේ. කලින් කථානායකතුමා පාර්ලිමේන්තුවේ මාධ්‍ය ඒකකය කැබිනට් අනුමැතියක් සහිතවයි ගත්තේ. මේ කථානායකතුමා අගමැතිතුමියගෙන් ඉල්ලුවා, මේකට කැබිනට් අනුමැතිය අරගෙන දෙන්න කියලා. හැබැයි, අගමැතිතුමිය ඉතාම ප්‍රඥාගෝචරව ඒක ප්‍රතික්ෂේප කළා. එතුමිය දැනුත් මේ සභාවට ඇවිල්ලා නැහැ. Cabinet Paper එකක් දමා media ඒකකය අනුමත කර දෙන්න, අවසර අරගෙන දෙන්න කියලා එතුමියගෙන් ඉල්ලුවාම, ඒක මඟ හැරියා. අදටත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මාධ්‍ය ඒකකය පාවිච්චි කරන්නේ, වාහන පාවිච්චි කරන්නේ, කෝටි ගණනක් වටිනා උපකරණ පාවිච්චි කරන්නේ, ඒවා තමන්ගේ පක්ෂයේ කටයුතුවලට යොදවන්නේ නීතියට විරුද්ධව; අනුමැතියක් නැතුව; කැබිනට් අනුමැතියක් නැතුව. කලින් හිටපු මහින්ද යාපා අබේවර්ධන කථානායකතුමා එතුමාගේ ධුර කාලයට පමණක් සීමා වන ආකාරයට ඒක පාවිච්චි කළා. එතුමාගේ ධුර කාලය අවසන් වීමත් සමඟම ඒ අනුමැතිය අවසන්. මේ අඩුපාඩුව දැක්කා. මේ අඩුපාඩුව දැකලා අවසර ඉල්ලුවා. හැබැයි, කැබිනට් මණ්ඩලයට ඒක ඉදිරිපත් කරන්න අගමැතිතුමිය කැමැති වුණේ නැහැ. ඊට පසුවවත් අඩු ගණනේ මේක නතර කරන්න එපායැ. මොනවාද, මේ කරන්නේ?

ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා අතර උගත්, හොඳ මහත්වරු ඇති. අවබෝධයක් තිබෙන, සාධාරණව කටයුතු කරන්න පුළුවන් අය තමුන්නාන්සේලාගේ 159දෙනා අතර ඇති. එහෙම අය නැහැ කියලා අපි කියන්නේ නැහැ. එහෙම කෙනෙකු මේ පාර්ලිමේන්තුවේ මේ උත්තරීතර තනතුරට, එම ගෞරවාන්විත තනතුරට පත් කරන්න කටයුතු කරනවා හැරෙන්න,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කරගෙන යන දේ ඉතාම නරක දෙයක්. මතක තබා ගන්න, අපි මේ ආණ්ඩුවේ බලයට, මේ 159දෙනාගේ බලයට යට වෙන්නේ නැහැ; ඔය 2/3 බලයට, විධායක බලයට යට වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්. කථාව අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මීට වඩා දුෂ්කර තත්ත්වයන් යටතේ, ඒකාධිපති බලය පැවැති කාලයේ, ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව ආපු දූෂක, පීඩක ආණ්ඩුවලට විරුද්ධවත් අපි වැඩ කර තිබෙනවා; සටන් කර තිබෙනවා. ඒ සටන අපි ඉදිරියටම අරගෙන යනවා කියන කාරණය මා නිර්භීතව ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොහොම ස්තුතියි. අද උදේ වරුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගොඩක් දෙනා මෙතැන කෑ ගැහුවා. නමුත් අද මාතෘකාවට අපි ප්‍රවිෂ්ට වුණොත්, විශේෂයෙන්ම - *[බාධා කිරීමක්]*

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමනි, ඔබතුමා රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ කුමන ස්ථාවර නියෝගය යටතේද?

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් අදහස් දැක්වූ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා Parliamentary Business Committee එකේත් නැහැ. පසුගිය Parliamentary Business Committee Meeting එකේදී -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මොකක්ද ස්ථාවර නියෝගය?

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
91 (ඊ). විශේෂයෙන්ම Parliamentary Business Committee එකේදි කථා කළේ, - *[බාධා කිරීමක්]* කථානායකවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න තිබෙන අයිතිය අපි පිළිගන්නවා; ගෙනෙන්න පුළුවන්කම තිබෙනවා. නමුත් මේ ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාව- *[බාධා කිරීමක්]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඒක point of Order එකක් නොවෙයි නේ.

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
ස්ථාවර නියෝගවලට යටත්ව තමයි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න පුළුවන්කම තිබෙන්නේ. *[බාධා කිරීම්]* නමුත් මේ සමහර කරුණු අධිකරණයේ සාකච්ඡා වෙමින් තිබෙන දේවල්. *[බාධා කිරීම්]* ඒ නිසා ඔවුන් එකඟ වුණා, ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාවේ තිබෙන දේවල් සංශෝධනය කරලා නැවත ගෙන එන්න. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ, නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා, කාරණය අවබෝධයි. *[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපිත් Parliamentary Business Committee එකේ සාමාජිකයෝ. අපි ඉතා පැහැදිලිව කිව්වා, ආණ්ඩුවට ඕනෑ විධියට විශ්වාස භංගය ලියන්න අපි ලැහැස්ති නැහැ කියලා. අනෙක් එක, Parliamentary Business Committee එකට කිසිම අයිතියක් නැහැ, සංශෝධනය කරන්න කියලා ඉල්ලීමක් කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාරණය පැහැදිලියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න.

[අ.භා. 1.13]

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දැක්කා නේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද උදේ මෙතැන දහලපු දැහලිල්ල. විශේෂයෙන්ම මේ මාතෘකාව ගැන මේගොල්ලන්ට කථා කරන්න අයිතියක් නැහැ. ඒක නිසා තමයි මේගොල්ලන් මේ මාතෘකාව මහ හරින්නේ. විශේෂයෙන්ම ලංකාවේ අපනයන ක්ෂේත්‍රය දියුණු කරන්න අවශ්‍ය කරන කටයුතු ටික දශක 4ක් තිස්සේ කර ගන්න බැරි වෙච්ච අය ඉන්න විපක්ෂයක් තමයි අද මේ මාතෘකාව මහ හරිමින් කථා කරන්නේ. මේගොල්ලන්ට ආර්ථිකය හසුරුවලා අන්තිමට ගොඩනගා ගන්න පුළුවන් වුණේ ඩොලර් බිලියන 108ක ආර්ථිකයක් පමණයි. මේක තමයි අවුරුදු 76ක කෙරුවාව. ඊළඟට, අපනයනය පැත්තෙන් ගත්තොත්, 2020-2024 වනකොටත් ඩොලර් බිලියන 16ක වාගේ අපනයන ආර්ථිකයක් තමයි මේගොල්ලන්ට හදාගන්න පුළුවන් වුණේ. විශේෂයෙන්ම අපි මෙන්න මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අපට පසුව අපනයන ක්ෂේත්‍රයට පිවිසුණු වියට්නාමය ඩොලර් බිලියන 505ක පමණ, තායිලන්තය ඩොලර් බිලියන 410ක පමණ, මැලේසියාව ඩොලර් බිලියන 330ක පමණ, ඉන්දුනීසියාව ඩොලර් බිලියන 300ක පමණ අපනයන ආර්ථිකයක් හදාගෙන තිබෙනවා. මේ උදවිය කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බලාගෙන කල්පනා කෙරුවොත් පෙනේවි, මෙච්චර කාලයක් ආණ්ඩු කරලාත්, මෙච්චර කාලයක් රටේ දේශපාලනය කරලාත්, මෙච්චර කාලයක් මේ ආර්ථිකය හසුරවලාත් අපේ රටේ අපනයන ආර්ථිකයක් හදා ගන්න තමන්ට බැරි වුණා නේද කියලා. මේ සභාව තේරුම් ගන්න ඕනෑ, අපනයන ප්‍රමුඛ ආර්ථිකයක් හදන්න නම් රටේ මූලික ව්‍යුහාත්මක වෙනස්කම් ටිකක් කර ගන්න ඕනෑ කියන එක. මේගොල්ලන්ට ඒ ටික දශක දෙකක් තිස්සේ කර ගන්න බැරි වෙච්ච නිසා අපි දැන් ඒ ටික කරනවා.

විශේෂයෙන්ම වෙළෙඳ ගිවිසුම්වලට එළැඹීම අනිවාර්ය, අත්‍යවශ්‍ය කාරණයක්. අද ලංකාවේ ක්‍රියාත්මක වන වෙළෙඳ ගිවිසුමකට තිබෙන්නේ ඉන්දියානු වෙළෙඳ ගිවිසුම විතරයි. ඒකත් 1990 අවුරුද්දේ එකක්. අපට එනැනින් එහාට region එක, අග්නිදිග ආසියාව, යුරෝපය, මැදපෙරදිග සමඟ තවම free trade agreements නැහැ. වියට්නාමයට මේ වාගේ free trade agreements තිස් ගණනකට වඩා තිබෙනවා. ඒ වාගේම, අපේ අපනයන තරගකාරිත්වය හදා ගන්න අවශ්‍ය කරන බදු ක්‍රම, බදු පහසුකම්, ඒ වාගේම යටිතල පහසුකම්, බලශක්ති පහසුකම් ලබා දෙන්න, පිරිවැය අඩු කර ගන්න මෙච්චර කාලයක් කටයුතු කරලා නැහැ. ඒ තරගකාරිත්වය ඇති කර ගන්න අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය වෙනස්කම් අපි මේ වනකොටත් කරනවා. විශේෂයෙන්ම තීරුබදු ප්‍රතිපත්තිය හරහා යෙදවුම් අමුද්‍රව්‍ය අඩු පිරිවැයකට ලබා දීම අපනයන කර්මාන්තයට රුකුලක් වෙනවා.

අපනයන ප්‍රමුඛ කර්මාන්ත ගත්තොත්, ඒ කර්මාන්ත බොහෝ වෙලාවට පිහිටුවා තිබෙන්නේ industrial zonesවල. නමුත්, අපේ රටේ කර්මාන්තකරුවන්ට industrial zones හදලා නැහැ. අපි දැන් අලුතින් කර්මාන්තපුර 11ක් හදාගෙන යනවා. ඒවා හරහා තමයි ආයෝජන ගෙන්වා ගන්න අපට පුළුවන් වෙන්නේ. ඒ වාගේම තමයි ලෝකයේ වෙළෙඳ පොළට අපි සම්බන්ධ වෙලා නැති නිසාත්, රාජ්‍ය යන්ත්‍රණයේ තිබුණු අකාර්යක්ෂමතාව නිසාත්, විශේෂයෙන්ම අපනයන ක්ෂේත්‍රයේ, රේගුවේ, බදු ක්‍රමවල, මූල්‍ය රෙගුලාසිවල සහ ඉඩම් ප්‍රතිපත්තිවල තිබුණු අකාර්යක්ෂමතාව නිසා ඍජු විදේශ ආයෝජන ලංකාවට ඇවිල්ලා නැහැ. මේ උදවිය බොරුවට මෙච්චර කෑ ගැහුවාට, ලංකාවේ average ඍජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 700ක් විතර තමයි මේගොල්ලන්ගේ

ආණ්ඩුවල ධුර කාලයේ තිබිලා තියෙන්නේ. මේ ආණ්ඩුව ආවාට පසුව පසුගිය අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.1ක FDIs ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි, export promotions කරන්න තිබුණු, 1980 ගණන්වල හදපු ශක්තිමත් ආයතනය වන EDB ආයතනය සම්පූර්ණයෙන් අකර්මණ්‍ය කරලායි තිබුණේ. අපි ආණ්ඩුව ගන්න කොට ඒකට අවශ්‍ය කරන සේවකයන් සහ ඒකට අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන දීලා තිබුණේ නැහැ. විශේෂයෙන්ම EDB එකට මිලියන 600කටත් වඩා අඩු මුදල් ප්‍රතිපාදන තමයි දීලා තිබුණේ. එහෙම නම්, ඒකට අවශ්‍ය කරන ප්‍රතිපාදන දීලා අපනයන ප්‍රවර්ධනය කිරීම කළ යුතුයි. මෙන්න මේ කියන කාරණා 5 හරියාකාරව ඉටු කළොත් තමයි රටක අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගතියක් දකින්න පුළුවන් වෙන්නේ. අපි මෙන්න මේ ක්‍රියාවලි සියල්ල කරමින් පසුගිය අවුරුදු දෙකේ සෑම ක්ෂේත්‍රයකින්ම ඉදිරියට ගිහින් තිබෙනවා.

ඊළඟට, අපි මේ අවුරුද්දේ National Export Development Plan එක ඉදිරිපත් කළා. ඒක අප විතරක් හදපු එකක් නොවෙයි, කාලාන්තරයක් තිස්සේ හැදිච්ච එකක්. නමුත් කර්මාන්තකරුවන් සියල්ලන්ගේම, අපනයනකරුවන් සියල්ලන්ගේම සහ ආසියානු සංවර්ධන බැංකුවේත් සහාය ඇතිව, සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරගෙන අපනයන ක්ෂේත්‍රයට අදාළව යන්ත්‍රණයක් පිහිටුවා මේ අපනයන ක්ෂේත්‍රය මෙතැනින් එහාට දියුණු කරන්නේ කොහොමද කියලා ක්ෂේත්‍ර 10ක් ප්‍රමුඛ කරගෙන අවුරුදු 5කට අදාළ වැඩ පිළිවෙළක් අපි දැන් ඉදිරිපත් කර තිබෙනවා.

විපක්ෂයේ සමහරු දැන් ලොකුවට කෑ ගැහුවත්, ලෝකයේ ආර්ථික අර්බුදයක් තිබෙන බව අපි හැමෝම දන්නවා. පොඩි ළමයෙක් පවා දන්නවා, ලෝකයේ ආර්ථික අර්බුදයක් තිබෙනවා කියලා. යුරෝපය සහ ඇමෙරිකාව තමයි අපේ ප්‍රධාන ආනයනකරු. එතකොට ඒ ප්‍රදේශවල තිබෙන උද්ධමනය, ඒ ප්‍රදේශවල තිබෙන ආර්ථික අර්බුද හැම තිස්සේම අපේ ඇඟලුම් ක්ෂේත්‍රයට බලපානවා. මොකද, 2008දී ලෝක ආර්ථික අර්බුදය ආවාම ඒක ඇඟලුම් ක්ෂේත්‍රයට බලපෑවා. ඒකට හේතුව තමයි, අප කරන්නේ high-quality garments වීම. ඒවා consumer spending එක මත තමයි depend වෙන්නේ. එතකොට ආර්ථික අර්බුද ආවාම සාමාන්‍ය slowdown එකක් එනවා. නමුත් අප ඒකෙම පදනම් වෙලා ඉන්නේ නැතිව, ඒ market එකේම පදනම් වෙලා ඉන්නේ නැතිව එතැනින් එහාට ගිහින් පසුගිය අවුරුදු දෙක ඇතුළත පමණක් මේ සියලු ප්‍රශ්න මැද්දේ අපි සියයට 6ක අපනයන වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා.

අපට බලශක්ති අර්බුදයක් තිබුණා, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රශ්න තිබුණා. විශේෂයෙන්ම ගුවන් සහ නාවික ප්‍රවාහන මාර්ගවල අවහිරතා තිබුණා. ඒ සියලු අභියෝග මධ්‍යයේ food and beverages sector එක සියයට 20කින් වර්ධනය වෙලා තිබෙනවා. Electrical and electronics sector එක සියයට 60කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම, spice sector එකත් මේ වසරේ සියයට 30කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේ අලුත් ක්ෂේත්‍ර ගණනාවක් ශ්‍රී ලංකාව තුළ නැඟී එමින් තිබෙනවා. අපේ සාම්ප්‍රදායික ක්ෂේත්‍ර ඒ ඒ ප්‍රමාණවලින් වර්ධනය වුණා වාගේම, අලුත් ක්ෂේත්‍රත් නැඟී එමින් තිබෙනවා. ඒ වාගේම, export destination එක diversify කර ගැනීමේ අවශ්‍යතාවත් අපට තිබුණා. ඒ සඳහා අප ගත් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් විධියට Indian market එක පසුගිය වසර දෙක තුළ වාර්ෂිකව සියයට 20කින් පමණ grow වෙලා තිබෙනවා. එම වර්ධනය මේ වසරේදීත් අපට පෙනෙනවා, පසුගිය වසරේදීත් පෙනුණා.

මෙහිදී, චීන market එක පිළිබඳවත් සඳහන් කළ යුතුයි. විවිධ පාර්ශ්ව වසර ගණනාවක් රට පාලනය කළත්, චීනයට ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක වටිනාකමකින් යුත් භාණ්ඩ ප්‍රමාණයක්වත් අපනයනය කර ගැනීමට හැකි වෙලා තිබුණේ නැහැ. නමුත්, අපි අද වන විට එම අගය ඇමෙරිකානු ඩොලර් මිලියන 269 දක්වා ඉහළ නංවාගෙන තිබෙනවා. මම මේ කියන්නේ, අපේ කර්මාන්තකරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ මහන්සිය, ඔවුන්ගේ ප්‍රමුඛතාව ගැනයි. අපි සිදු කරන්නේ පහසුකම් සලසන එක විතරයි.

අනෙක් පැත්තෙන් බැලුවොත්, ලෝක අර්බුදකාරී තත්ත්වය හමුවේ UAE, Arab සහ Iraq යන markets තුනටම මේ වසරේ අපේ අපනයන අඩු වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී තමයි සියයට 5ක අපනයන වර්ධනයක් අපි අත්කරගෙන තිබෙන්නේ. ඒ සියලු අභියෝග සහ අර්බුද හමුවේ අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ අප සියලුදෙනා ක්ෂණිකව ඉදිරිපත් වෙලා කටයුතු කළා. විශේෂයෙන්ම බලශක්ති අර්බුදය - ඉන්ධන අර්බුදය - ඇති වුණු අවස්ථාවේ අපනයනකරුවන්ට ප්‍රමුඛතාව ලබා දීලා, ඔවුන්ට අවශ්‍ය quota එක ලබා දීමට අපි කටයුතු කළා. ඒ අනුව, අපනයන කර්මාන්තශාලා එක දවසක්වත් වහන්නේ නැතුව අඛණ්ඩව පවත්වාගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම, packing සම්බන්ධයෙන්, විශේෂයෙන්ම DCTS සම්බන්ධයෙන් එංගලන්තය ඇතුළු යුරෝපා රටවල් හඳුන්වා දෙන අලුත් නීති රීති සපුරා ගන්න පුළුවන් විධියට දැනුම ලබා දීලා අපි එතැනින් එහාට ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට, US tariff එක ගැනත් කියන්න ඕනෑ. US tariff එක ගහලා, අපේ අපනයන කඩා වැටිලා, අරගළයක් ඇවිල්ලා, අපේ ආණ්ඩුව ගෙදර යයි කියලා කට ඇරගෙන බලාගෙන සිටියා. ඒ සඳහාත් අපේ රජය ක්ෂණිකව මැදිහත් වෙලා, අදාළ ක්ෂේත්‍රයේ පිරිසත් දායක කරගෙන, තානාපතිවරුන්ගේ සහායත් අරගෙන ලෝකයේ පවතින තරගකාරීම tariff rate එකකට එන්න අපට පුළුවන් වුණා. ඒ සියලු ක්‍රියාවලීන් සිදුවෙන්නේ අපනයන ක්ෂේත්‍රය ඇතුළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙනකොට අපි ජාතික අපනයන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ සඳහා ආයතන ගණනාවක් සම්බන්ධ වෙලා තිබෙනවා. එමෙන්ම, සෑම ක්ෂේත්‍රයකටම අදාළව අපනයන කම්ටු 24ක් පත් කරලා තිබෙනවා. ඒ වාගේම, EDB එක දැන් export forum එකක් ආරම්භ කරලා තිබෙනවා. මෙතුමන්ලා නොවිසඳු අපනයනකරුවන්ගේ ප්‍රශ්න 312ක් මේ වෙනකොට ඔවුන් අපට ඉදිරිපත් කරලා තිබෙනවා. එම ගැටලු එකින් එක විසඳමින් යන්න ඕනෑ. මොකද, එක් එක් ක්ෂේත්‍රයට අදාළ විසඳුම් තිබෙනවා. ධීවර කර්මාන්තයට අදාළ ගැටලු තිබෙනවා, කෘෂි කාර්මික ද්‍රව්‍ය අපනයනයට අදාළ ගැටලු තිබෙනවා, ඒ වාගේම පොල් කර්මාන්තයේ අපනයන වැඩි කර ගැනීමට බාධා වන ගැටලුත් තිබෙනවා. මේ විධියට දශක ගණනාවක් තිස්සේ නොවිසඳුණු ප්‍රශ්න තමයි අපි මේ විධියට එකින් එක විසඳමින් යන්නේ. එහෙම නැතුව, වසර ගණනාවක් තිස්සේ නොකළ දේවල් එකවර සිදු කිරීමට හැකියාවක් නැහැ. මේ තත්ත්වය අපේ කර්මාන්තකරුවන් ඉතා හොඳින් දන්නවා. විශේෂයෙන්ම, ජාත්‍යන්තර trade fairsවලට හරිහමන් විධියට සහභාගි වෙන්න budget එකක් දීලා තිබුණේ නැහැ. නමුත්, පසුගිය වසරේදී ජනාධිපතිතුමා ඒ සඳහා රුපියල් මිලියන 400කට අධික budget එකක් වෙන් කළා. එම ප්‍රතිපාදන යොදාගෙන අපි ජපානයේ පැවැති Food Expo එකට, Thailand's THAIFEX - Anuga Asia එකට, ඊළඟට Greeceවලට, ඕස්ට්‍රේලියාවට, චීනයට, ජර්මනියට, මෙතෙක් කාලයක් අපේ අපනයනකරුවන් ගිහිල්ලා නැති ක්ෂේත්‍ර සඳහා යන්න අපි ඔවුන්ට අවස්ථාව සලසා දුන්නා.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

විශේෂයෙන්ම, සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් - SMEs - 327දෙනෙක් පසුගිය අවුරුද්දේ පමණක් ලංකාවෙන් පිට රටවලට ගිහිල්ලා තමන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කරලා තිබෙනවා. ඒ වාගේම, හැම රටක් එක්කම අපි trade delegations ආරම්භ කරලා තිබෙනවා. මේ ආකාරයේ ක්‍රියාමාර්ග හරහා තමයි promotion එක වෙන්නේ. එම ක්‍රියාවලිය සිදු වෙනවා වාගේම, ප්‍රාදේශීය මට්ටමින් අපනයන ක්ෂේත්‍රය පුළුල් කිරීම සඳහා අපි කටයුතු කරමින් සිටිනවා. ඒ අනුව, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම සම්බන්ධ කරගෙන, ප්‍රාදේශීය වශයෙන් workshops පවත්වලා නව අපනයනකරුවන් නිර්මාණය කරන්න මේ වෙනකොට වැඩ පටන් අරගෙන තිබෙනවා. මෙහි උච්චතම අවස්ථාව වෙන්නේ, ලබන ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිත Sri Lanka Expo 2027. අවුරුදු 15කට පසුව තමයි එම Expo එක පැවැත්වෙන්නේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ලබා දී තිබෙනවා. ඒ අනුව, අවුරුදු 15කට පසුව ලබන ජනවාරි මාසයේ ශ්‍රී ලංකාවේ දැවැන්තම අපනයන ප්‍රදර්ශනය පැවැත් වෙනවා. කියන්න සතුටුයි, එම ප්‍රදර්ශනය සඳහා මේ වෙනකොට විදේශීය ආයෝජකයන් සහ ගැනුම්කරුවන් 600දෙනෙක් register වෙලා තිබෙනවා. ලබන ජනවාරි මාසයේ දෙවැනි සතිය කියන්නේ, විශේෂයෙන්ම ලංකාවේ සංචාරක ව්‍යාපාරයටත්, අපනයන ක්ෂේත්‍රයටත්, ආයෝජනවලටත් අවශ්‍ය සම්පූර්ණ attraction එක ලැබෙන මාසය.

ඊළඟට, අපි විදේශ ආයෝජනවලට එහා ගිහිල්ලා දේශීය කර්මාන්තකරුවා අපනයනයට යොමු කරන්න TIEP scheme එක promote කරගෙන ගියා. මීට කලින් TIEP scheme එක ගැන කර්මාන්තකරුවා දැනුවත් වෙලා තිබුණේ නැහැ. එයත් අර ණය වාගේ තමයි. ඒ කාලයේ ආණ්ඩුවෙන් දීපු ණය ගැන දැනගෙන හිටියේ කිහිපදෙනයි. ඒ ගැන සමස්ත ප්‍රජාව දැනගෙන හිටියේ නැහැ. අපි TIEP scheme එක promote කළාට පස්සේ, 2025දී විතරක් TIEP scheme එකේ දේශීය ව්‍යාපාරිකයෝ 355දෙනෙක් register වෙලා තිබෙනවා. මේ වෙනකොට ඒ අය අපනයන ක්ෂේත්‍රයට යොමු වෙලා තිබෙනවා.

ඊළඟට, BoI එක ගැන කිව්වා, ආයෝජන ගැන කිව්වා. BOI එක පසුගිය අවුරුද්දේ ඩොලර් බිලියන 1.1ක ආයෝජන ලබාගෙන, මේ අවුරුද්දේ මේ වෙනකොට ඩොලර් මිලියන 460කට ආසන්න ආයෝජන ළඟා කරගෙන තිබෙනවා. අපේ අපනයන ක්‍රියාවලිය යන්නේ, product diversification පැත්තට සහ market diversification පැත්තටයි. කියන්න සතුටුයි, 2025දී product diversification පැත්තෙන් විතරක් අලුත් HS codes 57ක් යටතේ අපි අපනයන ආරම්භ කරලා තිබෙනවා. හැබැයි, අපෙන් අහනවා මොනවාද කළේ කියලා. එහෙම නේද? අපි, අපේ අපනයනකරුවන්ට දෙන ධෛර්යය, අපනයනකරුවන්ට දෙන පහසුකම් සහ අපනයනකරුවන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීම තුළ ඔවුන් උනන්දු වෙලා තමයි මේ දේවල් කරන්නේ. 2026 මේ වෙනකොට අපි අලුත් HS codes 91ක් අපනයන ක්ෂේත්‍රයට යොමු කරගෙන තිබෙනවා.

අපි එම ක්‍රියාවලියෙන් ඔබ්බට ගිහිල්ලා අපේ ආයතන ලෝකයට, ජාත්‍යන්තරයට, අරගෙන යන්නේ කොහොමද කියන එක ගැන මේ වෙනකොට වැඩ පිළිවෙළක් සකස් කරමින් යනවා. ඒ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයත් එකතු වෙලා අපේ තානාපති කාර්යාල හරහා matchmaking කරන්න උත්සාහ කරනවා, අපේ ආයතනවලට විදේශ හවුල්කරුවන් සම්බන්ධ කරගන්නේ කොහොමද කියලා. මොකද, මෙතැනින් එහාට බඩු විකුණලා විතරක් trading mode එකේ ඉස්සරහට යන්න බැහැ. අවශ්‍ය investments ගෙන්වා ගන්න නම් targeted approach එකක් තිබෙන්න ඕනෑ, එක එක රටවලට අපි ඇතුළු වෙන්නේ කොහොමද කියන එක ගැන. කියන්න සතුටුයි, ලංකාවේ ප්‍රසිද්ධ ආයතනයක් වන මැලිබන් ආයතනය මේ අවුරුද්දේ එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, අපේ රටේ නිෂ්පාදිත බිස්කට් තායිලන්තයේ "7-Eleven" කියන වෙළෙඳ කුටි 15,000ක් හරහා එරට වෙළෙඳ පොළට නිකුත් කරන්න. ලංකාවේ බිස්කට් එකක් තායිලන්තයේ market එකට first time තමයි මේ යවන්නේ. ඒ වාගේ targeted approach එකක් අවශ්‍ය වෙනවා, අපේ brands, අපේ organizations වෙනත් රටවල position කරන්න. ඒ සඳහා මෙච්චර කාලයකට නිශ්චිත වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් දැන් "Go Global" කියලා programme එකක් on කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

මට තව පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

එම ක්‍රියාවලිය හරහා ඒ එන අයව list කරලා, විදේශ රටවල ඒගොල්ලෝ සම්බන්ධ වෙන්න ඕනෑ, ආයතන අපි list down කරලා තිබෙනවා. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයත් එකට එකතු වෙලා තමයි එම ක්‍රියාවලිය කරන්නේ. එතකොට මෙතෙක් කල් අපනයනකරුවන්ට නොලැබුණු සහන ප්‍රමාණයකුත්, incentive scheme එකකුත් ලබන අවුරුදු කිහිපය ඇතුළත ලබා දෙන්න මුදල් අමාත්‍යාංශයත් එක්ක මේ වෙනකොට කථා කරලා තිබෙනවා. අපටත් මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය හා වියට්නාමය වාගේ ඩොලර් බිලියන 500ක පමණ අපනයන ආර්ථිකයක් හදාගන්න අවශ්‍ය නම්, අපි මේ ක්‍රියාවලිය සක්‍රීයව කරන්න ඕනෑ. මම හිතනවා, ඒකට ඉදිරියේදී විපක්ෂය සහාය ලබා දෙයි කියලා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීවරුනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සඳහා විෂය කරුණු වන්නේ, මැද පෙරදිග යුද්මය වාතාවරණය සහ සබැඳි ගෝලීය සැපයුම් දාමය සඳහා බාධා හා අපනයන ආදායම හා සම්බන්ධ කරුණු. ඒ අනුව මාතෘකාව ප්‍රකාරව, ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ තමන්ගේ කථාව පවත්වන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.29]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය ඔහොම කිව්වාට ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයේ වාඩි වෙලා

ඉන්නකොට මන්ත්‍රීවරු කථා කළේ වෙන වෙන බහුබූත නේ. ඒවාට ඉඩ දුන්නා නේ. ඒ නඟපු චෝදනාවලට උත්තර දෙන්න අපට අයිතියක් තිබෙනවා. දැන්, පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කථා කරනවා. නමුත්, පාර්ලිමේන්තු සම්ප්‍රදාය කඩ කරලා කථානායකට ගෙනාපු විශ්වාස භංග යෝජනාව අයින් කරලා තිබෙනවා. අද විවාද කරන්න තිබුණේ ඒ ගැන. ඊළඟ කාරණය මෙකයි. පාර්ලිමේන්තුව ගිනි තියන්න ආපු අය කොහොමද පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කථා කරන්නේ? තුණ්ඩු දීලා රට පාලනය කරපු අය කොහොමද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය පැත්තෙන් මන්ත්‍රීවරයෙක් පිළිතුරු ලබා දුන්නා නේ. අපි මාතෘකාවට අනුව කථා කරමු.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඔබතුමියට ආණ්ඩු පක්ෂයේ කට්ටිය කථා කරනකොට ඒක තේරෙන්නේ නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

එකට උත්තර දෙන්න බැරි මොකද්?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

එකට උත්තර දෙන්න බැරි මොකද්?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

එකට උත්තර දෙන්න බැරි මොකද්? මෙතැනට ඇවිල්ලා උත්තර දුන්නා නම් ප්‍රශ්නයක් නැහැ නේ. මහ ලොකුවට ඔක්කෝම දන්න, සුපිරිසිදු චරිත නේ. ඇවිල්ලා උත්තර දුන්නා නම් ප්‍රශ්නයක් නැහැ නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශ්වාස භංග යෝජනාව Order Paper එකට ඇතුළත් කළාට පස්සේ ඒක අයින් කරන්න පුළුවන් මෙතැනදී බහුතර ඡන්ද විමසීමක් කරලායි.

එහෙම නැත්නම්, ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව Prorogue කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි මේ යෝජනාව අයින් කරන්න පුළුවන් වන්නේ. මේක මොකක්ද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

හරිද? එතුමාගේ දේවල් ඔක්කොම එළියට එන එක තමයි මේ මහ හරින්නේ.

දැන් බලන්න, ආණ්ඩුව ඇතුළේ බෙදීමක් තිබෙනවා. බිමල් රත්නායක මැතිතුමා උදේ මෙතැන හිටියා. හැබැයි, ඊට පස්සේ වැඩේ කථා වනකොට missing. *[බාධා කිරීමක්]* අගමැතිතුමිය රට. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොච්චර මේක හැදුවත්, මේක ලිඛිතව දීලා තිබෙන්නේ. ඇයි උත්තර දෙන්න බැරි? ලිඛිතව දීලා තිබෙන්නේ. මේවා දැන් සමාජ මාධ්‍යවල ගිහිල්ලා තිබෙන්නේ. මේක රටේ මිනිස්සු දන්නවා.

ඒගොල්ලන් තර්කයක් ගෙනාවා, අධිකරණයේ නඩු තිබෙනවා කියලා. මොන අධිකරණයේද නඩු තිබෙන්නේ? දේශබන්දු තෙන්නකෝන්ට අධිකරණයේ නඩු තිබියදීනේ මේ පාර්ලිමේන්තුවට යෝජනා සම්මතයක් ගෙනාවා නේද? අධිකරණයේ නඩු තිබියදීයි එහෙම කළේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

උත්තර දී ගන්නත් බැහැ. අනෙක් අයට හෝදන්නත් බැහැ, එතුමාව. ඒ නිසා තමයි මේක ගෙනෙන්නේ නැත්තේ. ඒ නිසා තමයි භය. 159ක් ඉන්නවා කියනවා නේ. හරි, උත්තර ටික දීලා බේරාගන්නකෝ. එතකොට ප්‍රශ්නයක් නැහැ නේ. කුමාර ජයකොඩිව බේරා ගත්තේ. ඊළඟට, අධිකරණ ඇමතිතුමාව බේරා ගත්තේ. මේ එක චෝදනාවකටවත් උත්තර දී ගන්න බැහැ.

අඩුම ගාණේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කියලා කියන්න එපායැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ලජ්ජා නැති වැඩ නේ. ගමේ ඉන්න පොඩි හොරුවත් හොරකම් කරන්නේ නැහැ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඒවාත් ගහලා තිබෙන්නේ. හැබැයි, මම එක පැත්තකින් ගරු කරනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කියන එකට නම් මම ගරු කරනවා. එච්චරයි. මම ඊට වඩා ඒ ගැන කථා කරන්නේ නැහැ. කවදා හරි ඕක ගෙනෙන්න වෙනවා නේ. ඒ වෙලාවට ඉතුරු ටික කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම දැක්කා ඊයේ පෙරේදා විද්වත් සමුළුවේදී සීතා කියලා මහාචාර්යවරියක් කියනවා, ජනතාවට සවලෙන් බෙදන ආණ්ඩුවක්ලු, ඉන්නේ කියලා. ඇවිල්ලා බලන්න කියන්න, නාගරික වතු නිවාසවලට. අපේ නියෝජ්‍ය ඇමතිතුමෙකු මෙතැන ඉන්නවා, මම නම කියන්නේ නැහැ. මොකද, නම කිව්වාම නැඟිටින නිසා. එතුමා දැන් නගරාධිපතිතුමියත් එක්ක හැම තැනකම යනවා නේ. මට්ටක්කුලිය, ආමර් වීදිය, මෝදර, මීතොටමුල්ල, සාලමුල්ල, සේදවත්ත, ඔරුගොඩවත්ත ප්‍රදේශවලට ඇවිල්ලා බලන්න කියන්න, ජනතාව ලෙවකන විධිය.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගෝඨාභයගේ කාලයේත් අපලයක් තිබුණා නේ, සීතා කියලා නෝනා කෙනෙකුගේ. අර torch එකකුයි, කුඩයකුයි ගත්ත එක්කෙනා. දැන් මේ ආණ්ඩුව කාලයේත් ඇවිල්ලා ඉන්නවා, සීතා කියලා නෝනා කෙනෙක්. දෙකම එකම model. ඒකේ හිටියා, වියත්මගේ කණ්ඩායමක්. ඒ වාගේ කණ්ඩායමක් මේක ඇතුළෙත් ඉන්නවා. එදාත් සීතා නෝනා කෙනෙක් ඇවිල්ලා හිටියා. මේ වතාවේත් සීතා කියලා නෝනා කෙනෙක් ඇවිල්ලා ඉන්නවා.

ඊයේ ඉඳලා TIN එක අනිවාර්යයි නේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව තිබෙන කාලයේ මම නොවෙයි, මේගොල්ලන්ගේ නියෝජ්‍ය ඇමති කෙනෙකු කිව්වා, "TIN සීයා TIN එක අනිවාර්ය කළාම වාහනයක් ලියාපදිංචි කරන්න බැහැ, ඉඩමක් register කර ගන්න බැහැ, credit card එකක් ගන්න බැහැ, බිල්ඩින් සැලසුමක් අනුමත කරන්න බැහැ" කියලා. ඕනෑනම් වීඩියෝ එක දාලා පෙන්වන්නම්. හැබැයි, දැන් TIN එක අනිවාර්යයිලු. සද්ද නැහැ. ආණ්ඩු කරන්න කලින් මේගොල්ලන්ට හැම ප්‍රශ්නයකටම උත්තරයක් තිබෙනවා. ආණ්ඩු කරන විධිය දවස්පතා කියලා දෙනවා. හැම ප්‍රශ්නයකටම ෆයිල් එකක් තිබෙනවා. දැන් ඇවිල්ලා වේදිකාවක් ගාණේ නහයෙන් අඬනවා, ආණ්ඩු කරන්න බැරි විධිය කියලා. ආණ්ඩු කරන්න බැරි විධිය කිය කියා අඬ අඬා යනවා. ඕක දුන්නා නම් හොඳයි පොඩි එකෙකුට, ඊට වඩා හොඳට කරයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ 76 වසරෙම මේකේ මොකුත් වෙලා නැහැ. ගොවි ජනපද ව්‍යාපාර බිහි වුණේ කොයි කාලයේද දන්නේ නැහැ. මහපොළ ශිෂ්‍යත්වය දුන්නේ, උදා ගම්මාන හැදුවේ කවුද? අපනයන ආර්ථිකය ගැන දැන් මහ ලොකුවට කථා කළාට, ජේවීපී එක 1988-89 කාලයේ මේ රට ගිනි තිබ්බාට පස්සේ, ආර්ථිකය කඩාකප්පල් කරලා විනාශ කරලා දැම්මාට පස්සේ ඇහලුම් කර්මාන්තශාලා 200ක් හදලා ඇහලුම් අපනයනයෙන් විශාල අපනයන ආදායමක් මේ රටට ගෙනෙන්න කටයුතු කළේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමායි. *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න, පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න, පණ්ඩිත වෙන්නේ නැතිව. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන්නේ කොයි කාලයේද? පසුගිය 76 වසර තුළ තමයි ගම් උදාව වැඩසටහන ආරම්භ වුණේ, වික්ටෝරියා සහ රන්දෙනිගල ජලාශ හැදුණේ. හැබැයි, ඒ 76 වසර ඇතුළතම තමයි තුණ්ඩු කෑල්ලෙන් රට වැහුවේ, මිනිස්සුන්ගේ බෙල්ලට වෙඩි තියලා මැරුවේ, කඹය දාලා ඇදගෙන ගියේ. ඕවා පරණ හින්දා අපි කථා කරන්න කැමැති නැහැ. හැබැයි, මේ කුහක ප්‍රකාශ නිසා අපි ඕවා කියන්න ඕනෑ. දැන් ඔය කථා ඇතුළේම කිව්වා නේ, 1983දී තමයි EDB එක වාගේ දැවැන්ත ආයතනයක් හැදුවේ කියලා. එතකොට පසුගිය 76 වසර ඇතුළේ නොවෙයිද ඒක හැදුවේ? 76 වසරෙන් පිටද ඒක හැදුවේ? මෙතැන අඬ අඬා ඉන්නේ නැතුව වැඩේ කරන්න.

ජනාධිපතිතුමා මැතිවරණයට කලින් ඇහුවා, refineries තිබෙනවා, තෙල් ගෙනැල්ලා විකුණන එක මහ කජ්ජක්ද කියලා. ඒවා කරන්න ආණ්ඩු ඕනෑද කියාත් එතුමා ඇහුවා. එතුමා ආණ්ඩුව භාර ගන්නකොට පෙට්‍රල් ලීටරයක් රුපියල් 290යි. හැබැයි දැන් පෙට්‍රල් ලීටරයක් රුපියල් 424යි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය කාන්තාවක් විධියට පොළට ගිහිල්ලා බලන්න, කඩේට ගිහිල්ලා බලන්න, එදා රුපියල් 10,000ට ගත්ත බඩු මල්ලට අද රුපියල් 15,000ක් ගෙවන්න ඕනෑ නැද්ද කියලා. තුනෙන් එකකින් අඩු කරනවා කියපු විදුලි බිල තව ටිකක් වැඩි වෙලා නැද්ද? බදු අඩු කරනවා කිව්වා නේ. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමුවැනි අය වැයෙන් නොවෙයිද ආහාරවල සහ අධ්‍යාපනය, සෞඛ්‍ය කියන සේවාවල බදු අඩු කරනවා කිව්වේ? ආණ්ඩුව කිව්වේ කොහොමද? පොඩි එකාට උගන්වන්න ගියාමත් බදු ගෙවන්න ඕනෑ, බඩගින්නට කන්න ගියාමත් බදු ගෙවන්න ඕනෑ, ලෙඩ වෙලා ඉස්පිරිතාලෙ ගියාමත් බදු ගෙවන්න ඕනෑ කියලා තමයි එදා කිව්වේ. ඒ වාගේ පට්ටපල් බොරු කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මාලිමාවේ මන්ත්‍රීවරියක් හින්දා ඔබතුමියත් මේවා අහලා ඇති නේ. අපි ළඟ විද්‍යාඥයෝ ඉන්නවා, ඒ නිසා මාළු අල්ලන App එකක් අපි හඳුන්වා දෙනවා කියලා ආණ්ඩුව කිව්වා. කොල්ලෝ ටික අම්බානකට විශ්වාස කළා, ඒක ඇත්ත නේන්නම් කියලා. ඊළඟට කිව්වා, අපේ රට වටේම මහ මුහුදු තිබෙනවා, අපි මුහුදු වතුරෙන් සල්ෆියුරික් අම්ලය හදනවා, හදලා අපනයනය කරලා ඩොලර් ආදායම ගේනවා කියලා. මීට පෙර කථා කළ නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේ ඒ මොකුත් නැහැ.

ඊළඟට, ත්‍රිකුණාමලයට ගිහිල්ලා කිව්වා, ලංකාවේ ලොකුම මිනිරන් පතල තිබෙන නිසා මේ ඩොලර් බිලියන 41 ගෙවලා දාන එක මහ කජ්ජක්ද කියලා. අද "මීක්" කියාගන්න බැහැ. නිකම් බොරු පම්පෝරි ගැහුවාට හෙණ ගහනවා වාගේ විදුලි බිල ඉහළ ගිහිල්ලා, ආහාර පානවල මිල ඉහළ ගිහිල්ලා, බෙත්-හේත්වල මිල ඉහළ ගිහිල්ලා, පොත්පත්වල මිල ඉහළ ගිහිල්ලා. වැඩිය ඕනෑ නැහැ. ගෑසුත් නැහැ. කහ පාට ගෑස් ඒගොල්ලන්ගේ යාළුවන්ගේ. ඒකත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මට තව විනාඩි දෙකක් වැඩිපුර දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නැහැ, නැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
නැහැ, නැහැ. මට විනාඩි දෙකක් දුන්නා. දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික විද්වත් සංවිධානයේ ජාතික සමුළුවේදී ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? එහිදී ජනාධිපතිතුමා කිව්වා, ඒගොල්ලන්ගේ ආණ්ඩුව ආවාට පස්සේ කිසිදු අලුත් බද්දක් ගහලා නැහැ කියලා. මම කියන්නම්, පනවපු බදු ලැයිස්තුව. කෝ, අර නියෝජ්‍ය ඇමතිතුමා ගියා නේ. මම කියන්නම්, පනවපු බදු ලැයිස්තුව. සේවා අපනයනය මත සියයට 15ක ආදායම් බද්ද ගෙනාවේ කවුද? අපිද? 2025.04.01වැනි දා සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 15ක ඒ අලුත් බද්ද මේගොල්ලන්ගේ ආණ්ඩුවෙන් පැනෙව්වේ. 2025.10.01වැනි දා සිට ක්‍රියාත්මක වන පරිදි අනේවාසික විදේශීය ඩිජිටල් සේවා මත සියයට 18 VAT එක ගෙනාවේ අපිද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලයට අමතරව තව විනාඩියක් ලැබෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
හොඳයි, මම කථා කරන්නම්.

මැතිවරණ කාලයේදී YouTube එකේ, TikTok එකේ, Facebook එකේ ඔබට කඩේ ගිය Gen Z පරම්පරාව, උදවු කරපු අය monetizationවලින් හම්බ කරන ගණනට තමයි මේ ආණ්ඩුව පහර ගැහුවේ. ඒගොල්ලන් ඡන්දය දීලා ඉල්ලාගෙන කෑවේ. ඒ බද්ද ගෙනාවේ නැද්ද? ඊළඟට, වෘත්තීය සේවා ගෙවීම් මත සියයට 5 රැඳවුම් බද්ද අපිද ගෙනාවේ? මේගොල්ලන් ගෙනාවේ; මේගොල්ලන්ගේ ආණ්ඩුවෙන්. 2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත අනුවයි එය ගෙනාවේ. එය සභතික කළේ 2026.06.03වැනි දා. මම දන්නේ නැහැ, මේවා ගැන මුඛයෙන් කථා කරනවාද, අධෝමුඛයෙන් කථා කරනවාද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී හෝ වට්ටම් ආදායම මත අය කරන බද්ද සියයට 10 කළේ කවුද? අපිද? මේ, JVP ආණ්ඩුව. ඊළඟට, ප්‍රාග්ධන ලාභ බද්ද සියයට 10 ඉඳලා සියයට 15 දක්වා වැඩි කළේ කවුද? අපිද? මේගොල්ලන්. එය ක්‍රියාත්මක වන දිනයත් ඕනෑනම් කියන්නම්, සභතික කළ පනත් අංකයත් කියන්නම්. ක්‍රියාත්මක වන දිනය 2025.04.01වැනි දා. පනත් අංකය 2025 අංක 2. රිරි මාංස උරා බොනවා වාගේ බදු වැඩි කරලා තිබෙනවා. ප්‍රාග්ධන ලාභ බද්ද සියයට 10 ඉඳලා සියයට 15 දක්වා වැඩි කළා. මූල්‍ය සේවා මත පනවා ඇති VAT එක සියයට 18 ඉඳලා සියයට 20.5 දක්වා වැඩි කළේ කවුද? අපිද? අන්න, ඊයේ ඉඳලා පොඩි පොඩි restaurantsවලටත් SSCL එක පනවා තිබෙනවා. ඒ නිසා මේවා රෙදි ඇඳගෙන කථා කරනවාද දන්නේ නැහැ. මේගොල්ලන් දන්න දෙයකුත් නැහැ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කථා කරනවා, පාර්ලිමේන්තුව ගිනි තියන්න ඇවිල්ලා.

මේගොල්ලන් දැන් අපනයනය ගැනත් කථා කරනවා. නමුත් අපනයනයට මොකද වෙලා තිබෙන්නේ? දැන් නියෝජ්‍ය ඇමතිතුමෙක් කෙබරයක් ගහලා ගියා, ඍජු විදේශ ආයෝජන එනවා කියලා. කෝ? මොන ව්‍යාපෘතියටද? කෝ, පෙන්වන්න, මොන ව්‍යාපෘතියටද, ඍජු විදේශ ආයෝජන ආවේ, මොනවාද ආරම්භ කරපු නිෂ්පාදන, මොනවාද ඒකෙන් ප්‍රතිඅපනයනය කළේ, රැකියා කීයක් ආරම්භ කළාද කියලා. ඒ නිසා මහත්තයෝ, දැන් බොරු කියන්න එපා.

ජනාධිපතිතුමාගේ ධුර කාලය මාස 60යි. මාස 55න් ජනාධිපතිවරණය පවත්වන්න කටයුතු සූදානම් කරන්න ඕනෑ. දැන් ඒ කාලයෙන් මාස 26ක් ඉවරයි. 27වැනි මාසය මේ යන්නේ. මම දන්නේ නැහැ, එක පැත්තකින් ජනාධිපතිතුමා පව්. එතුමාට මේ වාගේ කණ්ඩායමක් ඇඳගෙන යන්න වෙලා තිබෙන්නේ මොන විධියටද කියලා කියන්න මට තේරෙන්නේ නැහැ. ඉතින්, සතියකට සැරයක් ඇවිල්ලා හෝදන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කථානායක අද පැනලා ගියාට හැමදාම කථානායකට පැනලා යන්න බැහැ. එතුමාට චෝදනා 50ක් තිබෙනවා. මේ සභාවට ඇවිල්ලා ඒවාට උත්තර දෙන්න ඕනෑ. අපි දිගටම මේ කටයුත්ත ගෙනියනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.40]

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමා බදු සම්බන්ධයෙන් කියපු බොරු ප්‍රචාරවලට - බොරු කථාවලට - මම විශේෂයෙන්ම පිළිතුරක් ලබා දෙන්න කැමැතියි. එතුමා කිව්වා, වෘත්තීය සේවා ගෙවීම් මත සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් දැම්මාය කියලා. ඔබතුමා දේශීය ආදායම් (සංශෝධන) පනත පරිශීලනය කරලා බලන්න. ඔබතුමා වැරදි ප්‍රචාර කරන්න එපා. දේශීය ආදායම් (සංශෝධන) පනතේ පැහැදිලිව තිබෙනවා, සියලු වෘත්තීය සේවාවන්ට සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පනවනවා කියලා. *[බාධා කිරීමක්]* ඊට අමතරව රඳවා ගැනීමේ බද්ද අපි සියයට 10ක් කළාය කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම පොලිය කීයක් ආවත්, මෙතුමන්ලා තමයි රඳවා ගැනීමේ බද්ද,-

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ නම කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නම කිව්වේ නැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම බොරු කිව්වේ නැහැ. ප්‍රාග්ධන ලාභ බද්ද,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා කථා කරන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. *[බාධා කිරීමක්]* ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

ගරු නිශාන්ත ජයවීර මහතා
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
නමක් කිව්වේ නැහැ මම. *[බාධා කිරීමක්]* මම කිසිම නමක් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* මේක අහගන්න. *[බාධා කිරීමක්]*

[ගරු නිශාන්ත ජයවීර මහතා]

මේක අහගන්න, දන්නේ නැත්නම්. මේක අහගන්න, හරියටම. *[බාධා කිරීමක්]* මේක අහගන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා මේක අහගන්න. *[බාධා කිරීමක්]* බොරු ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ නැතුව මේක නිවැරදිව අහගන්න. මීට කලින් ඔබතුමන්ලා තමයි පොලී ආදායම කියක් ආවත් සියයට 5ක බදු මුදලක් අය කළේ. අපි ආවාට පස්සේ සියයට 10ක රඳවා ගැනීමේ බද්දක් අය කළාට ආදායම් බදු ගෙවන අයගෙන් විතරයි ඒක ගත්තේ. *[බාධා කිරීමක්]* ඊට අමතරව මූල්‍ය සේවා මත සියයට 20.5ක බද්දක් අය කළා කියනවා. එහෙම නොවෙයි වුණේ. මූල්‍ය සේවා මත පනවා තිබූ එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ බද්ද ඉවත් කරලා, ඒ දෙකේම එකතුව වෙනුවට සියයට 20.5ක් අය කළා මිසක් කිසිම බදු වැඩිවීමක් වුණේ නැහැ. ඒක, මෙතුමන්ලා සංකීර්ණ කරලා තිබුණු බදු ක්‍රමය අයින් කරන්න, සරල කරන්න ගත්ත පියවරක් විතරයි. ඊට අමතරව බදු බරක් පැටවුණේ නැහැ. ඒ නිසා මේ වාගේ බොරු ප්‍රකාශ ඉදිරිපත් කරන්න එපා කියලා මා එම මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊට අමතරව අපි බදු සහන කිහිපයක් දුන්නා. මම හැම තිස්සේම කියනවා, බදු නිදහස් සීමාව මසකට රුපියල් ලක්ෂයේ ඉඳලා රුපියල් ලක්ෂ එකහමාරකට වැඩි කළා කියන එක. වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට රුපියල් ලක්ෂ 18 දක්වා වැඩි කරලා තිබෙනවා. ඊට අමතරව කිරි ආශ්‍රිත නිෂ්පාදනවලට වැටි බදු සහන දීලා තිබෙනවා.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, TIN සහතික ගැන. TIN සහතික ගන්නකොට අපි විරුද්ධ වුණාලු. ඒ වෙලාවේදී TIN සහතික ලක්ෂ දෙකයි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරලා තිබුණේ. ඊට පස්සේ දෙපාර්තමේන්තුව කාර්යක්ෂමව කටයුතු කරලා, මිලියන 13කට වැඩි පිරිසකට මේ වෙනකොට TIN අංක නිකුත් කරලා තිබෙනවා, කිසිම පුරවැසියෙක් දෙපාර්තමේන්තුවට ගෙන්වන්නේ නැතුව. පවතින නීතිය අනුව TIN සහතිකයක් ගන්න ඕනෑ, වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයින්. ලංකාවේ වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයින් මිලියන 17කට වැඩි සංඛ්‍යාවක් ඉන්නවා. එයින් මිලියන 13කට වැඩි සංඛ්‍යාවක් සඳහා මේ වෙනකොට TIN සහතික නිකුත් කරලා තිබෙනවා. තවත් මිලියන 3කට වැඩි සංඛ්‍යාවකට තමයි TIN සහතික නිකුත් කරන්න තිබෙන්නේ. නමුත් මේ වෙලාවේදී විශේෂ ආර්ථික කටයුතු කිහිපයක් සඳහා TIN අංකය අනිවාර්යය කිරීම තුළ සමාජයේ අනවශ්‍ය කලබලයක් ඇති වෙලා තිබෙනවා. ඒ කලබලය නැති කරන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් මේ වෙනකොට විශේෂ නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, TIN අංකය ලබා ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධව. ඒ කියන්නේ මෙහෙමයි. අපි හිතමු, කවුරු හරි කෙනෙක් වාහනයක් ලියාපදිංචි කරන්න යනවා, එහෙම නැත්නම් වාහනයට ආදායම් බලපත්‍රයක් ලබා ගන්න යනවා, එහෙමත් නැත්නම් බැංකුවක ගිණුමක් විවෘත කරන්න යනවා කියලා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී විශේෂ නිවේදනයක් නිකුත් කරයි. ඒ වාගේ අවස්ථාවකදී කිසිම කෙනෙක් තවදුරටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන්න ඕනෑ නැහැ. තමන්ගේ අදාළ අවශ්‍යතාව ඉටු කර ගැනීම සඳහා යම් ආයතනයක් වෙත යනකොට ඔවුන්ට පුළුවන්, තමන්ගේ ජාතික හැඳුනුම්පතේ මුද්‍රිත පිටපතක්, තමන්ගේ දුරකථන අංකය සහ ඊමේල් ලිපිනයක් තිබෙනවා නම් ඒ ඊමේල් ලිපිනය ඒ අදාළ ආයතනයට ලබා දෙන්න. එතකොට TIN අංකයක් නොතිබුණා වුණත් හෙට සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ට පුළුවන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යන්නේ නැතුව අදාළ ආයතනයට තමන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සහ අදාළ තොරතුරු ලබා දීමෙන් තමන්ගේ අවශ්‍යතාව ඉටු කර ගැනීමට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් වැඩිපුර ලැබී තිබෙනවා.

ගරු නිශාන්ත ජයවීර මහතා
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

තවදුරටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගිහිල්ලා රස්තියාදු වෙන්න එපා. විශේෂ ආර්ථික ක්‍රියාකාරකමක් ඉටු කර ගන්න යනකොට ඒ අදාළ ආයතනය වෙත තමන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්, දුරකථන අංකය සහ ඊමේල් ලිපිනයක් තිබෙනවා නම් එයත් ලබා දෙන්න. එතකොට ඒ ආයතනයෙන් ඔබේ අවශ්‍යතාව ඉටු කරලා දෙයි. ඊට පස්සේ ඒ ආයතනය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඔබගේ සියලු තොරතුරු ලබා දීමෙන් අනතුරුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඔබ වෙත TIN එකක්, එහෙම නැත්නම් බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකයක් ලබා දෙයි. එලෙස ලබා දෙන්නේ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය. මම ඉල්ලා සිටිනවා, ඊමේල් ලිපිනයක් තිබෙන සියලුදෙනා ඒ ඊමේල් ලිපිනය ලබා දෙන්න කියලා. එලෙස ඊමේල් ලිපිනයක් ලබා දීලා තිබෙනවා නම් දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිගණක පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමෙන් අනතුරුව එම ඊමේල් ලිපිනයට බදු ගෙවන්නා හඳුනා ගැනීමේ සහතිකයේ පිටපතක් ලැබෙයි. ඒක නිසා මේක කලබල වෙන්න අවශ්‍ය කාරණයක් නොවෙයි.

ඊටත් අමතරව යම් පරිගණක සාක්ෂරතාවක් තිබෙන තරුණ පරම්පරාවට මම මතක් කරනවා, ඔයගොල්ලන් දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන්න එපා, online ක්‍රමවේදය ඔස්සේ මේ TIN සහතිකය ඉල්ලුම් කරන්න ඔබට පුළුවන් කියන කාරණය. තමන්ට අදාළ විස්තර සහ තමන්ගේ හැඳුනුම්පතේ පිටපතක් upload කිරීම හරහා TIN සහතිකය online ක්‍රමවේදය ඔස්සේ ඉල්ලුම් කළාම තමන්ගේ ඊමේල් ලිපිනයට අදාළ TIN සහතිකයේ පිටපතක් ස්වයංක්‍රියවම ලැබෙනවා. එතකොට දෙපාර්තමේන්තුව වෙත යන්නේ නැතිව ඒ TIN සහතිකය ලබා ගන්න පුළුවන්. ඒ විධියට කටයුතු කිරීම තුළ අනවශ්‍ය තදබදය නැති වෙලා යනවා. ඒ අනුව කටයුතු කරන්න කියලා මම සියලුම ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. ඉදිරියේදී TIN සහතිකය ලබා ගන්න ඔබ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගිහිල්ලා අනවශ්‍ය විධියට රස්තියාදු වෙන්න එපා. අදාළ ආයතනයට ගිහිල්ලා තමන්ගේ ආර්ථික ක්‍රියාකාරකම සිදු කර ගන්නා මෙන් අපි සමස්ත ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

අද දින සභාව කල් තැබීමේ යෝජනාවට අදාළව අපනයන ආදායම් ගැන කථා කරනකොට අපේ චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා වාගේ අපේ රජය ආවාට පස්සේ 2025 අවුරුද්දේ ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම වන ඇමෙරිකානු ඩොලර් බිලියන 17කට වැඩි ප්‍රමාණයක් උපයා ගන්න අපි සමත් වුණා. ඒත් එක්කම අපේ අපනයන ආදායම වැඩි කර ගන්න විශේෂ උපාය මාර්ග ලෙස අපනයන විවිධාංගීකරණ පස් අවුරුදු සැලැස්මක් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සැලැස්ම අනුව අවුරුදු පහක කාල සීමාවක් තුළදී අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 36ක් දක්වා වැඩි කර ගන්න තමයි සැලසුම් කරලා තිබෙන්නේ. ඒ අනුව විශේෂයෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය සහ රජය විසින් අදාළ කර්මාන්ත සම්බන්ධයෙන් දිරි දීමනා සහ සහන ණය

යෝජනා ක්‍රම හඳුන්වා දීලා තිබෙනවා. මොකද, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නහාසිටුවන්න, ඔවුන්ගේ අපනයන වැඩිදියුණු කරන්න තමයි රුපියල් බිලියන 95ක විශේෂ ණය යෝජනා ක්‍රමයක් නිකුත් කළේ.

ඊටත් අමතරව අපි කවුරුත් දන්නවා, "දිටිවා" සුළි කුණාටුවෙන් හානියට පත් වුණු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නහාසිටුවන්න අදාළ ආධාර මුදල් ලබා දෙන්න කටයුතු කළ බව. මේ සියලුම දේවලින් බලාපොරොත්තු වෙන්නේ අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නහාසිටුවලා අපේ ආර්ථිකය ශක්තිමත් කරන්නයි. අපි කවුරුත් දන්නවා, අපේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට දායක වන්නේ අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් බව. ඔවුන් නහාසිටුවීම තුළින් තමයි අපේ ආදායම වැඩි කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ අනුව ඉදිරියේදී වඩාත් වැඩි වේගයකින් අපේ අපනයන ආදායම වැඩි කර ගන්න කටයුතු කරන බව පවසමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.49]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන් අද මේ විවාදයේදී මූලික වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අපනයන ආදායම වැඩිවීම සම්බන්ධව අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් කථා කළා. හැබැයි, ඇත්තවශයෙන්ම සිදු වෙලා තිබෙන්නේ මේකයි. දැන් මේ රටේ අපනයනය කරන අය විශාල වශයෙන් පිට රටවල ඩොලර් park කරනවා, ලංකාවට ගෙනෙන්නේ නැහැ. මොකද එහෙම කරන්නේ? ලංකාවට ගෙනාවාම ආපහු ලංකාවෙන් එළියට ගෙනියන්න බැරි වෙන්න තමුන්නාන්සේලා දැන් යම්කිසි විධියකට බලපෑමක් එල්ල කරලා තිබෙනවා. ලංකාවේ ප්‍රධාන ව්‍යාපාරිකයෝ එක් කෙනෙක් දෙදෙනෙක් විතරයි ඇත්තවශයෙන්ම සල්ලි ආපහු ලංකාවට ගෙනෙන්නේ. අනෙක් අය සල්ලි ආපහු ලංකාවට ගෙනෙන්නේ නැහැ. මොකක්ද ඒගොල්ලන් කරන්නේ? මම ඒගොල්ලන්ගේ නම් කියන්නේ නැහැ, ඒගොල්ලන්ටත් අවස්ථාවක් තිබෙන්න ඕනෑ නිසා. ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයෙක් මොකක්ද කරන්නේ? චීනයේ සහ ඕස්ට්‍රේලියාවේ කොම්පැනි දෙකක් ලියාපදිංචි කරලා, චීනයෙන් බඩු ගෙන්වන විධියට දාලා, ඕස්ට්‍රේලියාවේ සිට චීනයට මුදල් යවා එම භාණ්ඩ ඕස්ට්‍රේලියාවට යවනවා.

පාරවල් හදන්න මුදල් වියදම් කරලා තිබෙනවා, ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා, අධිවේගී මාර්ග හදනවා කියලා දැන් තමුන්නාන්සේලා කයිය ගහනවා. කයිය ගැහුවාට බිටුමින් නැහැ; පාරවල් හදන්න බිටුමින් නැහැ; බිටුමින් ගෙන්වන්න විධියක් නැහැ. දැන් ඔන්න යුරෝපයෙන් ගෙන්වන්න plan එකක් ගහලා තිබෙනවා. යුරෝපයෙන් ගෙනෙන බිටුමින් ලංකාවේ පාරවල්වලට දාලා අවුරුද්දක් දෙකක් යනකොට පාරවල් ඉවරයි. මොකද, ඒක ලංකාවට ගැළපෙන්නේ නැහැ. තමුන්නාන්සේලා මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කරලා, එකතු කරලා, භාණ්ඩාගාරයේ සල්ලි තිබෙනවා කියලා ඒවායෙන් සල්ලි දැම්මාට, ඒ සල්ලිවලින් සියයට 90ක් යන්නේ මේ ව්‍යාපෘතිවලට අවශ්‍ය කරන යකඩ ටික, තාර ටික, අනෙක් සියලු දේවල් පිට රටවලින් ගෙන්වන්නයි. එතකොට මොකද වෙන්නේ? අනිවාර්යයෙන් ඩොලර් ඕනෑ වෙනවා. ඩොලර් නැතිව තමුන්නාන්සේලාට ජීවත් වෙන්න විධියක් නැහැ. මේ ගමන යන්න බැහැ. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන කයිය ගැහුවාට වැඩක් නැහැ. අපි මුල ඉඳලාම මේ ගැන කිව්වා. මම මේ පාර්ලිමේන්තුවේ ඇති වෙනකල් කියලා තිබෙනවා. පාර්ලිමේන්තුවෙන් පිටතදීත් කියලා තිබෙනවා. තෙල් සම්බන්ධව ආපු අර්බුදය බෙරාගන්න තමුන්නාන්සේලාට බැරිව ගියා. තමුන්නාන්සේලා මොකක්ද කළේ? පළමුවෙන් කිව්වා, තෙල් ටැංකි නැහැයි කියලා. ධාරිතාව නැහැයි කිව්වා; අරවා නැහැයි කිව්වා; මේවා නැහැයි කිව්වා. ඒක පෙන්වා දුන්නාට පස්සේ තමුන්නාන්සේලා single spot tenders ගහන්න පටන් ගත්තා. Term tenders cancel කළා. තෙල් ටික පුරවා ගත්තේ නැහැ වෙලාවට. දැන් මොකක්ද කියන්නේ? දැන් කියනවා, දැන් කරන්න විධියක් නැහැලු.

දැන් බැලුවාම, ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයක මිල තිබුණේ, රුපියල් 344ට. මිල අඩු කරලා ගෙනැල්ලා දුන්න එක අවසාන වශයෙන් දැන් රුපියල් 424ට ගිහින් තිබෙනවා. මේ විධියට ඔක්කොම මිල ඉහළ ගියාට පස්සේ මොකද වෙන්නේ? පාන් මිල රුපියල් 5කින් වැඩි වෙනවා. හැම භාණ්ඩයකම මිල වැඩිවෙලා තිබෙන්නේ. ඇත්තවශයෙන්ම මේක විශාල අර්බුදයක් බවට පත්වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලාට පෙනුණේ නැති වුණාට යටින් ගිනි ගොඩක් මේ තිබෙන්නේ. ඒ නිසා, ඒක හොඳින් අවබෝධ කරගන්න. තව මාසයක්, දෙකක් යනකොට; දවස් පනස් ගණනක් ඇතුළත තමුන්නාන්සේලා ඩොලර් බිලියන 2.3ක් හොයන්න ඕනෑ, ණය ගෙවන්නයි, ඉතිරි වැඩ ටික කරන්නයි. කොහෙන්ද ඒ මුදල හොයා ගන්නේ? ඒ නිසා මම කියන්න කැමැතියි, ඒ ක්‍රියාදාමය ගැන හොඳින් අවබෝධ කරගෙන වැඩ කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවට අපි වරප්‍රසාද ප්‍රශ්න 6කට වඩා ගෙනාවා. ඒ එක ප්‍රශ්නයක්වත් අහන්න අපට ඉඩ දුන්නේ නැහැ. ඒක ලේකම් මණ්ඩලයට දමනවා කිව්වා. මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් දැන් මාසයක් විතර තබාගෙන ඉන්නවා. මොකක්ද වුණේ කියලා මම දන්නෙත් නැහැ. මම අහපුවාම කියනවා, ඒක ලේකම් මණ්ඩලයට දාලා තිබෙන්නේ කියලා. ලේකම් මණ්ඩලයට දමන්න කියලා නොවෙයි අපි කිව්වේ. ඉතින්, කථානායකතුමාට පුළුවන් මේකට අවසරය දෙන්න. සෑහීමට පත්වන්නේ නම් එතුමාට අවසරය දෙන්න පුළුවන්. ඒක වරප්‍රසාදයක්ද, නැද්ද කියලා හොයලා බලන්නේ වරප්‍රසාද කමිටුව. ඒක එතුමා භාරගන්න ඕනෑ නැහැ. බල්ලාගේ වැඩේ බූරුවා කරන්න යන්න ඕනෑ නැහැ නේ.

අපි 44දෙනෙක් අත්සන් කරලා විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා තිබුණා, විවාදයට ගන්න කියලා. මෙතැන බිමල් රත්නායක මහත්මයා කිව්වා, "හා, අද යෝජනාව ගෙනෙන්න. අද ගෙනාවොත් හෙට විවාදය දෙන්නම්" කියලා. එහෙමයි කිව්වේ. "අද ගෙනෙන්න, හෙට විවාදය දෙන්නම්" කියලා කිව්වා. අද වෙච්ච දෙයක් නැහැ. බිමල් රත්නායක මහත්මයාත් නැතිලා ගිහිල්ලා. අවසානයේ අර අභිංසක නලින්ද ජයතිස්ස මහත්මයා හිර වුණා. දැන් මේ විශ්වාස භංග යෝජනාව විවාදයට ගන්න දෙන්නේ නැත්තේ ඇයි? මේකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙය *sub judice* කියලා කියනවා, *sub judice* ගැන දන්නේ නැති නීතිඥ මහත්වරු. ඉතින්, *sub judice* ගැන හරියට අවබෝධ කරගන්න ඉස්සරවෙලා හොයන්න ඕනෑ, මේ *sub judice* එක එන්නේ කොහොමද කියලා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

සාමාන්‍යයෙන් Court of Appeal එකේ නඩු කථා කරනකොට notice issue කරන්නේ නැතිව සාමාන්‍යයෙන් කාරණයක් කථා වෙනවා නම් ඒක *sub judice* නොවෙයි. තවම විනිශ්චයකාරවරු තීරණය කරලා නැහැ නඩුව අහන්න. නඩුව අහන්න කලින් ඒගොල්ලන් කියනවා, අපට කියන්න, මෙතැන නඩුවක් තිබෙනවාද, *prima facie* case එකක් තිබෙනවාද කියලා බලන්න කියලා. දැන් මේක අරගෙන ඇවිල්ලා උගත් නීතිඥ මහත්මයෙක් කියනවා, - මම දන්නේ නැහැ, උගත් ද, පඩිපෙළේ ද හිටියේ කියලා - මේක ගන්න බැහැ කියලා. දැන් අපේ මේ ලේකම් මණ්ඩලය කිව්වාම මොකක්ද කියන්නේ? මෙතැනත් ඉන්නවා, විනිශ්චයකාරතුමෙක් විධියට හිටපු අපේ සහකාර මහ ලේකම්තුමා. එතුමා දන්නා ප්‍රමාණය දන්නවාද, ඔය කියන මහත්වරු? නීතිපතිගෙන් ඇහුවෙත් නැහැ. අඩුම තරමින් නීතිපතිගෙන් අහලා කිව්වා නම් කමක් නැහැ. ඒ මනුස්සයාට තග දාලා, "හා, ඔයා කොහොමද එහෙම දාන්නේ. අපි කියන එක කරන්න" කියලා- අර ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයේ කවල් මෙහේ දමන්න එන්න එපා; මේක පාර්ලිමේන්තුව. එහෙම කරලා ඒ විශ්වාස භංග යෝජනාව විවාදයට ගැනීම නැවැත්තුවා. මොකක්ද කළේ? ඒක විවාදයට ගන්න දෙන්න බැහැයි කිව්වා. මීට කලින්, - උදාහරණ ඇතිවෙන්න තිබෙනවා - අර මහින්ද යාපා අබේවර්ධන මහත්මයාට එරෙහිව විශ්වාස භංග යෝජනාව ගෙනෙනකොට, ඒ වෙලාවේ නඩු 7කට වඩා තිබුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේ, හැම තැනම නඩු ඇහුවා, දේශබන්දු තෙන්නකෝන්ට විරුද්ධව leave to proceed දීලා. ඒ කියන්නේ, නඩුව අහන්න තීරණය කරලා. Notice issue කරලා නැතිව නොවෙයි. දැන් මේ චමින්ද කුලරත්න මහත්මයා දාලා තිබෙන නඩුවට - CA/WRIT/109/2026 - තවම notice issue කරලාත් නැහැ. තවම, නඩුවක් තිබෙනවාද කියලා කරුණු දක්වන්න කියනවා. ඒක බලාගෙන ඉඳලා රෝ අපේ කට්ටිය හිතාගෙන ඉන්නවා, - *[බාධා කිරීමක්]* ඔව්. ඒකේ යනවා නේ, අරහෙම වුණා මෙහෙම වුණා කියලා. ඒකේ කරුණු කියනවා. මෙහි තිබෙන කරුණු, චෝදනා ටික තමයි කියන්නේ. ඇවිල්ලා අපට කියනවා, දැන් නඩුව අහනවාලු. එක්කෝ ඒ ගැන දැන ගන්න ඕනෑ. මොකද, මහෙස්ත්‍රාත් අධිකරණයේ ඉන්නකොට ඒක තේරෙන්නේ නැහැ. මහෙස්ත්‍රාත් අධිකරණයේ නේ වැඩ කරලා තිබෙන්නේ. Court of Appeal එකේ වැඩ කරලාත් නැහැ, Supreme Court ගිහිල්ලාත් නැහැ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
පඩි පේළියේ හිටියේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, පඩි පේළියේ හිටියාම තේරෙන්නේ නැහැ. ඒක එක කාරණයක්.

ඊළඟට, දෙවැනි කාරණය ගන්නකෝ. හිටපු පොලිස්පති දේශබන්දු තෙන්නකොන් මහත්මයාට විරුද්ධව යෝජනාව මේ පාර්ලිමේන්තුවට ගෙනෙනකොට ඔහුට විරුද්ධව නඩු නවයක් යනවා; *sub judice* තමයි. දේශබන්දු තෙන්නකෝන්ගේ නඩුව යනකොට, 2025 අගෝස්තු 05වැනි දා මේ කථානායකම ඒ යෝජනාව අත්සන් කරලා දෙනවා, පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන්නට. ඒක *sub judice*. හෝ ගාලා කථා කරනවා. දේශබන්දු තෙන්නකෝන්ට බනිනවා, අරවා කියනවා, මේවා කියනවා. ඒකත් වැරදියි. හරිද? නමුත් මේකේ තිබෙන එක දෙයක් අල්ලාගෙන තමයි මේක කරන්න හදන්නේ. මතක තියාගන්න. තමුන්නාන්සේලා මේකට මුහුණ දෙන්නේ නැහැ. ඒක විතරක් මට කියන්න පුළුවන්. මුහුණ දෙන්න බැහැ. මොකද, මේකේ තිබෙන හොරකම් ටික බැලුවොත්, පල් හොරකම් ගොඩක් තිබෙන්නේ; හොරකම් නොවෙයි පල් හොරකම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
විනාඩි දෙකයි? ඒක වෙන්න විධියක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේකේ තිබෙන චෝදනා මොනවාද? මෙහි චෝදනා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. තොරතුරු ඉල්ලා සිටියාම මේ පාර්ලිමේන්තුව තොරතුරු ටික දීලා නැහැ. කවුද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඊළඟට, වාහනවලට කැබිනට් අමාත්‍යවරයෙකුට ලැබෙන ඉන්ධන ලබා ගනිමින්, ඊට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලැබෙන තෙල් ටිකත් ගහගෙන තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
දෙකම අරගෙනද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, දෙකම අරගෙන තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ!

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ඔව්. මේකේ ඔක්කෝම තිබෙනවා. ඒ සියල්ල මේකේ තිබෙනවා. ගන්න පුළුවන් උපරිම ඉන්ධන ප්‍රමාණය ලීටර් 900යි. ඊට අමතරව තවත් අරගෙන තිබෙනවා. ඊට අමතරව WP NC 4923 දරන වැන් රථය තම පෞද්ගලික පරිහරණයට භාවිත කර තිබෙනවා. මාස හයකට අධික කාලයක් තිස්සේ ඉන්ධන දීමනාවට අමතරව ඒකට තව ඉන්ධන ගහලා තිබෙනවා. අපේ විපක්ෂයේ මිනිහෙක් ඒවා කළා නම් සාමාන්‍යයෙන් එල්ලුම් ගස් යන වැඩ. රුපියල් ලක්ෂ තුනට අරගෙන ගිහිල්ලා අවුරුදු හතකට හිරේ

දානවා. *[බාධා කිරීම්]* ඔව්, චාමර සම්පත් මහත්තයාව තවම ඇදගෙන යනවා. අපි දන්නේ නැහැ, මොන වාගේ දෙයක් කරයිද කියලා. ඊළඟට බලන්න, මේ දීමනා අරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රී විධියට මාසේ ගාණේ තව ලීටර් 568ක් අරගෙන තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ඉරුවர්)
(An Hon. Member)
මාර වැඩක් නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ඒකේ තිබෙන චෝදනා සම්බන්ධව බැලුවොත් රුපියල් ලක්ෂ 20කට වැඩියි. ඊළඟට, නීති විරෝධී ආකාරයෙන් මාධ්‍ය අංශය සතු කැමරා උපකරණ ඇතුළු ඔක්කෝම බඩු ටික අරගෙන තිබෙනවා. ඊට පස්සේ බැලුවා, මේක මොනවා හරි කරලා settle කර ගන්න අගමැතිතුමිය ලවා යෝජනාවක් දාගන්න. අගමැතිතුමිය කිව්වා, අනේ මට නම් ඕවා ගේන්න එපා, මම ඔය හොර වැඩවලට අත ගහන්නේ නැහැ කියලා. දැන් ඒකෙන් backdate කරන්න බැහැ. ඒකත් දැන් ඉවරයි.

ඊළඟට, තව ඒවා තිබෙනවා. ඒවා ගැන නම් කථා කරලා වැඩක් නැහැ. එකට කන්න ගිහිල්ලා ගණන් බේරා ගන්න බැරිව, - මම ඒවා ගැන කියන්නේ නැහැ. ඒවා පෞද්ගලික ප්‍රශ්න. නමුත්, එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. ඒවා වැඩක් නැහැ නේ. පෞද්ගලික ඒවා නේ. *[බාධා කිරීමක්]* ඊළඟට, එතුමා අතිරේක ලේකම්වරයෙක් ලවා 274,975ක් දීලා, -*[බාධා කිරීමක්]* වමින්ද කුලරත්නත් එක්ක තිබෙන්නේ පෞද්ගලික ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විපක්ෂය පැත්තෙන් එතුමාට තව විනාඩි දෙකක කාලයක් දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාගෙන්ද අඩු වෙන්නේ? *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, තව කාලය ඕනෑ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩි දෙකක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තිබෙන කාලයෙන්ද අඩු වෙන්නේ?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමිය වෙලාව කපන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නැහැ, නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
විනාඩි දෙක, තත්පරයක් යනකොට ඉවරයි නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හරියටම වෙලාව දෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ෂුවර් නේද? මම කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන කාලයෙන් නේද අඩු වෙන්නේ?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඊළඟට, ගෙවල් තුනක් තිබෙනවා. ඒ, රම්‍ය, සුරම්‍ය, සුබ. කථානායක නිල නිවස තිබෙනවා. ඒකට තමන්ගේ සේවකයෝ අට දෙනෙක් ගෙනැල්ලා දාගන්නවා. ඊළඟට, ඒ අස්සේ තව ගෙයක් ගන්නවා, ලොරිස් පාරේ. එතුමාගේ ලේකම්ටත් තව එකක් අරගෙන දෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, දෙන්නාටම අරගෙන තිබෙනවා. එහෙම කරන්නේ කොහොමද? මේවා අමාත්‍යවරුන්ට තිබුණු දේවල්. තමුන්නාන්සේලා කිව්වා නේ, ඇමතිවරුන්ගේ ඒවා අපි ගන්නේ නැහැ, අරවා මේවා කියලා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කවුද, ලේකම්?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම දන්නේ නැහැ. ඉන්නවා නිටපු පීඑච්අයි මහත්තයෙක්. ඒක තමයි අරගෙන තිබෙන්නේ. මේ විධියට ගත්තාම, මේ තිබෙන චෝදනා බැලුවාම තමුන්නාන්සේලා මේ වාගේ මනුස්සයෙක් මෙතැන තියාගෙන ඉන්න එක ගැන ලජ්ජයි. තමුන්නාන්සේලා කියන්නේ කොහොමද? "අපි අතරේ හොරු නැහැ" කියනවා. අපේ හිටපු ඇමතිතුමෙකු වන කුමාර ජයකොඩි මහත්තයා ගනිමු. එතුමාව ඇමතිකමින් අයින් කරලා ජනාධිපතිතුමා එතුමාව අතින් අල්ලාගෙන යනවා, සෝලා පද්ධති විවෘත කරන්න.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

හොරෙකුගේ මුහුණ දිහා බලන්නේ නැහැ කියපු ජනාධිපතිතුමාට නේ, මේ විපර්යාසය සිදු වෙලා තිබෙන්නේ. ඊයේ පෙරේදා දවසක ගිහිල්ලා හේලීස් එකේ තව සෝලා ව්‍යාපෘතියක් open කරනවා. ඇමති පැත්තක. හිටපු ඇමති ඒකට ගිහිල්ලා. හිටපු ඇමති, චෝදනාවලට ලක් වෙලා ඉන්න මනුස්සයෙක්; High Court නඩු තිබෙන්නේ. මේ අය තමයි දැන් වංචා, දූෂණ ගැන කථා කරන්නේ. තව නියෝජ්‍ය ඇමතිවරයෙකුට පක්ෂයෙන් කියලා තිබෙන එකක් මට මේ ළඟදි ආරංචි වුණා. "හෝටල්වල පැත්ත පළාතක යන්න එපා" කියලා තිබෙනවා. මොකද, හෝටල්වලට ගිහිල්ලා ඩීල් දමනවාලු. මේවා කියන්න ඕනෑ. ඒක නිසා මේ යෝජනාව විවාදයට ගන්න. අපි මේවා ගැන කථා කරන්නම්.

ඊළඟට, ප්‍රියන්ජිත් විතාරණ මහත්මයාට ලුතිනන් කර්නල් බණ්ඩාර ධම්මතොට කියන පුද්ගලයා කුණුහරුපයෙන් තර්ජනය කරලා තිබෙනවා. මා ළඟ ඒ වීඩියෝ එක තිබෙනවා. එහෙම තර්ජනය කරන්නේ කොහොමද? මීට කලින් තිබුණු ප්‍රශ්නයකට ඔහුව -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් මෙහි ඉන්න නිසා මම මේ කාරණය අහන්න කැමැතියි. ඔහුට විරුද්ධව එවැනි චෝදනා තිබියදී ඔහු බටලන්ද, සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ directing staff එකට දාලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ ගැන සොයා බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව තත්පර කිහිපයක් දෙන්න. ඊළඟට, නිලන්ත සත්සර ගමගේ මහත්මයාට,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. අනේ, මට තත්පර කීපයක් දෙන්න. වෙලාව තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩියක කාලයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමන්ලාගෙන් තවත් විනාඩියක කාලයක් දෙන්නද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, විනාඩියක් දෙන්න. හරි, හරි. මට විනාඩියක කාලයක් දුන්නා නේ. මට ඒකේ කථා කරන්න දෙන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, ඔබතුමා තව විනාඩියක කාලයක් ලබා ගන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නිලන්ත සත්සර ගමගේ මහත්මයාට ලිපියක් ගහනවා, සුනිල් සෙනෙවි මහත්මයාගේ ලේකම්. මොහුට විරුද්ධව නඩු පවරන්න කියලා කාටද ලියුම ගහන්නේ? රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂට. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ කොහොමද නඩු දාන්නේ? මේගොල්ලන් හිතාගෙන ඉන්නේ, එයාත් මේගොල්ලන් පත් කරලා තිබෙන පොලිස්පති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ DG වාගේ අය වෙන්න ඇති කියලා. මොකද, කියපු ගමන්, 'ටක්' ගාලා අල්ලාගෙන ගිහිල්ලා ඇතුළට දමනවා නේ. එයාට එහෙම බලයක් නැහැ. මොකක්ද මේ තමුන්නාන්සේලා කරන්නේ? මේ රට එහෙම පිටින්ම හමුදා පාලනයකට ගෙන යන තැනකට අද තල්ලු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒකට විරුද්ධව කරන්න අවශ්‍ය කටයුතු ටික අපි කරනවා කියන කාරණය සඳහන් කරමින්-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමියට ස්තුති කරන්නයි හදන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
අවශ්‍ය නැහැ, කාලය බාධා වෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික සට්ටම්පති ජනාධිපති නීතීඥ ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම අමාරුවෙන් කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්ඩලික කමිටුවල නියෝජ්‍ය සභාපතිතුමිය)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.02]

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
நன்றி! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய அரசாங்கம் ஆட்சிபீடத்துக்கு வந்து இரண்டு வருடங்களாகின்றது. இந்தக் காலப்பகுதியில் எமது நாடு ஏற்றுமதித்துறையில் எவ்வகையான முன்னேற்றத்தைக் கண்டுள்ளது என்பது தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதமே இன்றைய தினம் நடைபெறுகின்றது. இந்த விவாதமானது, இந்த மன்றத்தில் நடைபெறுகின்ற மிகவும் முக்கியமானதொரு விவாதமாகும். ஏன் நாங்கள் இதனை முக்கியமானதொரு விவாதமெனக் கூறுகின்றோம் என்றால், இது நமது இலங்கை நாட்டின் தலைவிதியைத் தீர்மானிக்கின்ற செயற்பாடுகளை முன்னெடுக்கும் ஏற்றுமதித்துறையுடன் சம்பந்தப்பட்டு இருப்பதனால்தான்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று காலையில் இந்தச் சபையில் பல்வேறு கூத்தாட்டங்கள் நடைபெற்றன. எனக்கு முன்னர் பேசிய உறுப்பினரும் அதில் பங்கேற்றிருந்தார். கடந்த காலத்தில் இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தில் ஒலிபரப்பப்பட்ட 'கோமாளிகளின் கும்மாளம்' நிகழ்ச்சி எனக்கு ஞாபகத்துக்கு வருகின்றது. இந்த நிகழ்ச்சியை மரிக்கார் என்பவர் தொகுத்து வழங்கியிருந்தார். நாங்கள் எல்லோரும் அதனை ரசித்துக் கேட்டுக்கொண்டு இருப்போம். இன்று காலையில் இச்சபையில் அதுபோன்ற தொரு கூத்தாட்டம் இடம்பெற்றது. அதன் பிறகு, உரையாற்றிய எதிர்க்கட்சித் தலைவரின் பேச்சைக் கேட்கும்போது உண்மையிலேயே நகைப்புக்கிடமாக இருந்தது. இன்று இங்கு பேசிய எதிர்க்கட்சி உறுப்பினர்கள், எங்களுடைய சபாநாயகருக்கு எதிராக முன்வைத்திருக்கின்ற நம்பிக்கையில்லாத் தீர்மானம் தொடர்பிலே குறிப்பாக அவர்மீது அபாண்டமாக பழிகளைச் சுமத்துகின்ற வகையிலே பேசினார்கள். பாராளுமன்ற சிறப்புரிமையைப் பயன்படுத்தி இங்குள்ள உறுப்பினர்கள் தங்களது வாயில் வந்த எதையும் பேசலாம். அந்த வகையில், எங்களுடைய சபாநாயகர்மீது அபாண்டமாக பழி சுமத்துகின்ற நடவடிக்கைகளை முன்னெடுக்கின்றவர்களாக எதிர்க்கட்சியினர் மாறியிருக் கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய சபாநாயகருக்கு எதிராக எதிர்க்கட்சியினர் கொண்டுவருகின்ற போலியான குற்றச்சாட்டுகளை உள்ளடக்கிய நம்பிக்கையில்லாப் பிரேரணையை எதிர் கொள்வதற்கு நாங்கள் தயார்! நாங்கள் இதற்கு முன்னரும் இவ்வாறான நிலைமைகளைச் சந்தித்திருக்கிறோம். நாங்கள் எதிர்க்கட்சியினருக்குச் சொல்வது வேறெதுவுமல்ல, நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவரும்போது அதற்குரிய நடைமுறையைப் பின்பற்றி கொண்டுவாருங்கள் என்றுதான். அவ்வாறு கொண்டுவந்தால், அந்த நம்பிக்கை யில்லாப் பிரேரணையை நாங்கள் உள்வாங்கிக்கொள்வதற்கும், அதற்கு முகங்கொடுப்பதற்கும் தயாராக இருக்கின்றோம். அதன்போது, எந்தவித குற்றமும் இழைக்காத எங்களுடைய கௌரவ சபாநாயகர் அவர்களைப் பாதுகாப்பதற்கும் நாங்கள் தயாராக இருக்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டின் ஏற்றுமதித்துறையில் நாம் எவ்வாறான வெற்றிகளை ஈட்டி வருகிறோம் என்பது பற்றி இன்றைக்கு நாங்கள் பேசுகின்றோம். விசேடமாக, இன்று எமது நாடு 17 பில்லியன் அமெரிக்க டொலர் வருமானத்தை ஏற்றுமதிமூலம் பெறுகின்றது என்பது எங்களுக்குத் தெரியும். இதை எதிர்காலத்தில் 30 பில்லியன் அமெரிக்க டொலராக அதிகரிப்பது எங்களுடைய இலக்காக இருக்கின்றது. அதற்கான வேலைத்திட்டங்களை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். ஏற்றுமதித்துறை வருமானத்தில் பல்வேறு துறைகள் பங்களிப்புச் செய்தபோதிலும்கூட, எதிர்காலத்தில் மீன்பிடித்துறை ஊடாக கூடுதலான வருமானத்தை ஈட்டுவதற் குரிய ஏதுவான நடவடிக்கைகளை நாம் வேகமாக முன்னெடுத்து வருகின்றோம்.

இதுநாள்வரைக்கும் ஈட்டாத வருமானத்தை கடந்த இரண்டு வருடங்களில் மீன் ஏற்றுமதிமூலம் எங்களுடைய நாடு ஈட்டியிருக்கிறது. அதாவது, 6,888.9 கோடி ரூபாயை ஈட்டியிருக்கிறது. இதற்கு முன்னர், எங்களுடைய நாட்டுக்கு மீன்பிடித்துறைமூலம் கிடைத்த வருமானம் சுமார் 285 மில்லியன் டொலராகும். இப்போது, நாங்கள் அதை 315 மில்லியன் டொலராக அதிகரித்திருக்கிறோம். 2030ஆம் ஆண்டாகும்போது, இதை 600 மில்லியன் டொலராக அதிகரிப்பதற்குரிய வேலைத்திட்டங்களை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். இப்பொழுது, நாங்கள் எங்களுடைய மீன்பிடித்துறையை முன்னேற்றுவதற்கான நடவடிக்கைகளை முன்னெடுக்கின்றபொழுது, எங்களுக்கு ஒரு விடயம் தெரிகின்றது. எங்களுடைய நாட்டில் எங்களை நம்பியிருக்கின்ற 2 கோடியே 20 இலட்சம் மக்களினதும் எதிர்பார்ப்பு வேறெதுவுமல்ல, இந்த நாட்டைப் பொருளாதார ரீதியாக வளர்ச்சியடைகின்ற நல்லதொரு நாடாக மாற்றியமைக்க வேண்டும் என்பதுதான்.

அந்த எதிர்பார்ப்பின் அடிப்படையில் இன்று நாங்கள் அடைந்திருக்கின்ற முன்னேற்றத்தை ஏன் இதற்கு முன்னர் இருந்த ஆட்சியாளர்களால் அடைய முடியவில்லை? கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதற்குக் காரணம் வேறு எதுவுமல்ல, அவர்கள் மேற்கொண்ட இலஞ்சம், ஊழல், மோசடி, அதிகார துஷ்பிரயோகம் என்பனதான். இதன் காரணமாகத்தான் இந்த நாடு சீரழிக்கப்பட்டு இருக்கின்றது. இன்றைக்கு நாங்கள் அந்த நிலைமையிலிருந்து எமது நாட்டை மீட்டெடுத்து இருக்கின்றோம். ஏற்றுமதித் துறையாக இருக்கலாம், இறக்குமதித் துறையாக இருக்கலாம், உற்பத்தித் துறையாக இருக்கலாம், இன்றைக்கு இந்த நாடு பொருளாதார ரீதியாக அனைத்துத் துறைகளிலும் சாதகமான திசையை நோக்கிச் செல்கின்றபோது, இனிமேல் தங்களால் ஆட்சிக்கு வருவதென்பது வெறும் கனவு என்பது இவர்களுக்குத் தெரியும். அதனால் இவர்கள் ஏதாவது சிறிய பிரச்சினைகளை வைத்து, அதன்மூலம் இந்த நாட்டில் மீண்டும் சலனத்தை ஏற்படுத்துவது எப்படி? இந்த நாட்டில் வாழுகின்ற சாதாரண

[ගරු රාමලිංගම් චන්ද්‍රශේකර් මහතා]

අප්පාවි තමිල්, සිංහල, මුස්ලිම් මක්කල් මත්තියිල් මීණ්ඩුම් ඉනවාදත්තෙ, මතවාදත්තෙත් තූණ්ඩුවදු එප්පඩි? අදර්කාන මූලමාක එතෙක් කරුදුවදු? එන්රු සින්දිත්තුක්කොණ්ඩු ඉරුක්කින්රාර් කළ්.

කඩන්ද ඉරණ්ඩු වාරංකළිල් එමදු නාට්ටිල් නඩන්ද පල්වේරු සම්පවංකළ් පර්රි නාට්ටු මක්කළ් නන්කු අරිවාර්කළ්. නේර්රු මට්ටක්කළප්පිල් මයිලත්තමටු මේය්ච්චල් තරෙ පිරච්චිනෙ සම්පන්දමාකප් පෝරාට්ටම් නඩෙපෙර්රදු. ඉන්දප් පිරච්චිනෙ සම්පන්දමාක ඉංකිරුක්කින්ර ඔරුසිල නල්ල තමිල් පාරාළුමන්ර උරුප්පිනර්කළින් කරුත්තුකළෙ නාංකළ් කේට්ටෝම්. මට්ටක්කළප්පු මාවට්ටත්තින් එංකළුඩෙය පිරතිනිතියාක තෝළර් පිරපු අවර්කළ් ඉරුක්කිරාර්. අවර්කළුඩෙය තලෛයීටු එන්පදු ඉදිල් පාරිය තාක්කත්තෙ එර්පටුත්තියිරුක්කිරදු.

කඩන්ද කාලංකළිල් නාංකළ් ඉන්දප් පිරච්චිනෙයෙ නේරඩියාකක් කණ්ඩදන් කාරණමාක, එංකළුඩෙය කෞරව අමෛච්චරාන කේ.ඩි. ලාල් කාන්ත අවර්කළ් ඉලංකෛ මකාවලි අදිකාරසපෙ, කාණි ආණෛයාළර් නායකම් තිණෛක්කළම්, Forest Department ආකියවර්රින් අදිකාරිකළෙ අළෛත්තුප් පේසි ඉදර්කාන දීර්වෛ එට්ටිනාර්. අන්දත් දීර්වු නඩෙමුරෛප්පටුත්තප්පට්ටු වරුකින්රපෝදු, වටක්කු, කිළක්කිල් ඉරුක්කින්ර එන්දවෝර් අපිවිරුත්දිත් දිට්ටත්තුක්කුම් ඔත්තුළෛප්පු වළංකාද, කුරෛන්දපච්චම් ඔරු විළෛයාට්ටුත් දිඩලෛ අමෛප්පදර්කුක්කූඩ ඔත්තුළෛප්පු වළංකාමල් අදර්කු එදිරාක ඉරුක්කින්ර සුත්තුමාත්තු අරසියල් සෙය්කින්ර කේටුකෙට්ටවර්කළ් ඉන්දප් පිරච්චිනෙයෙයුම් පින්නිප්පිණෛත්තු, ඉන්ද නාට්ටිලුළ්ළ මක්කළෛක් කුළප්පුවදු එප්පඩි? අන්ද නිලෛයෛත් තොටර්න්දුම් තක්කවෛත්තුක් කොළ්වදෙප්පඩි? එන්පදු පර්රිත්තාන් අවර්කළ් යෝසික්කිරාර්කළ්. අදර්කාක අවර්කළිටම් ඉරුක්කින්ර ඔරේයෝර් ආයුදම් ඉනවාදමේ ඔළිය, වේරු එදුවුම්ලෛ. ඉන්රු තෙර්කිල් ඉනවාදත්තෛ මුන්නිලෛප්පටුත්තියදාන සෙයර්පාටුකළ් තලෛදූක්කි අකෝරමාන නිලෛයිල් ඉරුක්කින්රපොළුදු, වටක්කිල් ඉරුක්කින්ර කේටුකෙට්ට, සුත්තුමාත්තු සෙය්කින්ර, තෝල්වියටෛන්ද අරසියල්වාදිකළ් ඉන්දප් පිරච්චිනෙයෛක් කෛයිලෙටුත්තු ඉරුක්කිරාර්කළ්.

කෞරව කුළුක්කළින් පිරදිත් තවිසාළර් අවර්කළේ, ඉන්ද ඉනවාදත්තුක්කු එදිරාකවේ, මතවාදත්තුක්කු එදිරාකවේ 2024ආම් ආණ්ඩු මක්කළ් එංකළුක්කු ආණෛ වළංකි මුළු නාට්ටෛයුම් ඔප්පටෛත්තාර්කළ්. එංකළුක්කු ඉරුක්කින්ර කටප්පාටුදාන්, මක්කළුඩෙය පිරච්චිනෛකළෛත් තීර්ප්පදු. අදර්කු නාංකළ් එංකළාල් ඉයන්ර අනෛත්තෛයුම් සෙය්වෝම්. ඉන්ද නාට්ටිල් මීණ්ඩුම් ඉනවාදම් තලෛදූක්කුවදෛත් තටුත්තු නිරුත්තුවදර්කු එදුවාන අනෛත්තු නටවටික්කෛකළෛයුම් නාංකළ් එටුප්පෝම්. එදිර්ක්කට්සියිනර් විරික්කින්ර ඉනවාදප් පොරියිල් සික්ක වේණ්ටාමෙන ඉන්ද නාට්ටු මක්කළෛක් කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි, වණක්කම්!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරදිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.14]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(මාණ්පුමිකු චාමර සම්පත් දසනායක්ක)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩි 12ක කාලයක් තිබුණා. ඒකෙන් විනාඩි 2ක් කැපිලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු කථානායකතුමාට විරුද්ධව ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව විවාදයට නොගැනීම ගැන අද උදේ වරුවෙත් සභා ගර්භය තුළ ලොකු ගාලගෝට්ටියක් ගියා. ඒ අවස්ථාවේදී විශ්වාස භංග යෝජනාව ගැන අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගොඩක් දේවල් කිව්වා. මට කියන්න තිබෙන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකර්රප්පට්ටුළ්ළදු.]
[Expunged on the order of the Chair.]

විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑ කියලා. හරි නම්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකර්රප්පට්ටුළ්ළදු.]
[Expunged on the order of the Chair.]

එතුමාට විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකර්රප්පට්ටුළ්ළදු.]
[Expunged on the order of the Chair.]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එක දවසක් කාමරයට කඩා ගෙන ගියා කියලා මාව එළවා ගත්තා. මෙහෙමයි. ගරු කථානායකතුමාගේ කාමරයට යන්න අපට අවස්ථාව තිබෙනවා නේ. හැබැයි, කිසිම කථානායකවරයෙක්,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරදිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(මාණ්පුමිකු චාමර සම්පත් දසනායක්ක)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔන්න, මම එච්චරයි කියන්නේ. මම මාතෘකාවට අදාළව කථා කරන්නම්. හැබැයි, මෙතැන කිසිම කෙනෙක් මාතෘකාවට අදාළව කථා කළේ නැහැ. උදේ ගරු සභාවේ උද්ඝෝෂණය වෙලාවේ ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා කථා කරද්දිත් මම මේ පුටුවේ ඉඳගෙනයි හිටියේ. මම මේ වෙලාවේ ඒ ගැනත් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි කථා කරන්නේ, අපනයන ආදායම ගැන නේ. මේ අවුරුද්දේ අපනයන ආදායම ගැන මහා ලොකුවට පම්පෝරි ගහනවා. හැබැයි, ලබන අවුරුද්දේ බලමුකෝ. ලබන අවුරුද්දේ GSP Plus සහනය

නවත්වනවා. එය නවත්වන්න හේතුව මොකක්ද? ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කරන්න ආණ්ඩුව PSTA එක ගෙනෙනවාය කියනවා නේ. ත්‍රස්තවාදීන්ගෙන් ආරක්ෂා කරන්නේ මොකක්ද? මේ ආණ්ඩුව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ආණ්ඩුවක් නේ. මේ ආණ්ඩුවේ වැඩි හරියක් ඉන්නේ 1988-1989 කාලයේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

තමයි මේ ආණ්ඩුව කරන්නේ. ඒ කාලයේ පොලීසිවලට ගැහුවා. කැකිරාව පොලීසියට ගහපු, පන්නල යුද හමුදා කඳවුරට ගහපු මිනිස්සු තමයි මේ ආණ්ඩුව කරන්නේ. ඉතින්, මොකක්ද තවත් ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කරන්නේ? PSTA එක ගෙනෙන්නේ, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කරන්න කියලා නේ. දැන් උසාවියට ඉදිරිපත් කරන්නේ, පොලීසියේ පැය 24ක් තියාගෙන ඉඳලායි. මෙතුමන්ලා මේ පනත හදන්නේ එය පැය 72ක් කරන්න. පැය 72ක් කළාම මොකක්ද වෙන්නේ කියලා බලමු.

පෙනෙනවා නේද, හෝමාගම පොලීසියේ සිද්ධිය? හෝමාගම පොලීසියේ සිරකුඩුවේ දී තරුණයෙක් මැරුණා. තරුණයාගේ මරණයට අදාළව උසාවියට ඉදිරිපත් කළේ කාවද? Crimes Division එකේ OICව. මොකක්ද වුණේ? Crimes Division එකේ OIC දැම්මේ මම ඉන්න කොළඹ රක්ෂිත බන්ධනාගාරයට. හෝමාගම උසාවියේ සැකකරුවන් ගෙනෙන්නේ කොළඹ රක්ෂිත බන්ධනාගාරයට. ඔහුව ගෙනාවා. හැබැයි, ඇතුළට ගෙනෙන්න බැරි වුණා. රක්ෂිත බන්ධනාගාරයේ හිටපු 3,000ම කිව්වා, පුළුවන් නම් Crimes Division එකේ OICව ඇතුළට ගෙනෙන්න කියලා. ඔහුව රක්ෂිත බන්ධනාගාරයට ගෙනෙන්න දුන්නේ නැහැ. Crimes Division එකේ OICව තියා ගන්න දුන්නේ නැහැ. ඊට පසුව, මහනුවර දුම්බර බන්ධනාගාරයට අරගෙන ගියා. PSTA එක නොවෙයි, මොන නීති ගෙනාවත් තත්ත්වය මේකයි. අද පොලීසියේ කී දෙනෙක් බන්ධනාගාරගත වෙලා ඉන්නවාද? මේ වෙනකොට හිටපු පොලිස්පතිතුමා ඇතුළේ. ඊළඟට, හිටපු DIGලා කීදෙනෙක් ඇතුළේ ඉන්නවාද? තව ගත්තොත්, වාස් ගුණවර්ධන ඇතුළේ. පූජිත් ජයසුන්දර ඇතුළේ. සී.ඩී. වික්‍රමරත්න වෙඩි තියා ගත්තා. ඊළඟට, ලලිත් ජයසිංහ ඇතුළේ. දේශබන්දු දැන් ඔහුට එරෙහිව තිබෙන නඩුවලට අධිකරණයේ පෙනී ඉන්නවා. එලෙස කී දෙනෙක් බන්ධනාගාර ඇතුළේ ඉන්නවාද? 'සහෝදරයා' කියලා ඔයගොල්ලන් කියනවා නේ. පොලීසියේ හිටපු නිලධාරියෙක් හැටියට මම මගේ සහෝදර පොලිස් නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කරනවා, ඔයගොල්ලන් මේ ආණ්ඩුව කියන විධියට දඟලලා අමාරුවේ වැටෙන්න එපා කියලා.

දැන් මොකද වුණේ Crimes Division එකේ OICට? හවස හතයි, Crimes Division එකේ OIC ගෙනෙනකොට. Crimes Division එකේ OICට බිස්කට් පෙට්ටියක්, කෑම වේලක් දෙන්න කවුරුවත් හිටියේ නැහැ. අන්තිමේ දී බිස්කට් පෙට්ටිය අපෙන් ඉල්ලලා බන්ධනාගාරයේ ඉඳන් බිස්කට් එකක් කන්න දීලා තමයි රෑම මහනුවර බන්ධනාගාරයට අරගෙන ගියේ. පොලීසියේ තත්ත්වය ඒකයි. පොලීසියේ කට්ටිය දැන ගන්න ඕනෑ මොන අණපනත් ගෙනාවත්, ඔයගොල්ලන්ට ඔයගොල්ලෝ විතරයි කියලා. DIG ඇහ බේරා ගත්තා. Senior DIG ඇහ බේරා ගත්තා. ආනන්ද විජේපාල ඇමතිතුමා ඇහ බේරා ගත්තා. පොලිස්පති ඇහ බේරා ගත්තා. අන්තිමේදී හෝමාගම පොලීසියේ හිටපු නිලධාරීන් විතරක් අහු වුණා. ඕක හැමදාම පොලීසියට වෙලා තිබෙනවා. දැන් වාස් ගුණවර්ධන, ලලිත් ජයසිංහ හා හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දරලා අන්න ඇතුළේ පරිජ්පු කනවා. ඒකට හේතුව තමයි, පැවති ආණ්ඩුව බේරන්න, ආණ්ඩුව ආරක්ෂා කරන්න කටයුතු කිරීම. PSTA එක ගෙනාවාට පස්සේ මොනවාද වෙන්නේ කියලා අපට බලාගන්න පුළුවන්. ත්‍රස්තවාදයෙන් රජය ආරක්ෂා කරන්න ගියා විතරක් නොවෙයි, පොලිස් දෙපාර්තමේන්තුවේ ඉන්න සහෝදර පොලිස් නිලධාරීන් හැම කෙනාගෙන්ම මම මේ වෙලාවේදී ඉල්ලීමක් කරනවා, මොන පනත් ගෙනාවත් තමන්ගේ රස්සාව ආරක්ෂා කරගන්න කියලා. කොබෙයිගනේ සිද්ධියට අද වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? අන්න, ඊයේ-පෙරේදා ඒ පොලිස් නිලධාරියාව අත්අඩංගුවට ගත්තා. කඩවතදී ළමයෙකුට වෙඩි තිබ්බා. ඊළඟට, ඒගොල්ලන්ව අත්අඩංගුවට ගන්නවා. ඊයේ වනකොට CID එකෙන් බන්ධනාගාරයට ඇවිල්ලා, බන්ධනාගාරයේ ඉන්න ළමයාගෙන් කටඋත්තර ගන්නවා. තව ඉන්නවා, හෝමාගම භයදෙනෙකු අත්අඩංගුවට ගන්න. ඒ භයදෙනාම පොලිස් නිලධාරීන්. අන්තිමේදී පොලිස් නිලධාරීන්ගේ නෝනලාට, අම්මලාට, දරුවන්ට දෙවියන්ගේම පිහිටයි!

දැන් මේ පනත් කෙටුම්පත් ගෙනාවා නේ. මේ පනත් කෙටුම්පත් ඕනෑ කෙනෙකුට හදන්න පුළුවන්. මේ POCB එක ගෙනැල්ලා, සැකකරුවෙකු පැය 72ක් පොලීසියේ තියාගත්තොත් මිනිස්සු පොලීසිය වට කරයි. එතකොට පොලීසිවල ඉන්න නිලධාරීන්ට රාජකාරි කරගෙන යන්න බැරි වෙනවා. පොලිස් නිලධාරීන්ට රස්සාව දාලා දුවන්න වෙනවා. එම නිසා මේ පනත් කෙටුම්පත් අකුළා ගන්න කියන්න.

මේ පනත් කෙටුම්පත් ගෙනාවොත්, ගෝඨාභයගේ ආණ්ඩුව වැටුණු එකේ අනික් එක තමයි වෙන්නේ. මේ පනත් කෙටුම්පත් සම්මත කරලා මාස 6ක් යන්න ඉස්සෙල්ලා මේ ආණ්ඩුවට වෙන්නේ මොකක්ද බලන්න. මේ දේවල් අපි කියන්නේ වගකීමෙන්. මොකද, අපට අත්දැකීම් තිබෙනවා. අපි 88-89ත් හිටපු මිනිස්සු. අපි පොලිස් නිලධාරීන් හැටියට වැඩ කරපු අය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම නිසා පොලීසිය බේරාගන්න කවුරුවත් නැහැ, පොලිස් නිලධාරීන් බේරාගන්න කවුරුවත් නැහැ. අද වන විට ඕක තමයි මේ පොළොවේ තිබෙන ඇත්ත කථාව. මෙහෙම සැකකරුවන් මාස 6ක් පොලීසිවල තියාගන්න පුළුවන්ද? පොලිස් නිලධාරීන් බලාගෙන ඉන්නේ සැකකරුවන් පැය 24ත් උසාවියට ඉදිරිපත් කරලා ඇහ බේරාගන්න. ඒක තමයි ඇත්ත කථාව, ඒක තමයි විය යුත්තේ. කාගෙදෝ ලණුවක් කාලා, මොකක්දෝ පනත් කෙටුම්පතක් උස්සන් ඇවිල්ලා, මේ අධිකරණ ඇමති. හෙට තිබෙනවා, උද්ඝෝෂණයක්. හෙට වෘත්තීය සමිති ඒ උද්ඝෝෂණයට එනවා, භයවැනි දා තිබෙනවා, මේ පනතට විරුද්ධව තවත් උද්ඝෝෂණයක්. මේක ලෙහෙසි පහසු පනතක් නොවෙයි.

හෝමාගම පොලීසියේ කූඩුව තිබෙන්නේ reserve එක ළඟ. හෝමාගම පොලීසියේදී මැරිච්ච කෙනාගේ නෝනා ඒ සිද්ධිය වීඩියෝ කර ගත්තා. ඒ වීඩියෝ එක අරගෙන අධිකරණයට ඉදිරිපත් කළා. මහෙස්ත්‍රාත්තුමිය මොකක්ද කිව්වේ? මැරිච්ච කෙනාත් එක්ක කූඩුවේ හිටපු තව එක්කෙනෙක් ඉන්නවා, ඒ කෙනාව උසාවියට ගේන්න කිව්වා. තව වනතුරු ඒ කෙනාව උසාවියට ඉදිරිපත් කළේ නැහැ. මාත් එක්ක CRP එකේ ඒ කෙනා ඉන්නවා. මේ වන විට ඒ කෙනාගෙන් උදේ ගැහුවේ කවුද, රෑ ගැහුවේ කවුද කියලා සාක්ෂි අරගෙන තිබෙනවා.

ඔයගොල්ලන්ට නොයෙක් පනත් කෙටුම්පත් ගේන්න පුළුවන්. හැබැයි සහෝදර පොලිස් නිලධාරීන්ගෙන් මම ඉල්ලීමක් කරනවා, තමන්ගේ job එක බේරාගන්න කියලා. ආණ්ඩු ආරක්ෂා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කරන්න ගිහිල්ලා, දැන් නන්නත්තාර වෙලා ඉන්නවා බන්ධනාගාරයේ පෝලිමක්. වාස් ගුණවර්ධන, ලලිත් ජයසිංහ, මේ විධියට නම් වශයෙන් මට කියන්න පුළුවන්. අන්න, ඔක්කෝම ඉන්නවා වැලිකඩ. මේ ආණ්ඩුව මේ පනත් කෙටුම්පත ගෙනාපු දවසට අපට GSP සහනය නැති වෙනවා. ඒ විතරක් නොවෙයි. ඉදිරියේදී අපට කරගෙන යන්න බැරි විධියට මේ රට වැටෙනවා. අද ලෝකයේ කී දෙනෙක් කියලා තිබෙනවාද, මොන සංවිධානයෙන්ද නොකියා තිබෙන්නේ මේ පනත් කෙටුම්පත් ගැන. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයෙන් ආණ්ඩුවට කියලා තිබෙනවා, මේක කරන්න එපා කියලා.

ඒ වාගේම අවසාන වශයෙන් මම මේ කරුණත් කියන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේදී මම දිගින් දිගටම කිව්වා, ගෑස් සම්බන්ධව. දෙසැම්බර් මාසයේදී මම "360°" වැඩසටහනේදී කිව්වා, "සලකුණ" වැඩසටහනේදී කිව්වා, පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ ගෑස් ප්‍රශ්නය එනවා කියලා. එතකොට විජිත හේරත් අතැනට ඇවිල්ලා මහා ලොකු පොර ටෝක් එකක් දුන්නා, අපි ශත 15ක් අඩුවෙන් තමයි ටෙන්ඩරය ගත්තේ කියලා. මම මේක දෙමළෙන් කියන්න ඕනෑ, සිංහල තේරෙන්නේ නැත්නම්. “இரண்டு கப்பல்களில் இருந்து செய்ய ஏலாது”. නැව් දෙකෙන් මේක කරන්න බැහැ කියලා මම එදා පාර්ලිමේන්තුවේදී කිව්වා. මේ සඳහා නැව් 5ක් තිබෙන සමාගමක් වෙන්න ඕනෑ, නැව් 5ක් නැති සමාගමකට මේ ටෙන්ඩරය දෙන්න එපා කියලා tender document එකේ දාලා තිබෙනවා. මේගොල්ලන් මොකක්ද කළේ? ශත 15ක් අඩුවෙන් මේගොල්ලන්ට හිතවත් නැව් 2ක් තිබෙන සමාගමකට ටෙන්ඩරය දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නැව් දෙකකින් මේක කරන්න බැහැ, ලංකාවට දවස් තුනකට එක ගෑස් නැවක් යනවා. නැව් දෙකෙන් අදින්න බැහැ. නැවකට මාලදිවයිනේ ඉඳන් ලංකාවට එන්න, දවස් 7ක් යනවා. නැව් 2ක් තිබෙන සමාගමක් හින්දා තමයි, අද වන විට නිල් පාට ලිට්රෝ ගෑස් හිඟයක් ආවේ.

පසුගිය කාලවල මේ රටේ ගෑස් පිපිරුවා. කවුරු පිපිරෙව්වාද දන්නේ නැහැ, ගෝඨාභයගේ ආණ්ඩුව එළියට දාන්න. දඩ දඩ ගාලා ඒ කාලයේ ගෑස් පිපිරෙව්වා. ගෑස් පිපිරෙව්වා වාගේම විදුලියත් කැපුවා. ගෑස් නැති වුණා, ඊට පස්සේ ආණ්ඩුව වැටුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒවා නිසා තමයි ඔබතුමියන්ලාට මිනිස්සු ඡන්දය දුන්නේ. ගෑස් පෝලිම්වල ඉන්න බැහැ කියලා, විදුලිය කපපු එක ඇති වෙලා තමයි මිනිස්සු එදා ගෝල්ෆේස් එකට ගියේ. ඔයගොල්ලන්ව විශ්වාස කරලා තමයි මිනිස්සු එදා ඡන්දය දුන්නේ. මහා පම්පෝරි ගහන්න එපා. 2024 සැප්තැම්බර් 21වැනි දා උදේ හැම මිනිහාම වාගේ ගෑස් ළිපේ බත් උයලා කාලා තමයි ඡන්ද පොළට ගිහිල්ලා අනුර කුමාරට ඡන්දය දුන්නේ. සැප්තැම්බර් 21වැනි දා ගෑස් හිඟයක් තිබුණේ නැහැ. එදා ඔයගොල්ලන්ට ආණ්ඩුව දෙන්න මිනිස්සු ඡන්දය දාන්න ගියේ කිරිබත් උයාගෙන. එදා මේ රටේ ගෑස් තිබුණා. මේ විධියට ගෑස් පෝලිම් එනවා කියලා මම කිව්වේ මීට මාස කිහිපයකට කලින්. ඕනෑ නම් හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. මේ කාලයේදී මේක වෙනවා කියලා චාමර සම්පත් කිව්වා. එතකොට විජිත හේරත් මොකක්ද කිව්වේ? ඩොලර් ශත පහළොවක් අඩු කෙනෙකුට මේක දෙනවා, අපි මේක සාර්ථකව කරනවා කිව්වා. දැන් කෝ? මහා ලොකුවට පම්පෝරි ගහලා අද මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා, ආයෝජනය, ලාභය අපට මෙච්චර තිබෙනවා, අච්චර තිබෙනවා කියලා කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට අමතර විනාඩියක කාලයක් ලැබෙනවා, ඒ කාලය තුළ ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපනයන ආදායම ගිය අවුරුද්දට වැඩිය මේ අවුරුද්දේ හොඳයි කියලා සතුටු වෙන්න එපා. ලබන අවුරුද්දේ මේ පනත් කෙටුම්පත් ගෙනාපු ගමන් ගාමන්ට් වහන්න සිද්ධ වේවි. අද වනකොට බංග්ලාදේශයට මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ රටවල තිබුණු garment factories බංග්ලාදේශයට අරගෙන ගියා. අද වනකොට බංග්ලාදේශය නොසන්සුන්. ගිනි නියනවා; ගල් ගහනවා. බංග්ලාදේශයේ මිනිස්සු පඩි මදි කියලා උද්ඝෝෂණ කරනවා. ඒ නිසා අපට තිබෙන ඔය ඇහලුම් ක්ෂේත්‍රයත් නැති කරන්න තමයි ඔයගොල්ලන් සූදානම් වෙන්නේ. ප්‍රේමදාස garment factories ගෙනෙන කොට ඔබතුමන්ලා කිව්වා නේ, "සුද්දන්ගේ යටඇඳුම් මහන්නයි ගාමන්ට් ගෙනෙන්නේ" කියලා. ඔබතුමන්ලා ඒ වාගේ කථා කියපු මිනිස්සුනේ. එහෙම ආණ්ඩුවක්නේ ඔයගොල්ලන්; එහෙම අයනේ. ඒක නිසා ආණ්ඩුව මේ ත්‍රස්තවාදීන්ගෙන් ආරක්ෂා කරගන්න ඕනෑ. එහෙම නැතුව වෙන ත්‍රස්තවාදී කණ්ඩායමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විජේසිරි බස්නායක මහතා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.26]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි, කාලය වෙන් කිරීම සම්බන්ධයෙන්.

අද දවසේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ගන්නේ අපනයන ක්ෂේත්‍රය, අපනයනකරුවන් මුහුණ දීලා තිබෙන තත්ත්වය සහ ඒ පිළිබඳව රජයක් විධියට අපි කරන කටයුතු පිළිබඳවයි. විශේෂයෙන්ම අපි දන්නවා, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව, අපි මේ රට ආර්ථික, සමාජයීය සහ දේශපාලනික වශයෙන් ඇද වැටී තිබුණු දැවැන්ත බෙදවාචකයෙන් මුදාගෙන මේ මොහොත වන විට යම්කිසි ස්ථාවර මට්ටමකට ගෙනැවිත් තිබෙනවා කියන එක. හැබැයි, අපට මේ ස්ථාවරත්වය විතරක් මදි. මේ ස්ථාවරත්වයෙන් පසු අපේ ඊළඟ අදියර වන්නේ, ඒක වර්ධනය කිරීම, growth එක. ඒ growth එකෙන් පසුව තමයි සම්පූර්ණ පරිවර්තනය - transformation එක - සිදු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මොහොත වන විට අපට හැකි වෙලා තිබෙනවා, අපේ ආර්ථික වර්ධනය සියයට 5 මට්ටමේ තබාගන්නත්, රට තුළ විදේශ සමඟ කරන ගනුදෙනුවලට අවශ්‍ය දළ නිල විදේශ සංචිත ප්‍රමාණය ආසන්න වශයෙන් ඩොලර් බිලියන 6.9ක අගයක පවත්වාගෙන යන්නත්. ඒ වාගේම අපි මේ වන විට විදේශ ණය කළමනාකරණය ඉතාම ප්‍රශස්ත මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. මේ මොහොත, රටේ උද්ධමනය තනි අගයකට ගෙනැල්ලා කටයුතු කරමින් තිබෙන අවස්ථාවක්. මෙන්න මෙහෙම අපි කටයුතු කරමින් තිබෙන අවස්ථාවක තමයි මැද පෙරදිග අර්බුදය මතු වන්නේ. විශේෂයෙන්ම මේ වර්ෂයේ මාර්තු මාසයේදී ඇති වුණු ඒ නොසන්සුන්තාවත්, ඒ යුද්මය වාතාවරණයත්, ඒ භූ දේශපාලනික තත්ත්වයත් නිසා අද වනකොට අපි විතරක් නොවෙයි, මුළු ලෝකයම දැවැන්ත පසුබෑමකට ලක්වෙලා තිබෙනවා. මේ නිසා විශේෂයෙන්ම ලෝකයේ ගෝලීය සැපයුම් දාමවලට - global supply chainsවලට - විශාල බාධා ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම නාවුක ගාස්තුත්, රක්ෂණ ගාස්තුත් ඉහළ ගිහිල්ලා තිබෙන නිසා මේ තත්ත්වය සෘජුවම අපේ රටේ අපනයනවලට බලපා තිබෙනවා. එහෙමනම්, මේ හරහා එන බලපෑම අපට විශාල වශයෙන් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අපනයන ක්ෂේත්‍රය දිහා බැලුවොත්, පසුගිය කාල පරිච්ඡේදයේදී ඒ පිළිබඳව ලබාගෙන තිබෙන ප්‍රගතිය ගත්තොත්, විශේෂයෙන්ම අපට සතුටු වෙන්න පුළුවන්. 2022 වනකොට ඩොලර් බිලියන 14.9ක තිබුණු අපනයන ආදායම 2025 වනකොට ඩොලර් බිලියන 17.3ක් දක්වා වර්ධනය කර ගන්න අපට හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අවුරුද්දේ පසුගිය ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදය ගත්තත්, මේ මොහොතේදීත් අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 13.6ක අගයකට ළං වෙලා තිබෙනවා. එහෙමනම් මෙන්න මේ දත්ත දිහා බැලුවාම අපට පෙනෙනවා, අපි මෙහි අඛණ්ඩ වර්ධනයක් පවත්වාගෙන ඇවිල්ලා තිබෙනවා කියන කාරණය. විශේෂයෙන්ම ඔබතුමියත් දන්නවා, පසුගිය කාලයේ ඇති වෙච්ච "දිට්වා" සුළි කුණාටුව, ඒ වාගේම මැද පෙරදිග අර්බුදය වැනි මෙන්න මේ අර්බුද හමුවේ වුවද අපනයන ක්ෂේත්‍රයේ අඛණ්ඩ වර්ධනයක් තුළින් අපි ඉහළ අපනයන ආදායමක් අත්පත් කරගෙන තිබෙන බව. ඒක තමයි අපි මේ අවස්ථාවේදී සලකා බලන්නේ.

විශේෂයෙන්ම අපේ අපනයන සංයුතිය බැලුවොත්, ඒකේ විශාල පංගුවක් තිබෙන්නේ ඇඟලුම් ඇතුළු රෙදිපිළි සඳහායි. එහි ප්‍රමාණය ගත්තොත්, සියයට 31ක් විතර වනවා. ඒ වාගේම තේ, රබර්, පොල් සහ ඒ දේවල් ආශ්‍රිත නිෂ්පාදන ඊළඟට පෙළ ගැසෙනවා. ඒ වාගේම අපට ප්‍රධාන අපනයන වෙළෙඳ පොළවල් කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම එතැනදී මුලින්ම එන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය. අපේ මුළු අපනයනවලින් සියයට 23ක පංගුවක් ඇමෙරිකාවටත්, ඒ වාගේම සියයට 7ක පංගුවක් එක්සත් රාජධානියටත්, තවත් සියයට 7ක පංගුවක් ඉන්දියාවටත් ආදී වශයෙන් බෙදිලා යනවා. මෙන්න මෙතැනදී විශේෂයෙන්ම 2024 සැප්තැම්බර් මාසයේ ඉඳලා මේ දක්වා ඇති වෙච්ච දැවැන්ත කම්පන තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය, මේ රටේ අපනයනකරුවන් මුහුණ දුන් ගැටලු, බලපෑම අඩු කරන්න විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය, ඒ වාගේම අපනයන සංවර්ධන මණ්ඩලය විශාල ක්‍රියාකාරකම් රාශියක් සිද්ධ කළා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පහසුකම් සපයන්නෙක් විධියට, අපනයනය ප්‍රවර්ධනය කරන්නෙක් විධියට, දැනුම සපයන්නෙක් විධියට, නියාමකයෙක් විධියට එහිදී විශාල කාර්යභාරයක් කළා.

අපි දැක්කා, විශේෂයෙන්ම 2024දී රතු මුහුදු ආශ්‍රිතව නැව් ගාස්තු සම්බන්ධයෙන් අර්බුදයක් නිර්මාණය වනවා. ඒ වාගේම 2025 අප්‍රේල් මාසයේදී අපි දැක්කා, එක්සත් ජනපදය තීරු බදු පනවනවා. ඒ මොහොතේදීත් මේ රටේ විපක්ෂය බලාගෙන හිටියේ මේ තීරු බදුවලට මුහුණ දෙන්න බැරිව මේ රටේ පාලන බලය අපි අත්හරී කියායි. එහිදී ඉතාම කාර්යක්ෂමව, සාකච්ඡා මාර්ගයෙන් ඒ ප්‍රශ්නය විසඳා ගන්න අපිට හැකි වුණා. ඒ අනුව විශේෂයෙන්ම මේ තීරු බදු ප්‍රමාණය අඩු කරන්න අපට පුළුවන් වුණා.

ඒ විතරක් නොවෙයි, 2025 නොවැම්බර් මාසයේ අවසාන සතිය වනවිට "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒ වාගේම මේ වසරේ මාර්තු මාසයේදී මැද පෙරදිග යුද්ධය ඇති වුණා. මේ සියල්ල මධ්‍යයේ වුණත් අපනයනවල අඛණ්ඩ වර්ධනයක් ඇති වෙලා තිබෙනවාය කියන එක අපි කියන්න සතුටුයි. ඒ සඳහා අවශ්‍ය direction එක, නායකත්වය කර්මාන්ත අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු සියලුම රාජ්‍ය ආයතන විසින් ලබා දීලා තිබෙනවා. මේ උග්‍ර කම්පන හමුවේ මේවාට මුහුණ දෙන ආකාරය පිළිබඳව අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු පාර්ශ්වයන් විශාල ප්‍රමාණයක් සාකච්ඡා කරලා තිබෙනවා වාගේම ඒ කටයුතු සම්බන්ධීකරණය කරලා තිබෙනවා. අපිට හැකි වෙලා තිබෙනවා, ඒ සාකච්ඡා ඔස්සේ මේ තත්ත්වය කළමනාකරණය කරන්න.

ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම මැද පෙරදිග යුද්මය තත්ත්වයත් එක්ක බලශක්ති අර්බුදයක් මුළු ලෝකයේම නිර්මාණය වුණු බව ඔබතුමිය දන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 2026 පෙබරවාරි වනවිට අපිට ඩීසල් බැරලයක් මිලට ගන්න වැය වුණේ ඩොලර් 80යි. හැබැයි, අද වනවිට ඒක ඩොලර් 167ක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එය සියයට 86ක වැඩිවීමක්. මේ විධියට විශාල වශයෙන් මිල වෙනස්වීම් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොහොම ස්තුතියි. විශේෂයෙන්ම ඉන්ධන කියන්නේ, අපේ රටේ අපනයන ක්ෂේත්‍රයට, ආර්ථික වර්ධනයට සෘජුවම බලපාන කාරණයක්. ඒ අර්බුදය පැවති අවස්ථාවේදී අපි රජයක් විධියට මැදිහත් වෙලා, සෘජුවම සහනාධාර දීලා, කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට ඒ තුළින් ඇති වන බලපෑම අඩු කරන්න උදව් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම 2030 වනවිට මේ රටේ අපනයන ගෙන යන්න ඕනෑ තැන පිළිබඳව අපට ඉලක්කයක් තිබෙනවා. ඒ ඉලක්කය ඇමෙරිකානු ඩොලර් මිලියන 36ක්. මෙන්න මේ ඉලක්කය සපුරා ගැනීම සඳහා මේ වනවිට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සකස් කර තිබෙනවා, ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහයෝගයෙන් වාගේම මේ රටේ ඉන්න අනෙකුත් අපනයනකරුවන්, පාර්ශ්වකරුවන් 300ක් විතර එකතු කරගෙන. මේ සැලැස්ම ඉතා වැදගත්. මේ අපනයන සැලැස්ම තුළ අපි මෙතෙක් කළ ඒ සම්ප්‍රදායික අපනයන වෙනුවට අලුත් ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. එහෙම නම් 2026 - 2030 දක්වා කාලය තුළ මේ සැලැස්ම තමයි අපිට ක්‍රියාත්මක කරන්න වෙන්නේ.

[ගරු විජේසිරි බස්නායක මහතා]

මෙතැනදී වාහන උපාංග - auto components - ඇඟය, ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන අංශය - mineral-based sector, රබර් ආශ්‍රිත කර්මාන්ත - rubber-based industries, ආහාර සහ පාන වර්ග, කුළුබඩු නිෂ්පාදන - spices, සුගන්ධ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආදී වශයෙන් විශාල ක්ෂේත්‍රයක් හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම විදුලි සහ ඉලෙක්ට්‍රොනික අංශය, බෝට්ටු සහ නැව් නිර්මාණ කර්මාන්තය - marine-based industry, digital products and services කියන අංශවලට අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගනිමින් යනවා. මේ හරහා අලුත් දිශානතියකට, අලුත් ගිවිසුමකට සහ අලුත් ප්‍රවේශයකට ඇවිල්ලා, අපි සියලු දෙනාම එකතු වෙලා අපනයන සැලැස්මට උදව් කරලා මේ රට ගොඩනඟමු.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[පි.ප. 2.35]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! ஏற்றுமதிப் பொருளாதாரத்தினூடாக இந்த நாட்டுக்குக் கிடைக்கின்ற அந்நியச் செலாவணி சம்பந்தமாக இன்று நாங்கள் இந்தச் சபையிலே பேசிக்கொண்டு இருக்கின்றோம். கடந்த காலங்களிலே இந்த நாட்டை ஆட்சி செய்தவர்கள் விட்ட தவறுகள் மற்றும் அவர்களின் பாகுபாடான, பிழையான அரசியல் பொருளாதாரக் கொள்கைகள், இலஞ்சம், ஊழல், நிருவாகச் சீர்கேடுகள் போன்ற பல பிரச்சினைகள் காரணமாக இந்த நாட்டினுடைய பொருளாதாரம் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டது. அந்தப் பாதிப்பால் மக்கள் வீதிக்கு இறங்கியதால் இந்த நாட்டிலே ஓர் ஆட்சி மாற்றம் ஏற்பட்டது. இலங்கையினுடைய பொருளாதாரம் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருந்தாலும், கடந்த 2 வருடங்களில் ஏற்றுமதியின் ஊடாக குறிப்பிடத்தக்க முன்னேற்றம் ஏற்பட்டிருப்பது மகிழ்ச்சிக்குரிய விடயமாகும். ஆனால், நாட்டினுடைய பொருளாதார மேம்பாடு சம்பந்தமாக நாடும் ஒரு நாடாக அல்லது ஒரே பிராந்தியமாகச் செயற்படுகின்றதா? என்று பார்க்கின்றபோது எங்களுக்குப் பல கேள்விகள் எழுகின்றன. அந்த வகையிலே, எங்களுடைய ஏற்றுமதித் துறையின் எதிர்காலம் குறித்து நாங்கள் விவாதிக்கும்போது, யுத்தத்தினால் நீண்டகாலமாக கைவிடப்பட்டிருந்த வடக்கு, கிழக்கு மாகாணங்களும் சர்வதேச வர்த்தகத்தின் முக்கிய பொருளாதார மையங்களாக மாற்றப்பட்டால் இந்த நாட்டினுடைய ஏற்றுமதி வருமானம் இன்னும் சிறப்பாக அமையும் என்பதை இச்சந்தர்ப்பத்திலே உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

வடக்கு, கிழக்குப் பிராந்தியத்தின் பொருளாதார அபிவிருத்தி என்பது வெறுமனே அந்தப் பிராந்தியத்தின் அபிவிருத்தி மாத்திரமல்ல. வடக்கு, கிழக்கு அபிவிருத்தி செய்யப்படும்போது, நிச்சயமாக இந்த நாடு பொருளாதார ரீதியிலே அபிவிருத்தியடைவதற்கு அது வழிவகுக்கும் என்பதையும் குறிப்பிட விரும்புகின்றேன். ஒட்டுமொத்த பொருளாதார வளர்ச்சிக்கும் அந்நியச் செலாவணி வருமான அதிகரிப்புக்கும் வேலைவாய்ப்பை உருவாக்குவதற்கும் தேசிய பங்களிப்பை வழங்கக்கூடிய வகையிலே எங்களுடைய மாகாணங்கள் மாற்றப்பட வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் குறிப்பிட விரும்புகின்றேன்.

இலங்கை எதிர்கொள்ளும் மிகப்பெரிய பொருளாதார சவால்களில் நிலையான அந்நியச் செலாவணியை இந்த நாட்டுக்குக் கொண்டுவருவது மிகவும் முக்கியமான பிரச்சினையாக இருக்கின்றது. வடக்கு, கிழக்கு மாகாணங்கள் இலங்கையின் பொருளாதார வரைபடத்திலே தொடர்ச்சியாகப் பின்தங்கிய பிராந்தியங்களாகத் தொடர இடமளிக்கக் கூடாது. இந்தப் பிராந்தியங்களின் கடல்வளம், விவசாயம், கனிம வளங்கள், மனித வளம், அறிவுசார் ஆற்றல்கள் மற்றும் புவியியல் அமைவிடம் போன்ற முக்கியமான காரணிகளை முறையாகப் பயன்படுத்தாவிட்டால் வடக்கு, கிழக்கு மாகாணங்களை இலங்கையின் முக்கியமான ஏற்றுமதிக்குரிய மற்றும் முதலீட்டு மையங்களாக மாற்ற முடியாத சூழல் ஏற்படும். இந்தப் பிரதேசங்களை இலங்கையினுடைய முக்கியமான பொருளாதார முன்னேற்ற மையங்களாக மாற்றும்போது, நிச்சயமாக எங்களுடைய நாடு ஒருமித்த நாடாகப் பொருளாதாரத் துறையிலே முன்னேறக்கூடிய சந்தர்ப்பம் ஏற்படும்.

யுத்தத்திற்குப் பின்னரான காலத்திலே எங்களுடைய பிரதேசங்களின் அபிவிருத்தி என்பதை வெறுமனே வீதிகள், பாலங்கள் மற்றும் கட்டிடங்களை அமைப்பதாக மாத்திரம் நான் கருதவில்லை. மாறாக, மக்களின் வாழ்வாதாரத்தை உயர்த்தக்கூடியதாகவும், இளைஞர்களுக்கு வேலைவாய்ப்பை வழங்கக்கூடியதாகவும், பெண்களுக்குப் பொருளாதார சுதந்திரத்தை ஏற்படுத்தக்கூடியதாகவும் இருப்பதுடன், எமது மக்களை சர்வதேச பொருளாதாரத்துடன் இணைக்கக்கூடிய வசதியை ஏற்படுத்திக் கொடுப்பதும்தான் எங்களுடைய பிரதேசங்களினுடைய அபிவிருத்தியாக நாங்கள் கருதுகின்றோம். எங்களுடைய நாட்டினுடைய பொருளாதாரத்தை அபிவிருத்தி செய்ய வேண்டுமாக இருந்தால், இலங்கையில் இருக்கின்ற பிராந்தியங்களுடைய பொருளாதார அபிவிருத்தியை நாங்கள் மேற்கொள்ள வேண்டும்.

குறிப்பாக, இன்று பல விடயங்களை ஆளும்கட்சி மற்றும் எதிர்க்கட்சி உறுப்பினர்கள் பேசுகின்றார்கள். ஆனால், யுத்தம் நிறைவடைந்த பின்னரான 17 வருடங்களில் எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசங்களுடைய பொருளாதாரத்தை மேம்படுத்த அல்லது அப்பிரதேசங்கள் நாட்டினுடைய பொருளாதார மேம்பாட்டுக்குப் பங்களிப்புச் செய்கின்ற வகையிலே, எவ்வகையான ஏற்பாடுகள் செய்யப்பட்டு இருக்கின்றன என்று பார்க்கின்றபோது, மிகவும் சொற்ப அளவான அல்லது அவ்வாறான ஏற்பாடுகள் எதுவும் அற்றவகையிலேதான் காணப்படுகின்றது. எங்களுடைய நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்துகின்ற மற்றும் எங்களுடைய பிரதேசங்களினுடைய பொருளாதாரத்தை மேம்படுத்துகின்ற வாயில்களாக எங்களுடைய பிரதேசங்களிலே காணப்படுகின்ற விமான நிலையங்கள் மற்றும் துறைமுகங்கள் அமைய வேண்டும்.

இன்றைக்குப் பாருங்கள்! காங்கேசன்துறை துறைமுக அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட இந்திய நிதியுதவி கடந்த எத்தனையோ வருடங்களாகப் பயன்படுத்தப்படாமல் இருக்கின்றது. அதேபோலதான் மன்னார் மாவட்டத்தின் தலைமன்னார் துறைமுகமும் காணப்படுகின்றது. ஏற்கனவே செயற்பாட்டில் இருந்த அந்தத் துறைமுகத்தை மீண்டும்

திறப்பதன்மூலம் அங்கு பொருளாதார முன்னேற்றங்களை ஏற்படுத்தி, எமது நாட்டின் ஏற்றுமதிப் பொருளாதாரத்தைச் சீரமைக்க முடியும்.

எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களில் பலாலி, வவுனியா, மட்டக்களப்பு விமான நிலையங்கள் இருக்கின்றன. அவை போக்குவரத்துக்கான விமான நிலையங்களாக மாத்திரமல்லாமல், எமது நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துகின்ற வாயில்களாகவும் மாற்றப்பட வேண்டும். இவ்வாறு ஒரு நீண்டகாலத் திட்டம் இல்லாத சந்தர்ப்பத்திலே நிச்சயமாக 2025 - 2030 காலப்பகுதியில் வெளிநாட்டு வருமானமாக 30 பில்லியன் டொலர்களைப் பெற வேண்டுமென்ற இலக்கை எங்களால் அடைய முடியாத ஒரு சூழல் ஏற்படும்.

ஆகவே, நான் இந்தச் சபைக்கு என்னுடைய சில முன்மொழிவுகளை முன்வைக்க விரும்புகின்றேன். நாட்டின் ஒவ்வொரு பிராந்தியமும் பொருளாதார ரீதியாக வலுப்பெற்றால் மட்டுமே இலங்கை உண்மையான பொருளாதார சுதந்திரத்தை அடைய முடியும். ஏற்றுமதி வளர்ச்சி என்பது வெறுமனே வெளிநாட்டு வருமானத்தைப் பெற்றுக்கொள்வது மாத்திரமல்ல. அது மக்களின் உழைப்புக்கு சர்வதேச மதிப்பை, அங்கீகாரத்தை வழங்குகின்ற ஒரு செயற்பாடாக இருக்க வேண்டும் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். அந்தவகையில், எங்களுடைய பிரதேசங்களின் அபிவிருத்தி என்பது, அந்தந்தப் பிரதேச அபிவிருத்தியாக மாத்திரமல்லாமல், இலங்கையின் பொருளாதாரத்தை மேம்பாடுத்துகின்ற ஒரு வழிவகையாக இருக்கும் என்பதில் எந்த மாற்றுக் கருத்தும் இல்லை.

எனவே, இந்த உயரிய பாராளுமன்றத்தின் ஊடாக, அரசாங்கத்திடம் பின்வரும் கோரிக்கைகளை நான் முன்வைக்கின்றேன். வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களுக்கான தனியான பிராந்திய ஏற்றுமதி அபிவிருத்தித் திட்டம் ஒன்றை உருவாக்க வேண்டும். காங்கேசன்துறை, தலைமன்னார் துறைமுகங்கள் மற்றும் பலாலி, வவுனியா, மட்டக்களப்பு விமான நிலையங்களின் அபிவிருத்திக்கு காலக்கெடுவுடன்கூடிய செயற்றிட்டத்தை அறிமுகப்படுத்த வேண்டும். வடக்கு - கிழக்கு மாகாணங்களில் ஏற்றுமதி சார்ந்த சிறப்பு பொருளாதார வலயங்களை உருவாக்க வேண்டும். பனைசார் உற்பத்திகள், கடலுணவு, விவசாயம், உணவுப் பதப்படுத்தல் மற்றும் தகவல் தொழில்நுட்பத் துறைகளுக்கு விசேட நிதி மற்றும் வரிச் சலுகைகளை வழங்க வேண்டும். உள்ளூர் உற்பத்தியாளர்களுக்கு சர்வதேச தரச் சான்றிதழ்களைப் பெறுவதற்கு அரசாங்கம் உதவ வேண்டும். அதேபோல, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து, இன்னும் 30 செக்கன் தாருங்கள்!

வடக்கு மற்றும் கிழக்கில் நவீன குளிரூட்டப்பட்ட களஞ்சியங்கள், பொதியிடல் மையங்கள் போன்றவை அங்கு உருவாக்கப்பட வேண்டும். யாழ்ப்பாண பல்கலைக்கழகம், வவுனியா பல்கலைக்கழகம், கிழக்குப் பல்கலைக்கழகம் மற்றும் தொழில்நுட்ப நிறுவனங்களை ஏற்றுமதி உற்பத்தி மற்றும் ஆராய்ச்சியுடன் இணைக்க வேண்டும். இவ்வாறான இந்த முன்மொழிவுகளை 2027ஆம் ஆண்டுக்கான பாதீட்டிலாவது உள்வாங்க வேண்டுமெனக் கேட்டுக்கொண்டு, இந்தச் சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු අබූබකර් අතම්බාවා මහතා
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

වීසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.

[අ.භා. 2.44]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට ඉතාම හරවත්, ඉතාම හොඳ සංවාදයක් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතුවා. ඇත්තටම කනගාටුයි. Standing Orders හරියට පිළිපදින්නේ නැතිව විපක්ෂය විශ්වාස භංගයක් ගෙනැල්ලා, නැවත හරියට ගෙන්න කිව්වාට පස්සේ හරියට ගේන්නේ නැතිව මේ උත්තරීතර සභාව විහිළුවක් කර ගත්තා; කෝලම් මඩුවක් කරගත්තා. ඒ නිසා මෙතැන පොඩි කුමන්ත්‍රණයක් තිබෙනවාද කියලා අපට හිතෙනවා.

[ගරු අරුන් හේමවන්ද්‍ර මහතා]

අපි export market එකේ සැලකිය යුතු ජයග්‍රහණයක් අත්පත් කරගෙන තිබෙන මෙහොතක මේ විවාදය කඩාකප්පල් කරන්නද දන්නේ නැහැ, මේ වාගේ අනවශ්‍ය දේවල් කරන්නේ. හැබැයි අපට යුතුකමක් තිබෙනවා, අපේ පැත්තෙන් කෙරුණු දේවල් සම්බන්ධව මේ සභාව දැනුවත් කිරීමට සහ මේ රටේ ජනතාවට පැහැදිලි කිරීමට. ඒ නිසා අපි මේ වෙලාව හරි විධියට උපයෝගි කර ගන්නවා.

අපේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ ආණ්ඩුව භාර ගත්තේ 2024 සැප්තැම්බර් මාසයේයි. එතුමා 2024 සැප්තැම්බර් මාසයේ මේ රට භාරගන්නකොට, නොවැම්බර් මාසය වෙද්දී අපිත් මේ පාර්ලිමේන්තුවට එනකොට මේ රට තුළ තිබුණේ ඉතාම හැකිළුණු ආර්ථිකයක්. ඒ හැකිළුණු ආර්ථිකයත් එක්ක කිසිම දෙයක් කරන්න බැහැ. රටක් විධියට ඉදිරියට යන එකෙත් ලොකු ප්‍රශ්න, ගැටලු වගයක් තිබුණා.

පසුගිය කාලවකවානු තුළ ආර්ථික ඔස්තාර්ලා කියන සමහර උදව්විය ආර්ථිකය හකුළලා යම්කිසි ව්‍යාජ ප්‍රතිඵල ටිකක් පෙන්නුම් කරගෙන හිටියා. නමුත් ඒක නොවෙයි, සැබෑ තත්ත්වය. එතකොට අපේ රටේ නිෂ්පාදන ක්ෂේත්‍රය කඩා වැටිලායි තිබුණේ. හැම පැත්තෙන්ම පිරිහිලා තමයි තිබුණේ. ඒ නිසා අපි තීරණයක් ගත්තා, හැකිළුණු ආර්ථිකය වෙනස් කරන්න ඕනෑ, මෙතැන යම්කිසි ප්‍රසාරණයක් ඇති කරන්නට ඕනෑය කියලා. ඒ නිසා අපි ආර්ථිකය ක්‍රමානුකූලව විවෘත කරන්න පටන් ගත්තා. අපි ආනයන ක්ෂේත්‍රයත් විවෘත කරන්න පටන් ගත්තා. එතෙක් ආනයන සීමා වෙච්ච රටක් තමයි තිබුණේ. අපි ආනයන ක්ෂේත්‍රය විවෘත කිරීමත් එක්ක අපට අවශ්‍ය අමුද්‍රව්‍ය ටික මේ රටට ගේන්න හැකියාව ලැබුණා. ඒකත් සැලකිය යුතු ජයග්‍රහණයක්. ඒ වගේම අපේ රටේ තිබෙන - ස්වදේශීය - අමුද්‍රව්‍යයත් පාවිච්චි කරමින්, හරි විධියට, නිෂ්පාදන ක්ෂේත්‍රය ශක්තිමත් ආකාරයෙන් ඉස්සරහට අරගෙන යාමට අපි සමත් වුණා.

මුල්ම අවධියේ විපක්ෂය කියපු කථාව තමයි, මේ ආණ්ඩුව මාස තුනක්වත් අදින්නේ නැහැ කියන එක. ඒක ව්‍යාජ කාරණයක් කියලා අපි පෙන්නුම් කළා; ඔප්පු කළා. ඊට පස්සේ කිව්වා, මාස තුනක් නොවෙයි මාස හයක් ගිහිල්ලා මේ ආණ්ඩුව වැටෙයි, මාස හයට එහා පඩි ගෙවන්න විධියක් නැහැයි කියලා. ඒ කාරණාත් ව්‍යාජයි කියලා අපි සාර්ථකව පෙන්නුම් කළා. ඊට පස්සේ ලෝකයේ යුද බිය තත්ත්වයක් ඇති වෙනකොට අපේ ජනතාවත් භීතියෙන් තෙල් එකතු කරන්න පටන් ගත්තාට පස්සේ ඔන්න කිව්වා, තෙල් පෝලිමක් එනවා කියලා. ඒ කාරණයත් ව්‍යාජයි කියලා අපි සාර්ථකව පෙන්නුම් කළා. අපි පෙන්නුම් කළා මොකක්ද මෙතැන වෙලා තිබෙන්නේ, මෙතැන පෙට්‍රල් ෂෙඩ් හිමියන් කීදෙනෙක් හිටියාද කියලා. ඒ ලැයිස්තුවත් අපි එළියට දැම්මා. ඔන්න, නිශ්ශබ්ද වුණා. ඊට පස්සේ කිව්වේ මොකක්ද? මේගොල්ලන්ට කරගෙන යන්න බැහැ, ජාත්‍යන්තර සබඳතා නැහැ, කවුරුත් උදව් කරන්නේ නැහැ කියලා කිව්වා. නමුත්, ඒ කාරණයත් අපි සාර්ථක ලෙස පරාජය කළා. අපි ආණ්ඩුවක් විධියට එඩිතරව, ජාත්‍යන්තර සම්බන්ධතාත් එක්ක රට පාලනය කිරීමට අදාළ කටයුතු කළා. සැලකිය යුතු සාර්ථකත්වයක් අපි අත්පත් කර ගත්තා.

ඊළඟට ඔන්න "දිවිවා" ආවා. "දිවිවා" කියන්නේ, මෑත ඉතිහාසයේ අපි මුහුණ දීපු ඉතා බරපතළ ස්වාභාවික ව්‍යසනයක්. එතැනදීත් අපි සැලකිය යුතු දේවල් කරමින්, මේ රට තුළ වෙනස් කරන්න ඕනෑ නීති රීති පවා වෙනස් කරමින්, ජනතාව ආරක්ෂා කරමින්, ආර්ථිකය කඩා වැටෙන එක වළක්වමින්, මේ සියලුම දේවල් කළමනාකරණය කරමින් රටේ ආර්ථික වර්ධනය ඉතාම වේගයෙන් ඉදිරියට අරගෙන ගියා. අපි 2025 අවුරුද්ද නූතන ඉතිහාසයේ ලංකාවේ ඉතාම සුවිශේෂී අවුරුද්ද බවට පත් කරගත්තා. අපි හොඳටම තේරුම් ගන්න ඕනෑ බංකොලොත්භාවයෙන් මිදී ක්‍රමානුකූලව ගොඩනැඟෙන රටක් තමයි එවැනි ශක්තිමත් ආකාරයෙන් ඉස්සරහට ගමන් කළේ කියන එක.

මම හැමදාම කල්පනා කරන කාරණාවක් තිබෙනවා. ගෝලීය තත්ත්වයේ ඉතාම කැලඹීමක් ඇතිවෙච්ච මේ කාලය තුළ - අපි ඒකට කියන්නේ, unprecedented global situation කියලා - බැරිවෙලාවත් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයේ හිටියේ නැත්නම් මොකක්ද වෙන්නේ කියන එක සම්බන්ධයෙන් හැමදාම මම උපකල්පනය කරනවා. ඇත්තටම, ඒක හිතා ගන්න බැහැ. ආණ්ඩුවක් විධියට අපි කොයි තරම් කැපවීමෙන් කටයුතු කරනවාද කියන එක අපි ඒකෙදි පෙන්නුම් කර තිබෙනවා.

අපි ලෝකය වටේ ගමන් කරනවා. ජාත්‍යන්තර සම්බන්ධතා ඇති කර ගන්නවා. විවිධ රටවලට යනවා. දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ මෙවැනි තත්ත්වයක් කොතැනකවත් නිර්මාණය වෙලා තිබුණේ නැහැ. එක පැත්තකින්, මැද පෙරදිග කලාපයේ යම්කිසි කැලඹීමක්, නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දමා තිබෙනවා. අනෙක් පැත්තෙන්, යුක්‍රේන-රුසියා ආශ්‍රිතව, යුරෝසියා කලාපය ගත්තොත් එතැනත් ප්‍රශ්න, ගැටලු මතු වෙලා තිබෙනවා. ඉතින්, එවැනි තත්ත්වයක් තුළ බලශක්තියේ ස්වෛරීභාවයත්, සුරක්ෂිතභාවයත් ආරක්ෂා කරමින්, අපනයන ක්ෂේත්‍රයත් ක්‍රමානුකූලව වර්ධනය කරමින් රටක් විධියට ඉදිරියට යාමට අපි සමත් වෙලා තිබෙනවා. මේ සාමූහික ප්‍රයත්නයට සම්බන්ධ වෙච්ච විශේෂයෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු අපිත් එක්ක එකතු වෙලා ඉන්න සියලුදෙනාට අපේ හෘදයංගම ස්තුතිය පුද කරනවා. යම් යම් කැලඹීම් ඇතිවෙච්ච මේ කාල වකවානුව තුළත් රට වෙනුවෙන් එඩිතරව කටයුතු කරන මේ සියලු පාර්ශ්වයන්ට අපි ස්තුතිය පුද කරනවා.

ඇත්තටම ගත්තොත්, මේක සාමාන්‍ය ලෙස පසු කරගෙන යන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ගෙවුණු ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ඩොලර් බිලියන 13.61ක සාර්ථකත්වයක්, ජයග්‍රහණයක් අපි අපනයන ක්ෂේත්‍රය හරහා අත්පත් කරගෙන තිබෙනවා. මෙවැනි යුද බිය තත්ත්වයක් තුළත් අපි market diversification එක කරලා තිබෙනවා; අලුත් වෙළෙඳ පොළ අවස්ථා හොයලා තිබෙනවා. මෙතැනදී මම වැදගත් කාරණයක් කියන්න ඕනෑ. 2025දී එක්සත් ජනපදය විසින් ලෝකයේ විවිධ රටවල් සඳහා තීරු බද්දක් - tariff එකක් - පැනෙව්වා. ඒ රටවලට අයිතියක් තිබෙනවා, විවිධ රටවල් සඳහා තීරු බද්ද පනවන්න. රාජ්‍ය තාන්ත්‍රිකව අපි ඒකට මුහුණ දුන්නා; සාකච්ඡා කළා. හැබැයි, මේගොල්ලන් ඇත්තටම කල්පනා කළා, අපේක්ෂා කළා, බලාපොරොත්තු වුණා, මේ tariff එක හරහා අපේ අපනයන ක්ෂේත්‍රය සහ ආර්ථිකය කඩාගෙන වැටෙයි කියලා. නමුත් ඒකට ඉතාම සාර්ථකව අපි මුහුණ දුන්නා. රාජ්‍ය තාන්ත්‍රිකව වාණිජ වෙළෙඳ සාකච්ඡා හරහා, tariff පිළිබඳ සාකච්ඡා හරහා අපි මේ සම්බන්ධයෙන් සාර්ථක ජයග්‍රහණයක් අත්පත් කර ගත්තා. ඒ අනුව තීරු බදු අනුපාතය අපි සියයට 10ට අඩු කරගත්තා. ඒ වාගේම අපි තවත් tariff-free markets හොයා ගත්තා.

මම පසුගිය සතියේ තුර්කියට ගියා. ලංකාවේ මෑත ඉතිහාසයේ විදේශ අමාත්‍යාංශය නියෝජනය කරමින් ද්විපාර්ශ්වික සාකච්ඡා - bilateral discussions - සඳහා එම රටට ගිය පළමුවෙනි කෙනා

මම. මම එදා ගිහිල්ලා පැය කිහිපයක් තුළ නියෝජ්‍ය අමාත්‍යවරු හයදෙනෙකු එක්ක සාකච්ඡා කළා. Deputy Minister of Foreign Affairs, කෘෂිකර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යවරයා, කම්කරු නියෝජ්‍ය අමාත්‍යවරයා, සංස්කෘතික සහ සංචාරක කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා, ප්‍රවාහන හා යටිතල පහසුකම් පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා සහ වාණිජ නියෝජ්‍ය අමාත්‍යවරයා ද මුණ ගැසී සාකච්ඡා කළා. ඒ වාගේම අපි තවත් අවබෝධතා ගිවිසුම් දෙකකට අත්සන් තැබුවා. එකක් අපේ ගුවන් සේවාවට - air connectivity එකට - අදාළ අවබෝධතා ගිවිසුමක්. කෘෂි කර්මාන්තයට අදාළ අවබෝධතා ගිවිසුමකුත් අපි අත්සන් කළා.

විශේෂයෙන්ම පසුගිය කාල වකවානුව තුළ Turkey market එක ගත්තොත්, අපේ export market එකේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර තිබෙනවා. මෑත පෙරදිග කලාපයට යම්කිසි shock එකක් ඇති වෙලා තිබෙන විටත්, අර පැත්තෙන් Eurasian කලාපයටත් යම්කිසි shock එකක් ඇති වෙලා තිබෙන විටත්, එවැනි කුමන බාධා ආවත් රටක් විධියට අපි ඉස්සරහට ගිහින් තිබෙනවා. ඇත්තටම අපි ඒ ගැන රටක් විධියට ආඩම්බර වෙන්න ඕනෑ. ඒකට අදාළ වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේක ඉතාම සුවිශේෂී එකක්. ඇත්තටම මේ සුන්බුන් විපක්ෂය හැමදාම කල්පනා කළේ, මේ ආණ්ඩුව වැටෙයි, වැටෙයි, වැටෙයි කියලායි. හැබැයි, අපි සහතික ලෙස එක කාරණාවක් කියන්නම්. කුමන බාධා ආවත් මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව - අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව - සාමූහිකව ඒ සියලු අභියෝග ජය ගනිමින් රටක් විධියට ඉස්සරහට යන්න සූදානම්. අපි අනිවාර්යයෙන් මීට වඩා ප්‍රගතියක් ඊළඟ අවුරුද්දේ අත්පත් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මෙහිදී විශේෂ කාරණාවක් කියලා කථාව අවසන් කරන්නම්. මෙතැන තිබෙන එක කාරණාවක් තමයි, inter-sectoral coordination එක. අප කලින් දැකපු විධියට, විවිධ දේශපාලකයෝ තමන්ට හිතවත් ගජ මිතුරන් එක්ක තමයි මේ දේවල් කර ගත්තේ. ඒ දේශපාලන සංස්කෘතියේ වෙනස්වීමත් එක්ක ඉහළ සිටින නායකයාගේ සිට, අමාත්‍යවරුන්ගේ සිට, සභාපතිවරුන්ගේ සිට අප අතර හොඳ ඒකාබද්ධ බැඳීමක් සහිත යන්ත්‍රණයක් තිබෙනවා. ඒ යන්ත්‍රණය හරහා තමයි, අපි මේ රට ඉස්සරහට අරගෙන යන්නේ; drive කරන්නේ. එතකොට ඒ යන්ත්‍රණය ශක්තිමත් ආකාරයෙන් සකස් කරන එකේ ප්‍රතිඵලය හැටියට තමයි, අපි අනුකම්ටු රාශියක් පත් කරගෙන මේ කටයුත්ත ඉස්සරහට අරගෙන යන්නේ. අපි advisory committees කිහිපයක් දාලා තිබෙනවා; Inter-ministerial committees කිහිපයක් දාලා තිබෙනවා. විශේෂයෙන් අවුරුදු 15කින් පස්සේ "Sri Lanka EXPO" කියන වැඩසටහන, ඒ exhibition එක එළැඹෙන 2027 අවුරුද්දේ ජනවාරි මාසයේදී අපි පටන් ගන්නවා. ඒක ඉතා සුවිශේෂී කාරණාවක්. අපේ රටෙන් අපනයනයට කැමැති - තම රටවලට ආනයනය කරන්න කැමැති - විවිධ වෙළෙඳුන්, වාණිජ ක්ෂේත්‍රයට සම්බන්ධ විශාල සංඛ්‍යාවක් මේ රට තුළට එනවා. ඒ නිසා අපි හිතනවා මේක සුවිශේෂී අවස්ථාවක් කියලා. ලෝකයේ විවිධ කැලඹීම් එන්න පුළුවන්. විවිධ ප්‍රශ්න, ගැටලු එන්න පුළුවන්.

මෙතැන හිටපු තවත් මන්ත්‍රීවරයෙක් කිව්වා, GSP Plus එක අපට නැති වෙයි කියලා. එහෙම කිසිම දෙයක් වෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න මම මෙවරත් යුරෝපා සංගමයට අයත් රටක් වන රුමේනියාවට ගියා. එතැනටත් ගිහිල්ලා අපි සාකච්ඡා කළා. ඒ වාගේම ගියවර මම Brusselsවලට ගිය වෙලාවේත් GSP Plus සම්බන්ධව විශේෂ සාකච්ඡාවක් කළා. අප මේ ගෙනෙන සියලු නීති රීති ජාත්‍යන්තරයට ගැළපෙන විධියට තමයි ගෙන එන්නේ. අපි කිසිසේත්ම ජාත්‍යන්තරයත් එක්ක තරහා වෙලා මේ නීති රීති ගෙන එන්නේ නැහැ. අපි නීති ගේනවා, සාකච්ඡා කරනවා. කාට වුණත් උසාවියේදී ඒවා challenge කරන්න පුළුවන්. ආයෙත් අපි ඒ නීති ගැන සාකච්ඡා කරලා සංශෝධන සහිතව ගෙන එනවා.

මේ අවස්ථාවේදී මේ රටේ ජනතාවටත් මා කියන්න කැමැතියි, කුමන බාධා ආවත් අපි රටක් විධියට අපනයන ක්ෂේත්‍රයේ ජයග්‍රහණ දිගින් දිගටම පෙන්නුම් කරන බව. එතැනදී අපි විවිධත්වය තවත් ප්‍රවර්ධනය කරගෙන යනවා. ඒ සඳහා සියලුදෙනාට ශක්තිය හා ධෛර්යය ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම මේ සාමූහික ප්‍රයත්නයට සම්බන්ධ වෙච්ච සියලුදෙනාට ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[2.56 p.m.]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Hon. Presiding Member, today's Adjournment Motion is basically based on the export industry and trade. Particularly tea and rubber are some of the most important exports. Therefore, I am going to use my allotted time to speak about the working conditions and the livelihood of the plantation workers because unless and until their livelihood issues are addressed satisfactorily, obviously, things would not change.

Sir, I am going to speak in Tamil and I will be tabling the letter I sent to the Hon. President Anura Kumara Dissanayake this morning during the course of my speech.

இன்று காலையில் நான் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு கடிதமொன்று எழுதியிருந்தேன். அதில் நான் குறிப்பிட்ட விஷயங்கள் பின்வருமாறு:

"மாண்புமிகு சனாதிபதி அவர்களே, 2027ஆம் ஆண்டுக்கான பாதீட்டு உரையை நீங்கள் எதிர்வரும் 12ஆம் திகதி நாடாளுமன்றத்தில் ஆற்றவிருப்பதாக உங்களது செயலகத்திலிருந்து எனக்கு அழைப்புக் கிடைத்திருக்கிறது." நல்ல விஷயம்!

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මනෝ ගණේසන් මහතා]

" 'பட்ஜட்' என்ற பாதீட்டு உரை என்பது வெறுமனே வரவு செலவுக்கணக்கு அல்ல. அது அடுத்துவரும் உங்கள் அரசின் மூன்றாம் ஆண்டுக்கான கொள்கை உரையாகும். இதுவே சம்பிரதாயம் என்பது, நீண்ட பாராளுமன்ற அனுபவம் கொண்ட உங்களுக்கும் தெரியும்; எனக்கும் தெரியும். ஆகவே, எனது நண்பரும் சனாதிபதியும் நிதி அமைச்சருமான உங்களிடம் சில குறைந்தபட்ச கோரிக்கைகளை முன்வைக்க விரும்புகின்றேன். இரண்டு வருடங்கள் காத்திருந்த எங்களுக்கு அடுத்த வருடமாவது இவை தொடர்பான நடைமுறைத் தீர்வுகள் கிடைக்கும் என்ற அறிவித்தல்களை உங்கள் கொள்கை உரையில் தெரிவிப்பீர்கள் என நான் நம்புகின்றேன்." Not only just rhetoric; நடைமுறைத் தீர்வுகள் கிடைக்குமென்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது.

1) தொழிலாளர் சம்பளம்: கடந்த பாதீட்டில் பெருந்தோட்டத் தொழிலாளரின் சம்பள உயர்வு தொடர்பில் அறிவித்தீர்கள். நமது கட்சியான தமிழ் முற்போக்குக் கூட்டணி சார்பில் நாம் இதற்காக உங்களுக்கு ஆதரவாக இரண்டாம் வாசிப்பு மீதான வாக்கெடுப்பின்போது வாக்களித்தோம். ஆனாலும், எமது எதிர்பார்ப்பு நிறைவேறவில்லை. கம்பனிகள் தொழிலாளரையும் உங்களையும் ஏமாற்றி உள்ளன. கம்பனிகள் தொழிலாளர் கொண்டுவரும் தேயிலைக் கொழுந்தின் நிறை, இறப்பரின் நிறை இரண்டையும் உயர்த்தி உள்ளன. ஆகவே, இம்முறை சம்பள உயர்வு என்பது, 'ஒரு நாள் சம்பளத் தொகைக்கு கொழுந்து, இறப்பர் நிறை எவ்வளவு? " என்பதை கீழ்நாட்டு, மத்திய மலைநாட்டு தோட்டங்கள் என்ற அடிப்படையில் விபரமான வர்த்தமானி அறிவித்தல்மூலம் அறிவியுங்கள்!

2) அனைவருக்கும் சம சம்பளத்துடன் கூடிய சட்டபடியான வர்த்தமானி பிரகடனம்: நான் கடந்த முறையே கூறினேன். நமது தொழிலாளர்கள், பணி செய்வது RPCsஇல் மட்டுமல்ல, அரச தோட்டங்கள், தனியார் தோட்டங்கள், சிறு தோட்ட உடைமை தோட்டங்கள் ஆகிய நான்கு துறைகளில் ஒரே வேலையைச் செய்வதால், ஒரே சம்பளம் தர வேண்டும் என்பதற்குச் சட்டபூர்வ அந்தஸ்து வழங்க, இவ்விடயத்தை சம்பள நிர்ணய சபையில் - Wages Board - தீர்மானித்து, நான் மேலே சொல்லும் வர்த்தமானியை அறிவிப்பாக அறிவியுங்கள்!

3) மலையக வதிவிடக் காணி: வீடு கட்டி வாழ, பெருந்தோட்டங்களில வாழும் திருமணமான ஒவ்வொரு குடும்பத்துக்கும், அவர்கள் தோட்டங்களில் வேலை செய்தாலும் செய்யாவிட்டாலும் அவர்களது துன்பியல் வரலாற்றையும் தேசத்தின் வளர்ச்சிக்கு அவர்கள் கடந்த 200 வருடங்களாக அளித்துள்ள பங்களிப்பையும் கருத்திற்கொண்டு வதிவிட காணியாக குறைந்தபட்சம் 15 பேர்ச்சஸ் என்ற "மலையக வதிவிடக் காணிக் கொள்கையை" அறிவியுங்கள்!

4) வீடுகளின் எண்ணிக்கை: அடுத்த மூன்று ஆண்டுகளில் பெருந்தோட்டங்களில் இந்திய - இலங்கை நிதியுதவியால் கட்டப்போகும் தனி வீடுகள் எத்தனை என்பதை அறிவியுங்கள்!

5) காணி உரிமை கொண்ட பாதுகாப்பான தனி வீடுகள்: இந்திய - இலங்கை நிதியுதவியால் பெருந்தோட்டங்களில் மலைகளில் கட்டப்படவிருக்கும் வீடுகள், தொடர்மாடி வீடுகள் அல்ல. அவை காணி உரிமையுடன்கூடிய பாதுகாப்பான தனி வீடுகள்தான் என்பதை அறிவியுங்கள்!

6) மலையக அதிகாரசபை: சமூக - பொருளாதார வளர்ச்சி புள்ளிவிபரங்களில் பிற்படுத்தப்பட்ட பிரிவினர் என்ற நிலையில் இருந்து விசேட நடவடிக்கைகள்மூலம் மலையக மக்களை கைதூக்கிவிட நாம் சட்டப்படி உருவாக்கிய NEVIDA என்ற மலையக அதிகாரசபையை கலைத்து, ஒழித்துவிட மாட்டோமென உறுதியாக அறிவியுங்கள்!

7) மலையக வாழ்வாதாரக் காணி: பெருந்தோட்டங்களிலுள்ள பயிரிடப்படாத தரிசு நிலங்களை மலையக மக்களுக்கு வழங்குவதாக உங்கள் கட்சியின் "ஹட்டன் பிரகடனம்"மூலம் நீங்கள் உத்தரவாதம் வழங்கினீர்கள். இன்று அந்தக் காணிகளை தனியார் கம்பனிகளுக்கு வழங்க உங்கள் அரசு முடிவு செய்துள்ளது. இது மோசமான துரோகமாகும். இதை உடன் நிறுத்தி, நீங்கள் உறுதியளித்தபடி, தரிசு நிலங்களை மலையக இளைஞர்களுக்குப் பிரித்து வழங்கும் "மலையக வாழ்வாதாரக் காணிக் கொள்கையை" அறிவியுங்கள்!

8) மலையக தித்வா அகதிகள்: தித்வா பேரழிவால் பெரிதும் பாதிக்கப்பட்ட கண்டி, பதுளை, நுவரெலியா, பெருந்தோட்ட மக்களில் கணிசமானோர் இன்னமும் இடைத்தங்கல் முகாம்களிலே வாழ்கின்றனர். அவர்களுக்கு நீதி எங்கே? தேசிய இடர் நிவாரண அமைச்சின் 50 இலட்சம் ரூபாய் பெறுமதியான தித்வா வீட்டுத்திட்டத்தில் இருந்து மலையக தித்வா அகதிகளை அகற்றி, வழமையான இந்திய வீடமைப்புத் திட்ட வீடுகளை அவர்களுக்குத் தர, ஆரம்பத்தில் உங்கள் அரசு இரகசியமாக முயன்றது. இது ஓர் இன ஒதுக்கல் - apartheid - என நாம் கூறினோம். எனது கடும் எதிர்ப்பு மற்றும் தலையீட்டின் பிறகு அது நிறுத்தப்பட்டது. நமது கோரிக்கைகளை அடுத்து, இந்திய அரசு மேலதிகமாக 4,000 வீடுகளை தித்வா வீடமைப்புக்குத் தந்தது. அவுஸ்திரேலியா அரசு நில பாதுகாப்பு - NBRI - தொடர்பில் உங்களுக்கு உதவுகிறது. இந்நிலையில், மலையக தித்வா அகதிகளின் மறுவாழ்வு தொடர்பில் உங்கள் கொள்கையை உறுதியாக அறிவியுங்கள்!

9) நேர்மறை ஒதுக்கீடு: சமூக - பொருளாதார வளர்ச்சி புள்ளிவிபரங்களில் பிற்படுத்தப்பட்ட பிரிவினர் என்ற அடிப்படையில், பெருந்தோட்ட மக்களுக்கான கல்வி, சுகாதாரம், உட்கட்டமைப்பு ஆகிய துறைகளுக்கான விசேட நிவாரண ஒதுக்கீட்டுத் தொகைகளை, நேர்மறை அபிவிருத்திக் கொள்கை - Affirmative Action Scheme - அடிப்படையில் கூறி, அவற்றை அமுல்படுத்தும் பொறிமுறையையும் அறிவியுங்கள்!

அதேவேளை, மாண்புமிகு சனாதிபதி அவர்களே, எதிர்வரும் 12ஆம் திகதி நீங்கள் ஆற்றவுள்ள உரை, வரவு செலவுக்கணக்கு என்பதற்கு மேல், உங்கள் அரசின் வருங்கால கொள்கை விளக்க உரையாகும் என்பதை நான் மேலே குறிப்பிட்டுக் கூறியிருந்தேன். மேலும், இது உங்களது ஆட்சியின் சரிபாதி இரண்டரை வருடங்களை ஊடறுத்துச் செல்வதால், இலங்கையின் தமிழ் பேசும் கூட்டு தேசிய இனங்களின் பொது எதிர்பார்ப்புகளையும் ஒரு தேசிய கட்சியான தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் என்ற முறையிலும், நீண்டகால சிரேஷ்ட பாராளுமன்ற உறுப்பினர் என்ற முறையிலும் உங்களது "வளமான நாடு - அழகான வாழ்க்கை" தேர்தல் விஞ்ஞாபனம் மூலமாக நீங்கள் தமிழ் மக்களுக்கு வழங்கிய சில பிரதான உறுதிமொழிகளை உங்களது ஞாபகத்துக்குக் கொண்டுவருகிறேன்.

10) புதிய அரசியலமைப்பு: இரண்டு வருடங்கள் கடந்துள்ள நிலையில், "புதிய அரசியலமைப்பு உருவாக்கம்" என்ற உங்கள் உறுதிமொழிக்கு என்ன ஆனது?

11) අරසියල් කෛදිකළ්: නල්ලෙණ්ණ මන්නිප්පිල් නීංකළ් විටුවිප්පතාකච් චොන්න, නීණ්ටකාලමාකච් චිරෙයිල් වාටික්කොණ්ටු ඉරුක්කුම් තමිල් අරසියල් කෛදිකළින් විවකාරම් එන්න ආනතු?

12) කාණි විටුවිප්පු: නීංකළ් විටුවිප්පතාක උරුතියළිත්ත වට, කිළක්කිල් ආක්කිරමික්කප්පට්ට තනියාර් කාණි විවකාරම් එන්න ආනතු?

13) මාකාණ සපෙත් තේර්තල්: ඔරු වරුට අවකාසත්තිල් නීංකළ් නටත්තුවතාකච් චොන්න මාකාණ සපෙත් තේර්තල් එන්න ආනතු?

14) පයංකරවාත තටෙච් චට්ට අකට්රල්: පයංකරවාත තටෙච් චට්ටත්තෙ මුළුමෙයාක අකට්රුවෝමෙන එංකළුටන් චේර්ත්තු නීංකළ් පෝරාටිනීර්කළ්. ඉන්ත මෝසමාන චට්ටත්තුක්කු මාට්රු චට්টම් කොණ්ටුවර මුයල්කිරීර්කළ්. ඉනි පුතු චට්ටමෝ, තිරුත්තමෝ වේණ්ටාම්. පුතිය චට්ට වරෙවෙයුම් පළෙය චට්ටත්තෙයුම් මුළුමෙයාක අකට්රුංකළ්!"

මට කලින් විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. එයට මම ඇහුම්කන් දීගෙන සිටියා. එතුමා කිව්වා, ජාත්‍යන්තර මට්ටමින් සාකච්ඡා කර, කථා කර අලුත් නීති ගෙනෙනවා කියලා. අපි කථා කරන්නේ ඒ ගැන නොවෙයි. අනුර දිසානායක මැතිතුමා මා සමඟ අත්වැල් බැඳගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට - PTA එකට - විරුද්ධව සටන් කරපු එක්කෙනා. එතකොට මොනවාද කිව්වේ? "We will repeal it" කිව්වා. දැන් replace කරනවා. ඒකයි මම කියන්නේ.

ජාත්‍යන්තරයේ කථා අපිට ඕනෑ නැහැ. අපි රට ගැන කථා කරන්නේ. රටේ තත්ත්වය මෙහෙමයි. අපි එතුමා එක්ක වැඩ කරපු මිනිස්සු. අපි ඒක දන්නවා. නමුත්, එතුමා දීපු පොරොන්දු කඩකර තිබෙනවා. එහෙම පෙරොන්දු කඩන්න එපා. අපිට අලුත් නීතිත් එපා, පරණ නීතිත් එපා. දැන් රට තුළ ත්‍රස්තවාදය නැහැ. අපිට දැන් Public Security Ordinance එක හොඳටම ඇති. ඒ අනුව වැඩ කරන්න පුළුවන්. ඒකයි මම කියන්නේ.

" 15) කාණාමල්පෝනෝර් මට්රුම් චෙම්මණි විචාරණෙ: වටක්කිල් කාණාමල්පෝනෝර් විවකාරත්තුක්කු, චෙම්මණි විවකාරම් තොටර්පිල් කෛතියාන මුන්නාල් ලාන්ස් කෝප්රල් චෝමරත්න රාජපක්ෂවින් වාක්කුමූලත්තෙ අටිප්පටෙයාකක්කොණ්ටු තීර්වු තේටුංකළ්!

නාට්ටින් තකවලුක්කාක ඉන්තක් කටිතත්තෙ නාටාළුමන්රත්තිල් පතිවිටුකිරේන්. නන්රි."

මාණ්පුමිකු සනාතිපති අවර්කළේ, තෝට්ටත් තොළිලාළර්කළින් වීටමෙප්පුත් තොටර්පාක නීංකළ් ආක 50 වීටුකළෙක් කට්ටිවිට්ටු, 50 මාටිකළෙක් කට්ටියතුපෝල් චොන්නීර්කළ්. එංකළුටෙය මක්කළුක්කු වීටුකළෙවිට කාණිතාන් තේවෙ. කාණි උරිමෙ ඉල්ලාමල් මලෙයකත් තමිල් මක්කළින් පිරජාවුරිමෙ මුළුමෙයාකාතු. ඉතිල් නාංකළ් තෙළිවාක ඉරුක්කිරෝම්. එංකළුටෙය මක්කළුක්කු කාණි අවසියමාක ඉරුක්කින්රතු. එනවේ, කාණි තාරුංකළ්! චොන්තක් කාණියිල් වීටු කට්ට මුටියාත වරියවර්කළ් ඉරුප්පාර්කළේයානාල්, අවර්කළුක්කු අරසාංකම් උතවි චෙය්යලාම්. ඉන්තිය අරසාංකත්තින් 10,000 වීට්ටුත්තිට්ටත්තෙ නාංකළ්තාන් පේසි එටුත්තෝම්. එංකළුටෙය ආට්චික් කාලත්තිල් පෙට්ර උත්තරවාතම්තාන් ඉප්පෝතුම් ඉරුක්කින්රතු. ඔරු වීට්ටුක්කු 28 ඉලට්චම් රූපාය් වීතම් තරුවතර්කු ඉන්තිය අරසාංකම් තයාරාක ඉරුක්කිරතු; අතෙක් කටන් වචතියාකවුම් තරලාම්.

මුතලිල් කාණි වළංකුංකළ්! කාණියෙ වළංකාමල්, අවර්කළෙ ඉන්ත නාට්ටින් ඉරණ්ටාම්පට්ච කුටියුරිමෙ කොණ්ටවර්කළාක මාට්ර වේණ්ටාමෙනක් කූරිවෛක්ක විරුම්පුකින්රේන්. අටුත්ත මූන්රු ආණ්ටුකළිල් නීංකළ් එත්තනෙ වීටුකළෙක් කට්ටප්පෝකිරීර්කළ් එන්පතෙ එංකළුක්කුච් චොල්ලුංකළ්! 2025ආම් ආණ්ටු මාර්ච් මාතම් ඉටම්පෙට්ර වරවු චෙලවුත්තිට්ට විවාතත්තින්පෝතු, එනක්කු එතිරිලුළ්ළ ආචනත්තිල් අමර්ත්තිරුක්කුම් පෙරුන්තෝට්ටත්තුරෛක්කුප් පොරුප්පාන අමෛච්චර් කෛරව කේ.වී. චමන්ත විත්‍යාරත්න අවර්කළ්, නාන් කේට්ට කේල්වික්කුප් පතිලළික්කුම්පෝතු, 2025ඉල් 6,000 වීටුකළෙක් කට්ටුවතාකච් චොන්නාර්. ආනාල්, කට්ටවිල්ලෙ. 50 වීටුකළෙ මට්ටුමේ කට්ටියිරුක්කිරාර්. ඉප්පොළුතු අවර් ඉංකු ඉල්ලෙ.

අවර් පිරතිනිතිත්තුවප්පටුත්තුකින්ර පතුළෙ මාවට්ටත්තිල් මට්ටුම්තාන් එල්ලා කට්ටුමානංකළුම් නටන්තුකොණ්ටු ඉරුක්කින්රන. මලෙයකම් එන්රාල් පතුළෙ මට්ටුම්තාන් එන්රු අවර් නිනෛක්කිරාර්. මලෙයකම් එන්පතු පතුළෙ මට්ටුමල්ල, මහියංකනෙ, නුවරෙලියා, කණ්ටි, මාත්තළෙ, ඉරත්තිනපුරි, කේකාලෙ, කාලි, මාත්තරෙ, කොළුම්පිලුළ්ළ අවිචාවළෙ, කුරුනාකල් එන එල්ලා ඉටංකළෙයුම් උළ්ළටක්කුකින්රතු. පෙරුන්තෝට්ටංකළ් මාත්තරෙ මාවට්ටත්තිලුම් ඉරුක්කින්රන; මාත්තළෙ මාවට්ටත්තිලුම් ඉරුක්කින්රන. එනවේ, පෙරුන්තෝට්ටංකළ් උළ්ළ එල්ලා මාවට්ටංකළෙයුම් චාර්ත්තු ඉන්ත වීට්ටුත් තිට්ටත්තෙ මුන්නෙටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්.

වෙරුමනේ rhetoric - චත්තම් පෝට්ටුප් පේචුවතු, උරක්කක් කුරල්කොටුප්පතු, එතිර්ක්කට්චි එන්රු නිනෛත්තුක්කොණ්ටු පේචුවතෙල්ලාම් චරිවරාතු. නීංකළ් ආළුංකට්චි - අරචාංකම් - එන්පතෙ මරන්තුවිටක් කූටාතු. උත්තරවාතම් අළිත්තතර්කු ඉණෛක්ක, මේර්කුරිත්ත විටයංකළුක්කුරිය පතිල්කළෙ එතිර්වරුම් 12ආම් තිකති මාණ්පුමිකු සනාතිපති අවර්කළ් නිති අමෛච්චරාක ඉච්චපෛක්කු වරුම්පෝතු වළංකුවාර් එන්ර නම්පික්කෛ එනක්කු ඉරුක්කිරතු. අතනෙ එතිර්පාර්ත්තු නාන් ඉන්තක් කටිතත්තින් ආංකිල මර්රුම් තමිල් පිරතිකළෙ චපෛක්කුච් චෙය්ය ***චමර්ප්පික්කින්රේන්**. නන්රි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.06]

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(මාණ්පුමිකු ටී.කේ. ජයසුන්දර)
(The Hon. T.K. Jayasundara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව තුළ ප්‍රධාන කරුණු තුනක් ගැන කථා කරනවා. එයින් පළමු කරුණ වන්නේ, නව ලෝක අර්බුද තත්ත්වය තුළ අපනයනකරුවන්ට සහාය වීමයි. දෙවැනි කරුණ වන්නේ, නව වෙළෙඳපොළ හඳුනා ගනිමින් අගය එකතු කළ අපනයන පුළුල් කිරීමයි. තුන්වන කරුණ වන්නේ, අපනයන ක්‍රියාවලිය සක්‍රිය කිරීමට

** පුස්තකාලයේ තබා ඇත.*
** Laid in the Library.*
** Placed in the Library.*

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

ඩිජිටල්කරණය කිරීමයි. මෙන්න මේ කාරණා තුන තමයි අද එතුමා මතු කර තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුති කරන්න ඕනෑ. මොකද, අද දවසේ තිබෙන ලෝක තත්ත්වයත් එක්ක අපේ රටේ අපනයනකරුවා නව පිම්මක් උඩට ගෙනියන්න, එම අර්බුදය හමුවේ වුවද අපගේ ජාතික ඉලක්කය සපුරා ගන්න ඒ කළ යෝජනාව ඉතාම වැදගත්.

නමුත්, අපිට කනගාටුවට කරුණකුත් තිබෙනවා. ඒ තමයි, මේ වාගේ ජාතික කර්තව්‍යයක් කරන වෙලාවක, අපේ රටේ අපනයනකරුවන් ගොඩනගන්න බලන වෙලාවක, අපේ රටේ හොඳ විපක්ෂයක් තිබුණා නම්, අපනයනකරුවන්ගේ ගැටලු ටික ඉදිරිපත් කරලා හොඳ සාකච්ඡාවක් ගොඩනගන්න මේ අවස්ථාව හොඳින් ප්‍රයෝජනයට ගන්න තිබුණා. නමුත්, ඒ වාගේ විපක්ෂයක් අපට නොමැතිවීම අපේ අවාසනාව තමයි. හැබැයි, අපිට එහෙම විපක්ෂයට දොස් කියලා විතරක් බලාගෙන ඉන්න බැහැ. අපිට සිද්ධ වෙලා තිබෙනවා, ඒ සඳහා වැඩකටයුතු කරගෙන යන්න; අපේ ක්‍රියාවලිය දශමයකින්වත් නොනවත්වා ඉදිරියට ගෙනයන්න.

ව්‍යවසායයන් ගැන කථා කරනකොට, විශේෂයෙන්ම ඒ ගැන විතරක්ම නොවෙයි, අපනයන ගැන තමයි අපට ගොඩක් කථා කරන්න වෙන්නේ. අපනයන සංවර්ධන මණ්ඩලය මෙතැනදී විශේෂ දායකත්වයක් දරනවා. ලෝකයේ විශාල අර්බුදයක් පවතින අවස්ථාවක සහ "දිටිවා" සුළි කුණාටුව වැනි ව්‍යසනයකට රට මුහුණ දී තිබුණු වෙලාවේ, අපේ රටේ අපනයන ආදායම අඩු නොවෙන්න, අපනයන ආදායමේ යම් වර්ධනයක් ඇති කරන්න පුළුවන් මට්ටමට අදාළ ආයතන මෙහෙයවීම පිළිබඳව අපි ඔවුන්ට ස්තුති කළ යුතුව තිබෙනවා. එම ආයතනවල දායකත්වය නිසා පමණක් නොව, රටක් විධියට අපනයන ක්ෂේත්‍රය පිළිබඳව සංවිධිත දැක්මක් අපේ රජයට තිබුණු නිසා තමයි එවැනි අර්බුද හමුවේ අපනයන ආදායම වර්ධනය කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියලා මම හිතනවා.

සිංහල භාෂාවේ කියමනක් තිබෙනවා, "දුන්න දුනුගමුවේ, ඊතල කිතලගමුවේ, රාළ මීගමුවේ, මුවෙක් හැඹුවයි සබරගමුවේ" කියලා. අවශ්‍ය දේවල් තැන් තැන්වල තිබුණා කියලා එය බලයක් බවට පත්වෙන්නේ නැහැ. අවසාන ප්‍රතිඵලදායක තීන්දුවකට එන්න නම්, ඒ ටික ඔක්කෝම එක තැනකින් මෙහෙය වන, සංවිධානාත්මක වැඩක් බවට පත්වෙන්න ඕනෑ කියන එක තමයි ඒ කථාවෙන් අපට ඉතිහාසයේ ඉඳලාම කියලා දීලා තිබෙන්නේ. හැබැයි, මේ සමාජයේ හිටපු ඔස්තාර්ලා යැයි කියපු අයට, මේ රට මෙච්චර කාලයක් පාලනය කරපු දැවැන්ත විද්වතුන් යැයි කියපු අයට, එහෙම නැත්නම් අත්දැකීම් තිබෙනවා යැයි කියපු අයට, මෙච්චර කාලයක් මෙන්න මේක කරගන්න බැරි වුණා. එක්කෝ, ඒවා ඒගොල්ලන්ගේ පවුල්වල ඥාතීන්ට එකතු වුණා, එහෙම නැත්නම් තමන්ගේ හිතවත් කණ්ඩායම්වලට විතරයි ලගු වුණේ.

හැබැයි, දැන් ජනාධිපතිවරයාගේ මෙහෙය වීම යටතේ තිබෙන විශේෂ අමාත්‍ය කණ්ඩායමකට එම කාර්යභාරය භාර දී තිබෙනවා. අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ අමාත්‍යවරු සම්බන්ධ කරගත් දීර්ඝකාලීන සැලැස්මක් එක්ක යන වැඩ පිළිවෙළක් දැන් ක්‍රියාත්මක වෙනවා. ඒක විවිධ ආයතන වශයෙන් වෙන් වෙන්ව හදලා තිබෙනවා විතරක් නොවෙයි, දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යවසායක සභා හරහා, ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙන ප්‍රාදේශීය ව්‍යවසායක සභා ඇතුළු සියලු ආයතන ඒකාබද්ධ කරලා, හරියට ශරීරය ක්‍රියාත්මක වෙනවා වාගේ විධිමත් හා සංවිධිත ආකාරයකට අපි ඒ වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. ඒ නිසා තමයි, ලෝකය තුළ මෙවැනි පීඩනයක් තිබියදීත් අපේ රටට මේ ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් වුණේ.

විශේෂයෙන්ම, 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලයත්, 2026 ජනවාරි සිට සැප්තැම්බර් අතර කාලයත් ගත්තාම, අපේ රටේ භාණ්ඩ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 10.22ක් විධියටයි තිබුණේ. එය ඩොලර් බිලියන 10.76 දක්වා සියයට 5.35ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා. ඩොලර් බිලියන 2.74ක් තිබුණු සේවා අපනයන ආදායම, ඩොලර් බිලියන 2.85 දක්වා සියයට 3.88ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා. භාණ්ඩ හා සේවා දෙකේම එකතුව විධියට සමස්ත අපනයනය අරගෙන බැලුවොත්, ඩොලර් බිලියන 12.6ක්ව තිබුණු ආදායම ඩොලර් බිලියන 13.61 දක්වා සියයට 5.4ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා. ඇත්තටම ලෝකය සාමාන්‍ය තත්ත්වයක් යටතේ තිබුණා නම්, එම වර්ධනය අපට සාමාන්‍ය දෙයක් වෙන්න පුළුවන්. ලෝකයේ දැවැන්ත අර්බුදයක් තිබියදී, ලෝකය යුද බිමක් බවට පත් වෙලා තිබියදී, සමුද්‍ර සන්ධි ක්‍රියාත්මක නොවෙන තත්ත්වයක් තුළ, අපේ රටේ ඉන්ධන මිල ඉහළ යනකොට, ගෑස් මිල ඉහළ යනකොට, විදුලි බලය සඳහා යන වියදම වැඩි වෙනකොට, එවැනි තත්ත්වයක් යටතේත් මේ ජයග්‍රහණ අත් පත් කර ගැනීම තමයි මෙහි තිබෙන සුවිශේෂීත්වය. ඒ තත්ත්වය අපට ලෙහෙසියෙන් හිතන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ලෝකය තුළ එවැනි තත්ත්වයක් නොතිබුණා නම්, අපේ රටේ මෙම අංශවල වර්ධනය කොච්චර දුර යයිද කියලා මට හිතෙනවා. හැබැයි, ඒ කුමන තත්ත්වයක් තුළ වුවත් අපි මේ ජයග්‍රහණ අත් පත් කරගෙන තිබෙනවා. මේ රහස හඳුනගෙන අපි මෙතැනින් එහාට කටයුතු කළ යුතුයි. ඒ රහස තමයි, සංවිධිත බව, විධිමත් බව, එක නායකත්වයක් යටතේ වැඩ කිරීම හා සාමූහිකත්වය. මෙන්න මේ කාරණා සියල්ලේම ප්‍රගතිය මත තමයි අපි මෙච්චර දුර ගිහිල්ලා තිබෙන්නේ.

ඒ වාගේම, මෙන්න මේ කාරණයත් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. අපි දන්නවා, අපට චෝදනා කරන්න බලාගෙන සිටින විපක්ෂයක් තමයි දැන් තිබෙන්නේ කියලා. සාධාරණ චෝදනා නොව, අසාධාරණ චෝදනා එල්ල කරන විපක්ෂයක් ඉන්නකොට, එක්සත් ජනපදය විසින් අපේ රටට සියයට 44ක තීරු බද්දක් පනවපු වෙලාවේ ඒගොල්ලෝ කථා කළේ අපේ රට වෙනුවෙන්ද, එහෙම නැත්නම් "අපේ රට විනාශ වෙයන්" කියන අරමුණින් ද කියලා මේ රටේ මිනිස්සු දන්නවා. ඒක අපි විසින් කරපු එකක් වාගේ තමයි ඒගොල්ලෝ කථා කළේ. ඒ ගැන අපට උපදෙස් දෙන්න පටන් ගත්තා. මේ ලෝකයේ තිබෙන ලොකුම උපදෙස් ටික අපට පාර්ලිමේන්තුවේදී දෙන්න පටන් ගත්තා. හැබැයි, අපි ඒ සියල්ල පරාජය කරලා, ඇමෙරිකාවත් එක්ක සාකච්ඡා කරලා එම තීරු බද්ද සියයට 20 දක්වා අඩු කරගන්න අපට පුළුවන් වුණා.

ඒ විතරක් නොවෙයි, පිට රටින් භාණ්ඩ ආනයනය කරලා, අගය එකතු කරලා, නැවත අපනයනය කරන අයට විශාල සහන ප්‍රමාණයක් ලබා දීලා, අපනයන වැඩි කරගන්නේ කොහොමද කියලා උපදෙස් ලබා දෙමින් ඔවුන් ධෛර්යවත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම, "අපනයනය" කියන කාරණය ගත්තොත්, අපට අපනයන ක්ෂේත්‍රය වෙනම ගන්න බැහැ. ඒ සඳහා රටක තිබෙන ස්ථාවරත්වය බලපානවා. රටේ ස්ථාවරත්වයක් නැත්නම්, ඒ රට දිහා ව්‍යාපාරිකයෝ බලන්නේවත් නැහැ. ඒ වාගේම අපනයනකරුවෝ ඒ රට ගැන හිතන්නේවත් නැහැ. හැබැයි දැන් ලොකු ප්‍රවණතාවක් - trend එකක් - ඇති වෙලා තිබෙනවා, අපේ රටේ අපනයන ක්ෂේත්‍රය ගැන හිතන්න, ව්‍යවසායකයින්ට එන්න, මුදල් යොදවන්න. දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. ඔවුන් ලැහැස්තියි, මුදල් යොදවන්න. නමුත්, අපට ඉඩම් කෝ, අරක කෝ, මේක කෝ කියලා එක එක දේවල් ගැන ඔවුන් අහනවා. එවැනි විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන් ඔවුන් කථා කරනවා. හැබැයි, මෙතැනදී අපි දකින්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ තමයි, එවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් ව්‍යවසායකයින් කියන්නේ මොකක්ද කියන එක.

ව්‍යාපාර කරන්න අවශ්‍ය හොඳ වාතාවරණයක් අද වන විට අපේ රටේ තිබෙනවා කියලා ව්‍යවසායකයින්ට විශ්වාසයක් ඇති වෙලා තිබෙන නිසායි ඔවුන් එහෙම කියන්නේ. මීට අවුරුදු 4කට, 5කට, 6කට කලින් ව්‍යවසායයක් ගැන නොවෙයි, අපේ රට දාලා යන එක ගැනයි හිතුවේ. දරුවෙක්වත් අපේ රටේ තියාගන්නේ නැතිව පිට රට යවන්න තමයි එදා හිතුවේ.

නමුත් දැන් අපේ රටේ ප්‍රවණතාවක් ඇති වෙලා තිබෙනවා, ව්‍යවසායමය සංස්කෘතියක් සම්බන්ධව. අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ විනාශ කරපු රටක මේ තත්ත්වය නැවත ගොඩනඟන එක ලෙහෙසියෙන් කරන්න පුළුවන් සරල කාරණාවක් නොවෙයි කියලා අපි දන්නවා. හැබැයි, අපි ක්‍රම ක්‍රමයෙන්, පියවරෙන් පියවර ඉදිරියට යමින් තිබෙනවා. අපි මේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම අපි විදේශ රටවල් එක්ක හොඳ සම්බන්ධතා පවත්වමින් යනවා. ඒ වාගේම අර්බුද තත්ත්වයේදී අපි ඒ ව්‍යවසායකයින් එක්ක, අපනයනකරුවන් එක්ක එකට ඉන්නවා කියන පණිවිඩය දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ තානාපතිවරුන්ට අපි අපනයන දිරිමත් කරන ඉලක්ක ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ තේ කර්මාන්තය ගත්තොත්, මේ ලෝක තත්ත්වය ඇතුළේ සියයට 6ක පමණ අඩුවක් අපට තිබෙනවා. හැබැයි, මේ ලෝක තත්ත්වයත් එක්ක ඉන්දියාවේ තේ කර්මාන්තයේත් සියයට 8ක පමණ අඩුවක් තිබෙනවා. ඒ කියන්නේ, මුළු ලෝකයටම බලපාන මේ අර්බුදය තේ කර්මාන්තයටත් බලපා තිබෙනවා.

මේ අවස්ථාවේදී ඇත්තටම අපි හඳුනා ගන්න ඕනෑ, මේ විපක්ෂයේ සැලසුම මොකක්ද කියලා. විපක්ෂයට ඕනෑ, දැන් රට අස්ථාවරයි කියලා ජාත්‍යන්තරයට මතයක් ගොඩ නඟන්නයි. ඒක තමයි ඔවුන්ගේ සැලසුම. ඒකට අවශ්‍ය කටයුතු ටික තමයි ඔවුන් මේ කරමින් ඉන්නේ. ඒ විතරක් නොවෙයි. ඔවුන් සමාජය තුළත් යම් අස්ථාවර තත්ත්වයක් ගොඩ නඟන්න උත්සාහ කරනවා. ඒ වෙනුවෙන් පාවිච්චි කරන්න පුළුවන් ආගමද, ජාතියද, කුලයද, මොකක්ද ඕනෑම දෙයක් ඔවුන් පාවිච්චි කරනවා. ඒ ආකාරයට ඒ දේවල් පාවිච්චි කරලා ඔවුන් මේ රට අස්ථාවර කරන්න හදනවා. එක පැත්තකින් මහා ව්‍යවසායයන් ගැන කථා කරන ගමන්, අනෙක් පැත්තෙන් ගිහිල්ලා රට අස්ථාවර කරන්න කථා කරන අය ඉන්නවා. මේ දේවල් වෙනුවෙන්, ඒ අස්ථාවර බව ඇති කරන්න තමන්ගේ මාධ්‍යයන් පාවිච්චි කරන අයත් විපක්ෂයේ ඉන්නවා. ඒ වාගේම වංචා දූෂණ සම්බන්ධයෙන් වැරදිකරුවන් වුණු අය බේරාගන්න සටන් කරන අයත් ඉන්නවා. වංචාවට, දූෂණයට එරෙහි සමාජයක් හදනවා කියලා අපි පොරොන්දු දීලා අපේ රට ලෝකයේ ස්ථාවර රටක් බවට පත් කරන්න හදද්දි, ඒ වංචා දූෂණවලට අහු වෙච්ච අය බේරාගන්න සටන් කරන විපක්ෂයක් අපට ඉන්නවා. අද වන විට ඒ දේවල් අපි දකිනවා.

ඇත්තටම අරගෙන බැලුවොත් මේ විපක්ෂය විකෘතියක්. මේ විකෘතිවීමට හේතුවක් තිබෙනවා. ඒකට දේශපාලන හේතුවක් තිබෙනවා. මොකද, මේ විපක්ෂය එකට රංචු ගැහිලා තිබෙන්නේ කිසිම දේශපාලන න්‍යායක් ඇතිව නොවෙයි. ඒගොල්ලන්ට අපේ රටේ දේවල් අපනයනය වුණත් එකයි, නැතත් එකයි. ඒ අයට ලංකාව ඉස්සරහට ගියත් එකයි, නැතත් එකයි. ඒ අයට මේ රටේ ජනතාව දුප්පත්කමින් මිදුණත් එකයි, නැතත් එකයි. ඔවුන් බලන්නේ බලය දෙස විතරයි. තමන්ගේ අර පරණ සුපුරුදු ඒ නාඩගම් ටික කරන්න තමයි ඔවුන් බලන්නේ. ඒ නිසා අන්න ඒකට කැමැති, ඒ වැඩ එහෙම කරගෙන යන, නමුත් තාවකාලිකව තමන්ට එන වංචා දූෂණ චෝදනාවලින් මිදෙන්න විකෘතියක් ඇති කරලා, එකට රංචු ගැහිච්ච කණ්ඩායමක් තමයි අපි අද දකින්නේ. ඒක අපි අද උදේ ඉඳලා පාර්ලිමේන්තුවේ දැක්කා. අපි අද දවසේදී ගෙනා මේ හොඳ යෝජනාව කඩාකප්පල් කරන්නම තමයි උදේ ඉඳලා හැදුවේ. අපනයන සම්බන්ධයෙන් අද රට තුළ ඇති වෙන්න හදන හොඳ සාකච්ඡාව, අපනයනකරුවන්ට සහන දෙන්න හදන සාකච්ඡාව කඩාකප්පල් කරන්න තමයි අද දවසේම විපක්ෂය සූදානම් වුණේ. ඒ වෙනුවෙන් තමයි ඔවුන් අද දවසේදී සම්පූර්ණ වැඩ පිළිවෙළ ගෙනිව්වේ. ඒ කරපු වැඩේට අපි විපක්ෂයට දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. මේ රටේ අපනයනකරුවන්ගෙන් මම අහනවා, මෙන්න මේ වාගේ විපක්ෂයක් එක්ක කොහොමද රටක් හදන්නේ කියලා. ඔබ ඒ සඳහා හොඳ අවදියෙන් ඉන්න කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා. මේ යෝජනාව ගෙන ආ අපේ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ සිටින මන්ත්‍රීතුමන්ලා කියපු කාරණා කිහිපයකුත්, අද මේ මතු කරපු විෂයයටත් අදාළව සාකච්ඡා කරනකොට, මම ඇත්තටම අද මගේ කථාවේදී කියන්නට බලාපොරොත්තු වුණු කරුණු මොහොතකට පැත්තකින් තියන්න සිද්ධ වනවා. මොකද, ඔබතුමන්ලා දෙපළක් මා ඉදිරියේදී කරපු කථාවල සමස්තයේ තිබෙන අර්බුදය ඔබ විසින්ම තේරුම් ගත යුතුව තිබෙනවා. පළමුවෙන්ම මම මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා හැම වෙලාවේම බොහොම සද්භාවයෙන් කිව්වේ, රට ඉදිරියට ගෙනයන්නට නව ගාමක බලයක් ලබා ගන්නට නම් අපට මූලෝපායික උපාය මාර්ගයක් අවශ්‍යයි කියන එකයි. ඔබ වාගේම රටේම ජනතාවත් දන්නවා, ඔබ ආණ්ඩුව අරගෙන අවුරුදු දෙකක් ගත වෙලාත් උපාය මාර්ගිකව - strategically - අලුතින් මුකුත් කරලා නැහැ කියන එක. ඔබ පරණ ආණ්ඩු කරපු දේවල් ඊටත් වැඩිය හොඳට කරන බව පැහැදිලියි. නමුත් එයින් අපේ රට ගොඩ යන්නේ නැහැ.

විශේෂයෙන්ම අපනයන සම්බන්ධයෙන් ඔබතුමන්ලා මේ සභාවේදී කථා කළා. අපනයනවල ප්‍රගතියක් තිබෙනවාය කිව්වා. මම නැවත නැවතත් මේ පාර්ලිමේන්තුවට කියනවා, අපි අපටම බොරු කරගන්න හොඳ නැහැ, අපි අපිවම රවටා ගන්න හොඳ නැහැ කියලා. එලෙස රවටා ගැනීමෙන් අපහසුතාවට පත් වෙන්නේ අපි සියලු දෙනාම වාගේම මමත්, ඔබත් විශ්වාස කරන රටයි.

අපනයනය සම්බන්ධයෙන් ඔබතුමන්ලා කියන කාරණා ගැන අපි බලමු. අපනයනය සම්බන්ධයෙන් තිබෙන ඇත්ත කථාව මොකක්ද? අපි සන්සන්දනය කරන 2025/2026 වර්ෂයට අදාළ කාර්තු තුනේ අපනයනවල ඇත්තටම තිබෙන්නේ කඩා වැටීමක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ඇයි? අපේ රටට ඩොලර්වලින් විශාල අගයක් එකතු වන අපනයන අයිතමයන්ගෙන් ඇඟලුම් අයිතමය කඩාගෙන වැටිලා තිබෙනවා. ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත් එය 5.8ක ප්‍රමාණයක්. ඊළඟට, තේ අපනයනය සියයට 6.8කින් කඩාගෙන වැටිලා තිබෙනවා. මේ කාර්තු සන්සන්දනයේදී අපි ලබාගෙන තිබෙන සියයට 5කට ආසන්න සුළු වැඩිවීමට දායක වෙලා තිබෙන්නේ export of petroleum products කියන අයිතමයයි. එය සියයට 50කටත් වඩා වැඩියි. මොකක්ද යථාර්ථය? අපි අපනයනය කරලා තිබෙන්නේ ආනයනය කරපු

[ගරු දිලිත් ජයවීර මහතා]

භාණ්ඩ. මට ඒ අයිතම සියල්ල ගැන විස්තර කරන්න වෙලාවක් නැහැ. අපි අපනයනය සහ ආනයනය කරන ද්‍රව්‍ය අතර වෙනස ගත්තොත්, ලොකු අඩුවක් නැත්නම් minus තමයි තිබෙන්නේ. මේක තමයි ඇත්ත. ඉතින්, අපි අපට බොරු කරගන්න හොඳ නැහැ. මම ඒකයි කියන්නේ මහ පොළොවේ යථාර්ථය ගැන කථා කරන්න, මහ පොළොවට ගිහිල්ලා බලන්න, ලංකාවේ ප්‍රධාන පෙළේ අපනයනකරුවන්ට කථා කරන්න කියලා. එහෙම නැත්නම් ඔබම ගණන් හදලා බලන්න, අපනයනකරුවන් අපනයනය වැඩි කරන්න මොනවාද කරලා තිබෙන්නේ කියලා. ඔවුන්ට ඒ අපනයනය වැඩි කර ගන්න ඔබ මොනවාද කරලා තිබෙන්නේ කියාත් බලන්න.

අපනයනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේදී අංක එක හැටියට තිබෙන සාධකය තමයි බලශක්තිය. අපි අඩුවෙන් බලශක්තිය ලබා දුන්නාද? තරගකාරී ලෝකයට මුහුණ දෙන්න තරම් බලශක්තිය ලබා දුන්නාද? එහෙම නැත්නම් ඔවුන්ට වෙනත් යටිතල පහසුකම් සැපයීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාද? අලුත් වෙළෙඳ පොළවල් සොයා ගැනීමට ඔබ උදව් කරලා තිබෙනවාද? එහෙම උදව් කරලා තිබෙනවා නම් ඒ මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා තමයි අපි සැලකිය යුතු ප්‍රශ්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවේදී කියන්න උත්සාහ කරන්නේම මේකයි. ඔබ ඔය කියන විධියට විපක්ෂය සුන්බුන්ද, නටබුන්ද කියන්න මම දන්නේ නැහැ. නමුත් මම කරපු හැම කථාවකින්ම කියන්න උත්සාහ කළේ අපට මේ රට ජාත්‍යන්තර තලයට ගෙනියන්න නම් උපාය මාර්ගික වැඩසටහනක් අවශ්‍යයි කියන එකයි. අපට අන්තර්ජාතික වෙළෙඳ පොළත් එක්ක තරගකාරිව කටයුතු කරන්න නම් අපේ රටටම ආවේණික වූ, අපේම උපාය මාර්ග අවශ්‍යයි. එහෙම නැත්නම් අපි අනෙක් පැත්තට තමයි ආර්ථිකය ගෙනියන්නේ. ඒක තමයි සියලුම සත්‍ය දත්තවලින් කියන්නේ. අපට ඒ ගැන කථා කරන්න පුළුවන්. අපට සුරංගනා කථාවලින් නිර්වචන ලබා දෙන්නත් පුළුවන්. හැබැයි, ඇත්ත තත්ත්වය තමයි ආර්ථිකය බරපතළ විධියට කඩා වැටී තිබීම. අවාසනාවකට වාගේ, අපේ රටට සෘජු විදේශ ආයෝජන කිසිසේත්ම ලැබෙන්නේ නැහැ. ලැබෙන්න තිබෙන ආයෝජනයක්වත් අනාගතයේදී ලැබෙන්නේ නැහැ. නොබෙල් සම්මානලාභී ඩග්ලස් නෝර්ත් කිව්වා, දියුණු රටකින් තුන්වෙනි ලෝකයේ රටවල් වෙනස් වෙන්නේ ඒ රටවල තිබෙන system එක අනුව බව. එහෙම කියලා ඔහු පැහැදිලිව කියා තිබෙනවා, ඒ රටේ තිබෙන නීතිමය තත්ත්වය, ඒ රටේ තිබෙන අධිකරණ පද්ධතිය, ඒ රටේ තිබෙන ක්‍රමවේදය පිළිබඳව ඇති විශ්වාසය ඒ සඳහා බලපෑමක් ඇති කරන බව. මේ සියල්ල කඩා වැටුණු තත්ත්වයක් තුළ අපට FDIs බලාපොරොත්තු වෙන්න බැහැ. මට පෙනෙන විධියට FDIs බලාපොරොත්තු වෙන්න නම්, the lowest -hanging fruit available for us is the Colombo Port City. අද Colombo Port City එකට මොකක්ද වෙලා තිබෙන්නේ? මහල් නිවාස හදන, කොළඹ පිහිටි ප්‍රදේශයක් බවට පත් වෙලා. ඉතින්, අපට උපාය මාර්ගිකව භාවිත කළ හැකිව තිබුණු Colombo Port City එකට අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලා විරුද්ධ පක්ෂයේ ඉන්නකොට නොකියපු දෙයක් නැහැ, ඔය Colombo Port City එකට. ඔබතුමන්ලා ඒකට නොකියපු දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ළඟදී දැක්කා, මොකක්ද අක්‍රමිකතාවක් සිද්ධ වෙලා තිබෙනවාය කියලා ෂැන්ග්‍රි-ලා එකත් ආපහු පවරා ගන්න ඕනෑය කියනවා. ඉතින්, මේ වාගේ රටකට ආයෝජන ඒවිද, විදේශ ආයෝජන ඒවිද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? Colombo Port City එකට ආයෝජනය කරපු චීනය මේ රට ගැන මොනවා හිතනවා ඇත්ද? ඔවුන්ගේ සම්පූර්ණ ආයෝජනය අද ලංකාවේ ආයෝජකයින්ට මහල් නිවාස ගණනාවක් ඉදිකරන්න ලබා දීලා තිබෙනවා. ඒ ඩොලර් ආයෝජකයින් නොවෙයි, ලංකාවේ ආයෝජකයින්. ඉතින්, මෙවැනි උදාහරණ දීපු රටකට විදේශ ආයෝජන එන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අපේ රට, අපේ මව් බිම, අපි ආදරය කරන රට. මේ රටේ මොන දේ කරන්නත් ආර්ථිකය රැක ගන්න ඕනෑ, අපේ මිනිස්සු රැක ගන්න ඕනෑ. අපේ ආදරණීය මව් බිම රැක ගන්නට නම් අපේ ආර්ථිකය - කොඳු නාරටිය - රැක ගන්න ඕනෑ. ඒ සඳහා සුරංගනා කථාවලින් ඔබ්බට ගිය සැබෑ වැඩ පිළිවෙළක් අවශ්‍ය බව සඳහන් කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ රුවන් විජේවීර මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මෑත කාලීනව මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන යුද්ධය හා භූ-දේශපාලනික නොසන්සුන්තාවන් හමුවේ වුවත්, අපනයන ක්ෂේත්‍රය ලබා ගත් සාර්ථකත්වය හා ජයග්‍රහණ පිළිබඳව අද පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න අවස්ථාව සලසා දීම ගැන මම මුලින්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම එතුමාගේ මේ යෝජනාව සම්බන්ධව අපි රජය පාර්ශ්වයෙන් කරුණු දක්වමින් සාකච්ඡා කරන්න සූදානම් වුණත් පාර්ලිමේන්තු සභා ගර්භය තුළ අද උදේ ඉඳන්ම පැවති ජවනිකාව අප දැක්කා. ඒ ගැන අපට නැවත නැවතත් කියන්න තිබෙන්නේ මේකයි. අපි රටක් හැටියට කනගාටුදායක තත්ත්වයක ඉන්නවා. ඒ, මොකක් පිළිබඳවද? බංකොලොත් වෙච්ච විපක්ෂයක් පිළිබඳව. ඒ බංකොලොත්භාවය කොච්චරද කියන එක අද අපි උදැසන සිදු වූ ක්‍රියාවලිය තුළ දැක්කා.

ඇත්තටම මේ ගෝලීය අර්බුද හමුවේ පවා, ස්වාභාවික ආපදාවන්ට මුහුණ දෙන්නට සිදු වූ අවස්ථා පහු කරලා පවා, මේ වනකොටත් ලංකාව අපනයන ක්ෂේත්‍රය තුළ යම් සාධනීය තත්ත්වයක් අත්පත් කරගෙන තිබෙනවා කියන යථාර්ථය පිළිගැනීමට හා ඒක ජනතාවට පැහැදිලි කිරීමට පාර්ලිමේන්තුවේ ඒ ගැන කථා කරන්න තිබුණු මොහොතේදී ඒ වටිනාකම හැල්ලු කරමින්, ඒ වටිනාකමේ අගය හැල්ලු කරමින්, මේ සාකච්ඡාව යට යවන්න වෙනත් ආන්දෝලනාත්මක තත්ත්වයක් ඉස්මතු කරමින් මේ පාර්ලිමේන්තු සභා ගර්භය විකෘති කරන්න කරපු ජවනිකාව පිළිබඳව අපේ පිළිකුල සහ අප්‍රසාදය අපි ප්‍රසිද්ධියේම පළ කරන්න ඕනෑ.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. ඇත්තටම කථානායකතුමා පිළිබඳව වන විශ්වාස භංග යෝජනාව ගෙනාපු වෙලාවේ, - Parliamentary Business Committee එකේ සාමාජිකාවක හැටියට මට ඒක කියන්න පුළුවන් - ඒ පිළිබඳව සාකච්ඡා කරන්න පටන් ගත් අවස්ථාවේ අපේ සභානායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඉතාම පැහැදිලිව කියපු කාරණාව තමයි, මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේම ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් කියන එක. ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් ගෙනාපු, කැලෑ පත්තරයක් වාගේ වෙච්ච විශ්වාස භංගයක් නිසා විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 91(ඊ) උල්ලංඝනය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝගවල "පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේදී මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති" යටතේ 91(ඊ)හි මෙසේ සඳහන් වනවා:

> " කිසිම මන්ත්‍රීවරයකු විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කරනු නොලැබිය යුත්තේය."

එයට අනුව, දැනට අධිකරණයේ නඩු කටයුත්තක් හැටියට තීන්දුව දීමට නියමිතව පවතින කාරණා සම්බන්ධව මෙහි ඇතුළත් වෙලා තිබෙනවා කියන පදනම මත මෙය රීති උල්ලංඝනය කරමින් ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාවක් බවත්, එය නැවතත් ස්ථාවර නියෝගවලට අනුකූලව ලේකම් මණ්ඩලය විසින් සංශෝධනය කරනු ලැබීමෙන් අනතුරුව ඉදිරිපත් කරන ලෙසටත් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී - Parliamentary Business Committee එකේදී - තීරණය කළා. ඒ තීරණය මත තමයි, මේ විශ්වාස භංගය විවාදයට නොගැනුණේ. ඒ අවබෝධය ඇතිව අපි නැවතත් කියනවා, මේ විශ්වාස භංගය ස්ථාවර නියෝග 91 (ඊ) සහ සදාචාරාත්මකව ගත්තොත්, රීති උල්ලංඝනය කරමින් ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් බවත්, ඒ නිසා මෙය නැවතත් මේ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුකූලව රැගෙන ආ යුතු බවත්. ඒ නිසා නැවතත් අපට කියන්න තිබෙන්නේ අද මේ පාර්ලිමේන්තුවේ මේ විශ්වාස භංගය පිළිබඳව කථා කිරීමත්, අද අපි කථා කරන මාතෘකාවට කිසිසේත්ම අදාළ නොවන විකෘතියක් මේ පාර්ලිමේන්තු සභා ගර්භය ඇතුළේ ඇති කිරීමට උත්සාහ කිරීමත් තුළින් විපක්ෂයේ බංකොලොත්භාවය නැවත තහවුරු කර තිබෙනවා කියන එකයි.

ඇත්තටම අද අපි මේ කථා කරන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අනුව ගත්තොත්, ගෝලීය ආර්ථිකය අපට කොයිතරම් කම්පනයන් ඇති කරනු ලැබුවත්, 2026 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලයේ මුළු අපනයන ප්‍රමාණය 2024 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලයට සාපේක්ෂව සියයට 12.7ක ඉහළ අගයක් වාර්තා කර තිබෙනවා. අද දවසේ පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙන මේ යෝජනාව ඇතුළේ අපේ රුවන් විජේවීර මන්ත්‍රීතුමා ප්‍රධාන කාරණා තුනකුත් මතු කරනවා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා සඳහන් කළා, අපේ ආණ්ඩුව වසර දෙකක කාලය ඇතුළතදී මේ ආර්ථිකය වෙනුවෙන්, නැත්නම් මේ රට වෙනුවෙන් ගත්ත අලුත් ක්‍රියාමාර්ග මොනවාද කියලා. ඇත්තටම ගත්තොත්, අපි අපනයන ප්‍රවර්ධනයේදී ගෝලීය සැපයුම් දාම කඩා වැටිලා තිබෙද්දි පවා භාණ්ඩ අපනයනයට වඩා සේවා අපනයනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒක තමයි අපේ strategic plansවල තිබෙන්නේ. ඇත්තටම අපි හිතනවා, ආර්ථිකයේදී අපි තවදුරටත් මේ රටේ පවතින මේ අයිතමයන් ගැන අවධානය යොමු කළ යුතුයි කියලා. ඇත්තටම අපේ ලංකාවේ සාම්ප්‍රදායික අපනයන භෝග, නැත්නම් සාම්ප්‍රදායික අපනයන කර්මාන්තවලට වඩා වෙනස් වූ සේවා අපනයන ක්ෂේත්‍රය කියන එක අපේ ආර්ථිකයේ ඉලක්කය බවට පත් කරගන්න ඕනෑ. අලුත් අපනයන ක්ෂේත්‍ර පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඒ පිළිබඳව රුවන් විජේවීර මන්ත්‍රීතුමාගේ යෝජනාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

අපනයනකරුවන් මුහුණ දෙන ගැටලුවලින් ප්‍රධාන එකක් වන ප්‍රවාහන හා රක්ෂණ පිරිවැය පාලනයට සහන සැලසීම සම්බන්ධයෙන් යෝජනාවක් එතුමා මේකට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම තමයි නව වෙළෙඳ පොළවල් හඳුනා ගනිමින් අගය එකතු කරන ලද භාණ්ඩ අපනයනය සඳහා දිරිගැන්වීමත් එතුමා මෙහි යෝජනා කරනවා. ඒ වාගේම තමයි අපනයන නියාමන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කළ යුතුයි කියන එකත් එතුමා මේ යෝජනාව තුළට ඇතුළත් කර තිබෙනවා. මෙන්න මේ කාරණා තුන මේ යෝජනාවට ඇතුළත් කර තිබෙනවා. නැවත වතාවක් කියනවා නම් අපනයනකරුවන් දිරිගන්වන්න, ලංකාවේ අපනයන ක්ෂේත්‍රය වැඩිදියුණු කරන්න යෝජනා කරන ප්‍රධානම කාරණා තුනක් අද දවසේ ගෙනෙන මේ යෝජනාවේ තිබෙනවා. මම නැවතත් කිව්වොත්, එහි පළමුවැනි එක තමයි, ප්‍රවාහන සහ රක්ෂණ පිරිවැය පාලනයට සහන සැලසීම. දෙවැනි එක, නව වෙළෙඳ පොළවල් හඳුනා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහා දිරිගැන්වීම. තුන්වැනි එක, අපනයන නියාමන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම.

ඇත්තටම ගත්තොත්, රටක් හැටියට අපනයන ක්ෂේත්‍රය දිරිගැන්වීම තුළ තමයි අපේ ආර්ථිකයේ නැගිටීම තිබෙන්නේ. ඒ නිසා තමයි අපි භාණ්ඩ අපනයනයට වඩා, වඩාත් පුළුල්ව හා වඩාත් විධිමත්ව සේවා අපනයනයට ලොකු බරක් තියන්නේ. ඇත්තටම ගත්තොත්, සේවා ක්ෂේත්‍රය තුළ ලංකාවේ පුහුණු ශ්‍රමිකයන්ට විශාල ඉල්ලුමක් තිබෙනවා. ඒ හරහා අපි සේවා අපනයනය සඳහා විශාල වශයෙන් ජාත්‍යන්තර විශ්වාසයක්, ජාත්‍යන්තර අවධානයක් දිනා ගත්ත රටක් බවට පත්වෙලා තිබෙනවා. මෑත කාලීනව ගත්තොත්, ඇත්තටම ඒක අපි රටක් හැටියට ලබා ගත්ත ජයග්‍රහණයක්. ඒ වාගේම ගෝලීය සැපයුම් බාධා මධ්‍යයේ වුණත් EDB එක අපනයන වර්ධනය ඉතාම ඉහළ අගයක පවත්වාගෙන තිබෙනවා. ඇත්තටම ගත්තොත්, නැව් මාර්ගවල පවතින බාධා, ඒ වාගේම ඉන්ධන සැපයුමට ඇති වෙච්ච බාධා, ඒ වාගේම පසුගිය කාලයේ ලොකු ආන්දෝලනයකට තුඩුදුන්, ඇමෙරිකාව ඇහලුම් ක්ෂේත්‍රයට පැනවූ tariff එක නිසා ලංකාවේ අපනයන කර්මාන්තය, ඇහලුම් ක්ෂේත්‍රය කඩා වැටෙයි කියලා විපක්ෂය දැස් දල්වා බලාගෙන හිටියා. හැබැයි, ඇමෙරිකාව ලබා දුන්න tariff සහනය තුළ අපේ ඇහලුම් ක්ෂේත්‍රයට ඒ කම්පනය නොදැනෙන විධියට අපේ ආර්ථිකය කළමනාකරණය කර ගැනීමට ආණ්ඩුවක් හැටියට අපට හැකියාව ලැබී තිබෙනවා.

මේ වෙලාවේ මම මේ කාරණයත් කියන්න කැමැතියි. 2022දී බොර තෙල් බැරල් එකක මිල ඇමෙරිකානු ඩොලර් 65ට තිබෙද්දී පෙට්‍රල් ලීටරය රුපියල් 470යි දුන්නේ. අද මේ වෙනකොට ගෝලීය තත්ත්වයන් එක්ක, යුද්මය වාතාවරණය එක්ක බොර තෙල් බැරල් එකක මිල ඇමෙරිකානු ඩොලර් 118ක් වෙනවා. එහෙම තත්ත්වයකදී තමයි අද මිල වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි පිළිගන්නවා, මේ වෙනකොට ලෝකයේ පවතින, ලෝක ආර්ථිකයේ පවතින උච්චාවචනයන්, ලෝකයේ පවතින යුද ගැටුම් අපට බලපාන බව. ඒ වාගේම අපි නිෂ්පාදනය නොකරන ද්‍රව්‍ය තිබෙනවා. විශේෂයෙන්ම ඉන්ධන මත, ඒ වාගේම විදුලිය කියන කාරණාව මත; බලශක්තිය මත අප තවමත් ස්වාධීන රාජ්‍යයක් නොවෙයි. ඒ නිසාම අපට ඒ කම්පනයන්ගෙන් ගැලවෙන්න බැහැ. ඒක මේ රටේ මහ පොළොවේ වැඩ කරන ජනතාව දන්නවා.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

ආණ්ඩුව හැටියට අපි ජනතාවට දීලා තිබෙන සහන ගත්තොත්, විශේෂයෙන්ම මේ ඉන්ධන ඉන්ධන මිල දරා ගන්න බැරි, පහළ ආදායම් මට්ටමවල ඉන්න ජනතාවට අපි දෙසැම්බර් මාසය දක්වාම ඉන්ධන සහනාධාරයක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ඒ සඳහා වන යෝජනා ගෙනැල්ලා තිබෙනවා. අපි දන්නවා ලෝකයේ, ගෝලීය ආර්ථිකයේ පවතින උච්චාවචනයන් අපේ රටටත් බලපාන බව. ඒ නිසා ඒ කාරණා ඔක්කෝම එක්ක ගත්තාම අපි මේ අත්පත් කරගෙන තිබෙන වර්ධනීය වෙනස, සාධනීය වර්ධනය අපි අගය කරන්න ඕනෑ. ඒ නිසා දේශපාලන කුහකත්වය එක්ක, රට කඩා වැටෙනතුරු දෑස් දල්වාගෙන ඉන්න විපක්ෂය පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ අයට තවත් බොහෝ කාලයක් බලාගෙන ඉන්න සිද්ධ වන බවත් අපි කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු ඇමතිතුමියනි.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
හොඳයි.

ඇත්තටම ගත්තොත්, විපක්ෂයක කාර්යභාරය වෙන්න ඕනෑ මොකක්ද? විපක්ෂයට පැහැදිලිවම, මතවාදීමය වෙනස්කම් වෙනුවෙන් සටන් කරන්න පුළුවන්. ඇත්තටම දේශපාලනිකව ප්‍රතිවාදී කඳවුරක් හැටියට මීට වඩා දියුණු වැඩසටහනක් හෝ මීට වඩා දියුණු ආර්ථික ක්‍රමවේදයක් ජනතාව එක්ක සාධාරණව සාකච්ඡා කරන්න ඔවුන්ට හැකියාව තිබෙනවා. ඒකට බාධාවක් නැහැ. හැබැයි ඇත්තටම ගත්තොත්, මේ වෙනකොට අවිද්‍යාවට ගිහිල්ලා, ජනතාව මුළා කරමින්, භේදභින්න කරමින්, ආගම්වාදය හා ජාතිවාදය වපුරමින්, ආර්ථික ක්‍රියාවලියක් වෙනුවෙන් කිසිදු වෑයමක් නොකර, ඒ වාගේම ආර්ථිකව රට නංවා ගැනීම සඳහා වූ කිසිදු වැඩ පිළිවෙළක් නැතුව ඔහේ ඉබාගාතේ ඇවිදින විපක්ෂයක් බවට මේ විපක්ෂය පත්වෙලා තිබෙනවා. අද විපක්ෂයේ නියම කාර්යභාරය අහෝසි වෙලා තිබෙනවාය කියන කාරණය මම මේ වෙලාවේ කියනවා.

ඒ වාගේම අපි මේ රටේ අපනයන ප්‍රවර්ධනය සඳහා 2026 සිට 2030 දක්වා ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් හදලා තිබෙනවා. කර්මාන්ත අංශය සමඟ සම්බන්ධීකරණය සඳහා වැඩසටහන් හදලා තිබෙනවා. අපනයනකරුවන්ගේ සංසද හදලා තිබෙනවා. ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා ලංකාව හැටියට අපි සහභාගි වෙනවා; ඉදිරියටත් සහභාගි වීමට තිබෙනවා. අපනයනකරුවන්ගේ නියෝජිත කණ්ඩායම් සමඟ සාකච්ඡා කරනවා, ඉන්දියාව, චීනය හා මැද පෙරදිග රටවල. ඒ වාගේම ගැනුම්කරුවන් ලංකාවට කැඳවාගෙන සාකච්ඡා කරලා, ගැනුම්කරුවන් වෙනුවෙන්, ඒ වාගේම ව්‍යවසායකයන් වෙනුවෙන් අවස්ථා ප්‍රවර්ධනය කරලා තිබෙනවා. රාජ්‍ය තාන්ත්‍රික දායකත්වය අපි ඉහළම මට්ටමෙන් ලබාගෙන තිබෙනවා. අපේ විදේශ කටයුතු ඇමතිතුමා, විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා සහ අනෙකුත් අමාත්‍යවරු, අපේ අග්‍රාමාත්‍යතුමිය, ජනාධිපතිතුමා යන හැම කෙනෙකුම මේ රටේ සංවර්ධනය වෙනුවෙන් දක්වන්න පුළුවන් උපරිම මට්ටමෙන් රාජ්‍ය තාන්ත්‍රික මැදිහත් වීම දක්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු ඇමතිතුමියනි.

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මට තව පොඩි වේලාවක් දෙන්න.

ඒ වාගේම තමයි වෙළෙඳ පොළ ප්‍රවේශය, ප්‍රමිති අනුකූලතාව සහ කලාපීය ප්‍රවේශය. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ කාන්තා නායකත්වයෙන් යුත් අපනයනකරුවන් ඇති කිරීමේ වැඩ පිළිවෙළ දක්වාම අපේ අපනයන සංවර්ධනය සඳහා වන දීර්ඝ වැඩසටහන අරගෙන ගිහින් තිබෙනවා කියන එක.

අවසාන වශයෙන්, මම ඉතාම ආදරයෙන් කාරණයක් කියන්න කැමැතියි. අපි ඉලක්ක කළ සංවර්ධනයට යාම ප්‍රමාද වෙන්න පුළුවන්. ඒ ගැන අපි කනගාටු වෙනවා. ඇත්තටම එයට හේතුව ස්වාභාවික ආපදා. "දිට්වා" ආපදාව නිසා ලංකාවේ විශාල මුදලක් වැය වුණා නැවත ඒ පළාත් නැඟිටවන්න. කඩාගෙන ගිය පාරවල්, අහිමි වෙච්ච දුම්රිය මාර්ග, මහා මාර්ග කඩාගෙන වැටිච්ච ඒවා ප්‍රතිසංස්කරණය කරන්න, ජීවිත සඳහා වන්දි ලබාදීම්, නැවත ගෙවල්වල පදිංචි කිරීම වාගේ බොහෝ කටයුතු සඳහා මුදල් වැය වුණා. ඇත්තටම, නැවත රට ගොඩ නැංවීමේ ක්‍රියාවලිය එක්ක තමයි මේ ආර්ථික සංවර්ධනය ගෙන යන්න වෙලා තිබෙන්නේ.

ලෝකයේ පවතින අභියෝග හමුවේ වුණත් රැක බලා ගත යුතු සෑම පුරවැසියෙක්ම අත නොහැර රැක ගනිමින්, ආර්ථික ඉලක්කත් සම්පූර්ණ කරමින් මේ ආණ්ඩුව ඉදිරි ගමන් මාර්ගයේ යනවා කියන පොරොන්දුව ලබා දෙමින් මම නිහඬ වෙනවා.

අවස්ථාව ලබා දුන්නාට බොහොමත්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.39]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் ஏற்றுமதிப் பொருளாதாரத்தை ஊக்குவித்தல் என்ற அடிப்படையில் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தப் பிரேரணை நாட்டுக்குத் தேவையானது; வரவேற்கத்தக்கது. முதலீட்டாளர்களை ஊக்குவிப்பதன் மூலமாகவும் உற்பத்திகளை அதிகரிப்பதன் மூலமாகவும் ஏற்றுமதிப் பொருளாதாரத்தை அதிகரிப்பதற்கு வாய்ப்பு இருக்கின்றது. அந்த அடிப்படையில் பார்க்கின்றபொழுது, புலம் பெயர்ந்திருக்கின்ற diasporas போதியளவு நிதியோடு இருக்கின்றார்கள். அவர்களை வரவழைத்து, இந்த நாட்டில் உற்பத்தியை அதிகரிப்பதற்கான உபாயங்களை நாங்கள் ஏற்படுத்திக்கொள்ள வேண்டும்.

மேலும், தொழிற்சாலைகளை அமைக்க வேண்டிய தேவை இருக்கின்றது. கடந்த காலத்தில் 200 ஆடைத் தொழிற்சாலைகள் அமைக்கப்பட்டு இருந்தன. இப்பொழுது எத்தனை தொழிற்சாலைகள் இருக்கின்றன என்று தெரியவில்லை. கைத்தொழில் பொருளாதாரம் முன்னேற வேண்டுமாக இருந்தால், நிச்சயமாக ஆடைத்தொழிற்சாலைகள் அமைக்கப்பட வேண்டும். ஊழல், மோசடி இல்லாத பொருளாதார நடவடிக்கைகள் எடுக்கப்படல் வேண்டும். அதேவேளை, தேசிய ஒற்றுமை என்பது இன, மத, மொழி பேதம் இல்லாமல் எல்லோரும் ஐக்கியமாகவேண்டிய தேவை இருக்கின்றது. தேசிய இனப்பிரச்சினையைத் தீர்த்து முறையான அதிகாரப் பகிர்வை ஏற்படுத்துவதன்மூலமாக, புலம்பெயர்ந்து இருக்கின்ற diasporas மத்தியில் நம்பிக்கையை ஏற்படுத்த வேண்டும். இதன் மூலமாகவும், கிராமியப் பொருளாதாரத்தைக் கட்டி எழுப்புவதன் மூலமாகவும் நாடு வளம் பெற முடியும்.

சிங்கப்பூரில் சீனர்கள், மலாயர்கள், தமிழர்கள் என மூன்று இன மக்கள் வாழ்கிறார்கள். சிங்கப்பூரின் முதலாவது பிரதமரான லீ குவான் யூ அவர்கள், இந்த மூன்று இனத்தவர் களையும் சிங்கப்பூர் பிரஜைகளாகக் கருதி சம உரிமை, சமத்துவம் கொடுத்துத்தான் அந்த நாட்டை வளர்த்தெடுத்தார். அங்கு தர்மன் சண்முகரத்தினம் என்ற தமிழரும்கூட சனாதிபதியாக இருந்திருக்கின்றார். தனபாலன், இராஜரட்ணம் போன்றவர்களும் உயரிய பதவிகளை வகித்துள்ளார்கள். அந்தளவுக்கு திறமைக்கு முன்னிடம் கொடுக்கின்றபடியால் சிங்கப்பூர் வளர்ந்தது. இங்கு இனவாதம், மதவாதம் என்கின்ற அடிப்படைவாதங்கள் காணப்படுகின்றபடியால், தேசிய ஒற்றுமை குழம்பி இருக்கின்றபடியால் இந்த நாடு வங்குரோத்து நிலையை அடைந்திருக்கின்றது என்பதை நான் சொல்லிக்கொள்கின்றேன்.

அடுத்ததாக, எமது மாவட்டத்தில் காணப்படுகின்ற மயிலத்தமடு - மாதவனைப் பிரச்சினை பற்றி குறிப்பிட வேண்டும். இந்தப் பாராளுமன்றத்தில் அது பற்றி பல தடவை பேசியிருக்கின்றோம்; மாண்புமிகு சனாதிபதியிடமும் முறையிட்டிருக்கின்றோம். அமைச்சர்களான சுனில் ஹந்துன்னெத்தி, பிமல் ரத்நாயக்க போன்றவர்களிடமும் நாங்கள் இந்த விடயங்களைச் சொல்லியிருக்கின்றோம். இது இனவாதப் பிரச்சினை அல்ல, வாழ்வாதாரத்தோடு சம்பந்தப்பட்ட பிரச்சினை! அதாவது, தற்சார்புப் பொருளாதாரத்தின் அடிப்படையில், 500,000க்கும் அதிகமான கால்நடைகளோடு சம்பந்தப்பட்ட பிரச்சினை; 4,000க்கும் மேற்பட்ட பண்ணையாளர்களோடு சம்பந்தப்பட்ட பிரச்சினை! ஆகவே, இந்தப் பிரச்சினையைப் பற்றி கூறுகின்றபோது, இனவாதம், மதவாதம் என்று இதற்குச் சாயம் பூச முற்படுவது ஒரு பிழையான அணுகுமுறையாகும். எங்களுடைய அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் பேசியபோது, அந்த விடயத்தை இனவாத ரீதியாகக் குறிப்பிட்டதுபோன்று தெரிந்தது. உண்மையில், இது வாழ்வாதார மற்றும் தற்சார்புப் பொருளாதாரத்தோடு சம்பந்தப்பட்ட பிரச்சினையாகும். அதாவது, நீண்டகாலமாக அரசிடம் கையேந்தி நிற்காமல், துணிந்து நின்று தமது குடும்பங்களை, வாழ்வாதாரத்தை உயர்த்துகின்ற மக்களுடைய பிரச்சினையாகும்.

இந்த இடத்தில் கடந்த காலத்தில் நடைபெற்ற ஒரு சம்பவத்தைச் சொல்ல வேண்டும். இது பற்றி நாங்கள் கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களிடமும் சொன்னோம். பொலன்னறுவை மற்றும் அம்பாறை மாவட்டத்தில் இருந்து அங்கு வந்து சட்டவிரோதமாகக் குடியேறியவர்கள், சிறிதளவு பயிர்ச்செய்கையில் ஈடுபட்டுக் கொண்டு, அங்கிருக்கின்ற கால்நடைகளுக்கு அச்சுறுத்தலாக இருக்கின்றார்கள்; அங்கிருக்கின்ற கால்நடைகளைச் சுடுகின்றார்கள். உண்மையில், அவர்கள் சட்டவிரோதமாகக் குடியேறி இருக்கின்றார்கள்; சட்டவிரோதமாகத் துப்பாக்கிகளை வைத்திருக்கின்றார்கள்; சட்டவிரோதமாகப் பயிர் செய்கின்றார்கள். இது தொடர்பான பிரச்சினைக்கு நீதிமன்றத்தை நாடியபோது, சட்டவிரோதமாகக் குடியேறியவர் களை வெளியேறுமாறு அங்குள்ள நீதிமன்றம் தீர்ப்பளித்திருக் கின்றது; கொழும்பு நீதிமன்றமும் தீர்ப்பளித்திருக்கின்றது. அப்படியான ஒரு நிலையில், சட்டவிரோதமாகக் குடியேறியவர் களுக்குச் சார்பான முறையில் மகாவலி அதிகாரசபை செயற்பட்டுக்கொண்டு இருக்கின்றது. அந்த வகையில், சட்டவிரோதமான செயலில் ஈடுபடுகின்றவர்களுக்குச் சார்பான செயற்பாடுகள் நடைபெறுகின்றன.

நாங்கள் இது பற்றி பல தடவை இந்தப் பாராளுமன்றத்தில் பேசியிருக்கின்றோம். கௌரவ அமைச்சர்களிடம் முறையிட்டு இருக்கின்றோம். மாண்புமிகு சனாதிபதியிடமும் சொல்லி இருக்கின்றோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் 3,000க்கும் மேற்பட்ட ஏக்கர் காணிகளை விடுவித்து, மேய்ச்சல் தரையை அமைத்துத் தருவதாகக் குறிப்பிட்டிருந்தார். ஆனால், அது நடைமுறைக்கு வரவில்லை. இப்படியெல்லாம் நாங்கள் இந்தப் பிரச்சினை பற்றி பல தடவை பேசியும் ஏமாற்றப்பட்டோம். பொது மக்கள், சிவில் சமூகத்தினர், மனித உரிமைச் செயற்பாட்டாளர்கள் மற்றும் மதத் தலைவர்கள் என எல்லோரும் சேர்ந்து மட்டக்களப்பில் நேற்றைய தினம் ஒரு கவனயீர்ப்புப் போராட்டத்தை, அதுவும் வன்முறை மற்றும் இம்சை இல்லாமல் அஹிம்சை ரீதியான ஒரு போராட்டத்தை நடாத்தினார்கள். மிகவும் சாத்வீகமான முறையில், எந்தவிதமான வன்முறையும் இல்லாமல்தான் அந்தப் போராட்டம் நடைபெற்றது.

மட்டக்களப்பு மாவட்ட அரசாங்க அதிபர் அருள்ராஜ் அவர்கள் அலுவலகத்துக்கு வெளியே வராவிட்டாலும், மாவட்டச் செயலகத்தின் உட்பக்கமாக நின்று தங்களுடைய மகஜரைப் பெற்றுக்கொண்டு, தங்களுக்கு ஒரு கருத்தைச் சொல்லவேண்டும் என போராட்டத்தில் ஈடுபட்ட மக்கள் கேட்டுக் கொண்டார்கள். ஆனால், அவர் பிடிவாதமாக அதை மறுத்திருந்தார். அதாவது, "நான் வெளியே வரமாட்டேன்; படம் காட்ட விரும்பவில்லை" என்று அவர் குறிப்பிட்டிருந்தார். மாடுகள் சுடப்படுகின்றன; கத்திகளால் வெட்டப்படுகின்றன; பண்ணையாளர் சோமலிங்கம் கடத்தப்பட்டார்; பெண் ஒருவர் தாக்கப்பட்டிருக்கின்றார் என்று கூறி, இப்படியெல்லாம் நடப்பதைப் படம் என்று கூறுவது, மிகவும் கேளிக்கையான அல்லது அலட்சியப்படுத்துகின்ற ஒரு செயற்பாடு என்பதை நான் அவரிடம் சுட்டிக் காட்டினேன். கடைசிவரையும் அருள்ராஜ் என்று சொல்லப்படுகின்ற அரசாங்க அதிபர் அந்த மகஜரைப் பெறவில்லை. அவர் அதைப் பெற்றிருந்தால் ஒரு பிரச்சினையும் ஏற்பட்டிருக்காது. அங்கு கூடிய மக்கள் கலைந்திருப்பார்கள். அவர் நீண்ட நேரம் எங்களை அந்த இடத்தில் காத்திருக்க வைத்தது மட்டுமல்லாமல், பாராளுமன்ற உறுப்பினர்களைக்கூட சந்திப்பதற்கு அவர் சித்தமாக இருக்கவில்லை.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
ඔරු නිමිටම් තාරුංකළ්!

මාවට්ට අරසාංක අතිපර් අල්ලතු මාවට්ටච් චෙයලාළර් එන්බවර් මක්කළුක්කාකප් පණියාට්ර වරුකින්රවර්. කටන්ත කාලත්තිලුම් මක්කළුක්කාකප් පණියාට්ර වන්ත පල්වේරුපට්ට අරසාංක අතිපර්කළ් ඉරුන්තිරුක්කින්රාර්කළ්. ආනාල්, අවර්කළ් මක්කළින් කෝරික්කෛකළුක්කුච් චෙවිමටුත්තු, මක්කළ් වළංකුකින්ර මකජර්කළෛප් පෙට්රිරුක්කින්රාර්කළ්; පිරච්චිනෛකළෛ උරියවර්කළුක්කු අරිවිප්පතාකච් චොල්ලි ඉරුක්කින්රාර්කළ්. ආනාල්, "විටාක්කණ්ටන් කොටාක්කණ්ටන්" එන්පතුපෝන්රු, අවර් මකජරෛප් පෙර අංකු වරවිල්ලෛ. අන්තප් පිරච්චිනෛයෛ ඔරු වන්මුරෛයාක මාට්රක්කූටිය විතත්තිල් අවර් චෙයර්පට්ටිරුක්කින්රාර්. එන්තවොරු විටයත්තෛයුම් කෛයාළුකින්රපොතු, අවර් තානාක, සුය චින්තනෛයින් අටිප්පටෛයිල්, සුයමාක මූළෛයෛප් පයන්පටුත්තිච් චෙයර්පටවිල්ලෛ. ඉතන්කාරණමාක අංකේ පිරච්චිනෛ වළර්න්තුකොණ්ටු වරුකින්රතු. එංකළුටෛය අපිවිරුත්තික්කුප් පොරුප්පාන අමෛච්චර් සුනිල් හන්තුන්නෙත්ති අවර්කළිටම් නාංකළ් කේට්ටුක්කොළ්වතු, ඉන්තප් පිරච්චිනෛයෛත් තීර්ක්කවේණ්ටුම් එන්රුතාන්. එංකළුක්කු ඉටෛයේයුළ්ළ ඉටෛවෙළියෛ නීංකළ් අතිකරිත්තුක්කොණ්ටු චෙල්ලුකින්රීර්කළ්! නාංකළ් නල්ලවර්රෛප් පාරාට්ටුකින්රෝම්; තවරානවර්රෛච් චුට්ටික් කාට්ටුකින්රෝම්. ඉන්තප් පිරච්චිනෛ මිකවුම් පූතාකරමාක වළර්න්තුකොණ්ටු චෙල්කින්රතු. ඉතර්කුප් පින්නාල් අටිප්පටෛවාතිකළ් නිර්කින්රාර්කළ්.

පාරාළුමන්ර උරුප්පිනරාක ඉරුක්කින්රවර් tractorකූට වාංකික් කොටුත්තිරුක්කින්රාර් එන්රු චොල්ලප්පටුකින්රතු. අංකු පිරච්චිනෛ වරුකින්රතු. චිලවේලෛකළිල් අංකිරුක්කින්ර පණ්ණෛයාළර්කළ් කොල්ලප්පටුවතර්කුම් කූට වාය්ප්පිරුක්කින්රතු. ඒර්කෙනවේ 6 පේරෛ මරත්තිල් කට්ටිවෛත්තු අටිත්තාර්කළ්. ඉන්ත විටයංකළෛ නාංකළ් පල තටවෛ පාරාළුමන්රත්තින් කවනත්තිර්කුම් තන්තිරුක්කින්රෝම්. මාණ්පුමිකු චනාතිපති මර්රුම් කෙළරව අමෛච්චර්කළිටම් චොල්ලියිරුක්කින්රෝම්. ආකවේ, තයවුචෙය්තු මනිතාපිමාන අටිප්පටෛයිල්, සුය කෙළරවත්තෝටු, සුය චාර්පුප් පොරුළාතාරත්තින් අටිප්පටෛයිල් චෙයර්පටුකින්ර අන්තප් පණ්ණෛයාළර්කළ් වාළ්වතර්කු වළි විටුංකළ්! ඉල්ලෛයෙන්රාල්, මරුවළියාක අන්ත මක්කළ් විරුම්පුකින්ර ජනනායක රීතියාන ඉන්ත චාත්වීකප් පෝරාට්ටම් මෙන්මේලුම් තොටර්වතර්කුත්තාන් වාය්ප්පු ඉරුක්කින්රතු එන්පතෛක් කූර්ක්කොණ්ටු, ඉතර්කුරිය තීර්වෛ එංකළුක්කුත් තර වේණ්ටුම් එන්පතෛයුම් කේට්ටුක්කොණ්ටු, එනතු උරෛයෛ නිර්වුචෙය්කින්රේන්. නන්රි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගමනය පිළිබඳව ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා ගෙන එන ලද අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදයට එකතු වෙන්න අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපට ලැබුණේ රෝස මල් බන්දේසියක් මත තබපු රටක් නම් නොවෙයි. පණ අදිමින් තිබුණු රටක් හුස්ම ගන්න පුළුවන් තරමින් ආර්ථික ස්ථාවරත්වයකට ගේන්න ආණ්ඩුවක් විධියට අපට හැකියාව ලැබුණා. අපේ අපනයන ආදායම අන් කවරදාටත් වඩා වර්ධනයක් අත්පත් කරගෙන තිබෙන යුගයක ඉදිමින් තමයි අප මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අපි ජනතාවට වැල් පාලම්වල යන්න කිව්වේ නැහැ, අපි ජනතාවට පටි තද කර ගන්න කිව්වේත් නැහැ. ඉතාම හොඳ මූල්‍ය කළමනාකරණයක් සහිත ක්‍රමවේදයකට අනුව තමයි අපි මේ ආර්ථිකය ස්ථාවරත්වයකට ගෙනැල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අද ගත කරන්නේ ලෝක ආර්ථිකයේ විශාලතම අභියෝගයන්ට සහ වෙනස්වීම්වලට මුහුණ දීමට සිදු වෙලා තිබෙන කාලයක. මැද පෙරදිග කලාපයේ යුද්ධය තත්ත්වය, භූ-දේශපාලනමය ගැටුම්, ජාත්‍යන්තර වෙළෙඳ පොළේ අවිනිශ්චිතතා, නාවික ප්‍රවාහන පිරිවැය ඉහළ යෑම නිසා අපගේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම වැනි අභියෝගකාරී අවස්ථාවක සිට වුවද, ඒ අභියෝගවලට ඉතාම සාර්ථකව මුහුණ දීපු රටක් විධියට අපට අභිමානයක් තිබෙනවා, අපේ අපනයන ක්ෂේත්‍රය සම්බන්ධව.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දත්තවලට අනුව, මේ වසරේ ජනවාරිවල ඉඳලා සැප්තැම්බර් මාසය දක්වා වන මාස 9ක කාලය ඇතුළත අපි භාණ්ඩ හා සේවා අපනයන ආදායම ලෙස ඩොලර් බිලියන 13.66ක වර්ධනයක් අත්පත් කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඇත්තටම මේක රටක් විධියට අප ලැබූ ජයග්‍රහණයක් බව මම මේ වෙලාවේ කියන්න කැමැතියි. අපි එම ජයග්‍රහණය කෙටි කාලයක් තුළ ලැබුවා වුවත්, පසුගිය වසරවලට සාපේක්ෂව සියයට 5.41ක වර්ධනයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. භාණ්ඩ අපනයනයෙන් ඩොලර් බිලියන 10.76ක වර්ධනයකුත්, සේවා අපනයනයෙන් ඩොලර් බිලියන 2.85ක වර්ධනයකුත් අපි අත්පත් කරගන්න සමත් වෙලා තිබෙනවා. විශේෂයෙන් 2026 සැප්තැම්බර් මාසයේ අපනයන ආදායම ඩොලර් බිලියන 1.69 දක්වා ඉහළ ගොස් තිබෙනවා. ඒක මාසයක් තුළ වාර්තාගත වුණු ඉහළම අපනයන ආදායම ලෙස දක්වන්න පුළුවන්. එම වර්ධනය තිරසාර වර්ධනයක් බවට පත් කර ගැනීමට අපි කටයුතු කර තිබෙනවා සහ ඒ සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කර අවසන්. අපනයන ආදායම වර්ධනය කර ගැනීමත් අපේ ජාතික සැලැස්මේ එක් කොටසක්.

අපි ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සකස් කර අවසන්. එහි ප්‍රධානම ඉලක්කය වුණේ 2030 වන විට අපනයන ආදායම ඩොලර් බිලියන 36ක් දක්වා වර්ධනය කර ගැනීමයි. අපි බලයට එන්න ඉස්සරවෙලා පැවැති ආණ්ඩුවල අපනයන ආදායම් වාර්තාගත වුණේ ඩොලර් බිලියන 14, 15 වැනි පරාසයකයි. අපි වසර 5ක් ඇතුළත තෝරාගත් ක්ෂේත්‍ර 8ක් යටතේ ඩොලර් බිලියන 36 දක්වා අපනයන ආදායමේ වර්ධනයක් අත්පත් කරගන්න සැලසුම් සකස් කර තිබෙනවා. ඇත්තටම පෙර නිටපු පාලකයන්ට මේ ගැන කිසිදු වුවමනාවක් හෝ අදහසක්වත් තිබිලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසාම, 1992න් පසු අපනයන සංවර්ධන අමාත්‍ය සභාව ඔවුන් කැඳවා තිබුණේවත් නැහැ. වසර 28කට පසුව තමයි ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපනයන සංවර්ධන අමාත්‍ය සභාව කැඳවා අපනයන ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු සම්බන්ධව සාකච්ඡා කරලා ඒවාට විසඳුම් සොයාගනු ලැබුවේ. ලංකාවේ භූගෝලීය පිහිටීම, සම්පත් ප්‍රමාණය සහ

වෙළෙඳ පොළ ඉල්ලුම සැලකිල්ලට ගෙන තමයි අපි මේ ක්ෂේත්‍රයේ ඉදිරි ගමන් මාර්ගය පිළිබඳව සැලසුම් සකස් කර තිබෙන්නේ.

අපි තවදුරටත් අමුද්‍රව්‍ය අපනයනය කිරීම මත යැපිය යුතු රාජ්‍යයක් නොව, අපේ ආර්ථිකය අගය දාම නිෂ්පාදන බවට සකස් කරගෙන ඉදිරියට යා යුතු රටක්. අපි ගොඩනඟන්න ඕනෑ ලෝකය ඉදිරියේ ගුණාත්මකභාවයෙන් තරග කළ හැකි, නවෝත්පාදනයෙන් ඉදිරියට යන ශක්තිමත් ආර්ථිකයක් සහිත රටක්. අපේ ඊළඟ පරම්පරාවට ආදර්ශයක් දිය හැකි රටක් විධියට අපි මේ රට ගොඩනැඟිය යුතුයි. තරුණයන්ට අපි කියන්නේ, නවෝත්පාදනවලට යොමුවන්න, තාක්ෂණය ඉගෙන ගන්න, ව්‍යවසායකත්වය ඉගෙන ගන්න, රටට විදේශ විනිමය උපයන්න ඔබ මාර්ග සොයා ගන්න කියලායි. නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවාසනාවකට වාගේ පෙර පැවැති දේශපාලන පවුල්වල උපදේශය වුණේ පගා ගහන්න, හොරකම් කරන්න, මිනී මරන්න, කොමිස් ගන්න, ඉඩම් මංකොල්ල කන්න වාගේ කාරණයි. ඉතින්, එදා ඒ දේශපාලනය ආදර්ශයට ගත් පුත්තු හිරේ ඉඳිද්දි ඒගොල්ලන්ගේ දෙමාපියන් ඔවුන්ට ලියුම් යවනවා; ඒවා මාධ්‍යවලට දමනවා. ඔවුන් වපුරපු දේවල් තමයි අස්වැන්න විධියට ලබාගන්න වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වී වපුරලා මුං අස්වැන්නක් ලබාගන්න බැහැ නේ. තවමත් කාලය තිබෙනවා ඒ අයට නිවැරදි වෙන්න. මිථ්‍යාවෙන් මුළා වෙලා, හූනියම් කරලා, කටු ගහලා, තැන් තැන්වල හතු පිපෙනවා වාගේ බෝඩ් උස්සාගෙන ඉඳලා ආණ්ඩුව වටිටන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මොකද, අපි ආර්ථික වශයෙන් මෙන්ම සමාජයීය, සංස්කෘතික සහ දේශපාලන වශයෙන් දැවැන්ත පරිවර්තනයක් කරපු සහ ස්ථාවරත්වයට පත් වෙච්ච ආණ්ඩුවක් බව මේ පුංචි විපක්ෂය තරයේ මතක තබාගත යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැද පෙරදිග යුද තත්ත්වය හේතුවෙන් ගල්ෆ් කලාපය හරහා වන මුහුදු හා ගුවන් මාර්ගවල ගමන් අඩාළ වෙලා, ඒවායේ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු මෙන්ම, යුද අවදානම සහ රක්ෂණ වාරිකය ඉතාම ඉහළ යාම නිසා නැව්ගත කිරීම ප්‍රමාද වෙලා ලංකාවට ඉන්ධන හා අමුද්‍රව්‍ය ලැබීම සීමා කිරීමේ තත්ත්වයක් උද්ගත වුණා. ඒ හේතුවෙන් 2026 මාර්තු මාසයේ අපනයනය සියයට 5.2කින් පහත වැටුණු අතර, මැද පෙරදිග අපනයනය සියයට 48කින් විතර පහත වැටුණා. මෙම තත්ත්වය හමුවේ අපේ අපනයන සංවර්ධන මණ්ඩලය අධෛර්යයට පත් නොවී අපනයන ක්ෂේත්‍රයේ අඛණ්ඩ වර්ධනය වෙනුවෙන් මැදිහත්වීමක් කර තිබෙනවා. අපනයනකරුවන්ගේ සංගම් හා භාණ්ඩ ප්‍රවාහන නියෝජිතයන් සමඟ පැවැත් වුණු කඩිනම් සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට විකල්ප මාර්ග ඔස්සේ නැව්ගත කිරීම් අඛණ්ඩව සිදු කිරීමටත්, සමස්ත අපනයන යථා තත්ත්වයට පත් කර ගන්නත් අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම QR කේතය යටතේ ඉන්ධන ලබා ගැනීමේදී අපනයනකරුවන්ට මුහුණු දීමට සිදු වුණු ගැටලුවලට විසඳුමක් ලබා දෙමින් අපනයනකරුවන් 4,500කට අධික ප්‍රමාණයකට පහසුවෙන් එම ඉන්ධන ප්‍රමාණය තමන්ගේ අපනයන නිෂ්පාදන සකස් කිරීම සඳහා ලබා දීමටත් ආණ්ඩුවක් විධියට අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මැද පෙරදිග වෙළෙඳ පොළ ඉල්ලුම අහිමි වීමේ ගැටලුව නිරාකරණය කිරීමට අපි වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම, ගැනුම්කරුවන් සමඟ අපනයනකරුවන් සම්බන්ධ කිරීම, විකල්ප වෙළෙඳ පොළ පිළිබඳ තොරතුරු මත වෙළෙඳ පොළ වර්ගීකරණය කිරීම යනාදි කටයුතු සකස් කරලා තිබෙනවා.

ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය වැනි අපේ ප්‍රධාන අපනයන වෙළෙඳ පොළ තුළ ඇඟලුම්, තේ වැනි අපේ සාම්ප්‍රදායික නිෂ්පාදන සඳහා ඉල්ලුම ක්‍රමිකව අඩු වී තිබුණා. විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් ඒ ගැන සාකච්ඡා කළා. එයට විසඳුමක් විධියට අගය දාම එකතු කිරීම හරහා අපේ නිෂ්පාදන වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම තුළින් අපනයන ආදායම වර්ධනය කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. අපි අපනයන ආදායම වර්ධනය කර ගැනීම සඳහා සෑම ක්ෂේත්‍රයකින්ම ගත යුතු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපි වසර පහ ඇතුළත අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 36ක් දක්වා වර්ධනය කර ගැනීමේ ඉලක්කයක් තබාගෙන ඒ ඉලක්කය ඔස්සේ ගමන් කරමින් ඉන්නවා. අද වෙනකොට අපි ඒ ඉලක්කය සාර්ථකව සපුරාගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අපේ ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු සභාවට මෙවැනි සාධනීය යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 3.57]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය අද කථා කළේ විවාද කරන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළ කරුණුවලට වඩා, වෙනත් දේවල්. එහිදී අපේ ගරු

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

කථානායකතුමාට එරෙහිව සහ පොදුවේ ආණ්ඩු පක්ෂයට එරෙහිව එල්ල වුණු චෝදනා ප්‍රමාණයක් තිබෙනවා. ඒවාට උත්තර දෙන්න ඕනෑ කියලා මම හිතනවා. මොකද, ඒ දේවල් මාධ්‍ය තුළින් වාර්තා වෙනවා. ඊට පස්සේ ඒවා සමාජගත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි පළමුවැනි කාරණය මෙයයි. අද උදේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂය හැසිරුණු ආකාරය ඉතාම ඛේදනීයයි. ආණ්ඩු පක්ෂය හැටියටත්, මන්ත්‍රීවරියක් හැටියටත් අපි ඒ හැසිරීම හෙළා දකිනවා.

දෙවැනි කාරණය තමයි, එතුමන්ලා මතු කරන මේ කාරණය මොකක්ද කියන එක. ඒ පිළිබඳව අපි දීර්ඝ වශයෙන් කථා කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මෙහිදී විපක්ෂය මතු කරන කාරණය තමයි, එතුමන්ලා ගරු කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා, ආණ්ඩු පක්ෂය විසින් එම විශ්වාස භංග යෝජනාව පිළිබඳව විවාද කරන්නට ඉඩක් ලබා දෙන්නේ නැහැ කියන එක. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුවත් කථානායකවරයෙක් විශ්වාස භංග යෝජනාවකින් ඉවත් කිරීම කියන එක ස්ථාවර කරුණක් නොවෙයි. ඒ, පළමුවැනි එක. දෙවැනි එක තමයි, මේ පාර්ලිමේන්තුවේ සංයුතිය බැලුවත් ගරු කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නේ ජයග්‍රහණය කිරීමේ අරමුණින් නොවීම. එහෙම නම් එම විශ්වාස භංග යෝජනාවේ අරමුණ තමයි, ගරු කථානායකතුමාට එරෙහිව යම්කිසි තොරතුරු ප්‍රමාණයක් සමාජගත කිරීම; එය විවාද කිරීම හරහා මාධ්‍ය තුළින් ප්‍රචාරණයක් ලබා දීම.

පාර්ලිමේන්තුවේ කටයුතු මාධ්‍ය විසින් සජීවීව වාර්තා කරනවා; TV newsවල වාර්තා කරනවා, පත්තරවල වාර්තා කරනවා. පාර්ලිමේන්තුව විසින් මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පරම ලෙස ආරක්ෂා කර තිබෙනවා. ඒ අයිතිය පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත මඟින් ආරක්ෂා කර තිබෙනවා. හැබැයි, එය අපට අප ගැන කථා කර කර ඉන්නවත්, එහෙම නැත්නම් එකිනෙකාට මඩ ගහන්නවත් ලබා දී තිබෙන අයිතිවාසිකමක් නොවෙයි. පාර්ලිමේන්තු වරප්‍රසාද කියන්නේ, මහජනතාව වෙනුවෙන්, මහජනතාවගේ පොදු යහපත වෙනුවෙන් අවශ්‍ය කරුණු සාකච්ඡා කිරීම සඳහා ලබා දී තිබෙන වරප්‍රසාදයක්.

පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරලා අපි කරන්න ඕනෑ කාරණය ඒකයි. දැන් මේ විපක්ෂය කරන්න හදන්නේ මොකක්ද? අපි මේ කාරණය පැහැදිලි කරගන්න අවශ්‍යයි. කථානායකතුමා ඇතුළු මණ්ඩලයක් විසින් ගන්නා ලද තීරණයක් නිසා දැනට වැඩ තහනමට ලක් වෙලා ඉන්න නිලධාරියෙක් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සිදු කරන ලද පැමිණිල්ලක් තමයි මේ සියලු ම කරුණුවල මූලාශ්‍රය. එම නිලධාරියා විසින් අභියාචනාධිකරණයටත් නඩුවක් පවරා තිබෙනවා, එතුමාගේ වැඩ තහනම් කිරීම නීති විරෝධියි කියලා ප්‍රකාශ කරන ලෙසට. දැනට මේ කාරණය අභියාචනාධිකරණය ඉදිරියේ තිබෙන කාරණයක්. මොකද, එතුමාම තමන්ගේ වැඩ තහනම් කිරීමට එරෙහිව නඩුවක් පවරා තිබෙන නිසා.

අද පරම සත්‍ය වාගේ පාර්ලිමේන්තු සභා ගර්භයේ කථා කරපු සියලු කරුණුවල මූලාශ්‍රය වන්නේ පාර්ලිමේන්තුවේ වැඩ තහනම් කරන ලද නිලධාරියෙක් විසින් ඉදිරිපත් කළ කරුණුයි. මේක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තවම විමර්ශනය කරලා ඉවරත් නැහැ. අභියාචනාධිකරණය විසින් මේක සලකා බලා ඉවරත් නැහැ. එම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට පක්ෂ විපක්ෂ අපි හැමෝටම වගකීමක් තිබෙනවා, පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කරන්න, පාර්ලිමේන්තුවේ ස්වෛරීත්වය ආරක්ෂා කරන්න. ඒක සිද්ධ කරන්න නම් මන්ත්‍රීවරුන් හැටියට අපි පාර්ලිමේන්තු කටයුතුවල සීමාව තුළ කටයුතු කරන්නත්, අනෙකුත් ආයතනවල කටයුතුවලට අතපෙවීමක් නොකරන්නත් වගබලාගන්න ඕනෑ. නමුත් විපක්ෂය මේ මොකක්ද කරන්නේ?

කිසිදු ආකාරයකින් අධිකරණමය කටයුත්තක් හරහා හෝ විමර්ශන ආයතනයක් විසින් තහවුරු නොකරන ලද කරුණු පාර්ලිමේන්තු විවාදයකදී ප්‍රකාශ කරලා කථානායකතුමා අපහසුතාවට පත් කිරීම, ඒවා මාධ්‍ය තුළ ප්‍රචාරය කිරීම, සමාජගත කිරීම සහ අවලාද නැඟීම තමයි මේ විශ්වාස භංග යෝජනාවේ එකම අරමුණ. ඇයි අපි එහෙම කියන්නේ? අපි බොහොම පැහැදිලිව මේ කාරණය කියලා තිබෙනවා. අපේ සරෝජා පෝල්රාජ් ඇමතිතුමිය Parliamentary Business Committee එකේ සාමාජිකාවක් හැටියට මේ කාරණය ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළා. මීට ඉස්සෙල්ලාත් අපි මේ ගැන කථා කරලා තිබෙනවා. කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන එකට රජය විරුද්ධ නැහැ. ඇයි අපි කියන්නේ මේක ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් ගෙනෙන විශ්වාස භංග යෝජනාවක් කියලා?

ස්ථාවර නියෝග 91(ඊ)හි මෙසේ දක්වා තිබෙනවා:

> "කිසිම මන්ත්‍රීවරයකු විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කරනු නොලැබිය යුත්තේ ය. ..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ විනිශ්චයට ඉදිරිපත් කර තිබෙන කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ ආකාරයෙන් සභා ගර්භයේ කථා කරන එක එච්චර සුදුසු නැහැ. මාස කිහිපයකට ඉස්සෙල්ලා අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් මේ සභාවේදී පස් කන්න ගියා. හැබැයි, අධිකරණයට තමන්ගේ කාර්යභාරය ඉටු කරන්න ඉඩ දෙන්නේ නැහැ. විමර්ශන ආයතනවලට තමන්ගේ කාර්යභාරය ස්වාධීනව ඉටු කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ කටයුතුවලට දේශපාලන බලපෑම් කරන්න පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න උත්සාහ කරනවා. ඒක තමයි මේ සිද්ධ කරන්නේ. අධිකරණයේ දැනට සලකා බලමින් තිබෙන කාරණයක්, අධිකරණය ඉදිරියට ඉදිරිපත් වෙලා තිබෙන කාරණයක් සම්බන්ධයෙන් අධිකරණය විසින් තීන්දුවක් ලබා දෙන්න අවශ්‍යයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් කරලා තිබෙනවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපට ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න බැහැ. ඒකේ අවසාන නිගමනය අපට ගන්න බැහැ. ඒ සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරලා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. එහෙම කටයුතු කරන එකට රජය හැටියට අපි කිසිදු බලපෑමක් කරන්නේ නැහැ. නමුත් මෙතැනට ඇවිල්ලා ජෝගි නටලා, විකාර කරලා ඒ නිලධාරින්ට සහ අධිකරණ විනිසුරුවරුන්ට අනවශ්‍ය බලපෑම් කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒක තමයි මෙහිදී තහවුරු කරගන්න ඕනෑ පළමුවැනි කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන එකට අපි එකඟයි. හැබැයි අධිකරණය ඉදිරියේ සාකච්ඡාවට ලක් වන, අධිකරණයට ඉදිරිපත් කර තිබෙන කරුණු ඒ විශ්වාස භංග යෝජනාවෙන් ඉවත් කරන්න කියන කාරණය විතරයි ආණ්ඩු පක්ෂය හැටියට අපි විපක්ෂයෙන්

ඉල්ලා සිටින්නේ. නමුත් ඒ කරුණු ඉවත් කරන්න ඔවුන්ගේ එකඟතාවක් නැහැ. ඒ කරුණු ඉවත් කරන්නේ නැතුව නැවත නැවතත් මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න උත්සාහ කරනවා. මේ ඇයි? මේ විවාදයේදී අද කරපු විකාරය බලන්න. ඊට පස්සේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් විවාදය කරන්න බැරි වුණත් තමන්ගේ කාලය තුළ ඒකට අදාළ කරුණු, මඩ, අවලාද, තහවුරු නොකරන ලද - unsubstantiated - කරුණු මෙතැන ඔහේ කියලා දැම්මා. ඒක තමයි මේ කරන්නේ. මේ විධියට පාර්ලිමේන්තුව පාවිච්චි කරන පළමුවැනි වතාව මෙය නොවෙයි. අපේ රටේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමියකට එරෙහිවත් මීට පෙර මේ කාරණය සිද්ධ කළා. අපේ රටේ හිටපු පොලිස්පතිවරුන්ට එරෙහිවත් මේ කාරණය සිද්ධ කළා. දිගින් දිගටම මේ පාර්ලිමේන්තුව තුළ මෙවැනි අවලාද නැඟීම්, මඩ ගැසීම් සිදු වනවා. මේ විධියට එක එක්කෙනාට මඩ ගහන්නයි මේ මිනිස්සු පාර්ලිමේන්තුවට එන්නේ? ඒක තමයි මේ කරන්නේ. මොන තරම් ලජ්ජාවක්ද? මම හිතන්නේ රුපියල් මිලියන 10කට වඩා වැය වනවා, මේ පාර්ලිමේන්තුව දවසක් පවත්වන්න. දවසකට එවැනි වියදමක් දරලාත්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා එක එක්කෙනාට මඩ ගහමින් ඉන්නවා. මේ අය පාර්ලිමේන්තු එන්නේ මොකටද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කථා කරද්දි හිටපු කථානායකවරුන්ට එරෙහිව මීට ඉස්සෙල්ලා විශ්වාස භංග යෝජනා ගෙනාවේ කොහොමද? කථානායකතුමාට එරෙහිව පාර්ලිමේන්තුව තුළ එතුමාගේ ක්‍රියාකාරිත්වය ප්‍රශ්න කරන ආකාරයෙන් ඕනෑම විශ්වාස භංගයක් ගෙනෙන්න. ඒක ගැටලුවක් නොවෙයි. හැබැයි, අධිකරණයේ වැඩවත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කරන්න ඕනෑ වැඩවත් පාර්ලිමේන්තුවේ කරන්න අවශ්‍යතාවක් නැහැ.

මීට ඉස්සෙල්ලා අපේ රටේ පාර්ලිමේන්තුවට විශ්වාස භංග යෝජනා 5ක් කථානායකවරුන්ට එරෙහිව ගෙනැල්ලා තිබෙනවා. මොනවාද, ඒ? 1963දී ආර්.එස්. පැල්පොල මහතාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා, අකාර්යක්ෂමතාව, පාර්ලිමේන්තුව තුළ පක්ෂපාතීත්වය දැක්වීම සහ පුවත්පත් පරීක්ෂණ කොමිසමට විරෝධය පළ කරන යෝජනා පිළිබඳ ඡන්ද විමසීමට අදාළව ඇති කරගත් පොරොන්දු උල්ලංඝනය කිරීම නිසා. මේවා පාර්ලිමේන්තුවේ කටයුතුවලට අදාළ දේවල්. ඒ වාගේම එම්.ඒ. බාකීර් මාකර් මහතාට එරෙහිව 1980දී විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කලවාන මැතිවරණ කොට්ඨාස මන්ත්‍රී අබේරත්න පිලපිටිය මහතාගේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීමට අදාළව ඇති වූ මැතිවරණ පෙත්සම් තීන්දුවක් හා සබැඳි සිදුවීම් මුල් කර ගනිමින් 1980 දෙසැම්බර් 8 දින කථානායකතුමා විසින් දෙන ලද තීරණය ගැන තමයි එහි තිබෙන්නේ. එයත් පාර්ලිමේන්තුව විසින් ලබා දීපු තීරණයක්. එම නිසා එයත් කථානායකතුමාගේ කාර්යභාරයට සෘජුව සම්බන්ධයි. ඒ වාගේම එම්.එච්. මොහොමඩ් හිටපු කථානායකවරයාට එරෙහිවත් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාට එරෙහිව ලලිත් ඇතුලත්මුදලි සහ ගාමිණී දිසානායක යන මහත්වරුන්ගේ මූලිකත්වයෙන් ගෙන ආ දෝෂාභියෝග යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට කථානායකවරයා කටයුතු කිරීම නිසා ඔහුට එරෙහිව මෙම විශ්වාස භංගය ඉදිරිපත් විය. එයත් සෘජුවම පාර්ලිමේන්තුවට සම්බන්ධයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට අමතරව තවත් විනාඩියක කාලයක් ලැබෙනවා.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

බොහොම ස්තුතියි.

එම්.එච්. මොහොමඩ් කථානායකවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව ගෙනාවේ, 1992දී මහජන එක්සත් පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුල ගුණවර්ධන මහතා න්‍යාය පත්‍රයේ 4 වෙනි යෝජනාව සම්බන්ධයෙන් කරුණු දක්වමින් සිටියදී, "ප්‍රශ්නය දැන් විමසිය යුතුයි" යනුවෙන් වින්සන්ට් පෙරේරා මන්ත්‍රීතුමා විසින් සිදු කළ යෝජනාව ඡන්ද විමසීමට ලක් කිරීමට කටයුතු කිරීම සම්බන්ධවයි. නැවතත් පාර්ලිමේන්තුවට සෘජුවම අදාළ කථානායකවරයාගේ කාර්යභාරය ප්‍රශ්න කරන කරුණු බවට ඒවා පත්වනවා. මහින්ද යාපා අබේවර්ධන කථානායකවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව ගෙන ඒමට හේතු වූයේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය නැමති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට පටහැනි ආකාරයෙන් එය සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමයි. පාර්ලිමේන්තුවේ කාර්යභාරයට, කථානායකතුමාගේ කාර්යභාරයට ඒකත් අදාළයි. පාර්ලිමේන්තුවට පුළුවන්, ඒ සම්බන්ධව විවාද කරන්න, විශ්වාස භංගයක් ගෙනෙන්න. අවශ්‍ය නම් කථානායකතුමාට බලපෑම් සිද්ධ කරන්නත් පුළුවන්. ඉල්ලා අස්වෙන්නට අවශ්‍ය නම් ඒ බලපෑම කරන්නත් පුළුවන්. නමුත්, පාර්ලිමේන්තුවේ කටයුතුවලට අදාළව ඒක කරන්න ඕනෑ.

අධිකරණයේ කාර්යභාරය කරන්නවත්, විමර්ශන ආයතනවල කාර්යභාරය කරන්නවත් පාර්ලිමේන්තුවට කවුරුවත් බලය පවරා නැහැ. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ. ඒ නිසා මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කථා කරන මහත්වරුන් මහ ලොකුවට කථා කරන්නේ, පාර්ලිමේන්තුවේ හැමදාම හිටියා, හැමදාම ඉන්න නිතාගෙන ඉන්නවා වාගේයි. නමුත් අපි මතක තියාගන්න ඕනෑ, පාර්ලිමේන්තුව කියන්නේ මහජන ස්වාධිපත්‍යය සතු ආයතනයක් මිස, මේ මහත්වරුන්ට මෙතැනට ඇවිල්ලා උදේට උදේට නිවුස්වල යන විකාර නටන්න තිබෙන ආයතනයක් නොවෙයි කියන එක. අපි ඒ ගරුත්වය ආරක්ෂා කරන්නට ඕනෑ. විපක්ෂයටත් ඒ ගරුත්වය ආරක්ෂා කිරීමේ වගකීම තිබෙනවා. විපක්ෂ නායකතුමා තමන්ගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් මෙහෙයවා ගන්න ඕනෑ. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෙහෙයවා ගන්න ඕනෑ. එහෙම නැතිව පාර්ලිමේන්තුව මේ ආකාරයෙන් දිගටම කටයුතු කරන්න ගියොත් ඒ තුළින් අපි ඉතාම වැරදි ආදර්ශයක් රටට සැපයීමක් වනවා. ඒක ලංකාවේ කීර්තිනාමයටත් හොඳ නැහැ, පාර්ලිමේන්තුවේ කීර්තිනාමයටත් හොඳ නැහැ. මම හිතන්නේ නිවැරදිව විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළෝතින් එම විවාදය පැවැත්වීමේ ඉඩකඩ මේ සතිය තුළත් පවතිනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.09]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපනයන ආදායම සම්බන්ධයෙන් ගෙනැත් තිබෙන සභාව කල් තැබීමේ යෝජනාවට

[ගරු නීතිඥ විත්‍රාල් ප්‍රනාන්දු මහතා]

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. මම හිතන්නේ සැප්තැම්බර් මාසයේ අපනයන ආදායම සම්බන්ධයෙන් එතුමන්ලා ලොකු තක්සේරුවක ඉන්නවා. ඒක හරි. ඒක අසත්‍යයක් නොවෙයි. අපි දැක්කා, ඒ ගණන්. හැබැයි, එක මාසයකින් ඒක මනින්න එපා කියන එකත් මේ වෙලාවේ මම කියන්න කැමැතියි. මොකද, 2026 සම්පූර්ණ කාර්තු හතර ඉවර වෙද්දි බිලියන 19ක ප්‍රමාණයක ඉලක්කයක් තිබෙනවා. තවම ඇවිල්ලා තිබෙන්නේ බිලියන 13ක විතර ප්‍රමාණයක්. සැප්තැම්බර් මාසයේ අපේ අපනයන ආදායම වැඩියි. සැප්තැම්බර්වල අපනයන ආදායම වැඩි වුණාම නොවැම්බර්වල සභාව කල් තැබීමේ යෝජනාවක් ගේනවා, මෙන්න අපි අපනයන ආදායම වැඩි කළා කියලා. අපි අපනයන ආදායම වැඩි කළා, මෙන්න මෙහෙමයි මේ ආණ්ඩුවේ සියලු අංශවල ක්‍රියාමාර්ග කියලා ඔෂානි උමංගා මන්ත්‍රීතුමියත් කිව්වා. මම හිතන්නේ එතුමිය ඒක හරියට සොයා බලන්නේ නැතිව ඇති. Apparelsවල සහ textilesවල අපනයන ආදායම මේ වෙද්දි අඩු වෙලා තිබෙනවා. ඇත්ත කථාව ඒකයි. දිලිත් ජයවීර මන්ත්‍රීතුමාත් ඒක පැහැදිලි කරලා කිව්වා. මේ වන විට ඒ ප්‍රමාණය ගොඩක් අඩු වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, 2025 අවුරුද්දේ අවසාන මාස 3 බැලුවොත් බිලියන 3ක් විතර තමයි ලැබිලා තිබෙන්නේ. එතකොට ඉලක්කවලට යන්න නම් ඒ ප්‍රමාණයටත් වඩා සියයට 25ක් විතර වැඩිපුර අවසාන මාස තුනේදී ලබා ගන්න සිදු වෙනවා. කමක් නැහැ, ඒ ඉලක්කයට යන්නයි අපිටත් අවශ්‍ය. ඒ ඉලක්කයට යනවා නම් හොඳයි. ඒ ඉලක්කවලට යන එක තමයි අවශ්‍යතාව වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒක ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒක බලපු කවුරුවත් දැක්කේ නැහැ, මේ මාස නවයේ ආනයන වියදම කොච්චර වැඩි වෙලා තිබෙනවාද, වෙළෙඳ හිඟය - trade deficit එක - කොච්චර වැඩි වෙලා තිබෙනවාද කියලා. සියයට 53ක් විතර ඒක වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩි වීම ගැන බලන්නේ නැහැ. හැබැයි, වෙළෙඳ හිඟය බලද්දී අපි බලන්න ඕනෑ, ආනයන සහ අපනයන අතර වෙනස මොකක්ද කියලා. ඒකත් වැඩි වෙලා තිබෙනවා. ඒකත් කියන්න එපායැ. ඒකටත් යෝජනාවක් ගෙනැල්ලා කියන්න ඕනෑ, අපි ආනයන වියදමත් වැඩි කර ගෙන තිබෙනවා, ඒකටත් ආණ්ඩුවට ස්තුතිවන්ත වෙන්න ඕනෑ කියලා. මේ අවස්ථාවේදී මම ඒ කාරණයත් මතක් කරන්න අවශ්‍යයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාත් අද කථා කළා. එතුමා ඉතා හොඳ කථාවක් කළාට එතුමාට එක දෙයක් අමතක වුණා. අපනයන වැඩි කරන්න නම් ව්‍යුහාත්මක - structural - වෙනස්කම් ටික කරලා ඉන්න ඕනෑ, ඒක හිටපු ආණ්ඩුවලට කර ගන්න බැරිව ගියා, හැබැයි මේ ආණ්ඩුව ඒක කරලා තිබෙනවාය කියලා එතුමා කිව්වා. ඒවායින් ලොකුම වෙනස හැටියට කිව්වේ ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් ගැන. අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුම් ගැන එතුමා කිව්වා. ලංකාවේ ක්‍රියාත්මක වන වෙළෙඳ ගිවිසුමකට තිබෙන්නේ ඉන්දියානු වෙළෙඳ ගිවිසුම විතරයි, ඒකත් 1990 අවුරුද්දේ එකක්, අනෙක් කිසිම එකකට අපිට යා ගන්න බැරිව ගියා කියලා එතුමා බොහොම පැහැදිලිව කිව්වා. හැන්සාඩ් වාර්තාවෙන් එතුමා කළ ඒ ප්‍රකාශය බලන්න පුළුවන්. එහෙම නැත්නම් වීඩියෝ එකෙන් බලන්න පුළුවන්. එතුමා ඒක මතක් කරපු එක හොඳයි. වෙන කිසිම දෙයක් කර ගන්න බැහැ කියලා එතුමා කිව්වා. ETCA, CEPA, Sri Lanka -Singapore FTA කියන ගිවිසුම් ගෙනෙද්දි ඒවාට මේ රටේ විරුද්ධ වුණේ කවුද? පාරවල්වල කොච්චර අව්වේ ඇවිද්දාද? සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මේ ගැන හොඳට දන්නවා. 2008 අවුරුද්දේ ඉඳලා මේ CEPA ගැන, ETCA ගැන කථා කළොත්, මේවාට විරුද්ධ වුණේ කවුද? අපිද, විරුද්ධ වුණේ? India-Sri Lanka CEPA එක ගැන 2008 ජූලි 29 දින "India Today" website එකේ මෙසේ සඳහන් වනවා:

> "Sri Lanka's radical Marxist party, the Janatha Vimukthi Peramuna (JVP), has alleged that India had 'intensified its interference' in Sri Lanka's politics and economy."

මේ, CEPA එකට විරුද්ධව කියපු කථාව. දැන් ඇවිල්ලා කෑ ගහනවා, අපි ජාත්‍යන්තර ගිවිසුම්වලට ගියේ නැහැ කියලා. ඒ, එකක්.

ඊළඟට, JVP එකේ website එකෙත් ඒ ගැන තිබෙනවා. මේවා මම කියන ඒවා නොවෙයි. 2018 ඔක්තෝබර් 24 දිනැතිව ඔබතුමන්ලාගේ website එකේම මෙසේ සඳහන් වනවා:

> "Colombo flooded with a 'sea of heads' "

> "The 'People's Protest' was organized by the JVP to protest against ....destructive pacts such as ETCA and Singapore-Sri Lanka agreement,..."

මොකක්ද මේ කියන්නේ? කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා එතකොට ඉඳලා නැහැ. එතුමා Facebook එක බලමින් ඉඳලා තිබෙන්නේ, මේවා එන විට. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, ඔබතුමා හිටියා. ඔබතුමා නියෝජ්‍ය ඇමතිතුමාට මේවා මතක් කරලා දෙන්න.

ඊළඟට, ජනාධිපති අනුර කුමාර දිසානායක 2016දී කළ ප්‍රකාශයක් පිළිබඳව "Colombo Telegraph" එකේ මෙසේ සඳහන් වනවා:

> "Rise against ETCA: JVP Leader Anura Kumara Dissanayake Tells Public"

> ".....Janatha Vimukthi Peramuna (JVP) too calling on the people to join hands and rise against the government decision to sign the agreement."

අපිද එපා කිව්වේ? මේක පුදුම වැඩක් වුණා නේ. ඒගොල්ලන්ම ඒවා කරලා ඇවිල්ලා දැන් අපිට බණිනවා. මේවා මතක නැහැ. 2018 ඔක්තෝබර් 03වැනි දා නැවත ජනාධිපතිතුමා කළ ප්‍රකාශයක් පිළිබඳව "Daily FT" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා:

> "He went on to state that the Singapore-Sri Lanka Free Trade Agreement had damaged local industries and the Economic Technology Cooperation Agreement (ETCA) which is due to be signed would further hurt the economy."

නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, හිටපු ආණ්ඩුවල අයට කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බලන්න කියලා. මම නම් ඔය ආණ්ඩුවල හිටියේ නැහැ. හැබැයි, මම කියන්නේ කණ්ණාඩියෙන් බලන්න නොවෙයි, මේ විනාශය කළේ කවුද කියලා එතුමාගේ නාත්තාගෙන් අහ ගත්තොත් හොඳයි කියන එකයි. මෙතැනට ඇවිල්ලා දැන් අපනයන ආදායම ගැන කියනවා. යුරෝපයට, අග්නිදිග ආසියාවට වෙළෙඳ ගිවිසුම් නැහැලු, වියට්නාමයට තිස් ගණනක් තිබෙනවාලු, අපිට එකක්වත් නැතිලු. එහෙම ගිවිසුම් නැති වෙන්න හේතු මේ තිබෙන්නේ. මේවා තමයි හේතු. අපනයන ආදායම ගැන ඒ වාගේ කථා කරපු එක හොඳයි, මේ දේවල් දැනගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි අද උදෑසන සිදු වූ සිද්ධිය. දිවා ආහාරයට පස්සේ නම් මාතෘකාවට අනුව පමණක් කථා කරන්න කියනවා මම දැක්කා. හැබැයි, දැන් මාතෘකාවෙන් පිට ගිහිල්ලා තිබෙනවා. අවසානයට කථා කරපු කථිකයින් ඔක්කෝම කථා කළේ ඒ සිද්ධිය ගැන. ඒක නිසා මාව නම් නවත්වන්න ලැහැස්ති වෙන්න එපා, මමත් ඒ ගැන කථා කරන්න කැමතියි.

ලක්මාලි හේමවන්ද මන්ත්‍රීතුමිය දැන් පුරුදු සද්දෙ දාලා ගියා. එතුමිය මොකක්ද කිව්වේ? මේ පාර්ලිමේන්තුවේ සංයුතිය අනුව මේ විශ්වාස භංග යෝජනාව දිනන්න බැහැ, ඒක නිසා මේක ගෙනෙන එක වැඩක් නැහැ කියලා එතුමිය කිව්වා. එහෙම නම් අගමැතිතුමියගෙනුයි, විජිත හේරත් ඇමතිතුමාගෙනුයි අහන්න, කෙහෙළිය රඹුක්වැල්ලට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගෙනෙද්දී අපට බහුතරයක් තිබුණාද කියලා. එදාත් සංයුතිය අනුව බැලුවා නම් අත්සන් කරන්න හම්බ වෙන්නේ නැහැ. නමුත්, ඒ දෙදෙනාත් අත්සන් කළා නේ. නමුත් පරාදයි නේ. පරාද වුණාට ජනතා අධිකරණය ඉදිරියේ මොකද වුණේ? ඒක නිසා සංයුතිය බලමින් ඉඳලා නම් කොහොමත් විශ්වාස භංග යෝජනා ගෙනෙන්න වෙන්නේ නැහැ. මොකද, මේ පාර්ලිමේන්තුව ඇතුළේ ආණ්ඩුවකට බහුතරයක් තිබෙන නිසා, සංයුතිය කියන එක බලමින් ගෙනෙන්න ගියොත් විශ්වාස භංග කියන කොටස අයින් කරලා දාන්න වෙනවා. ඒක නිසා මේ *sub judice* කියන එක,- ජනාධිපති නීතිඥතුමා දැන් සභාවට එනවා. එතුමාගේ කථාවේදී මේ *sub judice* කියන එක ගැන පැහැදිලි කරයි.

මේකෙදි *sub judice* වෙන්නේ කොහොමද, මේ support කරන matter එකකට තවම noticeවත් දීලා නැතුව? හැම කෙනාම ස්ථාවර නියෝග 91 (ඊ)වල තේ එල්ලෙන්නේ. ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ තිබෙනවා, "... අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන..." කියලා. ඒක හරි. හැබැයි, proviso එකේ තිබෙනවා, "එසේ වුව ද, අගතියක් වීමේ අවදානමක් නොමැති බව කථානායකවරයාගේ මතය වන්නේ නම්" කියලා. එතකොට ඒක සලකා බලන්න පුළුවන්. ස්ථාවර නියෝග 91 (ඊ) ගැන කථා කරන නිසායි මම මේවා කියන්නේ. ඉතින්, ඒකට අගතියක් සිද්ධ වෙන්නේ නැත්තේ මේක මේ වෙනකොට notice නිකුත් කරලාත් නැතුව, support කරන ප්‍රශ්නයක් නිසායි.

මූලික කරුණු ඉදිරිපත් කිරීම පමණයි මේ සිදු වෙන්නේ. ඒක නිසා *sub judice, sub judice* කියලා යන්න එපා, ඉන්න. *Sub judice* නම් ඒක කොහොමද වෙන්නේ කියලා අපි බලමු. ඉතින්, තහවුරු නොකරන ලද - unsubstantiated - කරුණු කියලා කියනවා. *[බාධා කිරීමක්]* ඉන්න, කරුණු කියන්නම්. වේලාව තිබෙනවා නම් කරුණු කියන්නම්. කරුණු තිබෙනවා. නැති කරුණු නොවෙයි නේ අපි කියන්නේ.

එතුමා එල්ලුම්ගස් යවන්න නොවෙයි නේ අපි ඒක ගෙනාවේ. වැරදි තිබෙනවා නේ, එතැන පෙන්නුම් කරන්න. අපට documentsවලින් ඒවා පෙන්වන්න පුළුවන් නේ. ඒ නිසා මෙච්චර භය වෙන්න අවශ්‍ය නැහැ. මේ සභාවට ඇවිල්ලා කථා කරලා තමන්ගේ නිර්දෝෂීභාවය කියන්න තිබුණා. 159ක් ඉන්නවා නේ. ඒ නිසා කොහොමත් දිනනවා නේ. මේ විශ්වාස භංග යෝජනාව දිනා ගන්න බැරිද? මොකටද භය වෙන්නේ? ඒ නිසා මේ සභාවට ඇවිල්ලා දවස් දෙක තුනක් හරි කථා කරලා ඒක ඉවර කරන්න. ඒක තමයි මම කියන්නේ.

මොකද, බිමල් රත්නායක ඇමතිතුමා ඔක්තෝබර් 06වැනි දා සිංහ නාද කළා නේ, "ඕක ගෙනෙන්න. අපි ලබන සතියේ අරගෙන ඉවර කරමු" කියලා. එහෙම නේ කිව්වේ. එතකොට, ඔක්තෝබර් 09වැනි දා අපි විශ්වාස භංග යෝජනාව භාර දුන්නාම ඔක්තෝබර් 12වැනි දා න්‍යාය පත්‍රයට දාලා, ඒක අයින් කරනවා. අපට කියන්න එපා, ඔබතුමන්ලාට ඕනෑ විධියට විශ්වාස භංග යෝජනා හදන්න කියලා. මොකද, තිබෙන වැරදි අනුව, documents අනුව, සාක්ෂි අනුව තමයි අපි ඒක හැදුවේ. එහෙම නැතුව මේක ඇත්තටම චමින්ද කුලරත්න මැතිතුමාගේ පැමිණිල්ල අරගෙන හදපුවා නොවෙයි. මොකද, මේ සම්බන්ධයෙන් අපටත් සාක්ෂි තිබෙනවා. ඒක නිසා අපට මතක් වෙන්නේ අර අගවිනිසුරුතුමාට කරපු වැඩේ. අගවිනිසුරුතුමාව දැම්මා, එතුමාගේම නඩුව එතුමාටම අහන්න. ඒකට කරන්න දෙයක් නැහැ නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එතුමාව එතැනට හිර වුණා. ඒකයි අපි කිව්වේ, කැබිනට් මණ්ඩලයට දාලා, කැබිනට් මණ්ඩලයෙන් ජනමත විචාරණයකට යා යුතු පනතක් විධියට ඒක ගෙනෙන්න කියලා. ඒ වැඩේම මෙතැනත් කළා නේ. ගරු කථානායකතුමා මූලිකත්වය දරන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී එතුමාම ඒක අයින් කරනවා. එහෙම නම් එතුමාට තිබුණේ ඒ කාරක සභාවෙන් පොඩ්ඩක් ඉවත් වෙලා ඒ සඳහා ඉඩ දෙන්න. හැබැයි, එතුමා ඒක අයින් කරලා දානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
හොඳයි. තව විනාඩියක් වැඩිපුර මට දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බොරු ෂෝ දාන්න ගිහිල්ලා තමයි මේක සිද්ධ වුණේ. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් ලැබෙනවා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මේ ෂෝ එක නොදා හිටියා නම් මෙහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. 2025.07.07වැනි දා "Parliament of Sri Lanka" website එකේ මෙහෙම සඳහන් වෙනවා:

> "The Speaker does not use his official residence for personal or private gatherings or any other activities. All official meetings and diplomatic engagements related to the Speaker are conducted at the Speaker's Office located within Parliament."

දැන් මේවා අවශ්‍ය නැහැ නේ. කථානායකතුමාට නිල නිවසක් දීලා තිබෙනවා නේ. අපි කියලා තිබෙනවාද, ඔබතුමා නිල නිවාසයේ ඉන්න එපා යන්න කියලා? ඒකට වැය වෙන්නේ මේ රටේ ජනතාවගේ මුදල් දශම ගාණක්. එම නිසා ඒ ගැන කල්පනා කරලා බලන්න. එතුමා මේ රටේ තුන්වෙනි පුරවැසියා. අපිවත් නියෝජනය කරන්නේ එතුමා. එතුමා මේ රට නියෝජනය කරන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

එතැන අපූරුවට තිබෙනවා. මම කලිනුත් කිව්ව ආකාරයට මෙන්න මේ වාගේ අයත් එක්ක මුලින්ම මේවා ගැන කියනවා. මිනිස්සුන්ව චූන් කරන්න කියපු ඒවායින් තමයි එතුමා මේ කරදරේ වැටිලා තිබෙන්නේ කියන එකයි මම කියන්නේ.

ඊළඟට, මේ www.news.lkහි 2025.07.09වැනි දා කියනවා, "The Speaker's Residence will be transformed into a

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

knowledge centre for MPS" කියලා. මේක කියන්නේ කාව හමු වෙලාද දන්නවාද? European Union එකේ delegation එකක් හමු වෙලා තමයි එතුමා මෙහෙම කියන්නේ. දැන් අවුරුද්දකටත් වැඩියි. Knowledge centre එකක් ගැන නම් අපි දන්නේ නැහැ. මේකේ තිබෙන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කියලා තමයි තිබෙන්නේ. ඒ නිසා knowledge centre එකක් නම් වෙලා නැහැ. මේ බයිලා කියන්න ගිහිල්ලා තමයි එතුමා අමාරුවේ වැටිලා තිබෙන්නේ කියන එක මම මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිව්වා වාගේ unsubstantiated - නැහැ, අපි ළඟ කරුණු තිබෙනවා. එකක් දෙකක් මම කියන්නම්, මේ ගැන කියපු නිසාම. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් චමීර ප්‍රියශංක ගාල්ලගේ මහත්තයාට ලිපියක් එවනවා, "කොළඹ 04, ලෝරිස් පටුමඟ අංක 4-3 දරන රජයේ නිල නිවාසය 2025.06.06 වන දින සිට ඔබගේ පදිංචිය සඳහා වෙන් කර ඇති බව සතුටින් දැනුම් දෙමි" කියලා. ආලෝකබණ්ඩාර මහත්මයා හරි සතුටු වෙලා. හැබැයි, කොහොමද එහෙම දෙන්නේ? රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2001 බැලුවේ නැද්ද? ඒකේ තිබෙනවා නේ, මේ නිල නිවාසය දෙන්න ඕනෑ ක්‍රමවේදය ගැන. ඒ සඳහා පොරොත්තු ලැයිස්තුවක ඉන්න ඕනෑ. අනික, රජයේ සේවකයෙක් වෙන්න ඕනෑ. මෙහෙම දේශපාලන පත්වීම්වලට ආපු අයට මේ නිල නිවාසය ගන්න බැහැ. අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ට මේ නිල නිවාස ලබා දෙන ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, මේක කොහොමද දුන්නේ? ඉතින්, මේවා unsubstantiatedද? මේවා අපි කියන්න එපාද? මේවා පෙනෙන්නේ නැද්ද? මේවා මෙතැන කථා වෙන්න ඕනෑ නැද්ද? ගරු කථානායකතුමාගේ පාර්ලිමේන්තුවට තිබෙන වග වීම සම්බන්ධයෙන් අපි කියන්න ඕනෑ නැද්ද? මම ඊට අදාළ ලේඛන **සභාගත*** කරනවා.

ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය බැණලා බැණලා ගියා. එතුමියට මේවා බලා ගන්න පුළුවන්. ඒ වාගේම බලන්නකෝ, මේ නිල නිවාසවල බඩු බාහිරාදිය පිළිබඳව. මේවා හරි ලජ්ජා හිතෙන කතන්දර නේ. කථානායකතුමා කියන්නේ අපෙත් නායකයා. කරන්න දෙයක් නැහැ, මේවා කියන්න වෙනවා. ගෘහ භාණ්ඩ සහ අන්‍ය බඩු බාහිරාදිය පිළිබඳව inventory පොතක් තබා ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XVIIIවන පරිච්ඡේදයේ අපූරුවට සඳහන් කරලා තිබෙනවා. මොකක්ද, මේ? 2026.09.28වැනි දා බංගලා කළමනාකරු මහ ලේකම්තුමියට ලියලා එවනවා, ඒ inventory CR පොත නැති වෙලා තිබෙනවාය කියලා. මේ ප්‍රශ්නය ඇදුණාට පස්සේ, මේක අතේ මාට්ටු වුණාට පස්සේ ඒ CR පොත නැති වෙලා. මම ඒ සම්බන්ධයෙන් වන ලිපියත් **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මේක අන්තිම කාරණය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ප්‍රශ්න නොවෙයිද? බලනන, මේ තිබෙන්නේ, Communication Department එකෙන් බඩු ඉල්ලපු ලිපිය. පාර්ලිමේන්තුවේ Communication Department එක Speaker's Office Media Division එකට බඩු දෙන්නේ මොකද? තමන්ගේ බූදලයක්ද?*[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තුවක් දෙනවාලු. තමන්ගේ බූදලයක් කියලා හිතුවාද මෙහෙම ඉල්ලන්න? මේ බලන්න, ලියුම් තිබෙනවා නේ. 2025.03.15 දින Janaka Mahesh Athapaththu, Media Secretary to the Speaker භාණ්ඩ වගයක් ඉල්ලා තිබෙනවා. මෙන්න, දීපු ලැයිස්තුවක් තිබෙනවා. මේ තිබෙන්නේ. පිටු ගණනක් තිබෙනවා. මෙහෙම දෙන්නේ කොහොමද? ඊළඟට මම හිතන විධියට කැබිනට් මණ්ඩලය හරහා ඒක backdate කරලා හරිගස්ස ගන්නත් උත්සාහ කර තිබෙනවා. ඒ ඔක්කොම විස්තර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න සාක්ෂි ටික. මම මේ ලේඛන ටික පෙන්වනවා. මේ ඔක්කොම මට සභාගත කරන්න බැහැ. හැබැයි මේවා තිබෙන නිසායි අපි මේ චෝදනා එල්ල කරන්නේ. එහෙම නැතුව කට කහනවටවත්, චමින්ද කුලරත්න මැතිතුමා මේක කිව්වා කියන එක මතවත් නොවෙයි. "අපට 159ක් තිබෙනවා" කියන එක මේකට උත්තරයක් නොවෙයි. යම් ගැටලුවක් සිද්ධ වුණොත්, යම් චෝදනාවක් එල්ල වුණොත් වගකිව යුතු විපක්ෂයක් විධියට අපට ඒක ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙන්න ඕනෑ. ඒකට තිබෙන අයිතිය නැති කරන්න එන්න එපා. ඒක කරන්න ලැහැස්ති වෙන්නත් එපා; ඒකට අපි ඉඩ දෙන්නෙත් නැහැ. එහෙම බැරි නිසා තමයි, අර Privilege matter එක පිළිබඳ ප්‍රශ්නය පටන් ගත්තු නිසා තමයි අද උදේ අපි එතැනට ආවේ. එහෙම නැතුව වෙන කිසිම හේතුවක් නැහැ. අවසාන වශයෙන් මම මතක් කරන්න කැමැතියි, එන්න, මුහුණ දෙන්න, උත්තර දෙන්න, උත්තර දීලා මේකෙන් බේරෙන්න, අපට කෑ ගගහා ඉන්න එපා කියලා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.21]

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා ගෙනාපු සභාව කල්තැබීමේ යෝජනාව ගැන අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මුලින්ම අපි බලමු, ඒ ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව ගෙනෙන්න සිද්ධ වුණේ ඇයි කියන එක. අපි දන්නවා, 2022-2023 කියන්නේ, තට්ටු මාරු දේශපාලන ක්‍රමයේ අවසාන යුගය බව. ඒ අවසාන යුගයට ඇවිල්ලා, රට බංකොලොත් කරලා, ඒකට නඩු තීන්දුවක් දී තිබුණු යුගය පසු කරලා ආපු නිසා තමයි අද අපට මේ වාගේ මානෘකාවක් ගැන කථා කරන්න සිද්ධ වෙන්නේ. ඇයි ඒ? මේ ආර්ථිකය ක්‍රමානුකූලව ගොඩ ගන්නකොට ඊට අදාළ සාකච්ඡාවක් මේ සමාජය තුළ සිදු වෙන්න ඕනෑ. ඒ නිසා තමයි අද අපට මේ මානෘකාව ගැන කථා කරන්න අවස්ථාව ලැබුණේ.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම අපි ඒ කඩා වැටිච්ච ක්ෂේත්‍ර සියල්ලම මේ වෙනකොට ගොඩනඟමින්, ස්ථාවර කරමින් යනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි රජයක් විධියට මේ වනකොට නීති ක්ෂේත්‍රය යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක කරමින්, අණ පනත් හදමින් ස්ථාවර කරනවා. ඒ වාගේම දේශපාලන තමයි ක්ෂේත්‍රයේත් අපි යම් ප්‍රගමනයක් පෙන්වා තිබෙනවා. ජනතාව 2024දී ඡන්දය දෙනකොට බලාපොරොත්තු වුණා විනයගරුක පාර්ලිමේන්තුවක්. හැබැයි, අද අපි දැක්කා බහුතරයක් දෙනා එළියට පැන්නුවත් ජනතා ඡන්දයෙන් ආපු කිහිපදෙනෙක් ඒ විනයගරුක පාර්ලිමේන්තුවට නැවත වතාවක් හානි කරන මට්ටමට ඇවිත් තිබෙන ආකාරය. හැබැයි, 159දෙනෙක් ඉන්න මේ ආණ්ඩුව ඉතාම විනයගරුකව මේ සභාවේ හැසිරුණා.

දේශපාලන ස්ථාවරත්වය, රටේ සංස්කෘතියේ ස්ථාවරත්වය යන මේ සියල්ලම අපි ළඟා කරගනිමින් ඉන්නවා. චැදගත්ම දේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික ස්ථාවරත්වය. අන්න ඒ ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය කෘෂිකාර්මික, ධීවර, ආයෝජන ක්ෂේත්‍ර හරහා අපි ළඟා කරගෙන තිබෙනවා. අන්න ඒ කෘෂිකාර්මික, ධීවර, ආයෝජන ක්ෂේත්‍ර හරහා තමයි ඉදිරියේදී අපට බලාගන්න පුළුවන් වෙන්නේ අපනයනය කොච්චර ප්‍රමාණයකින් වර්ධනය කළාද කියන එක. ඒ ක්ෂේත්‍රවල වර්ධනයත් එක්ක තමයි අපනයනයේ වර්ධනය ගැන අපට කථා කරන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේ වර්ධනයක් අත්පත් කරගත්තේ කොහොමද, ඒ සඳහා තවදුරටත් තිබෙන සැලසුම් මොනවාද කියලාත් අපි මේ විවාදයේදී සාකච්ඡා කළ යුතු වෙනවා. ඒ නිසා මම ප්‍රවේශ වෙන්නේ ඒ සම්බන්ධව කථා කරන්නයි. හැබැයි, ඒ ක්ෂේත්‍රවල වර්ධනය ගැන කථා කරද්දී මම තව කාරණයක් කියන්න ඕනෑ. මේ රටේ ආර්ථිකය ස්ථාවර වෙනවා, වර්ධනයක් තිබෙනවා කියලා ජනතාවට පෙනුණත්, මේ කුහක විපක්ෂයට නම් ඒක පෙනෙන්නේ නැහැ. ඒ නිසා තමයි ඔවුන් මේ අවලාද නහන්න, මඩ ගසන්න පටන්ගෙන තිබෙන්නේ.

මට කලින් කථා කරපු දිලිත් ජයවීර මන්ත්‍රීවරයා කිව්වා, ඇහලුම් ක්ෂේත්‍රයේ කඩා වැටීමක් තිබෙනවා කියලා. ඔව්, ඇහලුම් ක්ෂේත්‍රයේ කඩා වැටීමක් තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. මේ ආසියාතික රටවල AI උපාංගවල වැඩි වර්ධනයක් තිබෙනකොට, ඒ වෙනුවෙන් මුදල් ආයෝජනය කරනකොට, මිල සංවේදී ඇඳුම් වාගේ ඒවාට තිබෙන ඉල්ලුම එක පැත්තකින් අඩු වෙනවා.

අනෙක් කාරණය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලෝකයේ අර්බුද හමුවේ සමහර රටවල් එක්ක ඔවුන් ගහපු ගිවිසුම් තිබෙන බව අපි දන්නවා. බංග්ලාදේශය, වියට්නාමය වාගේ රටවල් සමඟ අත්සන් කළ ගිවිසුම් තිබෙනවා. අන්න ඒ ගිවිසුම් අනුවත් යම් බලපෑමක් තිබෙනවා, මේ ඇහලුම් ක්ෂේත්‍රයේ කඩා වැටීමට. ඒත් අපි උත්සාහය අතහැරලා නැහැ. ඒ ක්ෂේත්‍රය නඟා සිටුවීම වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. ඒ ක්‍රියාමාර්ග මොනවාද කියලා මම පසුව කියන්නම්.

ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපනයනය වර්ධනය වෙලා තිබෙන්නේ බනිජ තෙල් නිෂ්පාදන පැත්තෙන් විතරයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂි අපනයනවල වැඩිවීම එතුමාට අමතක වෙලා තිබෙනවා. 2025 අවුරුද්දේ පලතුරු සහ ඇට වර්ග අපනයනයේ සියයට 68.6ක වර්ධනයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පොල් ආශ්‍රිත නිෂ්පාදනවල සියයට 42ක වර්ධනයක්, ආහාර සහ පාන වර්ගවල සියයට 24ක වර්ධනයක්, අනෙකුත් භෝගවල සියයට 57.2ක වර්ධනයක් තිබෙනවා. බනිජ තෙල් නිෂ්පාදන පැත්තෙන් විතරක් නොවෙයි වර්ධනය වෙලා තිබෙන්නේ. එතුමාට අමතක වෙලා. එතුමා ඉතිරි කෑලි ටික හලලා තමයි කියන්නේ. ඕක තමයි විපක්ෂයේ හැටි.

මම පසුගිය කාලයේ දැක්කා, එතුමා මාධ්‍ය සාකච්ඡාවකට පොඩි ගැහැනු දරුවෙකු යවා තිබෙනවා. ඇයට script එක ලියලා දෙනවා, ඒක කියන්න කියලා. ඒක කියාගන්න බැහැ. ඒ තමයි පරණ පුරුදු. එතුමා කිව්වා, මේ ආණ්ඩුව යන්නේ පරණ ගමනේ, පරණ පුරුදුවල කියලා. අපට කියන්න තිබෙන්නේ මේකයි. එතුමන්ලා පරණ පුරුදු දේවල් කරන්න ගිහිල්ලා තමයි මාධ්‍ය ඉදිරියේ ඇනගෙන තිබෙන්නේ. YouTubeවල ඒ වීඩියෝ සංසරණය වෙනවා. මේ රටේ ජනතාව ඒවා දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ වුවත් 2026 වර්ෂයේ ආහාර පාන අපනයන අංශයේ සියයට 20ක වර්ධනයක් තිබෙනවා. කුළුබඩු සහ සුගන්ධ තෙල්වල සියයට 30ක අපනයන වර්ධනයක් තිබෙනවා. පොල් ආශ්‍රිත නිෂ්පාදනවල සියයට 3.7ක වර්ධනයක් තිබෙනවා. විදුහුත් සහ ඉලෙක්ට්‍රොනික උපාංගවල සියයට 60.1ක වර්ධනයක් තිබෙනවා. බනිජ තෙල් නිෂ්පාදනවල සියයට 57.1ක වර්ධනයක් තිබෙනවා. ඒ කෑල්ල විතරයි එතුමාට අහු වුණේ. ඉතිරි කෑලි ටික එතුමාට අහු වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තමයි ඔවුන්ගේ ස්වභාවය.

මම තව කාරණයක් කියන්න ඕනෑ. මැද පෙරදිග යුද්ධයක් පවතිනකොට තමයි මේ ආණ්ඩුව මේ ආර්ථික වර්ධනය ලබා ගත්තේ. 2024දී ඩොලර් බිලියන 12.1ට තිබුණු අපනයන ආදායම 2025දී ඩොලර් බිලියන 12.95කට ගෙනැවිත් තිබුණා. 2026දී ඒක ඩොලර් බිලියන 13.6කට ගේනවා. එතකොට 2024-2025 කාලයේ සියයට 6.9ක වර්ධනයක් තිබෙනවා. 2025 සිට 2026 අවුරුද්දේ මේ මාස ගණන ඇතුළත සියයට 5.41ක වර්ධනයක් තිබෙනවා. සැප්තැම්බර් මාසයේ සියයට 17.23ක වර්ධනයක් තිබෙනවා. මේ, සැප්තැම්බර් මාසයේ විතරක් වර්ධනය. සමස්තයක් වශයෙන් මේ අවුරුදු දෙක - 2024-2026 - සාරාංශ කරලා ගත්තොත්, අපනයන ක්ෂේත්‍රයේ සියයට 12.6ක වර්ධනයක් තිබෙනවා. අන්න ඒක තමයි මේ ආණ්ඩුව ලබපු ජයග්‍රහණය. චිත්‍රාල් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ සැප්තැම්බර් මාසයේ 17.3ක් වුණා කියලා, ඒක අරගෙන කථා කරනවා නොවෙයි. මේ සමස්ත අවුරුදු දෙක ඇතුළත සිදුවූ සියයට 12.6ක වර්ධනයත්, මේ අවුරුද්දේ මේ මාස ගණන තුළ සිදුවූ 5.4ක වර්ධනයක් අරගෙන තමයි අපි කථා කරන්නේ. ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි ඩොලර් බිලියන 17.3ක ආදායමක් පසුගිය වසරේ අපනයනවලින් හොයලා තිබෙනවා. ඒකත් ලංකා ඉතිහාසයේ වාර්තාවක්.

චිත්‍රාල් මන්ත්‍රීතුමාට එක කාරණයක් අමතක වෙලා තිබෙනවා. අපේ ආනයන වියදම වැඩි වෙලාය කිව්වා. අමතක කරන්න එපා, තෙල්වලට අපට ලොකු වියදමක් දරන්න සිද්ධ වුණා කියන එක. සියයට 50ට වඩා වියදමක් තෙල් ආනයනය සඳහා දරන්න වුණා. ඒ වාගේම ලෝකයේ කෙළවරක යුද්ධයක් තිබෙනවා. ඒ යුද්ධයත් එක්ක සෑම භාණ්ඩයකම මිල වැඩි වුණා. අපි භාණ්ඩ ආනයනය කරන රටක්. හොඳ ආර්ථිකයක් ඔබතුමන්ලා හදලා ගියේ නැහැ. ඔබතුමන්ලා කිව්වේ 2048 වන කොට මේ රටේ ආර්ථිකය හදනවා කියලායි. එහෙම කියපු ආර්ථිකයක් තමයි අපි හදන්නේ. එතකොට සියලු දේවල් අපි ආනයනය කරන්න ඕනෑ. ආනයනය කරනකොට ආනයන වියදම වැඩි වෙලා තිබෙනවා. නැව් ගාස්තු, රක්ෂණ ගාස්තු වැඩි වෙලා තිබෙනවා. එහෙම ආර්ථිකයක් තිබුණු නිසා තමයි අපි මේ තැනට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට අපි රජයක් විධියට අපනයන වැඩි කර ගැනීම සඳහා තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ජාත්‍යන්තර නීති-රීතිවලට අනුකූලව නිෂ්පාදනය වර්ධනය කරන්නේ කොහොමද, carbon footprint එක අවම වන පරිදි sustainable productionsවලට අපි යන්නේ කොහොමද කියන එක ගැන අපි අවධානය යොමු කර තිබෙනවා.

[ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා]

අන්න ඒ කාරණා සියල්ල එක්ක අපනයනකරුවන් දැනුවත් කරමින්, පාඨමාලා පවත්වමින්, ඔවුන්ට අවශ්‍ය සහතික ලබා දෙමින්, අපි ඒ ක්‍රියාවලිය නැවතත් ක්‍රියාත්මක කරමින් ඉන්නවා; ඒ සඳහා අපනයනකරුවන් පුහුණු කරනවා. ඒ විතරක් නොවෙයි, අලුත් අංශ ගැනත් සොයා බලා අපනයන විවිධාංගීකරණය සඳහාත්, ඒ වාගේම වෙළෙඳ පොළ විවිධාංගීකරණය සඳහාත් අපි අලුත් වෙළෙඳ පොළවල් සොයාගෙන යමින් ඉන්නවා. එවැනි එක වෙළෙඳ පොළක් තමයි, මෙක්සිකෝව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, කාලයක් තිස්සේ "Sri Lanka Expo" කියන ප්‍රදර්ශනය පැවැත්වුණේ නැති බව. අවුරුදු 15ක් තිස්සේ ඒක නවත්වා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

අවුරුදු 15කට පස්සේ "Sri Lanka Expo" කියන ප්‍රදර්ශනය 2027 ජනවාරි මාසයේදී අපනයනකරුවන් වෙනුවෙන් පවත්වන්නට ලෑස්ති කර තිබෙනවා. ඒ වාගේම තමයි අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල සභාව අවුරුදු 28කට පස්සේ කැඳවා තිබෙනවා. ඒ වාගේ විශාල ප්‍රමාණයේ වැඩ කටයුතු රාශියක් කරමින්, අපනයනයේ දිශාව වෙනස් කරමින් 2026-2030 කාලය ඇතුළත රුපියල් බිලියන 36ක අපනයන ආදායමක් ගෙන එන්න අපි සැලසුම් කර තිබෙනවා. ඒ සැලසුම් එක්ක තමයි අප මේ කථා කරන්නේ. ඒ වෙනුවෙන් තමයි අපේ ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ආවේ. ඒ නිසා මේ යෝජනාව කාලෝචිත යෝජනාවක්. මේ වෙනුවෙන් මුළු රටම, මුළු අපනයනකරුවන්ම පෙළ ගස්වන්න ඕනෑ බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.31]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අද අපට මේ ගරු සභාවේදී මැද පෙරදිග යුද්මය වාතාවරණය නිසා මෙරටට සිදු වී ඇති බලපෑම් ගැන ලොකු කතන්දර ගොඩක් අහන්න ලැබුණා. ඒ පිළිබඳව තමයි, අපි අද උදේ ඉඳන් මේ දක්වා වාද කළේ. හැබැයි, මේ අවස්ථාවේදී අපි ඉතාම පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි, අද අපේ රට මේ වැටී තිබෙන ආර්ථික අගාධයට, පරිහානියට එකම හේතුව මැද පෙරදිග යුද්ධය ලෙස මේ ආණ්ඩුව පෙන්වන්න හදන්නේ, තමන්ගේ අදූරදර්ශී සහ වැඩ බැරි පාලනය පිළිබඳව එල්ල වන චෝදනාවලින් මිදෙන්නයි කියන එක. අපි ඒ කාරණය පළමුව සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ ශ්‍රමිකයන් එවන විදේශ ප්‍රේෂණ අඩුවීම හා වෙනත් කාරණා මත අද මැද පෙරදිග යුද්ධය යම්තාක් දුරට මේ පවතින තත්ත්වයන්ට බලපෑවා කියන කාරණය විපක්ෂය විධියට අපි බැහැර කරන්නේ නැහැ. හැබැයි, ඒ හැම කාරණයකටම වඩා ඉදිරියට ඇවිත් තිබෙන්නේ ඔබේ නොහැකියාව, ඔබේ සැලැස්මක් නොමැතිකම, ඔබට ඒ පිළිබඳව සූදානමක් නැතිකමයි කියන කාරණය අපි මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ.

ඔබතුමන්ලා ගැන කථා කරන කොට අපට පරණ කථා නොකියා බැහැ. අපට මතකයි, වර්තමාන ජනාධිපතිතුමා එදා විපක්ෂයේ ඉන්න කොට කියපු කථා. ඒවා කියන්න ගත්තොත්, කථා පේළියක් කියන්න තිබෙනවා. මම එක කාරණයක් විතරක් කියන්නම්. මෙවැනි අර්බුද තිබෙන කොට වර්තමාන ජනාධිපතිතුමා කිව්වා අපට මතකයි, "ඇමෙරිකාවට හෙම්බිරිස්සාව හැදෙන කොට ලංකාවට නිව්මෝනියාව හැදෙනවා" කියලා. ඇමෙරිකාවට හෙම්බිරිස්සාවක් හැදෙන කොට ලංකාවට නියුමෝනියාව හැදෙනවා කියපු ජනාධිපතිතුමාගෙන් අපි අහන්න කැමැතියි, අද ලංකාවට හැදිලා තිබෙන්නේ නියුමෝනියාවද, හෙම්බිරිස්සාවද කියන ප්‍රශ්නය.

ඒ වාගේම, මීට පෙර අපේ ලක්මාලි මන්ත්‍රීතුමිය කථා කරද්දී විපක්ෂයට කිව්වා, විපක්ෂයේ මන්ත්‍රීවරුන් අධිකරණය යටපත් කර කථා කරනවා කියලා. අද විපක්ෂයේ මන්ත්‍රීවරුන් අධිකරණය හැල්ලු කරමින්, අධිකරණය යටපත් කරමින් කථා කරනවා කියලා ලක්මාලි මන්ත්‍රීතුමිය මීට පෙර සඳහන් කළා. හැබැයි, ලක්මාලි මන්ත්‍රීතුමියට අමතක වෙලා තිබෙනවා, ලබා දීපු නඩු තීන්දුවක් අභියෝගයට ලක් කරමින් එතුමිය තමන්ගේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී කටයුතු කළා කියන එක. අද එතුමියට ඒක අමතක වෙලා, "අද විපක්ෂය අධිකරණය යටපත් කරන්න උත්සාහ ගන්නවා" කියලා එතුමිය මේ පාර්ලිමේන්තුවට ඇවිත් කියනවා. ඒක කොතරම් සාධාරණද කියා අපි අහන්න කැමැතියි.

ඒ වාගේම මෙතරම් දරුණු පීඩනයක්, මෙතරම් සමාජ පීඩනයක් තිබියදීත් අද මේ ආණ්ඩුව හිතනවා, නාමල් රාජපක්ෂ මැතිතුමා අනීතික කාරණා ඉදිරිපත් කරලා, විවිධ චෝදනා අනීතිකව ගොඩනඟලා සිරගත කරලා තැබුවාම මේ ප්‍රශ්නවලින් ඔවුන්ට මිදෙන්න පුළුවන් කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ආණ්ඩුව වෙහෙසෙන්නේ, අද මේ ආණ්ඩුව කැප වෙන්නේ, අද මේ ආණ්ඩුව තමන්ගේ සියලු වැර යොදන්නේ කුමක් සඳහාද කියන කාරණය මේ රටේම ජනතාව දන්නවා. නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ජනප්‍රියතාව පිළිබඳව අද ඔවුන් බිය වෙලා. අනුර කුමාර ජනාධිපතිතුමාට වඩා නාමල් රාජපක්ෂ මැතිතුමා ජනතාව අතර ජනප්‍රිය වීම නිසා, අද මේ ආණ්ඩුව විවිධ උත්සාහයන් ගන්නවා එතුමාගේ ජනප්‍රියතාව නැති කරන්නේ කොහොමද, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාව ඔසවා තබන්නේ කොහොමද කියා සිතමින්. ඒක තමයි අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුන්ගේ ප්‍රධාන පරමාර්ථය. එහෙම නැතුව මේ රටේ ප්‍රශ්න විසඳීම වෙනුවෙන් නොවෙයි, මේ රටේ ජනතාවට ලබා දීපු පොරොන්දු ඉෂ්ට කිරීම වෙනුවෙන් නොවෙයි අද මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් කටයුතු කරන්නේ. මම ඒ කාරණයත් මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමාජයේ මේ වන විට පවතින ගැටලුවක් පිළිබඳව ඊළඟට මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. මේ වන විට රටේ

උද්ධමනය සියයට 8 දක්වා වර්ධනය වෙලා. අපි ඒ ගැන සතුටු වෙන්නේ නැහැ. උද්ධමනය වර්ධනය වුණාම එදා ඔබ විපක්ෂයේ සිටියදී සතුටු වුණා වාගේ අපි අද සතුටු වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි අමාරු අවධියක තමයි අද ජනතාව ඉන්නේ. රුපියල් 800ට තිබුණු මිරිස් කිලෝවක මිල අද රුපියල් 1,500 දක්වා වැඩි වෙලා තිබෙනවා. හැබැයි, මිරිස් කිලෝවක මිල එසේ රුපියල් 1,500ට - අහස උසට - නඟින කොට, මේ රටේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හෝ ඒ සඳහා වග කියන ඇමතිවරයා හෝ අද ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ; ඒකට මොකක්ද කරන්නේ කියලා කියන්නේ නැහැ. අද ඔවුන්ට ඒක ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, මේ රටේ ජනතාවට ඒක ප්‍රශ්නයක්.

මිරිස් මිල එසේ ඉහළ යෑම සම්බන්ධ ප්‍රශ්නයේ සැබෑ තත්ත්වය අපි මේ මොහොතේ මේ ගරු සභාවට කියන්න ඕනෑ. මේ අර්බුදයේ ඇත්ත පැත්ත ගැන සඳහන් කළොත්, අද මේ ප්‍රශ්නය උද්ගත වී තිබෙන්නේ අපේ වරාය තුළ පවතින දැඩි තදබදය සහ අකාර්යක්ෂමතාව නිසායි. මේ ආණ්ඩුවේ අය බලයට එන්න කලින් විපක්ෂයේ ඉන්න කොට ඒවා පිළිබඳව විවේචනය කරලායි ආවේ. හැබැයි, තවම ඒවාට විසඳුම් යොදා නැහැ. අද වන විට ඉන්දියාවේ මිරිස් අපනයනකරුවන්ගේ සංගමය පවා ලිපියකින් දන්වා තිබෙනවා, ලංකාව තුළ එම කටයුතු සම්බන්ධයෙන් පවතින අදූරදර්ශීභාවය ගැන. අද වන විට බහලුම් දින 60කට අධික කාලයක්, මාස දෙකහමාරකට අධික කාලයක් ශ්‍රී ලංකා වරාය තුළ සිර කරගෙන තිබෙනවා; රඳවාගෙන තිබෙනවා. ඒ බහලුම් නිදහස් කිරීම ප්‍රමාද වීම නිසා ඒ එක් බහලුමක් සඳහා රුපියල් මිලියන 17ක පමණ දැවැන්ත ආයෝජනයක් කර තිබෙන දේශීය ආනයනකරුවන් බරපතළ මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මිරිස් තොග වෙළෙඳ පොළට නිකුත් කරගත නොහැකි වීම නිසා අද වෙළෙඳ පොළ තුළ මිරිස් කුඩු නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත සියල්ල බිඳ වැටී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බිඳ වැටී තිබෙන කර්මාන්ත නඟා සිටුවන්න මේ ආණ්ඩුව කිසිදු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ. මේ වන විට ඉන්දියාවේ මිරිස් අපනයනකරුවන් ලංකාවට මිරිස් අපනයනය කිරීම පවා තාවකාලිකව නවත්වා තිබෙනවා. ඔවුන් ඒ පිළිබඳව දන්වා ඇති ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

වරායෙන් කන්ටේනර් නිදහස් කිරීම ප්‍රමාද වීම සහ ආනයන ක්‍රියාවලියේ පවතින අවිධිමත්භාවය නිසා අද මේ රටේ සියලු පාරිභෝගික ජනතාව අපහසුතාවට පත් වෙලා ඉන්නවා. හැබැයි, එදා කන්ටේනර් පෙට්ටි 323 රටට ඇතුළු කරන්න ඔබේ ආණ්ඩුව ගත් උත්සාහය අපි දැක්කා. අදටත් ඒවාට උත්තර නැහැ. ඒ වැරැදිකරුවන්ට අදටත් දඬුවම් නැහැ. එදා ඒ කන්ටේනර් පෙට්ටි 323 රටට ගෙනෙන්න උත්සාහ ගත් ඔබ අද වරායේ හිර වෙලා තිබෙන මිරිස් කන්ටේනර් නිදහස් කර මේ රටේ ජනතාවට අඩු මිලට මිරිස් ලබා දීම සඳහා කටයුතු කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් ඔබ අද කසාය බීපු ගොළුවන් වාගේ මුනිවත රකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ පවතින තවත් ගැටලුවක් ගැන මම මීළඟට මේ සභාවේදී කියන්න කැමැතියි. ගරු වාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව සඳහන් කළා. අද වන විට රටේ කොහේවත් ගෑස් නැහැ. හැබැයි, ආණ්ඩුවේ ඔබතුමන්ලා ඒ කාලයේ ගෑස් පෝලිම් පිළිබඳව කථා කළා. අපට මතකයි, චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යවරයා එදා මුහුණුපොතේ තම ගිණුමේ සටහන් කළා, "ගෑස් තිබෙන තැනක් කියන්න. සල්ලි දීලා ගන්නම්" කියලා. එහෙම තමයි එතුමා එදා මුහුණුපොතේ සටහන් කළේ. "ගෑස් ගන්න තැනක් තිබෙනවාද? අපි සල්ලි දීලා ගන්න කැමැතියි" වාගේ දේවල් මුහුණුපොතේ එතුමාගේ ගිණුමේ අද සටහන් වෙලා තිබෙනවාද කියා අපි අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්න ඕනෑ. අපට මතකයි, ජනාධිපතිවරණ සමයේදී කිව්වා මාළු ඉන්න තැන් බලන්න ධීවරයන්ට app එකක් දෙනවා කියලා. තවම ඒ app එක නම් අපි දැක්කේ නැහැ. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුත් ඇහුවා, ඒ app එක රටට හඳුන්වා දෙන්නේ කවදාද කියලා. එදා විපක්ෂයේ ඉන්න කොට, මාළු ඉන්න තැන් හොයන්න app හදනවා කියපු ඔබෙන් අපි ඉල්ලීමක් කරනවා, ගෑස් තිබෙන තැන් සොයන්න අපට app එකක් හදා දෙන්න කියලා. එතකොට මේ රටේ ජනතාවට ගෑස් තිබෙන තැන් සොයා ගන්න පුළුවන් කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවිධ මර්දනයන් සිදු කරනවා. ඥානසාර හාමුදුරුවන් වහන්සේ රට වෙනුවෙන් කථා කරලා, ජාතිය වෙනුවෙන් කථා කරලා අද සිරගත වී ඉන්නවා. ඔබ හිතනවා නම් ඒ කාරණය යටපත් කරන්න පුළුවන් කියලා, ඔබ හිතනවා නම් අද මේ පාර්ලිමේන්තුවේ කවුරුවත් ඒ පිළිබඳව කථා කරන්නේ නැති නිසා ඒක යටපත් වෙලා කියලා, ඒක එහෙම නොවන බව මම සඳහන් කරනවා. එදා යුද්ධය පැවැති කාලයේදීත් කිව්වා, සිංහලයාට මතක දින හතයි කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය අමතක කරන්නේ නැහැ. ඥානසාර හාමුදුරුවන් වහන්සේට සාධාරණය ඉෂ්ට කර ගැනීම වෙනුවෙන් අපට කරන්න පුළුවන් උපරිම කැප කිරීම අපි කරනවා. උන්වහන්සේ ජාතිය වෙනුවෙන්, රට වෙනුවෙන් කථා කරලායි සිරබත් කන්නේ. ඒ නිසා අපි උන්වහන්සේ වෙනුවෙන් දැඩිව පෙනී සිටිනවා කියන කාරණයත් සඳහන් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විපක්ෂය පැත්තෙන් එතුමාට තව විනාඩි 3ක කාලයක් ලබා දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වුණු විනාඩි 3ක කාලය තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒ විනාඩි 3ක කාලය එතුමාට ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමනි, ඒ අනුව ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.41]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you very much.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டு நவம்பர் மாதத்துடன், வடக்கிலிருந்து முஸ்லிம்கள் வெளியேற்றப்பட்டு 36 வருடங்களாகின்றன. இது ஏறத்தாழ ஒரு தலைமுறைக்கான காலம்; ஒரு நூற்றாண்டின் மூன்றில் ஒரு பகுதிக் காலம். இவ்விடயம் பற்றி ஒருசில விடயங்களைச் சொல்லிவிட்டு, இன்றைய விவாதத் தலைப்புக்குள் வரலாமென நினைக்கின்றேன். வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம் மக்கள் சம்பந்தமாக இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு முதன்முறையாக அறிக்கையொன்றைச் சமர்ப்பித்திருக்கிறது. அந்த அறிக்கையின் பிரதியை பாராளுமன்ற நூலகத்தில் வைப்பதற்காக இந்தச் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

1990 ஒக்ரோபர் 15 தொடக்கம் 30ஆம் திகதி வரையான காலப்பகுதியில் LTTE அமைப்பானது வடக்கு மாகாணத்திலுள்ள ஐந்து மாவட்டங்களிலும் பலநூற்றாண்டு காலமாக தமது தாயகமாகக் கொண்டு வாழ்ந்து வந்த ஒட்டுமொத்த முஸ்லிம் மக்களையும் துப்பாக்கி முனையில் வெளியேற்றியது. அக்காலப் பகுதியில் அரசின் பாதுகாப்புப் படைகள் வேடிக்கை மட்டுமே பார்த்துக்கொண்டு இருந்தன. யாழ்ப்பாணத்திலிருந்து வெளியேறுவதற்குச் சில மணித்தியாலங்கள் வழங்கப்பட்டன. மன்னாரிலிருந்து மூன்று தினங்களுக்குள் வெளியேற வேண்டுமெனச் சொல்லியிருந்தார்கள். அந்த மக்கள் தங்களுடைய சொத்துக்கள் அனைத்தையும் விட்டுவிட்டு, ஆடைகள் மற்றும் சொற்பப் பணத்துடன் மாத்திரமே வெளியேற்றப்பட்டார்கள். இவ்வாறு 70,000 -100,000க்கும் இடைப்பட்ட மக்கள் வெளியேற்றப்பட்டார்கள்.

அவர்களில் பெரும்பாலானவர்கள் புத்தளத்தில் தஞ்சம் புகுந்தபோது, புத்தளம் மக்கள் அவர்களைப் பெருந்தன்மையுடன் வரவேற்றார்கள். அதற்காக நான் இன்றும் அந்த மக்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். இவ்வாறு வெளியேற்றப்பட்டவர்களில் ஆயிரக்கணக்கானோர் இன்றும் காணி, வீடு மற்றும் வாழ்வாதாரம் இன்றித் தவிக்கின்றார்கள். இவர்கள் மீண்டும் வடக்குக்குப் போனால், இரண்டாவது தடவையாகவும் வெளியேற வேண்டிய நிர்ப்பந்தத்துக்கு உள்ளாகுவார்கள் என நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இவர்கள் அங்கிருந்து வெளியேற்றப்பட்டதற்கு ஒரேயொரு காரணம், இவர்கள் முஸ்லிம்கள் என்பது மாத்திரம்தான் என்பதை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். எனவே, சனாதிபதி விசாரணை ஆணைக்குழு ஒன்றை நியமித்து, இதன் பின்னணி, இதற்கான காரணம், இனிமேல் இப்படி ஏற்படாமல் தடுப்பதற்கான வழிமுறைகள், அவர்கள் மீண்டும் அங்கு சென்று குடியேறுவதற்குத் தேவையான ஏற்பாடுகள், அவர்கள் அங்கு போகாமல் இருப்பதற்கான காரணம் போன்றவற்றை அறிந்து, அவர்களுக்கான இழப்பீடுகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, நான் இன்றைய விவாதத் தலைப்புக்குள் வருகின்றேன்.

அத දිනට තිබුණු යෝජනා අතරින් ප්‍රධානම යෝජනාව තමයි, ගරු කථානායකතුමාට එරෙහිව තිබුණු විශ්වාස භංග යෝජනාව. එම විශ්වාස භංග යෝජනාව විවාදයට නොගැනීමෙන් මාගේත් වරප්‍රසාද කඩ වුණා කියලා තමයි මම දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හැමෝම දිගින් දිගටම කියනවා මෙම විශ්වාස භංග යෝජනාව තුළ අධිකරණයේ විනිශ්චයට භාජන වන කරුණු තිබිය නොහැකියි කියලා. කවුරු හරි දන්නවා නම් කියන්න, ස්ථාවර නියෝගවල එහෙම දෙයක් තිබෙනවාද? මොකද, මමත් නවකයෙක් නේ. ස්ථාවර නියෝගවල එහෙම දෙයක් නැහැ නේද? ස්ථාවර නියෝගවල මොනවාද තිබෙන්නේ කියලා මම කියවන්නද? ස්ථාවර නියෝගවල මෙසේ සඳහන් වනවා:

> "91. සැම මන්ත්‍රීවරයකු ම, පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබීමට නියමිත යම් ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් කථා කිරීමේ දී, මතු සඳහන් රීති දැඩි ලෙස පිළිපදිනු ලැබිය යුත්තේ ය:-"

අපි පාර්ලිමේන්තුව තුළ විවාද කරන අවස්ථාවේ කථා නොකළ යුතු දේවල් පිළිබඳව ස්ථාවර නියෝග 91 යටතේ සඳහන් වෙනවා. ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ මෙසේ සඳහන් වනවා:

> "කිසිම මන්ත්‍රීවරයකු විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් ..."

මම අලුත්කඩේ අධිකරණයේ නීතිඥ මහත්මයෙක් විධියට සහ හැමදාම practise කරන මනුස්සයෙක් හැටියට මෙය කියන්නේ. අපේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාට විරුද්ධව කිසිම අධිකරණයක විනිශ්චය වීමට හෝ එහෙමත් නැත්නම් විනිශ්චයට භාජන වීමට නඩුවක් තිබෙනවාය කියලා මම දන්නේ නැහැ. මම දන්නා තරමින් නම්, එහෙම එකක් නැහැ. තිබෙනවාද? නැහැ නේ. ඇත්තටම නඩුවක් තිබෙනවාද? නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ, යම් කිසි විධියකින් විශ්වාස භංග යෝජනාවේ සඳහන් කරුණු අධිකරණමය කාරණයක් - *sub judice* - වන අවස්ථාවක, එම විවාදයේදී මූලාසනය දරන ගරු නියෝජ්‍ය කථානායකතුමාට පුළුවන් ඒ කාරණාව පිළිබඳව කථා කරන්න එපා කියලා නියෝගයක් දෙන්න විතරයි. මමත් "Erskine May: Parliamentary Practice" එකේ හොයාගෙන, හොයාගෙන යනවා. මේක මාර කථාවක්. යෝජනාවක *sub judice* තියන්න බැහැයිලු. මේ යෝජනාවේ *sub judice* නැහැ. ඒක වෙනම

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කථාවක්. හැබැයි, යම් කිසි තර්කයක් අනුවත්, රීතියක් අනුවත් ඉදිරිපත් කරන ලද යෝජනාවක *sub judice* තිබෙන්නට බැහැයි කියන එක මහ ඔල්මාද කථාවක්. අපි කියමු, මොකක් හෝ හේතුවක් මත යම් කිසි ඇමතිවරයෙකුට විරුද්ධව විශාල දූෂණ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා කියලා. දූෂණයක් තිබුණා නම් ඔහුට අනිවාර්යයෙන් චෝදනාවක් එනවා, චෝදනාව අධිකරණයට ඉදිරිපත් කළාම නඩුකරයක් පවතිනවා, ඊට පස්සේ කියනවා නඩුව ඉවර වෙනකල් ඔහු ගැන කථා කරන්න බැහැ කියලා. කොහේද, එහෙම එකක් මෙතැන තිබෙන්නේ? මමත් මේ ඔළුව කඩාගෙන කල්පනා කරන්නේ ඒකයි. එහෙම කොතැනකවත් නැහැ. එතුමාගේ ක්‍රියාව සම්බන්ධව අපි විශ්වාස භංගයකදී කථා කරන අවස්ථාවේදී, කථා කරන ඒ කොටසේ විනිශ්චයට භාජන වන කරුණක් තිබෙනවා නම්, ඒක කථා නොකරන්න කියලා නියෝගයක් කරන්න පුළුවන්. ඊට පස්සේ මම කියන්නම් තවත් දෙයක්.

ස්ථාවර නියෝග 27(2)හි මොකක්ද සඳහන්ව තිබෙන්නේ? එහි මෙසේ සඳහන්ව තිබෙනවා.

> "රීති විරෝධී යැයි කථානායකවරයා විසින් තීන්දු කරනු ලබන යම් ප්‍රශ්නයක් හැර මහ ලේකම්වරයාට දැනුම්දීම් ලැබී ඇති සියලු ප්‍රශ්න, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින හතක් ඉකුත් වන්නට මත්තෙන් නොයෙදෙන දිනයක දී පිළිතුරු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය:"

දැන් අපි කථානායකතුමා ගැන මොනවා හරි ප්‍රශ්නයක්, එහෙම නැත්නම් යෝජනාවක් ඉදිරිපත් කළොත්, ඒක නවත්වන්න පුළුවන් කථානායකතුමාට විතරයි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මෙයයි. විශ්වාස භංගය ගේන්නේ කථානායකතුමාට විරුද්ධවයි. එතකොට නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ. මාර වැඩේ! එතුමා බලනවා, මේ තිබෙන යෝජනාව ගත්තොත් මගේ සායම නැති වෙයි, මේ යෝජනාවේ ගොඩක් දේවල් තිබෙනවා, මෙතැන ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටවත් මාව බේරාගන්න බැරි දේවල් තමයි මේ යෝජනාවේ තිබෙන්නේ, හොඳම වැඩේ මේක මෙතැනින්ම නැති කරන එක කියලා. එම නිසා දැන් කථානායකතුමාට විරුද්ධව තිබෙන විශ්වාස භංග යෝජනාව විවාද කරන්න කථානායකතුමාම ඉඩ දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිගින් දිගටම දැන් අලුත් කථාවක් යනවා, මේ Parliamentary Business Committee එක ගැන. අනේ, මම නම් මේ පාර්ලිමේන්තුවට නවකයෙක්. නමුත්, මම මේක අහන්න ඕනෑ. Parliamentary Business Committee එකට පුළුවන්ද, ඉදිරිපත් කර තිබෙන යෝජනාවක්, ප්‍රශ්නයක් out of Orderද, in Orderද, න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුද, නැද්ද යන්න තීරණය කරන්න? එහෙම කොහේද තිබෙන්නේ? කථානායකතුමාටයි, මහ ලේකම්තුමියටයි තිබෙන බලතල මේ Parliamentary Business Committee එකට නැහැ. Parliamentary Business Committee කියන්නේ, යම්කිසි දෙයක් න්‍යාය පත්‍රයට ඇතුළත් කළාට පස්සේ, ඒක කවදා විවාදයට ගත යුතුද, ඒ සඳහා කොපමණ වෙලාවක් ලබා දිය යුතුද යන පටිපාටිය පිළිබඳව තීන්දු කිරීම මිසක්, Parliamentary Business Committee එකට බැහැ, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කරගෙන තීන්දු තීරණ ගන්න. එහෙම කරන්න බැහැ.එහෙම වුණාම මෙතැන හරි ප්‍රශ්නයක්. දැන් මගේ වරප්‍රසාදත් කඩවෙලා තිබෙන්නේ. එහෙම නම්, අනිවාර්යයෙන්ම මේ යෝජනාවයි, අද දින ගෙනාපු වරප්‍රසාද ප්‍රශ්නයි නැති කළේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒක කළේ ඇයි? තමාට විරුද්ධව යෝජනාවක් ගෙනාවොත් එතුමා ඒක නැති කරනවා. එතකොට මේක ප්‍රජාතන්ත්‍රවාදය ද? එතකොට අපට කවදාවත්, කොහොමවත් මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කරන්න ලැබෙන්නේ නැහැ.

පාර්ලිමේන්තුවේ සේවය කරමින් හිටපු නිලධාරියෙක්, ඔහුගේ Court of Appeal නඩුවේදී මේ කරුණු කියලා තිබෙනවා. ඒ කරුණු කිව්වේ ඔහුගේ විත්තිවාචකයට. කථානායකතුමාට විරුද්ධව නඩුවක් ඉදිරිපත් කළේ නැහැ. ඉදිරිපත් කරලා තිබෙන එකම පැමිණිල්ල ඉදිරිපත් කර තිබෙන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් නඩුවක් තවම ඉදිරිපත් කරලා නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කියන්නේ අධිකරණයක් නොවෙයි. අධිකරණ කටයුත්තක් පිළිබඳව කථා කිරීම හැර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද විෂය කරුණක් පිළිබඳව කථා කරන්න බැහැ කියලා කොතැනකදීවත් කියලා නැහැ. මට මේක හිතාගන්න බැහැ. මේක සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධියි. එතකොට මේකෙන් අන්තිමට වුණේ මොකක්ද දන්නවාද? දැන් කියා තිබෙනවා, සාමාන්‍යයෙන් කථානායකතුමාට හෝ අග්‍ර විනිශ්චයකාරතුමාට හෝ විනිශ්චයකරුවන්ට විරුද්ධව මෙතැන කථා කරන්න දෙන්නේ නැහැ කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකේ කියලා තිබෙනවා, "except upon a substantive motion" කියලා. යම්කිසි යෝජනාවක් ලිඛිතව ඉදිරිපත් කරන අවස්ථාවක හැර, ඒ පිළිබඳව කථා කරන්න බැහැ. අද උදේ ඉඳලා මේක කළේ. ඇයි ඒ? අද උදේ ඉඳලාම ආණ්ඩු පක්ෂයේයි, විපක්ෂයේයි ඔක්කෝම මන්ත්‍රීවරුන් කථා කළේම ස්ථාවර නියෝගවලට විරුද්ධව. ඇයි? එහෙම තමයි වෙන්නේ. නීත්‍යානුකූලව අවස්ථාවක් ලබා දුන්නේ නැත්නම්, ස්ථාවර නියෝග ගැන කථා කරමින් තමයි පටන් ගන්නේ.

මේ, පළමුවැනි අවස්ථාව නොවෙයි නේ. මේ ආණ්ඩුවේ අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමාට විරුද්ධව අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව ආණ්ඩුව කියවා බැලුවාම තේරෙන්න ඇති, මේක හරියන්නේ නැහැ, වැඩේ ටිකක් බරපතළයි, මේවා කථා කරන්න ගියොත් අපි හිර වෙනවා කියලා. ඊට පස්සේ ඒකට පොඩි technical game එකක් දාලා, අපිවත් මෝඩයාට අන්දවලා, ආ, නියෝජ්‍ය ඇමතිවරයකුට විරුද්ධව ඒ විශ්වාස භංගය ගන්න බැහැ කියලා කොහෙන්දෝ එකක් අරගෙන ඒ විවාදය නැවැත්වුවා. ඒ, පළමුවැනි වතාව. මේ, දෙවැනි වතාව. කථානායකතුමාට විරුද්ධව චෝදනා පනස් ගණනක් තිබෙනවා. දැන් මිනිස්සු බලනවා, කථානායකතුමා සම්බන්ධයෙන් චෝදනා පනස් ගණනක් තිබෙනවා; එච්චර ලොකු වරදක් මේ කථානායකතුමා කරලා ද කියලා. ඊට පස්සේ කියනවා, ඒකේ තිබෙන සමහර කරුණු සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දීපු complaint එකේ තිබෙනවා කියලා. ඒක ඉතින් ස්ථාවර නියෝගවලට විරුද්ධ නැහැ නේ. මේ පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලයේ මහත්මයෙකු අභියාචනාධිකරණය ඉදිරියේ තමාගේ විත්තිවාචකය වෙනුවෙන්, තමාට විරුද්ධව විනය පරීක්ෂණයක් කිරීම නීති විරෝධීය කියන්න ඉදිරිපත් කරපු affidavit එකේ ඉදිරිපත් කර තිබෙන කරුණු කිහිපයක් මේ යෝජනාවේ තිබෙනවා කියනවා. ඒක, කථානායකතුමාට විරුද්ධව ගොනු කරපු නඩුවක් නොවෙයි. තමාට විරුද්ධව ගන්නා ලද තීරණය පිළිබඳව ඔහුට තිබෙන විත්තිවාචකයක්. ඒක ඇදගෙන ඒ affidavit එකේ මේ කරුණු තිබෙනවා කියලා මේක *sub judice* ලු. අනේ, මේ *sub judice*, එහෙම නැත්නම් විනිශ්චයට භාජන වන කරුණු කියන එක පිළිබඳව සිංහලෙන් ඉතා ලස්සනට කියා තිබෙනවා. ස්ථාවර නියෝග 91 යටතේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා,

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

"විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව" කියලා. මේක තීන්දුව දීමට නියමිතත් නැහැ, විනිශ්චයට භාජන වෙලාත් නැහැ. අඩුම ගණනේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මඟින් කථානායකතුමාට විරුද්ධව නඩුවක් ගොනු කරලාවත් නැහැ. හැබැයි අපට සැකයක් මතුවනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම, එතුමාට විරුද්ධව තිබෙන කරුණු මඟින් අධිකරණ ක්‍රියාමාර්ගයක් හෝ එහෙම නැත්නම් මහෙස්ත්‍රාත් අධිකරණයේ හරි මහාධිකරණයේ හරි චෝදනා ඉදිරිපත් කරයි ද කියලා. එහෙම කළොත් නේ, බෙරාගන්න පුළුවන් වන්නේ. මේක සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩක්. මම බලාපොරොත්තු වුණේ නැහැ, මේ වාගේ බරපතළ චෝදනා තිබියදී මෙහෙම දෙයක් කරයි කියලා.

මිනිස්සු මෙච්චර දවසක් මේක ගණන් ගත්තේ නැහැ. නමුත් අද මේ ඇති වුණු ගාලගෝට්ටියත් එක්ක මේ යෝජනාවේ තිබෙන්නේ මොනවාද කියලා මිනිස්සු දැන් හොයන්න පටන් ගන්නවා. ඒක හොඳයි, විරුද්ධ පක්ෂයට. මොනවාද මේකේ තිබෙන්නේ, මොනවාද මේකේ තිබෙන කරුණු කියලා මිනිස්සු හොයන්න පටන් ගන්නවා. එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් භාර දුන්නාම ඒකේ නීතිමය ප්‍රශ්නයක් තිබෙනවා නම්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ ලේකම් මණ්ඩලයෙන් ඒ පිළිබඳව අදහසක් විමසා ඒ අනුව කටයුතු කරනවා මිසක් තමන්ගේ නඩු තමන්ම කරන, "නඩුත් භාමුදුරුවන්ගේ බඩුත් භාමුදුරුවන්ගේ" විධියට වැඩ කරන එක වැරදියි කියමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.55]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තැබීමේ විවාද දෙකක් තිබුණා වාගේ තමයි අවසානය වනකොට පෙනෙන්න තිබෙන්නේ. විපක්ෂය, ඔවුන්ට ඉදිරිපත් කරන්න තිබුණු කාරණා වෙනත් ආකාරයකට ඉදිරිපත් කර ගත්තා. ඒක එක විවාදයක්. ඒ වාගේම නිශ්චිත විෂයගත විවාදය වුණේ, අපනයන වර්ධනයවීම් පිළිබඳව සහ ඉන් ඉස්සරහට යන්න අවශ්‍ය යෝජනා පිළිබඳ විවාදයයි.

මම ප්‍රධාන වශයෙන් විපක්ෂයේ විවාදය ගැන කියන්න ඕනෑ. විපක්ෂයේ විවාදයට විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අද දවසේදී මුහුණ දීපු ආකාරය සාරාංශයක් ලෙස අරගෙන ඒ ගැන කථා කළොත්, ඒක තමයි අපේ රටේ විපක්ෂයට සිදුවෙලා තිබෙන්නේ. ඉදිරි අවුරුදු තුනේදීත් විපක්ෂයට සිදු වන්නේ මොකක්ද කියන එක ඉතාම සංකීර්ණතව, කෙටියෙන් බලාගන්න පුළුවන්, අද උදේ සහ දැන් තිබෙන තත්ත්වය දිහා බැලුවාම. ලොකු සද්දයක් දමලා, මහා ඝෝෂාවක් කරලා, පොළොවේ පස් කාලා, යන්නේ නැහැ මේක ඉවර කර ගන්නකල් වාගේ දැවැන්ත විධියට සටන්කාමීව තමයි මේ කටයුත්ත පටන් ගත්තේ. නමුත් දැන් ගයන්න කරුණාතිලක මන්ත්‍රීතුමාත් නැත්නම්, කලින් කථා කරපු කාරියප්පර් මන්ත්‍රීතුමාත් නැත්නම් විපක්ෂයේ කවුරුවත් මෙතැන නැහැ. අවසානයේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විතරයි ඉන්නේ. එක වෙලාවක එතුමාත් හිටියේ නැහැ. ඒකට තමයි විපක්ෂයේ ගැම්ම කියන්නේ.

පා ගමනක් යන්න පටන් ගත්තත් එහෙමයි. පා ගමන නුවරින් පටන් ගත්තොත් කොළඹට එනකොට හැරමිටිය විතරයි. උද්ඝෝෂණයක් පටන් ගත්තත් එහෙමයි. උපවාසයක් පටන් ගත්තත් එහෙමයි. මැතිවරණයක් පටන් ගත්තත් මෙහෙම තමයි. ඔන්න බලන්නකෝ, මේ රටේ මැතිවරණයක් - ඊළඟ ජනාධිපතිවරණය හෝ මහ මැතිවරණය - පටන් ගත්තත් එහෙමයි. මාධ්‍ය සාකච්ඡාවක් තිබ්බොත් නායකයෝ ටික පෙළට ඉන්නවා, stage එක පිරෙන්න. හැබැයි, ටික වෙලාවක් යනකොට එක එක්කෙනා බැහැලා යනවා. ඒකත් එහෙම තමයි. මේගොල්ලන් මේ ජාතියේ වැඩ සතියකට සැරයක් විතරයි plan කරන්නේ. හෝටලයකට හරි වෙන කොහේ හරි තැනකට ගිහිල්ලා, කාලා බීලා දැවැන්ත සාකච්ඡාවක් පවත්වා සතියකට විතර යම් දෙයක් plan කරනවා. හෙට ආණ්ඩුව පෙරළනවා කියලා කථා කරනවා. මේගොල්ලන්ට ඒවාට උදව් කරන කණ්ඩායමක් එළියේත් ඉන්නවා. ඒගොල්ලන් තමයි මේවාට යටින් මත හදන්නේ. එළියේ ඉන්න කණ්ඩායමට මේගොල්ලන් අනුවුණා. හිනාත් යනවා නේද, කාරියප්පර් මන්ත්‍රීතුමනි? එළියේ ඉන්න කණ්ඩායම මේකට මරු මත හදනවා; මෙහෙම ගිහිල්ලා දෙන්න කියලා එක එක මත හදනවා. එහෙම මත හදලා, එළියේ ඉන්න කට්ටියගේ මත මෙහේට ගෙනෙන එක්කෙනා තමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඔහු තමයි ඒ මත මෙතැනට ගෙනෙන්නේ. ඒවා ගෙනැල්ලා මෙතැන හදනවා, වැරදි මතයක්. මෙහෙම, මෙහෙම කරන්න කියනවා, පෝස්ටර් හදලා දෙනවා. මම දැක්කා, කවින්ද ජයවර්ධන පෝස්ටරය අනෙක් පැත්තට අල්ලාගෙන ඉන්නවා; පෝස්ටරය අනෙක් පැත්තට අල්ලාගෙන ඉන්නවා, කවින්ද ජයවර්ධන. ඒ කියන්නේ, තේරෙන සිංහලෙන් කිව්වොත්, පෝස්ටරය අල්ලන්න ඕනෑ පැත්තවත් දන්නේ නැහැ. පව් අප්පා! අඩුම තරමින් පැය 4ක්, 5ක් එක වැඩක් හරියට කරන්නකෝ. මොකද, මෙතැන කඳුළු ගෑස් - tear gas - ගහනවාද? අද පාර්ලිමේන්තු රැස්වීම් දවසක් නේ. අපි මේ පාර්ලිමේන්තුවේ කොච්චර උද්ඝෝෂණ කරලා තිබෙනවාද, වැඩේ ඉවර වනකල්?

විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගයන්න කරුණාතිලක මැතිතුමනි, උදේට එනකොට අඩු තරමින් හවස පහ වනකල් ඉන්න අනිවාර්යය කරලා විපක්ෂයේ අය එක්කගෙන එන්න. විපක්ෂයේ ඉන්න ටික දෙනාට අනිවාර්යය කරන්න, වෙන මුකුත් එපා, හවස පහ වෙනකල් පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ කියලා. ඔයගොල්ලන්ගේ උද්ඝෝෂණයේ පළමුවෙනි උද්ඝෝෂණය ඒක තමයි.

අනෙක, මේවා කැලෑ පත්තර නේ. මේවාට විශ්වාස භංග කියන්න පුළුවන්ද? විශ්වාස භංග නම් විශ්වාස භංගයක් ගෙනෙන්න ඕනෑ. කැලෑ පත්තර නේ මේ ගෙනැල්ලා තිබෙන්නේ. මොනවාද මේ කියන්නේ? මේ කාරණය අපි වාගේම ඔබතුමාත් හොඳටම දන්නවා. මේ පාර්ලිමේන්තුවට උත්තරීතර පාර්ලිමේන්තුව කියන්නේ ඇයි? ජනතා පරමාධිපත්‍යය නියෝජනය කරන නිසාත්, උත්තරීතරභාවය නියෝජනය කරන නිසාත් තමයි මේ පාර්ලිමේන්තුවට උත්තරීතර පාර්ලිමේන්තුව කියලා කියන්නේ. අපි කැමැති වුණත්, අකැමැති වුණත් ඒක නියෝජනය කරන මූලාසනය තමයි මෙතැන තිබෙන්නේ. ඒ, ගරු කථානායකතුමාගේ ආසනය.

ඉතිහාසයේ අපේ පාර්ලිමේන්තුවේ හිටපු කථානායකවරු ගැන අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමා යටතේ, ජෝශප් මයිකල් පෙරේරා හිටපු කථානායකතුමා යටතේ මම මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. වි.ජ.මු. ලොකුබණ්ඩාර හිටපු කථානායකතුමා වාර දෙකක් එම ධුරයේ හිටියා. ඒ වාගේම චමල් රාජපක්ෂ හිටපු කථානායකතුමා යටතේ, කරු ජයසූරිය හිටපු කථානායකතුමා යටතේ වාගේම මහින්ද යාපා අබේවර්ධන හිටපු කථානායකතුමා යටතේ මම මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. ඒ කථානායකතුමන්ලාගේ පෞද්ගලික ජීවිත තිබෙනවා, විවිධ චර්යාවන් තිබෙනවා, විවිධ හැසිරීම් තිබෙනවා. අපට ඒවා ගැන විවේචනයක් තිබුණේ නැහැ. අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමා ගත්තොත් එක character එකක්. හැබැයි, එතුමාගේ පාර්ලිමේන්තු දායකත්වය ගැන අපට විශිෂ්ටභාවයක් තිබුණා. අපට එතුමා ගැන විශිෂ්ටභාවයක් තිබුණා. එතුමාට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුණා.

ඊළඟට, අපේ වි.ජ.මු. ලොකුබණ්ඩාර හිටපු කථානායකතුමා තව character එකක්. එතුමා එක විධියක්. ඉතාම විහිළු තහළුවෙන් මේ සභාව හසුරුවපු වෙන අනන්‍යතාවක් එතුමාට තිබුණේ. එතුමාත් එක්ක අපි විදේශ ගමන් බිමන් ගිහිල්ලා තිබෙනවා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, මමත් එතුමාත් එක්ක විදේශ ගමන් බිමන් ගියා. හැබැයි, ඒවාට අපි විශ්වාස භංග ගෙනාවේ නැහැ.

මහින්ද යාපා අබේවර්ධන හිටපු කථානායකතුමා ගත්තොත්, එතුමාත් එක විධියක්. එතුමා මුහුණ දුන් දේශපාලන පසුබිම යටතේ එතුමාගේ කාර්ය මණ්ඩලය, එතුමාගේ කටයුතු ගැන අපට දේශපාලන වශයෙන් ප්‍රශ්නයක් තිබුණා.

මම මේ පාර්ලිමේන්තුවේ කථානායකවරයෙකු හැටියට විවේචනය කරපු එකම කථානායකතුමා තමයි, චමල් රාජපක්ෂ හිටපු කථානායකුමා. හැබැයි, ඒකත් එතුමා මූලාසනයේ ඉද්දී නොවෙයි, ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට - කථානායක ධුරය නැතිව - එයාර්බස් මිලදී ගැනීමේ ගනුදෙනුවට අදාළව එතුමාගේ නිල නිවාසයට COPE එක කැඳවපු එක ගැන. එයාර්බස් මිලදී ගැනීමේ ගනුදෙනුවට අදාළව කථානායක නිල නිවාසයේ COPE එක කැඳවීමට ඉඩ දීම ගැන මගේ විවේචනයක් තිබුණා. COPE එකේ හිටපු සභාපතිවරයෙකු හැටියට මම ඒකට විවේචන ඉදිරිපත් කළා. හැබැයි, චමල් රාජපක්ෂ හිටපු කථානායකතුමාගේ පෞද්ගලික චර්යාවන් ගැන මට විවේචනයක් නැහැ. එහෙම එතුමා ගැන අපි කථා කරලා නැහැ. හැබැයි, එතුමා එක්කත් අපි හොඳට ගනුදෙනු කරලා තිබෙනවා. එතුමාත් හොඳ කථානායකතුමෙක්. සභාව හසුරුවා ගැනීමේදී ආණ්ඩු බලය පාවිච්චි කර ගැනීම වෙනුවෙන් වාගේම පාර්ලිමේන්තුවේ අනන්‍යතාවන් වෙනුවෙන්, පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය වෙනුවෙන්, අපි කාගෙත් අයිතීන් වෙනුවෙන් එතුමා බොහෝ අවස්ථාවල පෙනී ඉඳලා තිබෙනවා. මම දන්නවා, චමල් රාජපක්ෂ හිටපු කථානායකතුමා මූලාසනයේ වාඩි වෙලා ඉන්නකොට - මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් එක්ක, ඒ පවුල් බලය මෙතැන තිබෙද්දී - අපට දෙන්න පුළුවන් වුණේ ඉතා සීමිත ඉඩකඩක් බව. ඒ ඉඩකඩ දුන් එකත් ලොකු දෙයක්, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

මොකද, එතැන තිබුණු බල ප්‍රවාහය දැවැන්ත එකක්. බැසිල් රාජපක්ෂත් ආණ්ඩුව පැත්තේ හිටියා. ඒත් එතුමන්ලා ඒ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කථානායක" කියන ධුරය අපි සලකන්නේ පොදු දෙයක් හැටියට. දැන් මෙතුමන්ලාට ඕනෑ වෙලා තිබෙන්නේ මොකක්ද? මෙතුමන්ලාට ඕනෑකම තිබෙන්නේ මේ රටේ තිබෙන දේශපාලන ස්ථාවරභාවය, විනිවිදභාවය, අපේ ආණ්ඩුවේ තිබෙන අදුෂිතභාවය පිළිබඳව මඩ ගොඩක් ගහන්න, ඒකට කැලැලක් ඇති කරන්න සහ ඒකට නිකම් කැලෑ පත්තරයක් ගහන්න. සමහර වෙලාවට ගමේ එහෙම ගෑනු අය ඉන්නවා. "ගෑනු" කියලා මම කියන්නේ අවඥාවට ලක් කරන්න හරි, නොසැලකිල්ලක් නිසා හරි එහෙම නැත්නම් අපහසුතාවට පත් කරන්න නොවෙයි. ඒ අය ගිහිල්ලා පිළිවෙළකට ඉන්න ගෑනු කෙනෙකුට මොකක් හරි අපහාසයක් කරන්න ගම පුරා නිකම් දෙයක් කියාගෙන කියාගෙන යනවා. හන්දියට ගිහිල්ලා, දන්නේ නැහැ, ආරංචි නැහැ, අන්න අරහෙමයි මෙහෙමයි අරගොල්ලන්ගේ දැන් හැටි කියලා කියමින් යනවා. ඒක සිය වතාවක්, දහස් වතාවක් විතර කියනකොට "ගොබෙල්ස් න්‍යාය" බවට පත් වෙනවා. කාරියප්පර් මන්ත්‍රීතුමා දැන් කිව්වේ ඒකයි. දැන් මිනිස්සු කල්පනා කරනවා වාගේම හිතනවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ, මේ පාර්ලිමේන්තුවේ කථානායක සම්බන්ධව මොකක් හරි වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ ඒගොල්ලන් දන්නවා, මේක සමාජය පිළිගන්නේ නැහැ, ජනතාව පිළිගන්නේ නැහැ කියන එක. එහෙම පිළිගන්නේ නැති වුණත් දැන් කියනවා, මේක පිළිගන්න, මෙතැනත් කවල් එකක් කියලා. මොකද, සතියක් පවතින විධියේ දේවල් කියන්න බැහැ. දැන් මේ සතියට තෝරාගෙන තිබෙන එක කාරණයක් තමයි, මේ. මොනවා හරි කාරණයක් තෝරා ගන්නවා. ඒ කියන්නේ ඒ පාර්ලිමේන්තු සතියට තෝරා ගත්ත දේවල් පැය 5ක්වත් පවත්වා ගෙන යන්න බැහැ නේ. පුදුමේ කියන්නේ ඒක නේ.

අද උදේ පටන් ගත්ත සද්දෙ අනුව සෙංකෝලයත් උස්සාගෙන යන්න හැදුවා. සෙංකෝලය උස්සාගෙන ගිහිල්ලා පාර්ලිමේන්තුව අක්‍රිය කරන්න හැදුවා. ඒ කියන්නේ, විශ්වාස භංග යෝජනාව විවාද කරන්න දෙන්නේ නැත්නම් පාර්ලිමේන්තු රැස්වීම් නැහැ කියන එක කරන්න තමයි ලැහැස්ති වුණේ. මේ, සෙංකෝලය තිබෙන්නේ අපූරුවට. දෙදෙනෙකුටවත් ඇවිල්ලා මේ සෙංකෝලය ගෙනියන්න කියන්නකෝ. මේක ගෙනියන්න හතරදෙනෙකුට එන්න කියන්නකෝ. කෝ, මෙතැන දඟලපු කට්ටිය කවුරුවත් දැන් නැහැ නේ. දැඟලිල්ලේ සද්දේ හැටියට දැන් ඒ අය මෙතැනට එන්න එපායැ. හවස් වෙනකොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නැති වෙයි, වෙත්‍රධාරිතුමන්ලා තේ බොන්න ගිහිල්ලා ඇති කියලා හිතලා සෙංකෝලය උස්සාගෙන යන්න හවස එන්න එපායැ, කට්ටියම ඉන්න වෙලාවේ දඟලපු දැඟලිල්ලේ හැටියට. ගමේ භාෂාවෙන් අපි ඒකට දෙයක් කියනවා. ඒක මෙතැන කියන්න හොඳ නැහැ. මොකද, පාර්ලිමේන්තු භාෂාවට ඒක ගැළපෙන්නේ නැහැ. ඒ කියන්නේ මේගොල්ලන්ගේ දවසේ පුස් වෙඩිල්ල තමයි මේක. ලබන පාර්ලිමේන්තු වාරයට තව කාරණයක් හොයා ගන්න වෙනවා. ඒ ක්‍රමයට තමයි මේගොල්ලන් කටයුතු කරන්නේ.

දැන් අපේ මාතෘකාව වන අපනයන ක්ෂේත්‍රය ගැන කථා කළොත් ඇත්තටම ඒ ගැන කියන්නත් සන්තෝෂයි. මේ, ලෝක ආර්ථික වර්ධන වේගය අර්බුදයක තිබෙන වෙලාවක්. විශේෂයෙන් ලෝක අපනයන වර්ධන වේගය තිබෙන්නේ සියයට 3.9ක අගයක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට මුළු ලෝකයේම සාමාන්‍ය අපනයන වර්ධන වේගය තිබෙන්නේ සියයට 3.9ක අගයක. අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා, ඒක සියයට 5ක අගයකට පවත්වාගෙන යන්න. අපි රටක් හැටියට ඒ ගැන සතුටු වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම මැද පෙරදිග යුද්මය තත්ත්වයක් යටතේ, ඒ වාගේම තෙල් අර්බුදයක් යටතේ - අපේ ආණ්ඩුවට කරගන්න බැරි වෙලා තිබෙන ගොඩක් දේවල් ගැන මෙතුමන්ලා කිව්වා - අපේ අපනයන වර්ධන වේගය සාර්ථක මට්ටමක තිබෙනවා කියන එක එතුමන්ලාත් පිළිගන්නවා. ඒක තමයි විශේෂත්වය. මේක සැප්තැම්බර් මාසයේ ඇති වුණු ප්‍රශ්නයක් විතරක් නොවෙයි. ඔබතුමන්ලා කියන 2024 සැප්තැම්බර් මාසයත් එක්ක හිතනකොට මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ අපනයන වර්ධන වේගය සියයට 17.23ක්. ඒක අපි ලැබූ වර්ධනයක්. හැබැයි මෙහි

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

විශේෂත්වය තමයි, ඇමෙරිකාවේ සම්බාධක යටතේ, මැද පෙරදිග අර්බුදයක් යටතේ, අපනයනවල නිෂ්පාදන වියදම වැඩි වෙලා තිබියදී කියන සියලු තත්ත්වයන් යටතේ මේ අවුරුද්දේ අපේ අපනයන වර්ධන වේගය අඛණ්ඩව පවත්වාගෙන යන්න අපට පුළුවන්කම ලැබුණු එක. ඒකෙදි අපි බලාපොරොත්තු වන දේ මොකක්ද? 2024 අවුරුද්දේ අපේ ඉලක්ක අපනයන ආදායම විධියට තිබුණේ ඩොලර් බිලියන 16.3යි. 2025 අවුරුද්දේ අපනයන ආදායම ඩොලර් බිලියන 17.3යි. මේ අවුරුද්දේ මේ මාස නවය තුළ අපනයන ආදායම ඩොලර් බිලියන 13.6යි. අපි බලාපොරොත්තු වෙනවා, 2026 අවුරුද්ද අවසානය වනවිට එය ඩොලර් බිලියන 18.5ක් දක්වා වැඩි කරගන්න. සාමාන්‍ය තත්ත්වය තිබුණා නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් බිලියන 20ක අපනයන ආදායමක් අපි ඉලක්ක කරලා තිබුණා. අපේ ඉලක්කය තමයි 2030 වෙනකොට ඩොලර් බිලියන 36ක අපනයන ආර්ථිකයක් හදන එක. සියලු අමාත්‍යාංශ ඒකාබද්ධව කථා කරමින් තමයි ඒ අපනයන ආර්ථිකය හදන්න අවශ්‍ය කරන වටපිටාව අපි සකස් කරගෙන යන්නේ. අපි ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් අරගෙන තිබෙනවා. මොන තත්ත්වයන් යටතේ වුණත් ඒ ප්‍රතිපත්තිමය තීරණ වෙනස් කරන්නේ නැහැ. අවුරුදු 28කට පස්සේ ජනාධිපතිතුමා අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල සභාව කැඳෙව්වා. අපි මාස තුනකට සැරයක් Exporters' Forum එක පවත්වනවා. Exporters' Forum එකට අමාත්‍යාංශ නවයක අමාත්‍යාංශ ලේකම්වරු සහභාගි වෙනවා. ඊට අමතරව රාජ්‍ය ආයතන ගණනාවක නිලධාරීන් සහභාගි වෙනවා. පසුගිය සැප්තැම්බර් මාසයේ 20වැනි දා අපි "ViYASA" මධ්‍යස්ථානය ආරම්භ කළා; අපේ රටේ ව්‍යවසායකයන්ට, කර්මාන්තකරුවන්ට one-stop centre එකක් හැටියට දැන් තොරතුරු ලබා දෙනවා. ඒ වාගේම අපනයන සංවර්ධන මණ්ඩලය අනෙකුත් අමාත්‍යාංශත් එක්ක, විශේෂයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා කටයුතු කරනවා. තානාපති සේවාවන් එක්ක අපි නිරන්තරයෙන් ගනුදෙනු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

ඒ වාගේම තමයි අපි අමාත්‍යවරු හැටියට යම් රටකට යනවා නම්, ඉස්සර වෙලා ඒ රටේ තානාපති සේවයත් එක්ක සාකච්ඡා කරලා, ඒ රටේ අපි කළ යුතු දේවල් මොනවාද යන්න පිළිබඳව සැලසුමක් හදලා, අවශ්‍ය නිලධාරීන් තෝරාගෙන තමයි යන්නේ. මම ඉතාම කෘතවේදීව කාරණයක් කියන්න ඕනෑ. මේ මෑතකදී මම සහභාගි වුණා ජපානයේ සාකච්ඡාවකට. ජපානයේ අපේ තානාපති මහාචාර්ය ජනක් කුමාරසිංහ මැතිතුමා තමයි සූදානම් කළේ ඒ සහභාගි වූ සම්පූර්ණ සාකච්ඡාව. JETRO එක, JOGMEC එක, JICA එක සහ METI කියන ජපානයේ ආයෝජන සම්බන්ධව තිබෙන ප්‍රධාන ආයතන හතරක් ඒකාබද්ධ කරගෙන, අපේ රටේ ඛනිජ සම්පත් - mineral - ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පවත්වපු සාකච්ඡාවට ජපන් ආයෝජන සමාගම් 103ක් සහභාගි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පළමුවැනි වතාවට, අපේ ඛනිජ සම්පත් ජපානයේ ප්‍රචලිත කිරීම සඳහා අපි සාකච්ඡාවක් පැවැත්වුවා; අපෙන් අපනයනකරුවන් 15දෙනායි, ජපානයෙන් ආයෝජන සමාගම් 103යි. මිට්සුයි ආයතනය, නිපෝන් ෆ්‍රැෆයිට් ඉන්ඩස්ට්‍රීස් ආයතනය ආදී විශාල සමාගම් ඒ සඳහා සහභාගි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉලක්කයක් එක්ක යන්නේ. අපේ බලාපොරොත්තුව තමයි මොන තත්ත්වයන් යටතේ හරි රටේ අපනයන සංවර්ධනය ස්ථාවරව පවත්වාගෙන යන එක. ඔබතුමන්ලාගේ හීනය තමයි, ලබන අවුරුද්ද වෙනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සල්ලි නැති වෙනවා, එතකොට ණය ගෙවා ගන්න බැරි වෙනවා, ඩොලර් බිලියන 1.5ක් අමතරව හොයන්න වෙනවා, ඒක හොයා ගන්න බැරි වෙනවා, ඒක හොයා ගන්න බැරි වෙලා, බඩු මිල වැඩි වෙලා, රට කඩාගෙන වැටෙන්න ඕනෑ කියන එක. අපේ ප්‍රාර්ථනාව, ඒකේ අනෙක් පැත්ත. ඒ තමයි, එම ඩොලර් බිලියන 1.5ත් සූදානම් කරගෙන, අපේ මූලික අමුද්‍රව්‍ය මට්ටමේ තිබෙන නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගැළපෙන ආකාරයට ඉදිරිපත් කරලා, අලුත් වෙළෙඳ පොළ හොයාගෙන අපේ අපනයන ක්ෂේත්‍රය වර්ධනය කරලා, රටේ ආර්ථිකය ස්ථාවර කිරීම. අපි ඒ වෙනුවෙන් මැද පෙරදිග කලාපයේ රටවල් එක්ක සාකච්ඡා කරනවා; ආසියා පැසිෆික් කලාපයේ රටවල් එක්ක සාකච්ඡා කරනවා. අප්‍රිකාවෙන් අපට අලුත් වෙළෙඳ පොළ හම්බ වෙලා තිබෙනවා. අවුරුදු විසි ගණනකට පස්සේ අපි ලබන ජනවාරි මාසයේ 14වැනි දා සිට 17වැනි දා දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා - BMICH - පරිශ්‍රයේදී "Sri Lanka Expo 2027" ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනය පවත්වනවා. ඒකේ දින තුනක් අපි සම්පූර්ණයෙන්ම වෙන් කරලා තිබෙන්නේ, විදේශීය ආයෝජකයන් හමු වීම සඳහා; buyer-seller meetingsවලට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි බලාපොරොත්තු වෙනවා, ආයෝජකයන් 1,500ක් කැඳවා ගන්න. කියන්න සතුටුයි, දැනටත් 600ක් register වෙලා තිබෙනවා. ඉතින් ඒ කාර්යය අපි කරනවා. ඒ නිසා මේක මේ හිතලුවක් නොවෙයි. අහම්බයක් නොවෙයි. ඔබතුමන්ලා කියන්න වාගේ මේක අපේ වාසනාවට ආපු දෙයක් නොවෙයි, ඉතාම අමාරු ආර්ථිකයක්. කාබාසිනියා කරලා, විනාශ කරලා දමපු, රටේ කර්මාන්තකරුවන්ගේ, අපනයනකරුවන්ගේ විශ්වාසය බිඳ වැටිලා කර්මාන්ත දමලා යද්දී නැවත කැඳවා ගත්ත ආර්ථිකයක්. කොටින්ම ගත්තොත්, ඔබතුමන්ලාගේම ව්‍යාපාරිකයෝ. එක්සත් ජාතික පාක්ෂික ව්‍යාපාරිකයෝ. එහෙම නේ. සාමාන්‍යයෙන් අපේ රටේ පන්ති අර්ථයෙන් ගත්තොත්, ඔබතුමන්ලාගේ පන්තියේ අය නේ, ව්‍යාපාර පන්තිය. අපේ පන්තිය නොවෙයි නේ. හැබැයි, ඒ අය තමයි දැන් මේ ආර්ථිකය නග්ගලා ගන්නේ. ඒ අය තමයි අපනයන ආර්ථිකය නග්ගන්න දායක වෙන්නේ. මොකද, ඒගොල්ලන්ට මේ විනිවිදභාවය - transparency - තුළ විශ්වාසයක් තිබෙනවා, ඔබතුමන්ලාට වඩා. අපි ඒක හදනවා. ඒ නිසා අපේ විවාදය අද සාර්ථකයි. සමාවෙන්න, ඔබතුමන්ලාගේ විවාදය අසාර්ථකයි.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.13ට, 2026 නොවැම්බර් 04වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.
அதன்படி பி. ப. 5.13 மணிக்கு பாராளுமன்றம், 2026 நவம்பர் 04, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.
Parliament adjourned accordingly at 5.13 p.m. until 9.30 a.m. on Wednesday, 04th of November, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1 වන ප්‍රශ්නයට - 2452/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2452/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for two weeks' time to reply to Question No. 1 - 2452/2026 - raised by the Hon. (Mrs.) Rohini Kumari Wijerathna, appearing in today's Order Paper.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2 වන ප්‍රශ්නයට - 2453/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 2453/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for two weeks' time to reply to Question No. 2 - 2453/2026 - raised by the Hon. (Mrs.) Rohini Kumari Wijerathna, appearing in today's Order Paper.

යෝජිත යාපනය ගෘහස්ථ ක්‍රීඩාංගණය: ඉදිකිරීම්
உத்தேச யாழ்ப்பாணம் உள்ளக விளையாட்டரங்கு: நிர்மாணம்
PROPOSED JAFFNA INDOOR STADIUM: CONSTRUCTION

2454/2026

3. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(iii) ඒ සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ක්‍රමවේදය කවරේද;

(v) ඉදිකිරීම් භාර දුන් කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(vi) එම කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා දරන ලද වියදම සහ භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස කවරේද;

(ii) ඇස්තමේන්තුගත මුදල ඉක්මවා වියදම් කර තිබේ නම්, එම ප්‍රමාණය සහ එයට හේතු කවරේද;

(iii) 2026 වර්ෂය සඳහා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන සහ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට නියමිත දිනය කවරේද;

(iv) වාර්ෂික නඩත්තු හා මෙහෙයුම් පිරිවැය ලෙස ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் உள்ளக விளையாட்டரங்கின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப் பட்ட திகதி யாது என்பதையும்;

(iii) அதற்காக ஒதுக்கப்பட்டுள்ள மொத்த ஒதுக்கீடு கள் யாது என்பதையும்;

(iv) ஒப்பந்தம் வழங்கப்பட்ட முறை யாது என்பதை யும்;

(v) நிர்மாணப் பணிகள் வழங்கப்பட்ட ஒப்பந்ததாரர் யார் என்பதையும்;

(vi) மேற்படி ஒப்பந்தத்துக்கான ஒப்பந்தத் தொகை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்துக்காக இதுவரை செலவிடப்பட்ட தொகை மற்றும் அதன் பௌதிக முன்னேற்றம் சதவீத அடிப்படையில் யாது என்பதையும்;

(ii) மதிப்பீட்டுத் தொகையை விஞ்சிச் செலவு செய்யப்பட்டுள்ளதாயின், அவ்வகையில் செலவு செய்யப்பட்ட தொகை மற்றும் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) 2026ஆம் ஆண்டுக்குத் தேவையான எஞ்சிய நிதி ஒதுக்கீடுகள் மற்றும் கருத்திட்டத்தை முழுமையாக நிறைவுசெய்ய எதிர்பார்க்கப்படும் திகதி யாது என்பதையும்;

(iv) வருடாந்த பராமரிப்பு மற்றும் செயற்பாட்டுச் செலவாக மதிப்பிடப்பட்டுள்ள தொகை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) whether the construction of the Jaffna Indoor Stadium has commenced;

(ii) if so, the date of commencement of the said construction;

(iii) the total provisions allocated for the said purpose;

(iv) the methodology by which the contract was awarded;

(v) the contractor to whom the said construction has been entrusted; and

(vi) the agreed contract amount of the said contract?

(b) Will he also inform this House -

(i) the expenditure incurred so far and the physical progress achieved as a percentage for the said project;

(ii) if expenditure has been incurred in excess of the estimated amount, that amount and the reasons therefor;

(iii) the remaining provisions required for the year 2026, and the scheduled date of completion of the said project; and

(iv) the estimated annual maintenance and operational cost?

(c) If not, why?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) රුපියල් මිලියන 161ක් වෙන් කර ඇත.

(iv) අංක අමප/25/2052/823/020 හා 2025.11.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ එකඟතාව ලබා ගැනීමට යටත්ව, යාපනය ගෘහස්ථ ක්‍රීඩාංගණය ඉදිකිරීම පිණිස ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගතවීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද යාපනය දිසා අධිකරණයේ ගොනු කර ඇති අංක 77/TR/2025 දරන නඩුව හේතුවෙන් ගිවිසුම්ගතවීම අත්හිටුවා ඇත.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

(அ) (i) இல்லை.

(ii) ஏற்புடையதன்று.

(iii) 161 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது.

(iv) இலக்கம் அம/25/2052/823/020 மற்றும் 2025.11.18ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தின்மூலம் தேசிய பெறுகை ஆணைக் குழுவின் இணக்கப்பாட்டைப் பெற்றுக் கொள்வதற்கு உட்பட்டு, யாழ்ப்பாணம் உள்ளக விளையாட்டரங்கை நிர்மாணிப்பதற்காகக் கட்டிடத் திணைக்களத்துடன் ஒப்பந்தம் மேற்கொள்வதற்கு அனுமதி வழங்கப்பட்டு இருந்தபோதிலும், யாழ்ப்பாணம் மாவட்ட நீதிமன்றத்தில் தாக்கல் செய்யப்பட்டுள்ள 77/TR/2025ஆம் இலக்க வழக்கின் காரணமாக அவ்வாறு ஒப்பந்தம் மேற்கொள்வது இடைநிறுத்தப்பட்டுள்ளது.

(v) ஏற்புடையதன்று.

(vi) ஏற்புடையதன்று.

(ஆ) (i) ஏற்புடையதன்று.

(ii) ஏற்புடையதன்று.

(iii) ஏற்புடையதன்று.

(iv) ஏற்புடையதன்று.

(இ) கேள்வி எழாது.

(a) (i) No.

(ii) Not relevant.

(iii) A sum of Rs. 161 million has been allocated.

(iv) Notwithstanding that approval was granted by Cabinet Decision No. CP/25/2052/823/020 dated 18.11.2025 to enter into an agreement with the Department of Buildings for the construction of the Jaffna Indoor Stadium subject to obtaining the concurrence of the National Procurement Commission, the execution of the agreement has been suspended due to Case No. 77/TR/2025 filed before the Jaffna District Court.

(v) Not relevant.

(vi) Not relevant.

(b) (i) Not relevant.

(ii) Not relevant.

(iii) Not relevant.

(iv) Not relevant.

(c) Does not arise.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.